
# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ බක් අව අටවක ලත් කුජ දින | කාණ්ඩය 112 | පත්‍රය 117 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මැයි 04 අඟහරුවාදා





සතියේ ප්‍රකාශන මණ්ඩපයෙන් බද්දරමල්ල අද පත්‍රය සමඟ

# සෞඛ්‍ය උපදෙස් නොපිළිපැද්දොත් දිනකට ආසාදිතයන් 8000-10,000 වාර්තා වීමේ අවදානමක්



සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 මර්දන සෞඛ්‍ය උපදෙස් නොපිළිපදිමින් ස්වයං විනයකින් තොරව තවදුරටත් ජනතාව කටයුතු කළහොත් ඉදිරි සති දෙක තුන ඇතුළත දිනකට ආසාදිතයන් 8000ක්, 10,000ක් වාර්තා වීමේ අවදානමක් පවතින බව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය 'දිනමිණ'ට ඊයේ (03) ප්‍රකාශ කළාය. **පිට 06**

## පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය අධි චෝදනා 863ක් යටතේ පූජිත්ට හේමසිරිට නඩු

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ බුද්ධි තොරතුරු ලැබී තිබියදී එය වළක්වා ගැනීමට නිසි ක්‍රියා මාර්ග ගැනීමට අපොහොසත් වී යැයි, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර හා හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු යන අයට එරෙහිව අධි චෝදනා 863ක් යටතේ කොළඹ මහාධිකරණය හමුවේ වෙන වෙනම නඩු දෙකක් පැවරීමට නීතිපතිවරයා ඊයේ (03) පියවර ගෙන තිබේ. **පිට 06**

රෝෂන් තුෂාර

## ඉන්දියාවේ සිට පැමිණ පුත්තලමේ සැඟවී සිටි කාන්තාවට හා මවට ඇප

මිහිර විජේසේකර- මාරවිල සමූහ

ඉන්දියාවේ සිට මුහුදු මාර්ගයෙන් පැමිණ සැඟවී සිටි කාන්තාව හා ඇයට රැකවරණය දුන් මවට එක් අයකුට එක්ලක්ෂ පනස් දහස බැගින් ශරීර ඇප දෙකක් නියම කරමින් අදාළ කාන්තාව හා ඇගේ දරුවන් දෙදෙනා මවගේ නිවෙසේ ස්වං නිරෝධායනයට යොමු කිරීමට පුත්තලම දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් එෆ්. මහප්‍රි මහත්මිය ඊයේ (3) නියෝග කළාය. පිට 06



## එල්ටීටීඊය ප්‍රවර්ධනය කළ අයෙක් එරාවුර්හිදී අත්අඩංගුවට

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය යොදා ගනිමින් එල්.ටී.ටී.ඊ සංවිධානය ප්‍රවර්ධනය කළ පුද්ගලයකු විශේෂ පොලිස් කණ්ඩායමක් විසින් එරාවුර් ප්‍රදේශයේදී පෙරේදා (02) රාත්‍රියේ අත්අඩංගුවට ගෙන තිබේ. පිට 06



## දිලුම්ට තවත් රාජ්‍ය ඇමැතිකමක්

මේ වන විට වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා, දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය ඇමැතිවරයා ලෙස කටයුතු කරන දිලුම් අමුණුගම මහතා ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය ඇමැතිවරයා ලෙස ද පත් කර ඇත. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරියේ දිලුම් අමුණුගම මහතා නව රාජ්‍ය ඇමැති ධුරයේ දිවුරුම් දුන් අයුරු.

## කොරෝනා අවදානම් අදියර 3 යටතේ ක්‍රියා කරන්න

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන

පිට 06

## හුදෙකලා පෙදෙස්වලින් පිට වන අයට දඬුවම් දෙනවා

පොලිස් මාධ්‍ය ප්‍රකාශක

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

හුදෙකලා කර ඇති ප්‍රදේශවලින් පිට වන සහ ඇතුළු වන පුද්ගලයන් වහාම අත්අඩංගුවට ගෙන දඬුවම් දෙන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා ඊයේ (03) පැවසීය. පිට 06

## ගැබිනි කතුන් 70කට කොරෝනා

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරසය ආසාදිත ගැබිනි කාන්තාවන් 70ක් පමණ මේ වන විට රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටින බව පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂිකා විශේෂඥ වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා මහත්මිය 'දිනමිණ'ට ඊයේ (03) පැවසුවාය. පිට 06

## ත්‍රිරෝද රථවලට QR කේතයක්

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

අපරාධ සහ වංචනික ක්‍රියා වළක්වා ගැනීමේ අරමුණ ඇතිව මෙරට සියලු ත්‍රිරෝද රථවල දත්ත ගබඩා කිරීමට අන්තර්ජාල යෙදවුමක් නිර්මාණය කිරීමට පොලිස් මූලස්ථානය පියවර ගෙන තිබේ. පිට 06

## අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් දෙනවා



පිට 06

## නිවෙසේ කොරෝනා ආසාදිතයන් සිටී නම් 1906ට කියන්න

පිට 06

## තවත් ප්‍රදේශ කිහිපයක් හුදෙකලා කෙරේ

පිට 06

## සංවර්ධනය නවතා දමා මහජන ජීවිත රකින්න



පිට 06

## ලංවිමේ කිහිප දෙනකුට කොවිඩ් හැදුණත් විදුලි සැපයුම අඛණ්ඩවම

ශිරාන් රණසිංහ

ලංවිම සේවකයන් කිහිප දෙනකුට කොවිඩ් 19 වයිරසය ආසාදනය වී තිබුණත් කිසිදු ප්‍රශ්නයකින් තොරව මුළු රටටම අඛණ්ඩව විදුලිය සැපයීමට අවශ්‍ය පියවර ගෙන තිබෙන බව ලංවිම සභාපති, ඉංජිනේරු විජිත හේරත් මහතා දිනමිණට ඊයේ (03) පැවැසීය. පිට 06

## අනවසර සංක්‍රමිකයන් රැගෙන එන බෝට්ටුවලට වැඩ වරදී

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

අනවසර සංක්‍රමිකයන් ප්‍රවාහනය කරන හෝ විදේශිකයන්ට මෙරටට ඇතුළු වීමට තම ධීවර යාත්‍රාවලින් පහසුකම් සපයන ධීවර කාර්මිකයන් හා යාත්‍රා හිමිකරුවන් අත්අඩංගුවට ගැනීමටත්, ධීවර කර්මාන්තයේ යෙදීම සඳහා නිකුත් කර ඇති සියලු බලපත්‍ර අවලංගු කිරීමටත් කටයුතු කරන බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව දැනුම් දී තිබේ. පිට 06

## ශ්‍රේෂ්ඨාධිකරණ-අභියාචනාධිකරණ නඩු මේ සතියේ විවෘත අධිකරණයේ නොකැඳවයි

පිට 06










# ගත වූ දින 10 තුළ මෙරටින් කොරෝනා ආසාදිතයෝ 13,000ක්

## සෞඛ්‍ය අමාත්‍යාංශය

**නුවන් කොඩිකාර**

ගත වූ දින 10ක කාලයේදී මෙරටින් කොරෝනා ආසාදිතයන් 13,000කට අධික පිරිසක් වාර්තා වී ඇති බවත්, ඒ අතරින් දින 06කදී කොරෝනා ආසාදිතයන් 1000 සීමාව පසු කර ඇති බවත්, අවසන් දින 04ම ආසාදිතයන් 1500 සීමාව පසු කර ඇති බවත් සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි.

දිනයකදී මෙරට වාර්තා වූ වැඩිම කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව වන 1891 පෙරේදා දිනයේදී වාර්තා වු අතර, ගත වූ දින 07 දී ආසාදිතයන් 10,374ක් වාර්තා විය.

පෙරේදා දිනයේදී වැඩිම ආසාදිතයන් සංඛ්‍යාව කොළඹ දිස්ත්‍රික්කයෙන් වර්තා වූ අතර එම ගණන 387කි. ඒ අනුව පිළියන්දලින් 81ක්, පාදුක්කෙන් 25ක්, වැල්ලම්පිටියෙන් 23ක්, මොරටුවෙන් 17ක්, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙන් 64ක් ලෙස ආසාදිතයන් වාර්තාවී තිබේ.

මේ අතර පෙරේදා දිනයේදී කළුතර දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 330ක්, පාණදුර දකුණ 58ක්, බදුරලිය 41ක්, කළුතර 39ක්, බේරුවල 31ක් , මතුගම සහ පානදුර උතුර 19ක් සහ බණ්ඩාරගම 18ක් ලෙස ආසාදිතයන් වාර්තා වී ඇත.

පෙරේදා දිනයේදී ගම්පහ දිස්ත්‍රික්කයෙන් ද කොවිඩ් ආසාදිතයන් 297 දෙදෙනකු හඳුනා ගෙන ඇති අතර, සීදුව 52ක්, නිට්ටඹුව 49ක්, මිනුවන්ගොඩ 30ක්, මීරිගම 38ක්, දිවුලපිටිය 23ක, වේයන්ගොඩ 21ක් සහ බියගම 18ක් ලෙස එම ආසාදිතයන් වාර්තා වී තිබේ.

කුරුණෑගල 51ක්, ගාල්ල 80ක්, මොනරාගල 44ක්, මාතර 17ක්, කෑගල්ල 47ක්, බදුල්ල 35ක්, අම්පාර 07ක්, අනුරාධපුර 71ක්, ත්‍රිකුණාමලය 45ක්, වව්නියාව 03ක්, මහනුවර 66ක්, නුවරඑළිය 102ක්, රත්නපුර 70ක්, පුත්තලම 88ක්, යාපනය 05ක්, මාතලේ 22ක්, පොළොන්නරුව 19ක්, කිලිනොච්චිය 14ක්, මඩකළපුව 02ක්, හම්බන්තොට 35ක්, මුලතිව් 06ක් සහ විදේශගතව සිට මෙරටට පැමිණි පුද්ගලයන් 45 දෙනකු ද ආසාදිතයන් ලෙස හඳුනා ගෙන ඇත.

පෙරේදා දිනයේදී මෙරටින් තවත් කොරෝනා මරණ 09ක් වාර්තාවී ඇති අතර, ඒ අනුව මෙරට සමස්ත කොවිඩ් මරණ සංඛ්‍යාව 696ක් දක්වා ඉහළ ගොස් තිබේ.

මෙරට සමස්ත කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව 111,753ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, රෝහල් ගතව සිටින ආසාදිතයන් සංඛ්‍යාව 13,815කි. සුවය ලද පිරිස 97,848කි.

ඇතැම් ප්‍රදේශවලින් කොරෝනා වයිරසය ආසාදනය වන පුද්ගලයන් හඳුනා ගැනීමේ ප්‍රමාදයක් ඇතැයි කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී, යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ යුද හමුදාපතිවරයා මෙසේ ද කීය.

'ඇතැම් පුද්ගලයන් පෞද්ගලික රෝහල්වලින් පරීක්ෂණ සිදු කර කොරෝනා ආසාදිත බවට තහවුරු වුවහොත් ඒ පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට නොදන්වා නිවෙසේම රැඳී සිටිනවා. අදාළ තොරතුරු පෞද්ගලික රෝහල්වලින් ලැබීමේදී ද කිසියම් ප්‍රමාදයක් සිදු වෙනවා. මීට දින 10කට පෙර වාර්තා වූ ආසාදිතයන් ප්‍රතිකාර ලබා රෝහල්වලින් පිටව යෑම මේ දිනවල සිදු වෙනවා. එනිසා රෝහල්වල පවතින තදබදය ඉදිරි දෙක තුනේදී අඩු වනු ඇති බවට විශ්වාස කරනවා.'

# ලොව පුරා කොවිඩ් ආසාදිත ගණන කෝටි 15 ඉක්මවයි

**මහින්ද අලුත්ගෙදර**

ලොව පුරා රටවලින් වාර්තා වන කොවිඩ් අසාදිතයන් ගණන කෝටි 15 ඉක්මවා ගොස් තිබේ.

ඒ අනුව ලෝකයේ රටවල් සහ ස්වයං පාලන ප්‍රදේශ 218කින් වාර්තා වන කොවිඩ් ආසාදනය වූවන්ගේ සංඛ්‍යාව 153,506,481 දක්වා ඉහළ ගොස් තිබෙන අතර, එම හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව 3,216,705 දක්වා ඉහළ ගොස් තිබේ. කෙසේ වුවද ඒ අතරින් 130,848,347 දෙනකු පූර්ණ සුවය ලබා තිබෙන බව වාර්තා වෙයි.

වැඩිම ආසාදිතයන් පිරිස අමෙරිකාවෙන් වාර්තා වන අතර, එම සංඛ්‍යාව කෝටි තුන ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව අමෙරිකාවේ ආසාදිතයන් සංඛ්‍යාව 33,180,441ක් වන අතර, එරට මරණ සංඛ්‍යාව 590,000 ඉක්මවා ඇම විශේෂත්වයකි. ඒ අනුව එරට මිය ගිය සංඛ්‍යාව 591,062කි. මේ අතර ඉන්දියාවේ ආසාදිතයන් 19,925,604ක් සහ බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 14,754,910ක් ලෙස වාර්තා වන අතර, ප්‍රංශයේ ආසාදිතයන් 5,652,247ක් සහ තුර්කියේ ආසාදිතයන් 4,875,388ක් ලෙස වාර්තා වේ.

කෙසේ වුවද කොවිඩ් ආසාදනය වී මිය ගිය සංඛ්‍යාව ලක්ෂය ඉක්මවා ඇත්තේ එක්සත් ජනපදය, ඉන්දියාව, බ්‍රසීලය, ප්‍රංශය, රුසියාව, එක්සත් රාජධානිය, ඉතාලිය සහ මෙක්සිකෝව රටවල පමණි.

ගෙවුණු දිනයේ ද ඉන්දියාවෙන් ලක්ෂ 4කට ආසන්න කොවිඩ් ආසාදිතයන් පිරිසක් හඳුනාගෙන තිබෙන අතර, එරටින් පෙරේදා (02) වාර්තා වූ කොවිඩ් මරණ සංඛ්‍යාව 3,688කි. මේ වසංගත ව්‍යාප්තියේ දෛනික කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව ලක්ෂ 4 සීමාව පසු කර ගිය ලොව පළමු රට බවට ඉන්දියාව පත්ව තිබේ. ඒ අනුව එරටින් පෙරේදා (02) දිනයේ නව ආසාදිතයන් 392,562ක් හඳුනාගෙන තිබේ.

එම තත්ත්වය හමුවේ වයස අවුරුදු 18 ඉක්ම වූ සියලුම පුද්ගලයන්ට කොවිඩ් මර්දන එන්නත් දීමට තීරණය කර ඇතත් එන්නත් හිඟයක් පවතින බව එරට වාර්තා පවසයි. එන්නත්කරණ වැඩසටහනට ප්‍රමාණවත් තරමේ එන්නත් තොග නොමැති බවට ප්‍රාන්ත කිහිපයකම බලධාරීන් පවසා ඇත. රුසියාවේ නිෂ්පාදිත 'ස්පුට්නික්' කොවිඩ් මර්දන එන්නතේ පළමු තොගය පසුගියදා (01) ඉන්දියාවට ලැබී තිබුණේ එවන් පසුබිමක වීම විශේෂත්වයකි.

ඉන්දියාවේ හදිසි භාවිතයට අවසර හිමි වූ තෙවැනි කොවිඩ් එන්නත මෙය වන අතර, එයින් මාත්‍රා මිලියන 850ක් එරටේ නිපදවීමට ද ඉන්දියාව අපේක්ෂා කරයි. මේ අතර කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානවල ගිනි ඇතිවීම සහ ඔක්සිජන් හිඟකම නිසා ඉන්දියාව මේ වන විට තවත් ඛේදවාචකයකට මුහුණදී සිටී. නවදිල්ලි අගනුවර රෝහලක ඔක්සිජන් හිඟයක් හේතුවෙන්, දැඩි සත්කාර ඒකකවල ප්‍රතිකාර ලැබූ රෝගීන් හය දෙනෙක් ඇතුළු රෝගීන් 08 දෙනෙක් මිය ගොස් තිබේ. මේ අතර බටහිර ගුජරාට ප්‍රාන්තයේ කොවිඩ් රෝහලක හට ගත් ගින්නකින් ද සෞඛ්‍ය සේවකයන් දෙදෙනෙක් ඇතුළු පුද්ගලයන් 16 දෙනකු මියගොස් තිබේ.

# දක්ෂිණ අධිවේගි අන්තර් හුවමාරු කිහිපයක කාර්ය මණ්ඩල ඉවත් කෙරේ

**නුවන් කොඩිකාර**

කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනකුට කොරෝනා ආසාදනය වීම හේතුවෙන් දක්ෂිණ අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු කිහිපයක කාර්ය මණ්ඩල ඉවත් කර තිබේ.

කොට්ටාව, කඩුවෙල සහ අතුරුගිරිය අන්තර් හුවමාරුවල සේවකයන් එලෙස ඉවත් කර ඇති බව එහි නිලධාරියකු පැවැසීය.

කෙසේ වෙතත් එම අන්තර් හුවමාරු විවෘතව තැබෙන අතර, ඒවායෙන් දක්ෂිණ අධිවේගී මාර්ගයට ඇතුළු වන හෝ පිට වන රථ වාහන සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමක් සිදු නොවේ.

ඒ අනුව අතුරුගිරිය, කොට්ටාව සහ කඩුවෙල අන්තර් හුවමාරුවලින් ඇතුළු වන රථ වාහනවලට පිට වන ස්ථානයේදී ගාස්තු ගෙවීමේ හැකියාව ඇත.

මේ වන විට කොට්ටාව අන්තර් හුවමාරුවේ සේවකයන් 12 දෙනකුට, කඩුවෙල අන්තර් හුවමාරුවේ සේවකයන් 04 දෙනකුට සහ අතුරුගිරිය අන්තර් හුවමාරුවේ එක් සේවකයකුට කොවිඩ් ආසාදනය වී තිබේ.

මේ හේතුවෙන් දක්ෂිණ අධිවේගී මාර්ගයේ කහතුඩුව පිවිසුම අසල අධික රථවාහන තදබදයක් තිබෙන අතර, මේ නිසා මාතර දෙසින් පැමිණෙන වාහනවලට කහතුඩුව ප්‍රවේශපත් කවුළුවෙන් මුදල් ගෙවා අධිවේගී මාර්ගයෙන් පිටවීමට සිදු විය.

# සියලු සත්වෝද්‍යාන අද සිට තාවකාලිකව වසා තැබේ

පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අද (04) සිට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් දෙහිවල ජාතික සත්වෝද්‍යානය, පින්වල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය සහ රිදියගම සෆාරි උද්‍යානය මහජනයා වෙනුවෙන් නැවත දැනුම් දෙන තෙක් තාවකාලිකව වසා තබනු ලැබේ.

# අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රැඳවූවන් 18කට කොවිඩ්

අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රැඳවූවන් 18 දෙනකුට කොරෝනා ආසාදනයවී ඇතැයි බන්ධනාගාර ආරංචි මාර්ග පවසයි.

අම්බලන්තොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේදී සිදු කරන ලද ඇන්ටිජන් පරීක්ෂණයේදී මේ ආසාදිතයන් හඳුනාගෙන තිබේ. රැඳවූවන් 26 දෙනකුට සිදු කළ ඇන්ටිජන් පරීක්ෂණවලින් මේ පිරිස හඳුනාගෙන ඇත.

# මස්කෙළිය ප්‍රා. රෝහල කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කෙරේ

**මස්කෙළිය සමූහ - ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක**

මස්කෙළිය ප්‍රාදේශීය රෝහල කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ කටයුතු මේ දිනවල කඩිනමින් සිදු කෙරේ.

මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන මස්කෙළිය ප්‍රාදේශය රෝහල මහල් 04කින් සමන්විතය. වාට්ටු සංකීර්ණ 06කින් සමන්විත වන මස්කෙළිය ප්‍රාදේශීය රෝහලේ මේ වන විට ක්‍රියාත්මක වන්නේ බිම් මහලේ පිහිටි හදිසි ප්‍රතිකාර අංශය, බාහිර රෝගී අංශය, දන්ත වෛද්‍ය ඒකකය සහ වෛද්‍ය සායනය පමණි.

වාට්ටු සංකීර්ණය පිහිටි මහල් 03ක් කොවිඩ් ප්‍රතිකාර වෙනුවෙන් කඩිනමින් පිළිසකර කෙරේ.

# මාතලේ දිසාවේ කොවිඩ් පාලනයට විශේෂ වැඩපිළිවෙළක්



**මාතලේ දිස්ත්‍රික් සමූහ**

මාතලේ දිස්ත්‍රික්කයෙහි ශීඝ්‍රයෙන් පැතිර යන කොවිඩ් වයිරසය පාලනය කිරීමට ජනතාව දැනුම්වත් කිරීම මෙන්ම කෝවිඩ් රෝගීන් සොයා දැවැන්ත වැඩපිළිවෙළක් දිස්ත්‍රික්කයේ ඇති සියලුම ස්වේච්ඡා සංවිධාන සහ රාජ්‍ය සේවකයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට මාතලේ දිස්ත්‍රික් කොවිඩ් කමිටුව පසුගියදා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවති රැස්වීමේදී තීරණය කරන ලදි.

දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, අතිරේක දිස්ත්‍රික් ලේකම් ඉෂාන් විජේතිලක, කොවිඩ් දිස්ත්‍රික් කමිටු සම්බන්ධීකාරක මේජර් ජනරාල් නිශාන්ත මානගේ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මේ රැස්වීම පැවැත්විය.

මෙහිදී දිස්ත්‍රික්කයේ දැනට හඳුනාගෙන ඇති කෝවිඩ් ආසාදිතයන් මෙන්ම එම රෝගය ව්‍යාප්තවී ඇති ආකාරය පිළිබඳව දිස්ත්‍රික් වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානී විශේෂඥ වෛද්‍ය ප්‍රභාත් රණසිංහ මහතා විසින් සවිස්තරාත්මක විග්‍රහයක් සිදු කරන ලදි.

ඒ අනුව දිස්ත්‍රික්කයේ ලියාපදිංචි සියලුම මරණාධාර, කාන්තා, තරුණ, වැඩිහිටි සමිති, සිවිල් ආරක්ෂක කමිටු, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය සේවයට කැඳවීමේදී සේවා අවශ්‍යතාව මත නිවෙස්වල රැඳී සිටීමට අවසර දී ඇති රාජ්‍ය සේවකයන්ගේ ද සහභාගිත්වයෙන් සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කොවිඩ් පාලන කමිටු පිහිටුවා කොවිඩ් ආසාදිත පවුල් අධීක්ෂණය හා ඊට අදාළ කාර්යයන් කළමනාකරණය කිරීමට ද තීරණය කළහ. එමෙන්ම මේ කමිටු සඳහා ප්‍රදේශයේ සියලුම ආගමික නායකයන් ද සහභාගි කර ගත යුතු වේ.

එමෙන්ම ලග්ගල පිහිටි කොවිඩ් ආසාදිත ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි රෝගී ධාරිතාව උපරිම මට්ටමට ළගාවී ඇති බැවින් නාඋල, අඹන ප්‍රාදේශීය රෝහලේ ඇඳන් සියයකින් සමන්විත රෝගී රැඳවුම් මධ්‍යස්ථානයක් කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික පහසුකම් දීමට ද මේ කමිටුව මෙහිදී තීරණය කරන ලදි. මෙයට සමගාමීව දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය රෝහලකම එක වාට්ටුවක් කොවිඩ් රෝගීන්ට වෙන් කර ඊට අවශ්‍ය පහසුකම් දීමට ද තීරණය විය.

ඡායාරූපය - මාතලේ දිස්ත්‍රික් සමූහ

# කොවිඩ් රෝගීන්ට ප්‍රමාණවත් පහසුකම් කඩිනමින් දෙන්න

## උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයාගෙන් නිලධාරීන්ට උපදෙස්

**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොවිඩ් රෝගීන්ට ප්‍රමාණවත් පහසුකම් කඩිනමින් පුළුල් කිරීමට පියවර ගන්නා ලෙසට උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

ආණ්ඩුකාරවරයා මේ බව පැවැසුවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොවිඩ් 19 වසංගතය වැළැක්වීමේ මෙහෙයුම් කමිටුව ප්‍රධාන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පෙරේදා (02) පැවති අවස්ථාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ආණ්ඩුකාරවරයා මෙසේ ද කීය.

'මේ වන විට මැදවච්චිය ප්‍රදේශයේ ස්ථාපිත කරමින් පවතින ඇඳන් 150කින් සමන්විත වාට්ටු සඳහා අවශ්‍ය වෛද්‍ය කාර්ය මණ්ඩල සහ භෞතික සම්පත් සියල්ල දීමට කටයුතු කරන්න.'

උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පාලිත බණ්ඩාර මහතා

'මේ වන විට අනුරාධපුරයෙන් කොවිඩ් රෝගීන් 1136ක් පමණ වාර්තාවී තිබෙනවා. අලුත් අවුරුදු පොකුරට අනුරාධපුරයේ කොවිඩ් රෝගීන් 350ක් පමණ වාර්තාවී තිබෙනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ද කොවිඩ් බෝ වීමේ සක්‍රීය භාවය වැඩියි. නිරෝධායනය වීමේ ස්ථාන අවම නිසා ගෘහ නිරෝධායනය බහුලව සිදු කරනවා. ඔවුන් කොවිඩ් ආසාදිත බවට හඳුනාගතහොත් අනුරාධපුර, නොච්චියාගම, ගලෙන්බිඳුණුවැව, කැබිතිගොල්ලෑව රෝහල්වලට යොමු කරනවා. ඒ වගේම අපට විශාල අර්බුදයක් ව තිබූ පීසීආර් මැෂිම දැන් යථා තත්ත්වයට පත් කර සාර්ථකව ක්‍රියාත්මක වෙනවා.

# බස් රථවල මගීන් ගෙන යා හැක්කේ එහි ආසන සංඛ්‍යාවට පමණයි

## පොලිස් මාධ්‍ය ප්‍රකාශක

**උපාලි කරුණාරත්න**

බස් රථවල මගීන් රැගෙන යා හැක්කේ එහි ආසන සංඛ්‍යාවට බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ නියෝජ්‍ය පොලිස්පතිවරයා මෙසේ ද කීය.

'එයට පරිබාහිරව ක්‍රියා කරන බස් රථවලට එරෙහි නිරෝධායන රීතීන් යටතේ කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. රියැදුරන්, කොන්දොස්තරවරුන්, සහායකයන්, බස් රථවල අයිතිකරුවන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

පසුගිය 01 වැනිදා බස්නාහිර පළාතෙන් පිට වන සහ ඇතුළු වන ස්ථාන 12කදී පොලිසිය සහ හමුදාව වාහන 526ක පුද්ගලයන් 1102ක් පරීක්ෂාවට ලක් කර තිබෙනවා. ඒවායේ සිටි 250ක පමණ පිරිසක් නිරෝධායන රීතීන් අනුව කටයුතු නොකරන බවට පෙනී ගියා. ඒ සම්බන්ධයෙන් එම පිරිසට අවවාද කළා. මෙවැනි මෙහෙයුම් දිගින් දිගටම ක්‍රියාත්මක කරනවා. විවිධ පවුල්වල, විවිධ ප්‍රදේශවල පදිංචි අය එකම වාහනයක ගමන් කරමින් සිටිනවා නම් ඔවුන් මුහුණු ආවරණ පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතුයි'.

# ජන සතු බස් සමාගම් කොටස් හිමියන්ට වන්දි ගෙවීම තාවකාලිකව නතර කළා

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

**නුවන් කොඩිකාර, සුභාෂිණී සේනානායක සහ ඇල්පිටිය සමූහ**

ජනතා සන්තක බස් රථ සමාගම්වල සේවයේ නියුක්තව සිටි කොටස් හිමියන්ට දීමට ඇති වන්දි මුදල් ගෙවීම තාවකාලිකව නතර කළ බව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය පවසයි.

වන්දි මුදල් ගැනීමට ඩිපෝ වෙත පුද්ගලයන් පැමිණීම පවතින කොවිඩ් අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් අවදානම් සහගත නිසා සෞඛ්‍ය නීති රීතිවලට යටත්ව වන්දි මුදල් ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇති බව එම මණ්ඩලය සඳහන් කරයි.

වන්දි මුදල් දෙන කාලවකවානුව කඩිනමින් දැනුම් දෙන බව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී මහහේෂ් කුලතිලක මහතා පැවැසීය.

# කම්කරු කාර්යාලවලට පැමිණීම සීමා කරන්න

## කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයා ජනතාවගෙන් ඉල්ලීමක් කරයි

**අනුර ප්‍රේමලාල්**

කොවිඩ් ආසාදිතයන් හඳුනා ගැනීම නිසා දැනටමත් ප්‍රාදේශීය කම්කරු කාර්යාල කිහිපයක් වසා දමා ඇති නිසා කොළඹ ප්‍රධාන කාර්යාලයට සහ අනෙකුත් කාර්යාල වෙත එන ජනතාව තමන් ගැන සිතා මේ කාලසීමාවේ රාජකාරී කරගැනීමට පැමිණීම සීමා කිරීම හොඳ යැයි කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා ජනතාවගෙන් ඉල්ලා සිටියි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'දැනට අපේ අම්බලන්ගොඩ, මහරගම සහ කළුතර කම්කරු කාර්යාල ආසාදිතයන් හඳුනා ගැනීම නිසා වසා දමා තිබෙනවා. දැනට අප රාජ්‍ය පරිපාලනය විසින් නිකුත් කර තිබෙන චක්‍රලේඛය අනුව නිලධාරීන්, සේවකයන් සේවයට පැමිණ රාජකාරී කටයුතු කරගෙන යනවා. ජනතාවගේ පැමිණීමේ සංඛ්‍යාවේත් අඩුවක් තිබෙනවා. පවතින වසංගත තත්ත්වයේ අවධානම සැලකිල්ලට ගෙන මේ කාලසීමාවේ කම්කරු කාර්යාල වෙත පැමිණීම අඩු කරනවා නම් හොඳයි.'

# දැඩි සෞඛ්‍ය කොන්දේසිවලට යටත්ව දඹුල්ල ආර්ථිකය කඩිනමින් විවෘත කිරීමට පියවර

**මාතලේ දිස්ත්‍රික් සමූහ**

අනපේක්ෂිත ආකාරයෙන් සෞඛ්‍ය අංශ විසින් පසුගියදා දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයෙහි සිදු කළ පීසීආර් පරීක්ෂණවල ප්‍රතිඵල අනුව එහි කොරෝනා ආසාදනය වුවන් 50 දෙනකු පමණ හඳුනාගෙන ඇති බැවින් මේ තත්ත්වය මඟහැරී යන තෙක් ආර්ථික මධ්‍යස්ථානය නැවත දන්වනතුරු තාවකාලිකව වසා දැමීමට මාතලේ දිස්ත්‍රික් කොවිඩ් මර්ධන කමිටුව විසින් පසුගියදා තීරණය කරන ලදි.

මේ අතර දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය කළමනාකාර භාරය සහ වෙළෙඳ සංගමය සමඟ දිස්ත්‍රික් කොවිඩ් කමිටුව විසින් ඉකුත්දා (01) පවත්වන ලද සාකච්ඡාවේදී මේ තත්ත්වය නිසා ගොවීන්ට මුහුණ පෑමට සිදු වන අපහසුතා සැලකිල්ලට ගනිමින් ආර්ථික මධ්‍යස්ථානය දැඩි සෞඛ්‍ය කොන්දේසිවලට යටත්ව කඩිනමින් නැවත විවෘත කිරීමට තීරණය කර තිබේ.

ඒ සඳහා දැඩි කොන්දේසි සහ නිර්ණායක පැනවීමට ද දිස්ත්‍රික් කොවිඩ් මර්දන කමිටුව විසින් පියවර ගෙන ඇත.

මේ තීරණ අනුව එක් වෙළෙඳසල් පරිශ්‍රයක රැඳී සිටිය හැකි උපරිම සංඛ්‍යාව පස්දෙනකුට සීමාවේ. එමෙන්ම මොවුන්ගේ නීරෝගිතාව සනාථ කිරීමට පීසීආර් පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. මෙයට අමතරව මොවුන් සෑම දෙසතියකට වරක්ම පීසීආර් පරීක්ෂණ වර්තාවක් ඉදිරිපත් කළ යුතුවේ. එමෙන්ම ආර්ථික මධ්‍යස්ථානයට ඇතුළු වන සෑම පුද්ගලයකුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද දැඩිව අනුගමනය කළ යුතුය.

දිනපතා පස්වරු 2.00 සිට පස්වරු 10.00 දක්වා ආර්ථික මධ්‍යස්ථානය විවෘතව තැබිය යුතු අතර, එක් වෙළෙඳසල් පරිශ්‍රයක තිබිය යුතු එළවළු ගෙන එන ලොරි සංඛ්‍යාව දෙකකට සීමා කෙරේ. තවද පිට පෙදෙස්වලින් පැමිණෙන ලොරි රථයක රියැදුරු සමඟ පැමිණිය හැකි වන්නේ එක් ගොවියකුට හෝ කළමනාකරුවකුට පමණි. මෙසේ පිටතින් පැමිණෙන ව්‍යාපාරිකයන් සහ ගොවීන් අදාළ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාගෙන් ගත් පීසීආර් සහතියක් හෝ ඇන්ටිජන් පරීක්ෂාව සිදු කළ බව තහවුරු කරන සහතිකයක් ඉදිරිපත් කළ යුතුවේ.

මෙසේ පැමිණෙන සියලු වාහන ආර්ථික මධ්‍යස්ථානයේ ප්‍රධාන රථගාලේ ගාල් කළ යුතුය. මේ ස්ථානයට ඇතුළු වන සෑම පුද්ගලයකුම පළමුවෙන් විෂබීජ නාශකයක් යොදා දෑත් සෝදා පිරිසිදු කර ගත යුතුවේ. මෙහි සිදු කෙරෙන නාඩි වෙළෙඳාම මෙන්ම එළවළු මලු කඩා අලෙවි කිරීම ද සම්පූර්ණයෙන්ම තහනම් වන අතර, මෙහි තොග වෙළෙඳාම පමණක් සිදු කළ යුතුය.

මේ ආර්ථික මධ්‍යස්ථානයේ විවෘත කෙරෙන සතියේ පළමු දින දෙක මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන්ට පමණක් සීමා වන අතර, මේ පරිශ්‍රය නිරන්තරයෙන් දැඩි නිරීක්ෂණයට ලක් කිරීමට කොවිඩ් මර්දන කමිටුව තීරණය කර තිබේ.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මැයි 04 අඟහරුවාදා

# ජීවිතය ද? - 'ෆන්' එක ද?

කොවිඩ් තෙවන රැල්ල ශීඝ්‍රයෙන් රට පුරා ව්‍යාප්ත වන්නට පටන් ගෙන තිබේ. එහෙත් අවාසනාවකට මෙන් අපේ ජනතාව තවම එහි භයානකකම වටහාගෙන නැත. එක්කෝ ඔවුහු මෙය නොසලකා හරිති. නැතහොත් ජීවිතයට වඩා කෙටි කාලීන පොලිය වැදගත් කොට සලකති. පෙරේදා රූපවාහිනී ප්‍රවෘත්ති නැරඹූ කෙනකුට මේ තත්ත්වය හොඳින් වටහා ගත හැකිය. තිස් ගණනක පිරිසක් මහ ඔයේ ජල ක්‍රීඩා කරමින් සිටිති. ඒ අතර කුඩා දරුවෝ ද වෙති. පොලිසිය එම ස්ථානයට නොගියේ නම්; ඔවුන්ගේ ජල ක්‍රීඩාව කොතැනකින් කෙළවර වේ දැ'යි කිසිවකුටත් කිව නොහැකිය. තවත් ස්ථානයක හතළිස් ගණනක පිරිසක රැස් කොට දේව මෙහෙයකි. පොලිසිය එම ස්ථානයට ද කඩා වැදුණේය.

රජය තෙවන කොවිඩ් රැල්ලත් සමග නව නීති ගණනාවක් හඳුන්වා දෙන්නේ කොවිඩ් ව්‍යාප්තිය වළක්වා ගැනීම සඳහාය. එය තවදුරටත් පැහැදිලි කළ හොත් කොවිඩ්වලට සම්බන්ධ සෑම නීතියකින්ම කෙරෙන්නේ වසංගතයෙන් වටිනා ජීවිත බේරා ගැනීමය. මේ නීති - රීති හා උපදේශන දිනපතාම ජනමාධ්‍ය ඔස්සේ විකාශය කරනු ලැබේ. ඒ හැරෙන්නට ඕනෑම පුද්ගලයකු ඇතැ'ති ජංගම දුරකථනයෙහි ද ඒවා වරින් - වර සටහන් වේ. රටේ ඕනෑම කටකතාවක්, ඕපාදූපයක් ක්ෂණයෙන් දැනගන්නා අපේ ජනතාව කොවිඩ් නීතිය හා උපදේශන මාලාව දන්නේ නැතැ'යි කියන්නේ නම්; එය අමූලික බොරුවකි. සිදුවන්නේ නොසලකා හැරීමය. මෙය තමන් ගැන නොසලකා හැරීමක් සේම අනෙකා ගැන නොසලකා හැරීමක් ද වන්නේය.

කිසියම් රටක වසංගතයක් පැතිර යන විට එය වළක්වා ගැනීමේ ක්‍රියා පටිපාටියෙන් වැඩි වැඩ කොටසක් ජනතාව වෙත පැවරේ. සෞඛ්‍ය අංශවලට හා රජයකට කළ හැක්කේ උපදේශන සැපයීම, ප්‍රතිකාර සේවා පවත්වා ගැනීම හා නීති - රීති පැනවීම පමණි. වසංගත රෝග විශේෂඥයන්ගේ මතයට අනුව සෞඛ්‍ය උපදේශන අකුරටම අනුගමනය කරන්නේ නම්; රෝගය පැතිරෙන්නේ නැත. මෙහිදී සුළු අතපසුවීමකින් වුව රෝගය නැවත පැතිර යන්නට පුළුවන. ඉන් කියැවෙන්නේ දැඩි අවධානයකින් යුතුව ජීවන පැවැත්ම සකසා ගත හොත් කොවිඩ් පරාජය කිරීම අපහසු නැති බවය. වයිරසයේ කුමන ප්‍රභේද තිබුණ ද නිසි සෞඛ්‍ය පිළිවෙත් මගින් එයින් ආරක්ෂා විය හැකිය.

කොවිඩ් තෙවන රැල්ල මතුවන්නේ ජනතාවගේ නොසැලකිල්ල නිසා බව තහවුරු වී ඇත. ඒ ගැන විවාදයක් නැත. ගිය වසරේ සමරන්නට නොහැකි වූ අලුත් අවුරුද්ද මේ වසරේ නිදහසේ සමරනු දක්නට ලැබිණි. අලුත් අවුරුදු සමයේ ආරම්භයේදීම සෞඛ්‍ය අංශ අනතුරු හඟවමින් නව උපදේශන ගණනාවක් ලබා දුන්නේය. එහෙත් රටේ සමස්ත පුරවැසියන්ගෙන් බහුතරය ඒවා පිළිගෙන කටයුතු කර නැති බව පැහැදිලිය. එහි අදහස වන්නේ ජීවිතවලට වඩා තාවකාලික විනෝදය ගරු කොට සලකන්නට අපේ ජනතාව හුරු වී ඇති බවය. මේ පුරුද්ද තිබෙන තාක් කොවිඩ් මර්දනය අපහසු වනු ඇත. කොවිඩ් තෙවන රැල්ල පවා නොසලකා හරිමින් සමහරු ක්‍රියා කරති. ඔවුන් අත්අඩංගුවට ගෙන දඬුවම් ලබා දිය යුත්තේ අපරාධයක් සිදුකරන බැවිනි.

සමාජ විශ්ලේෂකයන්ගේ මතයට අනුව අපේ රට ද ඉන්දියාවේ තත්ත්වයට පත්වන්නට ඉඩ තිබේ. මේ වන විටත් රටේ රෝහල් වෙත කොවිඩ් ආසාදිතයන් විශාල වශයෙන් පැමිණෙන බව වාර්තා වී ඇත. පෙරේදා නව ආසාදිතයන්ගේ ගණන එක්දහස් අටසියය ඉක්මවා තිබිණි. විසිවන දා සිට අඛණ්ඩව නව ආසාදිතයන්ගේ ගණන ඉහළ යමින් පවතී. ශ්‍රී ලංකාව තවත් ඉන්දියාවක් බවට පත් නොවන්නට නම්; නව ආසාදිතයන්ගේ ගණන වහාම අඩු කර ගත යුතුය. එය රජයට පමණක් කළ හැකි දෙයක් නොවේ. වගකීමෙහි වැඩි බර ඇත්තේ ජනතාව මතය. අලුත් අවුරුද්දට පෙර කොවිඩ් ව්‍යාප්තිය ඉතා හොඳින් පාලනය වී තිබිණි. ජනතාවගේ අසංවර හැසිරීම නිසා එය වහා වෙනස් විය. දැන්වත් එම හැසිරීම නිවැරදි කර ගත යුතුය.

කොවිඩ් තෙවන රැල්ලේ විශේෂතා කිහිපයක් තිබේ. ඒවා ජනතාව හොඳින් වටහා ගත යුතුය. එක් විශේෂයක් වන්නේ තෙවන රැල්ල ඉතා වේගයෙන් පැතිර යෑම හා එය මාරාන්තික වීමය. තව විශේෂයක් වන්නේ තෙවන රැල්ලේ ආසාදිතයකුට නිරෝධායනයෙන් පමණක් සුවපත් විය නොහැකි වීමය. තෙවන රැල්ලේ ආසාදිතයන් වහාම රෝහල් ගතවී ප්‍රතිකාර ලබා ගත යුතුය. තවත් විශේෂයක් වන්නේ තෙවන රැල්ල තරුණ පරම්පරාව අතර ශීඝ්‍රයෙන් පැතිර යන්නට පටන් ගැනීමය. එහි අර්ථය වන්නේ කොවිඩ් තෙවන රැල්ල රටේ කොඳු නාරටිය ගොදුරු කර ගනිමින් සිටින බවය. රටේ ආර්ථිකයට හා අනාගතයට මරු පහරක් ලෙස මේ තත්ත්වය හැඳින්විය හැකිය. අපේ තරුණ පරම්පරාව ඉහත පසුබිම හොඳින් වටහාගෙන ආරක්ෂා විය යුතුව තිබේ.

කොවිඩ් වසංගතයට අදාළ නව නීතියට අනුව හුදෙකලා කළ ප්‍රදේශවලින් පිටතට පැමිණීම තහනම්ය. පිටතින් හුදෙකලා කළ ප්‍රදේශවලට පැමිණීම ද තහනම්ය. මේ ප්‍රදේශ ආරක්ෂක අංශ යොදවා වට කර තබන්නට හැකියාවක් නැත. කළ හැක්කේ මුරපොළක් හෝ මුරපොළ දෙකක් හෝ පිහිටුවා පරීක්ෂා කිරීම පමණි. හුදෙකලා ප්‍රදේශයෙන් පැන යෑමට හොර පාරවල් ඕනෑම ප්‍රදේශයක තිබේ. මෙහිදී සිදුවිය යුත්තේ ජනතාව අවංක ලෙස කොවිඩ් මර්දනයට සහයෝගය දැක්වීමය. හුදෙකලා ප්‍රදේශයකින් පැන යෑම වීරකමක් සේ සලකන්නේ නම්; එම පුද්ගලයා තරම් අඥානයකු තවත් සිටිය නොහැකිය. මංගල සාද, නිවෙස්වල සාද, පමණක් නොව; ආගන්තුක සත්කාර පවා නැවැත්විය යුතු බව සෞඛ්‍ය අංශ පෙන්වා දී ඇත. අප ඊට අනුගත විය යුතුය.

කොවිඩ් වසංගතයට දේශපාලනයක් නැත. පන්ති භේදයක්, ජාති - ආගම් භේදයක් නැත. වසංගතය කඩා වදින්නේ සියල්ලන්ම ගොදුරු කර ගැනීමටය. එබැවින් සෑම පුරවැසියකුම තම වගකීම හා යුතුකම දෙස ආපසු හැරී බැලිය යුතුය.

### දිල්රුගෙ සිව්පද

| | |
|---|---|
| තැනකදී මුණ ගැසී ඉඳහිට දොඩන | විට |
| ඇඩ්වත ලිහනවද තවකෙකු ඉදිරි | පිට |
| දොඩමළු එපා මුව වැස්මත් ඉවත් | කොට |
| පවසන දේ ඇහෙනවනෙ නොදුටුවට | කට |

# හදවත් ගැස්ම වැඩි කළ ඔක්සිජන් අර්බුදය



ආචාර්ය සුරතිස්ස දිසානායක
පරිසර විද්‍යා හා සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

මේ දිනවල ලෝකයේම කාගේත් ප්‍රධානතම මාතෘකාවක් බවට පත්ව ඇත්තේ ඔක්සිජන්ය. ඊට හේතුව වන්නේ ගෝලීය ව්‍යසනයක් බවට පත්ව ඇති කොවිඩ් 19 වසංගතයේ නව ප්‍රභේදයන් ව්‍යාප්ත වෙමින් ශ්‍රී ලංකාව ද ඇතුළු ලෝකයේ බොහොමයක් රටවල් දැඩි ලෙස අසරණභාවයට පත්ව තිබීමය. උදාහරණයක් ලෙස අසල්වැසි ඉන්දියාවේ ජනතාව කොවිඩ් ආසාදනය වීම නිසා ශ්වසන අපහසුතා උත්සන්න වීමෙන් ඔක්සිජන් නොමැතිව මහ මග පවා මරණයට පත් වන අවස්ථා මේ දිනවල ඉතා සුලබය. ශ්‍රී ලංකාවට ද නුදුරේදීම මෙවැනිම ආකාරයේ ඔක්සිජන් හිඟතාවකට මුහුණ දීමට සිදු වනු ඇතැයි රෝහල් ආරංචි මාර්ග පවසයි. ඔක්සිජන් පරිසරයට එකතු වන්නේ කෙසේ ද? ඔක්සිජන් සෑදෙනුයේ කිනම් ආකාරයට ද යන්න ලොකු, පොඩි සැවොම දන්නා කරුණකි.

ගහ-කොළ, සතා-සීපාවා හා මිනිසා ඇතුළු සැමටම නැතිවම බැරි සාධකයක් ලෙස ඔක්සිජන් හැඳින්විය හැකිය. එහෙත් ඔක්සිජන් නොමැතිව ජීවත් විය හැකි ජීවීන් ද මෙම පෘථිවිය මත සිටී. ඔවුන් පෘථිවියේ ජීවය ආරම්භය වූ අදින් වසර මිලියන 3600කට පමණ පෙර සිටම පැවත එන්නන් වේ. නමුත් සමස්තයක් ලෙස ගත් කල සූන්‍යෂ්ටික හෙවත් සංවිධානය වූ න්‍යෂ්ටියක් සහිත ඒක සෛලික මෙන්ම බහු සෛලික ජීවීන්ගේ පැවැත්මට ඉතාමත්ම වැදගත් සාධකය වන්නේ ඔක්සිජන්ය. මෙම ජීවීන්ගේ දේහ ක්‍රියාවලිය පවත්වා ගැනීමට නැතහොත් පරිවෘත්තීය ප්‍රතික්‍රියා සිදු කර ගැනීමට අවශ්‍ය ශක්තිය ලබා ගැනීම සඳහා ද්‍රව්‍ය බිඳ හෙළීමට මෙන්ම ද්‍රව්‍ය ගොඩනැඟීමට සිදු වන අතර එම බොහෝමයක් ක්‍රියා සෛලය තුළ සිදු වේ. එම ක්‍රියාවලිය සෛලීය ශ්වසනය ලෙස ද හඳුන්වනු ලබයි.

මෙම සෛලීය ශ්වසනය සඳහා අවශ්‍ය ඔක්සිජන් ඒක සෛලික සූන්‍යෂ්ටික ජීවීන් සරල විසරණය මඟින් දේහ පෘෂ්ඨය ඔස්සේ ලබා ගනී. නමුත් සංකීර්ණ බහු සෛලික ජීවීන් හට එම සරල විසරණ ක්‍රියාවලිය පමණක් ප්‍රමාණවත් නොවන බැවින් සෛලිය ස්වසනය අත්‍යවශ්‍ය වනවා ඇත. එහිදී අවශ්‍ය ශක්තිය නිපදවා ගැනීමට ඔක්සිජන් දේහයේ සෑම සෛලයකටම ගමන් කළ යුතුව ඇත. එම ගමන් කිරීම සඳහා පරිවහන මාධ්‍යයක් ලෙස බොහෝමයක් බහු සෛලිකයන්හි රුධිරය පවතී. රුධිරය තුළින් මෙම ඔක්සිජන් රැගෙන යෑමට විවිධ වූ වර්ණකයන් හෙවත් ඔක්සිජන් රැගෙන යෑමට ඔක්සිජන් සමඟ බැඳීමේ හැකියාව ඇති රසායනික ද්‍රව්‍යයන් රුධිරයේ අන්තර්ගත වේ. උදාහරණ ලෙස හිමෝග්ලොබින්, මයෝග්ලොබින්, ක්ලෝරෝක්‍රූවොරින්, හීමොසයනීන්, හීමෝඑරිත්‍රින් යනාදිය දැක්විය හැකිය.

## මිනිසාගේ ශ්වසන වර්ණකය

මිනිසාගේ ශ්වසන වර්ණකය ලෙස වැදගත් වන්නේ හිමොග්ලොබින්ය. දේහයේ සෑම සෛලයකටම රුධිරය ඔස්සේ පෙණහළුවල සිට ඔක්සිජන් රැගෙන යෑම මෙමගින් සිදු කරයි. හිමොග්ලොබින් සමඟ ඔක්සිජන් බැඳී යෑමෙන් ඔක්සිහිමෝග්ලොබින් නම් අස්ථායි සංයෝගය තැනෙන අතර එය රුධිරය ඔස්සේ පරිවහනය වී සෛලයන් මතදී බිඳ හෙළී අනතුරුව ඔක්සිජන් හා හිමෝග්ලොබින් වෙන් වේ. නමුත් සමහර වායුන් වර්ග වන කාබන් මොනොක්සයිඩ් යනාදිය හිමෝග්ලොබින් සමඟ සම්බන්ධ වී ස්ථායි සංයෝගයක් වන කාබොක්සිහිමොග්ලොබින් තනනු ලබයි. එය සෛලයන් මතදී හිමෝග්ලොබින් ලෙස වෙන් නොවී පවතින නිසා සෛලීය ශ්වසනය සිදු කළ නොහැකිව එවැනි අවස්ථාවලදී මිනිසා විසඥතාවයට පත් වී ප්‍රතිකාර නොලදහොත් මිය යන තත්ත්වයට පත් වේ. ගිනි ගන්නා ස්ථානවලට දීර්ඝ කාලයක් මිනිසා නිරාවරණය වුව හොත් මෙම තත්ත්වයට මුහුණ දීමට සිදුවනු ඇත. අපගේ සෛලයන්වලට ලැබෙන ඔක්සිජන් ප්‍රමාණය නිසියාකාරව නොලැබුණ හොත් එම සෛලයන්හි නිර්වායු ශ්වසනය සිදු කරමින් ලැක්ටික් අම්ලය නිපදවීම සිදු කරනු ලබයි. එමගින් අපගේ පේශීන්ගේ ස්නායු හා සම්බන්ධ ස්ථාන සිර කරවීමෙන් ශරීරයේ මාංශ පේශීන්ගේ කෙණ්ඩ පෙරලීම වැනි ක්‍රියාවන් ඇති වේ. එය දීර්ඝකාලීනව පැවතුණ හොත් විසඥතාවය ඇති වී මිය යා හැකිය.



## ඔක්සිජන් නැතිව මිනිසකුට ජීවත්විය හැකි කාලය

ඔක්සිජන් රහිතව මිනිසකුගේ දේහ සෛලවලට ජීවත්විය හැකි කාලය සැලකුව හොත් මොළයේ සෛලවලට එය විනාඩි 4-6 අතර කාලයකි. එම කාලය තුළ මොළයේ සෛල මිය යනවා ඇත. එය ආරම්භ වී තත්පර 10 කදී එම පුද්ගලයාට දැනීම නැතිවී ඔහු මිය යා හැකිය. විනාඩි 10 කට පසු දැඩි ස්නායු ආබාධයක් ඇතිවීම එම තැනැත්තාට උරුමය. මෙම කාලයට ප්‍රථම එම තැනැත්තාට නැවත ඔක්සිජන් ලබා දුන හොත් ඔහුගේ දේහ ක්‍රියාකාරිත්වය ආරම්භ විය හැකිය. එබැවින් කිසියම් තැනැත්තකු ඔක්සිජන් හිඟකමෙන් අපහසුතාවට පත්ව ඇති විට ඔහුව ජීවත් කරවීමට නම් අනිවාර්යයෙන්ම විනාඩි 10 ක කාලසීමාවකදී ක්‍රියාත්මක වී ඔහුට ඔක්සිජන් කෘත්‍රිමව සපයා දිය යුතුය. එය CPR (Cardio pulmonary Resuscitation) ලෙස හඳුන්වයි. ඉතාමත්ම ඉක්මනින් මිය යන්නේ මිනිසාගේ මොළය වන අතර හෘදය පැය 4-6 අතර ද, අග්න්‍යාශය පැය 12-24 අතර ද, අක්මාව පැය 24 අතර ද, වකුගඩු පැය 48-72 අතර ද කාලයකදී මිය යනවා ඇත. එබැවින් කිසියම් තැනැත්තකුගේ මොළය මිය ගිය හොත් ඉහත කාලයන්ට ප්‍රථමයෙන් ඔහුගේ එම අවයව වෙනත් තැනැත්තෙකු වෙනුවෙන් බද්ධ කිරීම සඳහා ලබා දිය හැකිය.

## නියුමෝනියාව හා කොරෝනා

නියුමෝනියාව යනු ඉතාමත් දරුණු පෙණහලු රෝගයකි. එය ප්‍රධාන වශයෙන්ම බැක්ටීරියා වයිරසය හා දිලීර මගින් හටගන්නා අතර එමගින් පෙනහලුවල ඇති වාතකෝෂ හෙවත් 'ගර්ථ' වල තරලය පිරීම ඇති කරවයි. එවැනි තත්ත්වයකදී එම පුද්ගලයන් රෝහල්ගත කර ඔක්සිජන් ලබා දීම හෝ ඔවුන් සංවාතනය කිරීමට ලක් කළ යුතුය. කොරෝනා වයිරසය මගින් එය වැලඳුණු තැනැත්තන්ගේ පෙනහළු දෙකටම මෙය සිදු කරවනු ලබයි.

## කෘත්‍රිම ඔක්සිජන් නිපදවීම

විශේෂයෙන්ම ඔක්සිජන් අඩු තැනැත්තන්ට දීමට වාණිජ වශයෙන් නිපදවන ඔක්සිජන් රෝහල්වල පවතී. එම ඔක්සිජන් කිසියම් ඔක්සිජන් හිඟයකින් පෙළෙන රෝගීන් සඳහා සාමාන්‍ය ආකාරයට මුඛ ආවරණයක් (Face Mask) මගින් ලබා දිය හැකිය. නමුත් ඇතැම් කොරෝනා ආසාදිත රෝගීන්ට එවැනි ඔක්සිජන් ලබා දීම ප්‍රමාණවත් නොවන අතර ඔවුන් දැඩි සත්කාර ඒකක (ICU) තුළ සංවාතනය (Ventilate) කළ යුතුය. ඒ සඳහා විශේෂයෙන් සකස් කරන ලද ICU ඇඳන් අවශ්‍ය වන අතර අද වන විට මෙම කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ඉන්දියාව දැඩි ඔක්සිජන් හිඟයක සිර වී ඇත. එම නිසා මිනිසුන් දස දහස් ගණනින් දිනකට මිය යන බව පෙනෙන්නට තිබේ. වෙළෙඳපොළේ පවතින ඔක්සිජන් හිඟයක් ද එරට පවතී. එමෙන්ම එරට රෝහල්වල මෙම සායනික ඔක්සිජන් හිඟය දැඩිව බලපා ඇති නිසා මෙසේ අධික ලෙස කොරෝනා ආසාදනය වීමෙන් මිනිසුන් මිය යනු ලබයි.

වාණිජ ලෙස ඔක්සිජන් නිපදවීම ක්‍රම කිහිපයකින් සිදු කරනු ලබන අතර "ක්‍රයොණික් ආසවනය" හෝ "රික්තක අවශෝෂණ" ක්‍රියාවලිය මගින් හෝ ජලයේ විද්‍යුත් විච්ඡේදනය භාවිත වන ප්‍රධාන ක්‍රමයන් වේ.

මෙරට දෛනික ඔක්සිජන් නිෂ්පාදන හැකියාව ලීටර 67,000 ක් පමණ වන අතර දෛනික සායනික ඔක්සිජන් අවශ්‍යතාවය ලීටර 22,000 ක් පමණ වෙතැයි ගණන් බලා ඇත. නමුත් මෙම කොරෝනා වසංගතය නිසා වැඩි වන රෝගීන් හමුවේ මෙම දෛනික සායනික ඔක්සිජන් ප්‍රමාණය මෙන්ම ICU ඇඳන් ප්‍රමාණය ද ප්‍රමාණවත් නොවනු ඇත.


## ශ්‍රී ලංකාවේ කොරෝනා රෝගීන් සඳහා සායනික ඔක්සිජන් ප්‍රමාණවත් ද?

මෙරට දෛනික ඔක්සිජන් නිෂ්පාදන හැකියාව ලීටර් 67,000 ක් පමණ වන අතර දෛනික සායනික ඔක්සිජන් අවශ්‍යතාවය ලීටර් 22,000 ක් පමණ වෙතැයි ගණන් බලා ඇත. නමුත් මෙම කොරෝනා වසංගතය නිසා වැඩි වන රෝගීන් හමුවේ මෙම දෛනික සායනික ඔක්සිජන් ප්‍රමාණය මෙන්ම ICU ඇඳන් ප්‍රමාණය ද ප්‍රමාණවත් නොවනු ඇත.

එහෙත් මෙරට ඔක්සිජන් නිපදවන සමාගම් මගින් අවශ්‍යතාවය අනුව දෛනික ඔක්සිජන් සැපයුම තුන් ගුණයක් දක්වා වැඩි කළ හැකි බව ප්‍රකාශ කර ඇත. එසේ වුව හොත් අපට ඔක්සිජන්වල හිඟයක් ඇති නොවනු ඇත. නමුත් මෙම රෝගයේ ශීඝ්‍ර ව්‍යාප්තිය නිසාත් එම ප්‍රභේදය මගින් බොහෝමයක් රෝගීන් ක්ෂණයකින් නියුමෝනියා රෝගීන් බවට පත් වන නිසාත් ඉන්දියාව මෙන් ශ්‍රී ලංකාවට ද, සායනික ඔක්සිජන් ප්‍රමාණවත් නොවනු ඇත. එබැවින් "මුහුදට හත්ගව්වක් දුර තිබියදී අමුඩය ගැසිය යුතු නැතැයි" යන ප්‍රස්ථා පිරුළ අතහැර ඉහළ ඔක්සිජන් ඉල්ලුමක් පවතින මෙවැනි කාලපරිච්ඡේදයක් තුළ මෙරට විශ්වවිද්‍යාල පද්ධතිය ද ආධාර කරගෙන හැකි තරම් ඔක්සිජන් ගබඩා කර ගත හොත් එය අපට වාසිදායක වනු ඇත. එමගින් පහසුවෙන් ඕනෑම කෙනෙකුට අවශ්‍ය වූ විට මුවට ඔක්සිජන් දිය හැකි පරිදි නවතම ආකාරයකට එය පැකට් ලෙස හෝ ගබඩා කර ලබා දිය හැකි වේ නම් එය වසංගතයේ උච්ච අවස්ථාවේදී කළ යුතු කාර්යය වේ. එමෙන්ම නිසි සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් මෙම වසංගතයෙන් ගැලවීමට උත්සාහ දැරිය යුතු වේ.




**චතුමී පිටිපන**



# කොරෝනා අභියෝගතා මැද වෘත්තීය අධ්‍යාපනය



ලලිත් අභයගුණවර්ධන
හිටපු ජනාධිපති අධ්‍යක්ෂ ජනරාල් (විශේෂ ව්‍යාපෘති හා මෙහෙයුම් සහ හිටපු අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය)

පාසල් සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු දරුවන් යොමු වන්නේ වෘත්තීය අධ්‍යාපනය දෙසටය. වර්තමානයේ වෘත්තීය අධ්‍යාපනය සෑම දරුවකුටම වඩාත් පලදායී වන්නේ කොරෝනා වසංගතයත් සමග කාර්යාල මත පදනම් වුණු වෘත්තීන් අවලංගු වෙමින් පවතින හෙයිනි. ලෝකයේ සෑම රටකටම බලපා තිබෙන මෙම අර්බුදය හේතුවෙන් සමාගම් මූලික වුණු වෘත්තීන් මෙම බරපතළ අභියෝගයට මුහුණ දෙමින් සිටී.

කොරෝනා වසංගතය හේතුවෙන් රැකියා අහිමි වීම සහ නව රැකියා මාර්ගවලට යොමු වීමට ඇති ඉඩකඩ ද ඇහිරී යෑම හේතුවෙන් වෘත්තීය දැනුම උපයෝගි කර ගනිමින් ස්වයං රැකියා කෙරෙහි යොමු වීමේ වාසිය මෙහිදී දක්නට ලැබේ. එමෙන්ම රටේ නව ව්‍යවසායකයන් බිහි වේ.

මේ නිසා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි ගමන සඳහා නිපුණතාවයෙන් හෙබි ශ්‍රම බළකායක් ස්ථාපිත කිරීම ඉතා වැදගත් කාරණයකි. මෙලෙස නිපුණතාවයෙන් හෙබි ශ්‍රම බළකායක් බිහිකර ගැනීමට අප රටක්, සමාජයක් ලෙස කළ යුත්තේ කුමක්දැයි සලකා බැලීම වටී.

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ඉගෙනීමෙන් පසු උසස් අධ්‍යාපනයට හිමිකම් නොලබන හා උසස් පෙළ සමත් නමුත් විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට අවස්ථා නොලබන තරුණ තරුණියන් සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් සකස් විය යුතුය. අත්දැකීම් හා පළපුරුද්ද තුළින් ඉහත තරුණ තරුණියන් වෘත්තීය පුහුණුවට යොමු වන්නේ කරුණු 4ක් මුල්කරගෙනය. ඒවා නම්.

i.වෘත්තීය පුහුණුවෙන් පසු රැකියාවක් ලබා ගැනීමට.

ii.වෘත්තීය පුහුණු කුසලතා වර්ධනය (NVQ) කර ගනිමින් වෘත්තීය පුහුණු ඩිප්ලෝමා, උපාධි ලබා ගනිමින් කළමනාකාර තත්ත්වයේ රැකියාවලට යොමු වීමට,

iii.විදේශීය ශ්‍රම වෙළෙඳපොලේ රැකියා සඳහා පිළිගෙත් වෘත්තීය පුහුණු සහතිකයක් ලබා ගැනීමට සහ

iv. වෘත්තීය පුහුණුවෙන් පසු සුළු හෝ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අරඹා ස්වයං රැකියාවක් සඳහා පිවිසීමේ බලාපොරොත්තුවෙනි.

වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන දේශීය සහ විදේශීය ශ්‍රම වෙළෙඳපොළට සරිලන ලෙස, එනම් පුහුණු පාඨමාලාවල විෂය මාලාවන් ගුණාත්මකභාවයකින් හා ශ්‍රම වෙළෙඳපොලේ ඉල්ලුමට ගැලපෙන ලෙස සකස් විය යුතුය.

එමෙන්ම ශ්‍රම වෙළෙඳපොලේ ඉල්ලුම් කරන වෘත්තීන් 200කට වැඩි ප්‍රමාණයක් ඇති මුත් අද වන විට පාඨමාලා සකස් වී ඇත්තේ වෘත්තීන් 100කට පමණි. මේ ගැන ද මේ විෂය සම්බන්ධ බලධාරීන්ගේ අවධානය යොමු වී යම් යම් පියවර ගත යුතුව ඇත.

## වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්

කාර්මික හා වෘත්තීය පුහුණුවට තරුණ තරුණියන් යොමු කර ගැනීමට නම් වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියා ස්ථාපන නිලධාරීන්ගේ සහයෝගය ලබා ගෙන පාසල් පද්ධතියේ විවිධ අවස්ථාවලදී හැරයන දරුවන් හඳුනාගෙන, වෘත්තීය උපදේශන හා මාර්ගෝපදේශන වැඩසටහන් මඟින් දැනුවත් කිරීමට කටයුතු කිරීම සිදු කළ යුතුය.

විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට නොහැකි හා උසස් වෘත්තීය සහතිකයක් ලබා ගැනීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස් සඳහා කාර්මික අධ්‍යාපන උපාධි ලබාගැනීමට ඇති ඉඩකඩ වැඩි කළ යුතුය. එනම් ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) තුළ ඉහළ මට්ටමට (LEVEL 7) දක්වා ඇති අවස්ථා වැඩි කිරීම.

දැනට රත්මලාන පිහිටා ඇති වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පහසුකම් වැඩි දියුණු කර ඒ හා සමාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයන් කීපයක් ප්‍රධාන නගරවල ආරම්භ කිරීම සුදුසුය. උදාහරණයක් ලෙස පිලිපීනයේ මැනීලා නගරයේ ඇති තාක්ෂණ විශ්වවිද්‍යාලය වැනි ආයතන ආරම්භ කළ යුතු වේ.

ගුණාත්මකභාවය සහතික කළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දේශීය, රාජ්‍ය හා පෞද්ගලික කර්මාන්ත හා නිෂ්පාදන ආයතන තුළ විවිධ අංශවල ඇති ශිල්පීය පුරප්පාඩු හඳුනා ගෙන ඒ සඳහා වෘත්තීය පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

එමෙන්ම නව කර්මාන්ත හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් සඳහා වෘත්තීය පුහුණු නව පාඨමාලා පුහුණු ආයතනවල සැලසුම් කර සංවිධානය කිරීම, ආයෝජන මණ්ඩල කලාපවල ඉල්ලුම්වලට ගැළපෙන ලෙස නිපුණතාවන් පුහුණු කිරීමේ පුහුණු මධ්‍යස්ථාන එම කලාප ආසන්නයේ ස්ථාපිත කිරීම යෝග්‍ය වේ.

වෘත්තීය පුහුණුවට පැමිණෙන්නන් බලාපොරොත්තු වන්නේ නව තාක්ෂණයෙන් යුත් ආකර්ෂණීය පන්ති කාමරයන්ය. ඒ නිසා තරුණ පිරිස ආකර්ෂණය වන නවීන උපකරණ හා පහසුකම්වලින් යුත් ශ්‍රම වෙළෙඳපොළ අභිමුඛ පුහුණු වැඩසටහන්වලින් යුක්ත පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම ද වැදගත්ය.

පුහුණුවට පැමිණෙන අය සඳහා මූල්‍ය සහයෝගී ක්‍රමවේදයක් ඇති කිරීම (අවම වශයෙන් මධ්‍යස්ථානවලට පැමිණීම සඳහා පාපැදියක් වත් ලබා දීම), ශිල්පීය වෘත්තීන් සඳහා සමාජ ප්‍රතිමූර්තියක් ඇති කිරීම සහ ශිල්පීන් සඳහා අඩු වැටුප් හා වේතන ගෙවීම නිසා කාර්මික හා වෘත්තිය පුහුණුවට තරුණයන්ගේ ආකර්ෂණ ඍණාත්මක වේ. එම දෝෂය මගහරවමින් ඒ සඳහා පිළිගත් වැටුප් හා වේතන ගෙවීමට පියවර ගැනීම අද දවසේ කළ යුතුම කටයුත්තකි.

## ආයතනික පුහුණුව

ශ්‍රම වෙළෙඳපොලේ සියලුම වෘත්තීන් සඳහා ආයතනික පුහුණුව දීම වැදගත් වේ. වෘත්තීය පුහුණුවන්නන්ගේ සේවාස්ථ පුහුණුවේදී (OJT) පුහුණු දීමනාවක් ගෙවීම, වෘත්තීය පුහුණු ආයතනවල පෙනුම සහ පහසුකම් ප්‍රශංසනීය ලෙස සකස් වීමෙන් තරුණ පිරිස් පුහුණු ක්ෂේත්‍රයට නැඹුරු වීමට, ආකර්ෂණය ඇති කිරීමට බලපායි. අඩු තරමින් එක් පළාතකට අංග සම්පූර්ණ නේවාසිකාගාරවලින් සමන්විත පුහුණු ආයතනයක් බිහි කළ යුතුය.

එම ආයතනවල වෘත්තීය අධ්‍යාපන පුහුණුවට අමතරව, ශාරීරික අධ්‍යාපන පුහුණුව, සංස්කෘතික වැඩසටහන්, ව්‍යවසායකත්ව වැඩසටහන්, හරිත සංකල්පයන්, සන්නිවේදන නිපුණතාවයන්, තොරතුරු තාක්ෂණය වැනි විෂයන් ඇතුළත් ක්‍රියාකාරකම් ඉහළ නැංවිය යුතුය. චීනයේ ෂුවැංගේ හි ඇති කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු විද්‍යාලය මේ සඳහා පෙන්වා දිය හැකිය.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක විය යුත්තේ සමාජ ඉල්ලුම පදනම් කර ගෙන නොව, දේශීය හා විදේශීය කර්මාන්තවල ඉල්ලුම පදනම් කර ගෙනය.

ශ්‍රම ඉල්ලුම ඇති ක්ෂේත්‍රයන් කිහිපයකි. ඒවා නම්,

i සංචාරක කර්මාන්තය
ii කෘෂිකර්ම ක්ෂේත්‍රය (වැවිලි ක්ෂේත්‍රය)
iii ඉදිකිරීම් ක්ෂේත්‍රය
iv ධීවර ක්ෂේත්‍රය
v විදේශීය ශ්‍රම වෙළඳපොලේ රැකියා අවස්ථා වේ.

ඉහත අංශ පහේ ශ්‍රම වෙළෙඳපොළ හඳුනාගෙන, එයට ගැළපෙන ලෙස විෂය මාලාව සකස් කර න්‍යායික, ප්‍රායෝගික හා ආයතන පුහුණුව (OJT) ඇතුළත් කර පාඨමාලා සකස් කළ යුතුය.

ඉහත i, ii, iii ක්ෂේත්‍ර තුනේ පුහුණුව ලබන තරුණ පිරිස්වලට, හොඳ පිළිගැනීමක්, රැකියාව පිළිබඳ අභිමානයක්, වටිනාකමින් යුත් පිළිගත් පුහුණුවීම් ක්‍රමවේදයක්, අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම, ජාතික වෘත්තීය සහතිකයක් (Li - L7) ලබා දිය යුතුය.

එමඟින් තරුණ පිරිසගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර ගත හැකිය. ඒ අනුව වැඩි තරුණ පිරිසකට ශ්‍රම වෙළෙඳපොළ තුළ රැකියා අවස්ථා විවෘත කර ගත හැකි වේ.

> “ වෘත්තීය පුහුණුවෙන් පසු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා යොමුවන්නන් හට ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවක් ලබා දීම, මූල්‍ය ආයතන සම්බන්ධ කිරීම (ක්ෂුද්‍ර මූල්‍ය ණය) කළ යුතුය. ඉන් නොනැවතී ඔවුන්ට තම නිෂ්පාදන අලෙවිය සඳහා ඇගයීම් ලබා දීම සිදු කිරීම ඉතා වැදගත් වේ.

විදේශ ශ්‍රම වෙළෙඳපොලේ වෘත්තින්හි ශ්‍රම ඉල්ලුම හඳුනා ගැනීම වැදගත් වේ. එහිදී අප පළමුව තානාපති කාර්යාලවල සහාය ලබා ගැනීම, විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සමග සම්බන්ධ වීම, විදේශ රැකියා ආයතනවලින් උපදෙස් ගැනීම කළ යුතුය. ඊට අමතරව විදේශීය පුහුණු ආයතන සමග සම්බන්ධතාවය, විදේශීය රටවල ඇති රාජ්‍ය සංවිධාන සමග සම්බන්ධ වීම තුළින් ශ්‍රම වෙළෙඳපොළ හඳුනා ගත හැකිය.

ඉන්පසු විදේශ ශ්‍රම වෙළෙඳපොළට ගැළපෙන ලෙස අප කටයුතු සංවිධානය කළ යුතුය. මෙහිදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

- පුහුණු වැඩසටහන් සැලසුම් කර සංවිධානය කිරීම.
- විෂය මාලාවන් නවීකරණය කිරීම.
- විදේශ රටවල සිටින විශේෂ පුහුණුව ලත් අයගේ දැනුම ලබා ගැනීම

මේ සඳහා උදාහරණයක් ලෙස ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය දැක්විය හැකිය. අද මෙහි පුහුණුව සාර්ථකව අවසන් කරන ශිල්පීන්ට ඕස්ට්‍රේලියාව, කැනඩාව, මැද පෙරදිග, සහ ජර්මනිය යන රටවල රැකියා අවස්ථාව ලැබේ.

- හඳුනා ගත් රටවල භාෂාව ගැන පුහුණුවක් ද මෙම පුහුණුලාභීන්ට දිය යුතුය.
- වෘත්තීය පුහුණුවෙන් පසු දෙන සහතිකය එම රටවල් පිළිගන්නා සහතිකයක් විය යුතුය. එවිට පුහුණුලාභීන්ට ඉතා පහසුවෙන් එම රටවල ශ්‍රම වෙළෙඳපොළට ඇතුළු විය හැකිය.
- අද වන විට ඕස්ට්‍රියාව, ජපානය, කොරියාව, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, මැදපෙරදිග රටවල වෘත්තීය පුහුණු ශිල්පීන් සඳහා රැකියා අවස්ථා බහුලව ඇත. එම රටවල ප්‍රධාන ආයතන හා අපගේ තානාපති කාර්යාල හරහා සම්බන්ධතාවය ගොඩනගා ගෙන අප වෘත්තීය පුහුණු ආයතනයන් සමග එම ආයතන ඒකාබද්ධ කර ගැනීමට කටයුතු කිරීම.

## ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව

වෘත්තීය පුහුණුවෙන් පසු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා යොමුවන්නන් හට ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවක් ලබා දීම, මූල්‍ය ආයතන සම්බන්ධ කිරීම (ක්ෂුද්‍ර මූල්‍ය ණය) කළ යුතුය. ඉන් නොනැවතී ඔවුන්ට තම නිෂ්පාදන අලෙවිය සඳහා ඇගයීම් ලබා දීම සිදු කිරීම ඉතා වැදගත් වේ. ඔවුන්ගේ නිර්මාණ සඳහා ප්‍රදර්ශන පළාත් මට්ටමෙන් පැවැත්වීම, ඔවුන්ට අවශ්‍ය පුහුණු ශිල්පීන් වෘත්තීය පුහුණු ආයතනවලින් යොමු කිරීම, මූල්‍ය අවස්ථාවන් හා නීතිමය ගැටලු අවස්ථාවලදී උදව් කිරීම සහ පසුවිපරම් කටයුතු කිරීම කළ යුතුම දෙයකි.

සේවයේ නිරත වන්නන්ගේ වෘත්තීය පුහුණුව ද ඉහළ නැංවීම සඳහා අප කටයුතු කළ යුතුය.

දැනට රැකියාවල නිරතවන්නන්ගෙන් සමහර අය සඳහා දුරස්ථ, ජංගම, හෝ මාර්ගගත (ON Line) මගින් පුහුණුව ලබාදීමේ ක්‍රමවේද සකස් කිරීම, කාර්යාල වේලාවෙන් පසු වෘත්තීය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, සති අන්තපාඨමාලා ආරම්භ කිරීම, කෙටි කාලීන පාඨමාලා ආරම්භ කිරීම වැනි දේ ඒ යටතේ කළ හැකිය.

දැනට ව්‍යාපාර ක්ෂේත්‍රයේ යෙදී සිටින අයට ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ජාතික වෘත්තිය සහතිකයක් දීම ද සිදු කළ යුතුය. මෙමගින් කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රයේ නියැළී සිටින්නන්ගේ ශිල්ප දැනුම හා කුසලතාවය වර්ධනය වන අතර, ඔවුන්ගෙන් ලැබෙන පාඨමාලා ගාස්තු වශයෙන් අය කර ගන්නා මුදල් ආයතනයේ නඩත්තු හා අමතර වේතන ගෙවීමට යොදා ගත හැකිය.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු උපදේශයන් සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව සඳහා ගුණාත්මක ගුරු පිරිසක් නොමැතිවීම ගැටලුවකි. මේ සඳහා රාජ්‍ය සහ පුද්ගලික අංශවල සහභාගිත්ව (PPP) සහ අන්තර්ජාතික සම්බන්ධතාවයක් ගොඩනගමින් කාර්ය මණ්ඩලයේ ධාරිතාවය සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

ආදේශක උපදේශකවරුන් හෝ පුහුණුකරුවන් ලෙස පෙර වර්ෂවලදී කුසලතා කාර්ය සාධනයන්වල ඉහළ ප්‍රගතියක් ලබා ගත් සිසුන්ගේ සේවාව ආයතන වෙත ලබා ගැනීමට ක්‍රම වේදයක් සකස් කිරීම, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතනවල සේවකයින් සඳහා අනිකුත් සේවාවන්වලට ගැලපෙන ලෙස උසස් වැටුප් ලබා දීමට කටයුතු කිරීම වැදගත්ය.

ජයසිරි මුණසිංහ




## වගකීමට මුල් තැන දී රට බේරා ගනිමු

රට මේ මොහොතේ ඇත්තේ අභියෝගාත්මක අවස්ථාවකය. කොවිඩ් හැර වෙනත් මාතෘකාවක් මතකයට නොනැගේ. නැවත නැවතත්, යළි යළිත්, පුනා පුනා අවධාරණයෙන් සිහි කැඳවිය යුතු සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද පිළිබඳව මාධ්‍ය මගින් ජනතාව දැනුම්වත් කරමින් සිටින මොහොතක ඒ සියල්ල සිහියට ගෙන වගකීමෙන් යුතුව කටයුතු කිරීම ජනතාව මත පැවරී ඇත.

සෞඛ්‍ය අංශ පවසන්නේ තවමත් කොවිඩ් තුන්වැනි රැල්ල ද පාලනය කිරීමේ මට්ටමක් රට තුළ පවතින මුත් ඉදිරි තෙසතිය ඉතා තීරණාත්මක බවයි. එක් අයකුගෙන් අවම වශයෙන් ආශ්‍රිතයින් පස් දෙනකුටවත් රෝගය පැතිර යෑමේ සම්භාවිතාව ඇති නිසා රෝගීන් දහස ඉක්මවා වාර්තා වන මේ මොහොතේ රෝගීන් පොකුරු පිටින් රෝහල්ගත වීමේ අවදානමක් උදා වීමට බැරිකමක් නැත. ඉන්දියාව අද එතැනට වැටී ඇත.

කෙසේ වෙතත් මේ මොහොතේ සෞඛ්‍ය අංශ අවධාරණය කරන්නේ හැකි තරම් දුරට සංචරණය සීමා කරන ලෙසයි. නමුත් මේ ගැන තවමත් තැකීමක් නොකරන පිරිස් ඕනෑ තරම් සිටිති. රැකියා ආයතනවල ද සිටිති. සියලු දෙනාගේ ආරක්ෂාව වෙනුවෙන් මේ වන විට රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනවල ද සේවකයින් ගෙන්වීම සියයට පනහ හෝ හැත්තෑපහ දක්වා සීමා කර ඇත. එය රටේ ආරක්ෂාව වෙනුවෙන් රජය ගත් ක්‍රියාමාර්ගයක් මිස ප්‍රශ්නයෙන් පැන යෑමට හෝ සේවකයින්ට දුන් වරප්‍රසාදයක් නොවේ. මේ නිදහසින් අයුතු ප්‍රයෝජන ගන්නා ඇතැම් අය තමන්ගේ නිවාඩු දිනය නගරයට, කඩ මණ්ඩියට හෝ එසේ නැත්නම් කාලය ගෙවා දැමීමට කොහේ හෝ යෑමට කටයුතු කරති. තවත් පිරිසක් නිවෙසේ සිටිනු නොහැකිව දෝ තම නිවාඩු දිනයේදිත් රැකියා ආයතනයට පැමිණ රාජකාරිය කෙසේ වෙතත් කල් මැරීමට කටයුතු කරති. මෙය තමන් මෙන්ම අනුනුත් අනතුරේ හෙළීම මිස රාජ්‍ය සේවකයෙක් ලෙස තම අවංක කැපවීම පෙන්වන ලක්ෂණයක් නොවේ.

නිවෙස්වල සිටින පිරිස්වලට සෞඛ්‍ය බලධාරීන් විසින් දී ඇති උපදෙස වන්නේ අසල්වැසි නිවෙසකටවත් ගොඩ නොවදින ලෙසයි. අත්‍යවශ්‍යම හේතුවකට හැර ගමේ වෙළෙඳසලටවත් නොයන ලෙසයි. කොවිඩ් පළමු අවස්ථාවේදී විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට නගරයේ ජනතාවට සාපේක්ෂව යම් තරමක නිදහසක් භුක්ති විඳීමට අවකාශය ලැබුණ ද ඉන් ප්‍රයෝජන නොගෙන නිවෙස්වලටම වී නිවෙසේ ගෙවත්තේ වැව් තාවුල්ලෙන් සොයා ගත හැකි යමක් පිළියෙල කර කුසගිනි නිවා ගැනීමට උත්සාහ දැරුවා විනා බඩු මුට්ටු ගොඩ ගසා ගැනීමට නගරයට දිව ආ බවක් දක්නට ලැබුණේ නැත. කැලේ කොළේ උයා පිහාගෙන හෝ ජීවිතය බේරා ගැනීමේ වුවමනාව සහ තැනට ඔබින නුවණ ඔවුහු රටට ආදර්ශවත්ව පෙන්වූහ. මේ මොහොතේ ද රට පවතින්නේ එවන් කැපකිරීමක් කළ යුතු අවස්ථාවකය. නමුත් ඇතැම් පිරිස් තවමත් වගකීම් විරහිතව කටයුතු කරනු දක්නට ලැබෙයි.

එමෙන්ම තමන්ගේ සෞඛ්‍යාරක්ෂාව තමන්ම සපයා ගනිමින් කොවිඩ් ආසාදිතයකු නොවී සුරක්ෂිතව සිටින පිරිස් ද ඕනෑ තරමය. මෙය දෙස් විදෙස් ජනතාවගෙන් අපට උගත හැකි පාඩමකි. වසංගතයක් යනු ඇස් පනා පිට මුහුණට මුහුණලා එන සතුරකු නොවේ. මේ නිසා හැම අතින්ම අපි සන්නද්ධ විය යුතුය. ශරීරයේ ප්‍රතිශක්තිකරණය වර්ධනය කර ගැනීමට හැකි සෑම විටම උත්සාහ දැරිය යුතුයි. විශේෂයෙන් ශක්තිජනක ආහාර මෙන්ම රෝගවලින් වළක්වාලන විටමින් සහිත ආහාර ඉතා වැදගත්ය. ගමේ තිබෙන කොස්, පොළොස් ශරීරයේ ප්‍රතිශක්තිකරණය වඩවයි. පලතුරුවලින් විටමින් ලැබෙයි. එමෙන්ම මුළුතැන්ගෙයි කුළුබඩුවලින් බෝවන රෝගවලින් ශරීරය ආරක්ෂා කර දෙයි. නගරයේ සුපිරි වෙළෙඳසල්වල හෝ තිරිඟු පිටි ආහාරවලින් ශරීරය වඩවා ගන්නා ඇත්තන්ට රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව අඩුය. විශේෂයෙන් දරුවන්ට මේ සෞඛ්‍යාරක්ෂිත ආහාර මේ අවස්ථාවේ වැඩි වැඩියෙන් ලබා දීමේ වගකීම මවුපියන් සතුය.

මේ දිනවල සමාජ මාධ්‍යවලින් ද කොරෝනා වයිරසය මැඩලිය හැකි බෙහෙත් වට්ටෝරු ගැන පුවත් සංසරණය වෙමින් පවතී. මේවා කොරෝනා වයිරසයට දක්වන ප්‍රතිචාරය කෙසේ වෙතත් ශරීර ප්‍රතිශක්තිය සහ රෝගවලින් ආරක්ෂා කිරීමේ ගුණය සහිත ඖෂධ ඇතුළත් වීම නිසා අතුරු ආබාධ ඇති විය හැකි යැයි සිතිය නොහැකියි. ඉඟුරු, සුදු ලූනු , කොත්තමල්ලි, ආදිය ශරීරයට කිසිසේත්ම අගුණයක් නැත. එමෙන්ම දරුවන් ප්‍රසූත කළ මව්වරුන්ට දෙන තැම්බුම් හොද්ද ගැන ද සඳහන් විය. මුරුංගා පොතු, ගොරකා හෝ සියඹලා, රතු ලූනු ,ගම්මිරිස් ආදියෙන් සකසා ගන්නා තැම්බුම් හොද්ද ඉතා ගුණදායකය. කිසිදු වැදගත්කමක් නොමැති පුවත් අනුන්ගේ ඔපාදුප මාධ්‍යවලට මුදා හරිනවාට වඩා මෙවැනි පුවත්වලින් කවුරු කවුරුත් දැනුම්වත් වීම බොහොම අගනේය.

අපි සැම කෙනෙකුටම තනි තනිව පැවරී ඇති සමාජ වගකීමක් ඇත. අසල්වැසි ඉන්දියාවට වඩා ඉදිරියෙන් සිටින සංස්කෘතියෙන්, ඇවතුම් පැවතුම්වලින්, අධ්‍යාපනයෙන්, බුද්ධි මට්ටමින් හා සාමාන්‍ය දැනීමෙන් යුත් ජාතියක් වන අපිට කොරෝනා තුන්වැනි රැල්ල ද ජයගැනීමේ ශක්තිය ඇත. අපි ඒ වගකීමට මුල් තැන දී රට බේරා ගැනීමේ සටනේ කොටස්කරුවන් වී ජාතික යුතුකම ඉටු කළ යුතු මොහොතේ ඊට මුල් තැන දෙමු.

සකුන්තලා ජයසිංහ

# කොරෝනා අවදානම් අදියර 3 යටතේ ක්‍රියා කරන්න

## සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 ආසාදිතයන් වාර්තා වීම ඉහළ යෑමත් සමඟ කොරෝනා අවදානම් අදියර 3 යටතේ අවසර දී ඇති කාර්ය වහාම ක්‍රියාත්මක වන පරිදි කොවිඩ් මර්දන සෞඛ්‍ය මාර්ගෝපදේශ සංශෝධනය කර ඇති බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා පැවසුවේය.

සංශෝධනය කළ මාර්ගෝපදේශ නැවත දැනුම් දෙන තෙක් බලපැවැත්වෙන බව ද ඒ මහතා ප්‍රකාශ කළේය.

වයිරසයට සාර්ථකව මුහුණ දීම සඳහා පිළිපැදිය යුතු වැදගත් පූර්වාරක්ෂක විධි ක්‍රම ගණනාවක් සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කර ඇති අතර DReAM ලෙස එම පූර්වාරක්ෂක විධි ක්‍රම හඳුන්වාදී තිබේ.

DReAM යන්නෙන් අදහස් වනුයේ D - පුද්ගල දුරස්ථභාවය, සමූහ ලෙස රැස් නොවී සිටීම, නිවසටම වී සිටීම, (Physical Distancing, no gathering, mainly stay at home), Re - ස්වසන චර්යා විධි (Respiratory etiquette), A - විෂබීජහරණ පිළිවෙත් (දැත් සේදීම, විෂබීජනාශක දියර යෙදීම) (Aseptic practices), M - නිසි අන්දමට මුව ආවරණ පැළඳීම (Proper use of Mask) යන්න ය.

මෙම ක්‍රමවේදය නිසි ලෙස අනුගමනය කිරීමෙන් කොවිඩ් වයිරසයෙන් ජනතාවට ආරක්ෂා විය හැකි බව සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි.

# ශ්‍රේෂ්ඨාධිකරණ-අභියාචනාධිකරණ නඩු මේ සතියේ විවෘත අධිකරණයේ නොකැඳවයි

**නෙල්කා මැදගෙදර**

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ මෙම සතිය තුළ විභාග කිරීමට නියමිතව තිබූ නඩු පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විවෘත අධිකරණ ශාලාවන්හී නොකැඳවීමට තීරණය කර තිබේ.

ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ ඊයේ( 03) සිට ලබන 07 තෙක් කැඳවීමට දින නියමවී තිබූ නඩු යළි කැඳවන දින පසුව දැනුම් දෙන බව ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛකාධිකාරී ප්‍රදීප් මහමුතුගල මහතා නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

ඉදිරි සති දිනවල කැඳවීමට නියමිත නඩු පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ලැයිස්තුවේ දින අනුව යළි කැඳවීමට නියමිත බව ද එම ලැයිස්තුව ශ්‍රේෂ්ඨාධිකරණ නිල වෙබ් අඩවියේ සඳහන් වන බව ද ලේඛකාධිකාරීවරයා වැඩිදුරටත් කියා සිටී.

ඒසේම නීතිඥවරයෙකුට අවශ්‍ය නම් හැර යම් කිසි සේවාදායකයෙකුට අධිකරණ පරිශ්‍රයට ඇතුළු විය නොහැකි බවත් , සේවා අවශ්‍යතා සඳහා අධිකරණ පරිශ්‍රයට ඇතුළු වන සෑම අයෙකුම කොවිඩ් පිළිබඳ රජයේ සෞඛ්‍ය මාර්ගෝපදේශන මාලාව අනුව කටයුතු කළ යුතු බවද ප්‍රදීප් මහමුතුගලගේ මහතා පවසයි.

මේ සතියේ තුළදී අලුත් ඉදිරිපත් කෙරෙන නව නඩු ලිපි ගොනු ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛකාධිකාරී කාර්යාලයේ ලියාපදිංචි කිරීම් පෙරවරු 9.30 සිට පස්වරු 1.30 දක්වා පමණක් සිදු කෙරෙන බවද හෙතෙම වැඩිදුරටත් කීය.

අභියාචනාධිකරණයේ නඩු ලබන 07 වැනිදා තෙක් විවෘත අධිකරණ ශාලාවන් හී නොකැඳවෙන බවත් එම නඩු යළි කැඳවෙන දින නීතිඥවරුන් මාර්ගයෙන් සියපු පාර්ශවකරුවන් වෙත දැනුම් දෙන බව අභියාචනාධිකරණ ලේඛකාධිකාරීවරයා නිවේදනය කර සිටී.

# තවත් ප්‍රදේශ කිහිපයක් හුදෙකලා කෙරේ

**නුවන් කොඩිකාර**

කොරෝනා වයිරසයේ ව්‍යාප්තියත් සමඟ තවත් ප්‍රදේශ කිහිපයක් හුදෙකලා කිරීමට පියවර ගත් බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

ඒ අනුව නුවර එළිය දිස්ත්‍රික්කයේ හගුරන්කෙත පොලිස් බලප්‍රදේශයට අයත් රත්මැටිය ග්‍රාම නිලධාරි වසම, කළුතර දිස්ත්‍රික්කයේ පාණදුර දකුණ පොලිස් බලප්‍රදේශයේ පින්වත්ත, නාරම්පිටිය, පිංවත්ත බටහිර යන ග්‍රාම නිලධාරි වසම් සහ බණ්ඩාරගම පොලිස් බලප්‍රදේශයේ බණ්ඩාරගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම මේ මොහොතේ සිට හුදෙකලා කළ බව ශවේන්ද්‍ර සිල්වා මහතා සඳහන් කළේය. කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක පොලිස් බලප්‍රදේශයේ උග්ගල්ල ග්‍රාම නිලධාරි වසම සහ මඩකලපුව, මන්මුනෙයි උතුර පොලිස් බලප්‍රදේශයේ තිස්සවීරසිංගම් චතුරශ්‍රය ග්‍රාම නිලධාරී වසම, වත්තල පොලිස් බලප්‍රදේශයේ අල්විස් වත්ත ප්‍රදේශය ග්‍රාම නිලධාරි වසම ද හුදෙකලා කළ බව යුද හමුදාපතිවරයා කියා සිටියේය.

# අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් දෙනවා

## විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස

**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක**

කිසිම ආණ්ඩුවකට විසඳුමක් දීමට නොහැකි වූ ජනතාව පීඩාවට පත්කරනු ලබන අලි මිනිස් ගැටුමට සමඟි ජනබළවේග රජයක් යටතේ ස්ථිරසාර තිරසර විසඳුමක් දෙන බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා සඳහන් කළේය.

නොච්චියාගම හොරුවිල ශ්‍රී තපෝධනාරාම විහාරස්ථානයේ දී පසුගියදා ජනතාව සමඟ පැවති පිළිසඳරකින් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් මේ බව සඳහන් කළ විපක්ෂ නායකවරයා එහිදී තවදුරටත් මෙසේ ද පැවසීය. අලි මිනිස් ගැටුම් නිසා නිවාස හානි, වගා හානි, දේපළ හානි වගේම ජීවිත හානි සිදුව තිබෙනවා. ඒ වගේම වන අලින්ටත් හානිකර තත්ත්වයක් නිර්මාණය වී තිබෙනවා. අලි මිනිස් ගැටුමට සමඟි ජනබලවේග රජයක් යටතේ ස්ථිරසාර තිරසර විසඳුමක් දෙනවා.

# සංවර්ධනය නවතා දමා, මහජන ජීවිත රකින්න

## එජාප සභාපති වජිර අබේවර්ධන

**ශිරෝමි අබයසිංහ**

කොරෝනා වසංගත තත්ත්වය උත්සන්න වෙමින් පවතින මේ මොහොතේ රටේ සියලු සංවර්ධන ක්‍රියාදාමයන් අත්හිටුවා, සියලු සම්පත් මහජන ජීවිත ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් යොදවන ලෙස රජයෙන් ඉල්ලා සිටින බව එක්සත් ජාතික පක්ෂයේ සභාපති සහ හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන මහතා මාධ්‍ය වෙත විශේෂ ප්‍රකාශක් කරමින් ඊයේ (03) පැවසීය.

කොරෝනා ව්‍යාප්තිය වළක්වා ගැනීම සඳහා රජය නිසි වේලාවට නිවැරදි තීන්දු තීරණ නොගැනීම නිසා මේ වනවිට රටේ සමස්ත ජනතාව දැඩි අවදානමකට මුහුණ පා සිටින බවත් මෙම තත්ත්වය හමුවේ තවදුරටත් බලා නොසිට වැඩි මිලට හෝ එන්නත් මෙරටට ගෙන්වා ජන ජීවිත ආරක්ෂාකර ගැනීමට රජය පියවර ගත යුතු බව හෙතෙම අවධාරණය කළේය.

රට සතියකට හෝ දෙකකට ලොක්ඩවුන් කර ජන ජීවිත ආරක්ෂාකර ගැනීම සඳහා පියවර ගන්නා ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයන් දිගින් දිගටම ඉල්ලීම් කළත් රජය ඒ පිළිබඳ අවධානය යොමු නොකිරීම නිසා දිනෙන් දින රට අවාසනාවන්ත තත්ත්වයකට තල්ලු වෙමින් පවතින බව ඒ මහතා පෙන්වා දුන්නේය.

# නිවෙසේ කොරෝනා ආසාදිතයන් සිටී නම් 1906ට කියන්න

**නුවන් කොඩිකාර**

තම නිවසේ කොරෝනා වයිරසය ආසාදිත වූ තැනැත්තන් සිටී නම් 1906 අමතා දැනුම් දෙන්නැයි කොවිඩ් -19 පැතිරීමේ ජාතික ක්‍රියාන්තවිත මධ්‍යස්ථානයේ ප්‍රධානී, යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි. රෝහල්වලට යා නොහැකිව නිවෙස්වල සිටින රෝගීන් සම්බන්ධයෙන් මෙම පියවර ගත් බව ද යුද හමුදාපතිවරයා කියා සිටියේය.

01 වැනි පිටුවෙන්...

## අනවසර සංක්‍රමිකයන්...

ඉන්දියාවේ සිට මුහුදු මාර්ග ඔස්සේ මෙරටට පැමිණෙන පුද්ගලයන්ගෙන් මුදල් ගෙන ඔවුන්ට රැකවරණය සැලසීම හා ඔවුන් මෙරටට බෝට්ටු මඟින් ගෙන ඒමට උතුරේ ධීවරයන් කටයුතු කරන බව ආරක්ෂක අංශ අනාවරණය කර ගෙන තිබේ.

රුපියල් විසදහසේ සිට ලක්ෂය දක්වා මුදලක් මෙම සංක්‍රමණිකයන්ගෙන් ධීවරයන් විසින් අය කරනු ලබන බව පැවැසේ.

මන්නාරම සිට යාපනය දක්වා මුහුදු කලාපය ඔස්සේ ඉන්දීය ජාතිකයන් මෙරටට ඇතුළු වීම සිදු කෙරෙන අතර ඉන්දියාවේ දරුණු ලෙස පැතිරයන කොරෝනා තත්ත්වය හමුවේ ඔවුන් මෙලෙස පැමිණීම අනතුරුදායක බව ආරක්ෂක අංශ සඳහන් කරයි.

මෙලෙස පැමිණි පවුලක සාමාජිකයන් සිව්දෙනකු නාවික හමුදාව විසින් පසුගිය දා සොයා ගැනුණු අතර මේ තත්ත්වය පාලනය කිරීම සඳහා යාපනය සහ මන්නාරම මුහුදු ප්‍රදේශ ඇතුළු උතුරු මුහුදු කලාපය ආවරණය වන පරිදි දැවැන්ත ආරක්ෂක වැඩපිළිවෙළක් මේ වන විට ආරම්භ කර ඇතැයි නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා පැවැසීය.

## එල්ටීටීඊය ප්‍රවර්ධනය ...

නවදීන් පිල්ලේ මෝහන් හෙවත් තියටර් මොහන් නමැති 50 හැවිරිදි සැකකරු එල්.ටී.ටී.ඊ සංවිධානයේ හිටපු සාමාජිකයකු බව පොලිස් පරීක්ෂණවලින් අනාවරණය වී තිබේ.

සැකකරුට එරෙහිව පොලිස් ස්ථාන කිහිපයක විවිධ වැරදි සම්බන්ධයෙන් නඩු 14ක් ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නිතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

සැකකරු ළඟ තිබූ ජංගම දුරකතනය සහ අයි පෑඩ් වර්ගයේ පරිගණකයක් එරාවූර් පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. පරිගණක තොරතුරු පිළිබඳ විශේෂඥ දැනුම ඇති පොලිස් කණ්ඩායමක් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා එරාවූර් ප්‍රදේශයට ගොස් තිබේ.

එරාවූර් චෙන්කලඩි ප්‍රදේශයේ පදංචි මේ සැකකරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන යටතේ රඳවා ප්‍රශ්න කරන බව පොලීසිය පවසයි.

## හුදෙකලා පෙදෙස්වලින්...

රටේ දැනට පවතින කොරෝනා වසංගතය පාලනය කිරීම සඳහා රටේ බහුතර ජනතාව සහාය දෙන බවත් සෞඛ්‍ය නීති කඩකරමින් සුළු පිරිසක් ක්‍රියාකරමින් සිටින බවත් හෙතෙම කීවේය.

හුදෙකලා කර ඇති ප්‍රදේශවල හදිසි රෝගී තත්ත්වකට පත් වන පුද්ගලයකු ළඟම ඇති රෝහලකට ගෙන යාම සඳහා අවසර ලබා දී ඇති බවත් වෙනත් කිසිඳු පුද්ගලයකුට එම ප්‍රදේශයෙන් පිටවීම සඳහා පොලීසියේ අවසරය නොලැබෙන බවත් හෙතෙම ප්‍රකාශ කළේය.

කොරෝනා තත්ත්වය පාලනය කිරීම සඳහා ජනතාවට සහාය ලබා දෙන ලෙසත් ජනතා සහාය මත මෙය පැතිරීම පාලනය කළ හැකි බවත් ඒ මහතා පැවැසීය.


# සාතිශය සංවේගය



## ටී.එම්. හෙට්ටිහේවා මිය

(ආයතනික ණය අයකරගැනීම් අංශය - ප්‍රධාන කාර්යාලය)

නො. 15, මැදවේල්ල පාර, නල්ලූරුව, පානදුර නිවසේ පදිංචිව සිටි

**ටී.එම්. හෙට්ටිහේවා මහත්මියගේ**

හදිසි අභාවය පිළිබඳව

*ආයතනික කළමනාකාරීත්වය ඇතුළු කාර්ය මණ්ඩලයේ සාතිශය සංවේගය මෙයින් පළකර සිටිමු.*

අවසන් කටයුතු 2021 මැයි මස 03 වන දින
සවස 5.00 ට
මිනිවන්පිටිය සුසාන භූමියේදී සිදු කෙරිණි.

**නිවන් සැප ලැබේවා!**

ලංකා බැංකුව

BOC
ලංකා බැංකුව இலங்கை வங்கி


## ත්‍රිරෝද රථවලට...

මෙම යෙදවුම ඇතුළත් කර ඇති ත්‍රීරෝද රථයක් හඳුනාගැනීම සඳහා QR තේකයක් ත්‍රීරෝද රථයේ සටහන් කිරීමට පියවර ගන්නා බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් පතිනායක මහතා පවසයි.

## ඉන්දියාවේ සිට පැමිණ...

මෙම කාන්තාව සහ දරුවන් ඉන්දියාවේ සිට ධීවර යාත්‍රාවක ආධාරයෙන් පැමිණ පුත්තලම වේප්පමඩුව ප්‍රදේශයේ නිවසක සැඟව සිටියදී සොයාගැනීමෙන් පසු පුත්තලම පොලිසිය මගින් ඊයේ අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබේ. ආගමන විගමන පනත උල්ලංඝනය කරමින් මුහුදු මාර්ගයෙන් පැමිණීම හා නිරෝධායන නීති-රීති කඩ කිරීමේ චෝදනාව මත එම පිරිස අත්අඩංගුවට ගෙන ඇති ඔවුන්ට රැකවරණය දුන් එම කාන්තාවගේ මව ද පොලිසිය විසින් අත්අඩංගුවට ගැනිණි. එම කාන්තාව ශ්‍රී ලාංකික සම්භවයක් ඇති ඉන්දියානු කාන්තාවක් බව සෞඛ්‍ය අංශ හඳුනාගෙන තිබේ. මෙසේ ඇප මත මුදා හැරියේ පුත්තලම වෙප්පමඩුව පදිංචි එම් .රූපාවති (62) හැවිරිදි කාන්තාවක් හා ඇගේ දියණිය බව කියන ඉන්දියාවේ සිට මුහුදු මාර්ගයෙන් මුන්පායිසම්මුගන් ගවායි නමැති 34 හැවිරිදි කාන්තාවය.

## ගැබිනි කතුන් 70ක්...

සාමාන්‍ය අයෙකුට මෙම වයිරසය ආසාදනය වනවාට වඩා ගැබිනි මවකට ආසාදනය වුවහොත් සංකූලතා වැඩි වීමේ අවදානමක් පවතින බවත් එම නිසා විශේෂයෙන්ම ගර්භනී මවුවරුන් වයිරසයෙන් ආරක්ෂා වීමට වග බලා ගත යුතු බවත් ඒ මහත්මිය ප්‍රකාශ කළාය.

තමන්ට වැළඳී ඇත්තේ කොවිඩ් බවට සැකයක් කිසියම් ගැබිනි මවකට පවතින්නේ නම් ළඟම තිබෙන රෝහලට ගොස් ප්‍රතිකාර ලබා ගත යුතු යැයි ද ඒ මහත්මිය පැවසුවාය.

## කිහිප දෙනකුට කොවිඩ්...

මේ වන විට රට පුරා අඛණ්ඩ විදුලි සැපයුමක් පවත්වාගෙන යන්නේ මණ්ඩලයේ සමස්ත සේවකයන්ගෙන් තුනෙන් එකක් සේවය කරන මොහොතක බව ද සභාපතිවරයා සඳහන් කළේය.

අත්‍යවශ්‍ය රාජකාරිවල නිරත ලංවිම සේවකයන් ඇතුළු පනහකට අධික සේවක පිරිසක් මේ වන විට කොරෝනා වයිරසයට ගොදුරු වීමත් සමග රට පුරා අඛණ්ඩව විදුලිය ලබාදීම අභියෝගයක් පවතින බවට මතුව ඇති සංවාදය සම්බන්ධයෙන් විමසා සිටි අවස්ථාවේ දී ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය.

## දිනකට ආසාදිතයන්...

දිනකදී දැනට වාර්තා වන ආසාදිතයකු පුද්ගලයන් හතරදෙනකුට මේ වයිරසය ව්‍යාප්ත කළහොත් සහ ජනතාව වයිරසයේ ව්‍යාප්තිය පිළිබඳ නොසැලකිල්ලෙන් කටයුතු කළ හොත් මේ ඉලක්කම් වාර්තා විය හැකි බව ද ඇමැතිවරිය පැවසුවාය.

කොවිඩ් ව්‍යාප්තය රට තුළ පාලනය කිරීමේ හැකියාව තවමත් තිබෙන බවත් ජනතාව ස්වයං විනයකින් තොරව කටයුතු කළහොත් ඉදිරි සති දෙක තුන තුළදී එය ගිලිහී යාමේ අවදානමක් පවතින බවත් ඇමැතිවරිය කියා සිටියාය.

අත්‍යවශ්‍ය කාරණයකට හැර නිවසෙන් බැහැරට නොයාම, නිවසෙන් බැහැරට යන විට මුව ආවරණ නිසි ලෙස පැළඳීම, පුද්ගලයන් අතර දුරස්ථභාවය තබා ගැනීම, සෙනඟ රැස් වන ස්ථානයන්ට නොයාම යනාදි කාරණ නිසි ලෙස අනුගමනය කිරීමෙන් වයිරසය ආසාදනය වීමෙන් වැළකී සිටිය හැකි බව ද ඇමැතිවරිය පැවසුවාය.

## අධි චෝදනා 863ක්...

අදාළ නඩු විභාග කිරීම සඳහා වෙන වෙනම විශේෂ ත්‍රි පුද්ගල මහාධිකරණ විනිසුරු මඩුලු දෙකක් පත්කරන ලෙසට නීතිපතිවරයා ඊයේ (03) අගවිනිසුරුවරයාගෙන් ලිඛිතව විශේෂ ඉල්ලීමක් කළ බව ද නීතිපති සම්බන්ධිකාරක අධි නීතිඥ නිශාරා ජයරත්න මෙණෙවිය 'දිනමිණ'ට පැවසුවාය.

මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කළ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සහරාන් හෂිම් ඇතුළු කණ්ඩායම බෝම්බ ප්‍රහාර එල්ල කිරීමට සංවිධානය වී තිබෙන බවට ආසන්න බුද්ධි තොරතුරු ලැබී තිබියදී නිසි ක්‍රියාමාර්ග නොගැනීම, බෝම්බ ප්‍රහාර වළක්වා ගැනීමට කටයුතු නොකිරීම, රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතාගේ බුද්ධි තොරතුරු නොසලකා හැරීම ඇතුළු චෝදනා 863 බැගින් ඉදිරිපත් කරමින් මෙම නඩු පවරා ඇත.

විත්තිකරුවන් දෙදෙනා දණ්ඩනීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ මිනී මැරීම හා 306 වගන්තිය යටතේ මිනී මැරීමට තැත් කිරීම යන චෝදනා ඉදිරිපත් කර ඇති බවද අධි නීතිඥවරිය පැවසුවාය.

නිශාරා ජයරත්න මෙණෙවිය මෙසේද පැවසුවාය.

හිටපු පොලිස්පති පුජිත් ජයසුන්දර හා හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු යන මහත්වරුන්ට එරෙහිව 2019 පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට අදාළව මියගිය හා තුවාල ලැබූ පුද්ගලයන් සම්බන්ධයෙන් මිනී මැරීමේ හා මිනී මැරීමට තැත්කිරීමේ චෝදනාවලට අදාළව තොරතුරු ප්‍රදර්ශනය කිරීම නීතිපතිවරයා විසින් ඊයේ කොළඹ මහාධිකරණයේදී සිදුකරනු ලැබුවා. මෙම නඩු විභාග කිරීම සඳහා විශේෂ ත්‍රි පුද්ගල මහාධිකරණ දෙකක් පත්කරන ලෙස ද නීතිපතිවරයා අගවිනිසුරුවරයාගෙන් ලිඛිතව ඉල්ලීමක් කළා. 2019 අප්‍රේල් 07 දින හා 2019 අප්‍රේල් 21 යන කාල සීමාව අතරතුරදි රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා ලබාදුන් සංවේදී තොරතුරු හා බුද්ධි තොරතුරු වන සහරාන් හෂිම් සහ ඔහුගේ කණ්ඩායම ආගමික සිද්ධස්ථාන හා හෝටල්වලට හා අනෙකුත් ස්ථානවලට බෝම්බ ප්‍රහාර එල්ල කිරීමට සංවිධානව සිටි බවට හා ප්‍රහාර එල්ල කිරීමට ආසන්නව හා සූදානම්ව සිටින බවට ඔවුන්ට ලැබුණු තොරතුරු නොසලකා හැරීම සහ ඒ මත කටයුතු කිරීමට මුළු මුණින්ම අපොහොසත් වීම හේතුවෙන් 2019 පාස්කු දින බෝම්බ ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය හා 306 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම යන චෝදනා යටතේ මේ නඩුව පැවරීය.

# මරණ දැන්වීම්

**කුසුමාවතී නල්ලපෙරුම (පලිහවඩන) මහත්මිය** - නැසීගිය රොබට් කොඩිකාර පලිහවඩනගේ භාර්යාව වූද, සිසිර (නැසීගිය), පබා (හිටපු නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්), තමර (අවෙයානස් පුද්ගලික සමාගම), අමර (මාර්ග සංවර්ධන අධිකාරිය) චමින්ද (කැනඩාව) ගේ මෑණියන් වූද, නයනා, ජයන්ත, මුදිතා, ප්‍රසංගා (ශ්‍රී ජයවර්ධනපුර රෝහල), තිමතිගේ නැන්දණිය වූද විශ්‍රාමලත් විදුහල්පතිනි කුසුමාවතී නල්ලපෙරුම මහත්මිය අභාවප්‍රාප්ත වූවාය. අවසන් කටයුතු 2021 මැයි 5 වෙනි බදාදා සවස 5 ට උඩහමුල්ල පොදු සුසාන භූමියේදී සිදු කෙරේ. **39, දුම්රියපොළ පටුමග, උඩහමුල්ල, නුගේගොඩ.**

033285

# ලක්ෂ 12ක් වටිනා බුරුත කඳන් ප්‍රවාහනය කළ ටිපර් රථයක් අත්අඩංගුවට

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

කළුගල් මැද අතුරන ලද රුපියල් ලක්ෂ දොළහක් වටිනා නීති විරෝධී බුරුත කඳන් 47ක් ප්‍රවාහනය කරමින් තිබූ ටිපර් රථයක් වවුනියාව පුලියන්කුලම් නයිනමඩු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් විසින් පෙරේදා (02) අත්අඩංගුවට ගෙන තිබේ.

මේ බුරුත කඳන් තොගය නයිනමඩු රක්ෂිතයෙන් කපා ඇති අතර, කළුගල් ප්‍රවාහනය කරන මුවාවෙන් මේ බුරුත කොට ප්‍රවාහනය කර තිබේ. පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන්ට ලැබුණු තොරතුරක් මත ඔවුන් එහි යන විට බුරුත කඳන් පටවන ලද ටිපර් රථය දමා සැකකරුවන් පලා ගොස් තිබේ.

පොලිස් විශේෂ කාර්ය බළකාය විසින් අත්අඩංගුවට ගත් බුරුත කඳන් සහ ටිපර් රථය වවුනියාවේ පුලියන්කුලම පොලිසිය වෙත බාර දී ඇති අතර,



පොලිසිය ටිපර් රථයේ අයිතිකරු සෙවීමට පරීක්ෂණ ආරම්භ කර තිබේ.

# රසායනික පොහොර වෙළෙඳපොළේ නෑ

## රාජාංගණය ගොවීන් සුරැකීමේ සංවිධානය

**තලාව සමූහ - බී. ඩබ්ලිව්. ඩී. ධර්මකීර්ති**

වගාවලට යෙදීමට අවශ්‍ය රසායනික පොහොර වෙළෙඳපොළේ නොමැති බව රාජාංගණය ගොවීන් සුරැකීමේ සංවිධානයේ නියෝජිතයෝ පවසති.

ඔවුන් මේ බව පැවැසුවේ රාජාංගණය, යාය 4 ප්‍රදේශයේ පෙරේදා (02) පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔවුහු මෙසේ ද කීහ.

'රජයෙන් එක්වරම රසායනික පොහොර භාවිතය නතර කර කොම්පෝස්ට් පොහොර භාවිත කරන ලෙසට දන්වා තිබෙනවා. නමුත් එය ක්ෂණිකව සිදු කරන්න බෑ. එය ක්‍රම ක්‍රමයෙන් සිදු කළ යුත්තක්.

රජයෙන් ගන්නා මේ තීරණය නිසා රාජාංගණය ව්‍යාපාරයේ අක්කර 45,000ක පමණ වී හා අතිරේක බෝග වගා කර ඇති ගොවීන් දැඩි අසීරුතාවකට පත්ව සිටිනවා. මීට පෙර රුපියල් 1500කට වෙළෙඳපොළෙන් පොහොර ගැනීමට හැකියාව තිබුණත් කළුකඩ වෙළෙන්දන් පොහොර තොග සඟවා වැඩි මිලකට අලෙවි කරනවා.

ගොවියා කොම්පෝස්ට් පොහොරවලට හුරුකිරීමේ යෝජනාවට අපත් කැමතියි. ඒත් එක්වරම කළ නොහැකියි. රසායනික පොහොර භාවිතය ටිකෙන් ටික අඩු කර ඊට සමගාමීව කොම්පෝස්ට් පොහොර භාවිතය වැඩි කිරීමට වැඩපිළිවෙළක් සකසා දෙන්න.'

# ප්‍රසම්පාදන දැන්වීම

## වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ජාතික තරගකාරී ක්‍රමය යටතේ ලංසු මිල ගණන් කැඳවනු ලැබේ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට 2021.05.04 දින පෙ.ව. 9.00 සිට 2021.05.24 දින ප.ව. 3.30 දක්වා කාලය තුළ පහතින් සඳහන් කර ඇති ආයතන වෙත පැමිණ ලංසු ලියවිලි පරීක්ෂා කිරීමෙන් පසුව ඊට අදාළ ලංසු ගාස්තු මෙම ආයතනයේ මුදල් අයකැමි වෙත මුදලින් ගෙවා ලංසු ලියවිලි ලබාගත හැකිය.

| අනු අංකය | ඉදිකිරීම් හා අලුත්වැඩියා ව්‍යාපෘතියේ විස්තර | අවශ්‍ය ලියාපදිංචිය හා ශ්‍රේණිය | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම (රුපියල් මිලියන) | ආපසු නොගෙවන ලංසු ගාස්තුව (රුපියල්) | ලංසු ඇපකරයේ වටිනාකම (රුපියල්) | ලංසු ලියවිලි ලබාගත හැකි ආයතනය |
|---|---|---|---|---|---|---|
| 01. | Refurbishment of MCH Clinics - Nawagaththa Clinic | C9 හෝ C8 | 1.2 | 1,500 | 12,000 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල, "සෞඛ්‍ය සංකීර්ණය", පුවක්ගස් හන්දිය, මිගමු පාර, කුරුණෑගල. |
| 02. | Construction of stores for Dengu prevention equipment at MOH Ibbagamuwa | C9 හෝ C8 | 1.3 | 1,500 | 13,000 | |
| 03. | Construction of waste management centre at DH Kandanegedara | C9 හෝ C8 | 1.3 | 1,500 | 13,000 | |
| 04. | Construction of Parapet wall & gate at DH Kobeigane | C9 හෝ C8 | 1.4 | 1,500 | 14,000 | |
| 05. | Renovation and refurbishment of Kitchen at DH Katupotha - (Roof, Celling, Floor) | C9 හෝ C8 | 1.4 | 1,500 | 14,000 | |
| 06. | Renovation and refurbishment of Dental Clinic Celling & Kitchen at DH Thalampitiya | C9 හෝ C8 | 1.4 | 1,500 | 14,000 | |
| 07. | Construction of vehicle garage & Interlocking of the compound at MOH Rasanyakapura | C9 හෝ C8 | 1.5 | 1,500 | 15,000 | |
| 08. | Renovation and refurbishment of dental clinic building at DH Mawathagama (Including roof & ceiling, wash room) | C9 හෝ C8 | 1.5 | 1,500 | 15,000 | |
| 09. | Renovation and refurbishment of OPD building roof & all wash rooms at DH Rajanganaya | C9 හෝ C8 | 1.6 | 1,500 | 16,000 | |
| 10. | Renovation and refurbishment of OPD Building at PMCU Tharana Udawela | C9 හෝ C8 | 1.6 | 1,500 | 16,000 | |
| 11. | Estimate for the roof repair and celling work at dental clinic at DH Rideegama | C9 හෝ C8 | 1.6 | 1,500 | 16,000 | |
| 12. | Upgrading existing mental health clinic at DH Alawwa | C9 හෝ C8 | 1.6 | 1,500 | 16,000 | |
| 13. | Construction of retaining wall at DH Nawathalwatta. | C9 හෝ C8 | 1.7 | 1,500 | 17,000 | |
| 14. | Construction of Boundry wall & chain link fence at Dental clinic Uhumeeya | C9 හෝ C8 | 1.7 | 1,500 | 17,000 | |
| 15. | Expansion and upgrading of laboratory at DH Dunakadeniya | C9 හෝ C8 | 1.8 | 1,500 | 18,000 | |
| 16. | Renovaton and modification ward No 3 upper floor at DH Ambanpola | C9 හෝ C8 | 1.8 | 1,500 | 18,000 | |
| 17. | Renovation and refurbishment of ADC - Maliyadewa Adarsha MV | C9 හෝ C8 | 1.9 | 1,500 | 19,000 | |
| 18. | Renovation and refurbishments at DH Kandanegedara | C9 හෝ C8 | 1.9 | 1,500 | 19,000 | |
| 19. | Renovation and refurbishment of MO rest room, ward No. 2 & Office wash rooms drainge system at DH Wellawa | C8 හෝ C7 | 2.0 | 2,000 | 20,000 | |
| 20. | Renovation and refurbishment of ward No. 01, 02 & Dental Clinic roof at DH Hettipola | C8 හෝ C7 | 2.0 | 2,000 | 20,000 | |
| 21. | Renovation and refurbishment at DH Alawwa | C9 හෝ C8 | 2.0 | 2,000 | 20,000 | |
| 22. | Renovation and refurbishment of PMCU Divurumpola | C8 හෝ C7 | 2.1 | 2,000 | 21,000 | |
| 23. | Renovation and refurbishment of OPD Building roof ceiling & pavement at PMCU Hiruwalpola | C8 හෝ C7 | 2.1 | 2,000 | 21,000 | |
| 24. | Renovation and refurbishment of MO quarters at DH Mahagirilla | C8 හෝ C7 | 2.1 | 2,000 | 21,000 | |
| 25. | Renovation and refurbishments at DH Hettipola | C8 හෝ C7 | 2.1 | 2,000 | 21,000 | |
| 26. | Renovation and refurbishment of PMCU Alabadagama | C8 හෝ C7 | 2.2 | 2,000 | 22,000 | |
| 27. | Renovation and refurbishment of PMCU Wadakada | C8 හෝ C7 | 2.2 | 2,000 | 22,000 | |
| 28. | Remaining work of parapet wall at Mental Health Rehabilitation unit Uhumeeya | C8 හෝ C7 | 2.2 | 2,000 | 22,000 | |
| 29. | Construction of toilet at Mawathagama Hospital | C8 හෝ C7 | 2.2 | 2,000 | 22,000 | |
| 30. | Refurbishment of MOH offices Narammala | C8 හෝ C7 | 2.3 | 2,000 | 23,000 | |

| අනු අංකය | ඉදිකිරීම් හා අලුත්වැඩියා ව්‍යාපෘතියේ විස්තර | අවශ්‍ය ලියාපදිංචිය හා ශ්‍රේණිය | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම (රුපියල් මිලියන) | ආපසු නොගෙවන ලංසු ගාස්තුව (රුපියල්) | ලංසු ඇපකරයේ වටිනාකම (රුපියල්) | ලංසු ලියවිලි ලබාගත හැකි ආයතනය |
|---|---|---|---|---|---|---|
| 31. | Remainning work at PMCU Wewagama | C8 හෝ C7 | 2.4 | 2,000 | 24,000 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල, "සෞඛ්‍ය සංකීර්ණය", පුවක්ගස් හන්දිය, මිගමු පාර, කුරුණෑගල. |
| 32. | Renovation and refurbishment of OPD Building at PMCU Makulpotha (Including roof, plastering, painting) | C8 හෝ C7 | 2.4 | 2,000 | 24,000 | |
| 33. | Renovation and refurbishment of DH Sandalankawa | C8 හෝ C7 | 2.6 | 2,000 | 26,000 | |
| 34. | Renovation and refurbishment & expansion of clinic area, Female ward & minor staff rest room at DH Bingiriya | C8 හෝ C7 | 2.7 | 2,000 | 27,000 | |
| 35. | Renovation and refurbishment of clinic building at PMCU Minuwangete | C8 හෝ C7 | 2.7 | 2,000 | 27,000 | |
| 36. | Renovation and refurbishment of MO quarters roof at PMCU Divullegoda | C8 හෝ C7 | 2.7 | 2,000 | 27,000 | |
| 37. | Upgrading wash roof facilities at PMCI - DH Koshena | C8 හෝ C7 | 2.8 | 2,000 | 28,000 | |
| 38. | Renovation and refurbishment of MO Quarters & Minor staff quarters at DH Hiripitiya | C8 හෝ C7 | 2.9 | 2,000 | 29,000 | |
| 39. | Essential renovation of Clinic building, roof, parapet wall & gate at PMCU Divullegoda | C8 හෝ C7 | 3.0 | 2,000 | 30,000 | |
| 40. | Construction of retaining wall with boundry wall at MOH Mawathagama (Including the rear side) | C8 හෝ C7 | 3.1 | 2,000 | 31,000 | |
| 41. | Other Infrastructure Upgrading facilities of MCH Clinics including expansion of waiting area - DH Koshena | C8 හෝ C7 | 3.1 | 2,000 | 31,000 | |
| 42. | Renovation and refurbishment of PMCU Kalugalla | C8 හෝ C7 | 3.2 | 2,000 | 32,000 | |
| 43. | Renovation and refurbishment of PMCU Pothuhera (Including Drug store & Staff wash rooms) | C8 හෝ C7 | 3.2 | 2,000 | 32,000 | |
| 44. | Upgrading facilities of MCH Clinics including expansion of waiting area - Mohoththawagoda clinic | C8 හෝ C7 | 3.5 | 2,000 | 35,000 | |
| 45. | Renovation and refurbishment of Drainage system & building with kitchen at DH Gokarella | C8 හෝ C7 | 3.6 | 2,000 | 36,000 | |
| 46. | Renovation and refurbishment of dental clinic at PMCU Uhumeeya - (Including roof, Ceiling) | C8 හෝ C7 | 3.6 | 2,000 | 36,000 | |
| 47. | Essential renovations and refurbishment of DH Kadanegedara | C8 හෝ C7 | 3.7 | 2,000 | 37,000 | |
| 48. | Refurbishment existing PMCIs - DH Kotawehera | C8 හෝ C7 | 4.0 | 2,500 | 40,000 | |
| 49. | Renovation and Refurbishment of RMO & PHM Quarters at DH Narammala | C8 හෝ C7 | 4.8 | 2,500 | 48,000 | |
| 50. | Renovation of drug stores at RDHS Kurunegala | C7 හෝ C6 | 5.0 | 2,500 | 50,000 | |
| 51. | Construction of fence & gate at PMCU Thalawila | C9 හෝ C8 | 1.3 | 1,500 | 13,000 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - පුත්තලම, රෝහල් ගොඩනැගිල්ල, මාදම්පේ. |
| 52. | Renovation of ward at DH Lunuwila | C9 හෝ C8 | 1.9 | 1,500 | 19,000 | |
| 53. | Construction of labour room & ward at DH Kottukachchiya | C9 හෝ C8 | 1.9 | 1,500 | 19,000 | |
| 54. | Construction of fence & gate at DH Nawagaththegama | C8 හෝ C7 | 2.7 | 2,000 | 27,000 | |
| 55. | Improvement of admin Building at B.H. Anamaduwa | C8 හෝ C7 | 3.3 | 2,000 | 33,000 | |
| 56. | Improvement of Electricity system, renovation of kitchen, toilets & color wash of SKS room at D.H Udappuwa | C8 හෝ C7 | 3.6 | 2,000 | 36,000 | |
| 57. | Improvement of Alcohol rehabilitation center at D.H Lunuwila | C8 හෝ C7 | 3.8 | 2,000 | 38,000 | |

02. ලංසු ඇපකරය මුදලින් ගෙවන්නේ නම් ඉහත සඳහන් ලංසු ඇපකරයේ වටිනාකමින් 50% ක අගය ලංසු ලියවිලි ලබාගන්නා ආයතනය මුදල් අයකැමි වෙත ගෙවා මුදල් අයකැමි විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියේ සහතික කරන ලද ඡායාපිටපතක් ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතු අතර, ලංසු ඇපකරය මුදලින් නොගෙවන්නේනම් ඉහත සඳහන් ලංසු ඇපකරයේ වටිනාකමට සමාන අගය ලංසු ලියවිලි සමග නිකුත් කරනු ලබන ආකෘතියට අනුකූලව ලංසු ලියවිලි ලබාගන්නා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමත වාණිජ බැංකුවක් මගින් ලබාගෙන ලංසු ලියවිලි සමග එහි මුල්පිටපත ඒ ඒ ව්‍යාපෘතියට අදළව වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

03. නිසි පරිදි සම්පූර්ණ කළ ලංසු ලියවිලි ලංසු මුල්පිටපත හා දෙවන පිටපත වෙන් වෙන්ව කවරවල බහා සියල්ල යළි එක් කවරයක බහා ඉදිකිරීම් ව්‍යාපෘතියට අදළ නම ලිපි කවරයේ වම්පස ඉහළ තීරුවේ පැහැදිලිව ලියා, ඊට අදළ ලංසු ලියවිල්ලේ සඳහන් ආයතනය වෙත නියමිත දින හා වේලාවට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් හෝ එම ආයතනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම සිදුකළ යුතුය.

04. ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ඒ සඳහා සහභාගි විය හැකි අතර, භාණ්ඩාගාර ලේකම්ගේ 04/2016 (ii) චක්‍රලේඛයට අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සිදු කෙරේ.

05. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, කරුණෑගල 0372222278 හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පුත්තලම 0322247261 යන දුරකථන අංක අමතා ලබාගත හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,**
**පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,**
**වයඹ පළාත.**

# සුදේව - කිංස්ලි වැඩ අරඹති





**මහින්ද අලුත්ගෙදර**

ජනාධිපති මාධ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස පත් කෙරුණු ප්‍රවීණ මාධ්‍යවේදී සුදේව හෙට්ටිආරච්චි සහ ජනාධිපති මාධ්‍ය ප්‍රකාශක පත්වීම ලද කිංස්ලි රත්නායක මහත්වරු ඊයේ (3) පෙරවරුවේ සිය ධුරයන්හි රාජකාරි ආරම්භ කළහ.

කොළඹ කොටුව, ජනාධිපති මාධ්‍ය අංශ පරිශ්‍රයේ දී ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් නව ධුරයන්හි රාජකාරී භාර ගැනීම සිදු කෙරුණු අතර පවතින තත්ත්වය හමුවේ සීමිත පිරිසක් ඊට එක්ව සිටීම විශේෂත්වයකි.

මිරිසවැටිය විහාරාධිපති පූජ්‍ය ඊතලවැටුණුවැවේ ඥාණතිලක හිමි, ආචාර්ය පූජ්‍ය කිරින්දේ අස්සජි හිමි, මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, මහාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමි, පූජ්‍ය උඩුවේ ධම්මාලෝක හිමි ප්‍රමුඛ මහා සංඝරත්නය සෙත් පිරිත් සජ්ඣායනා කර ආශිර්වාද කළහ.

ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, ආරක්ෂක ලේකම් ජෙනරල් කමල් ගුණරත්න, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජෙනරාල් මොහාන් සමරනායක මහත්වරුන්, අගමැති මාධ්‍ය අංශයේ සහ ජනාධිපති මාධ්‍ය අංශයේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය මේ අවස්ථාවට එක් වූහ.

# ආනයනකරුවන්ගේ ගැටලු නිසා පාම් ඔයිල් ගෙන්වීම තහනම් කළා

## ● වෙළෙඳ ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන

**අනුර ප්‍රේමලාල්**

මෙරට ඇති වී තිබෙන තත්ත්වය හා සමහර පාම් ඔයිල් ආනයනකරුවන්ගේ ගැටලු පදනම් කරගනිමින් පිරිපහදු නොකළ පාම් තෙල් ආනයනය තහනම් කර ඇති බව මැලේසියානු මහා කොමසාරිස් හා ඉන්දුනීසියානු තානාපති හමුවේ වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා ඒ බව පැවසුවේ ඊයේ (3) මැලේසියා මහකොමසාරිස් යැන්ග් තායි ටාන් මහතා, ඉන්දුනීසියානු තානාපති අයි. ගුස්ති නුරාග් ආදියාසා මහතා අමාත්‍යාංශයේදී වෙළෙඳ හමු වූ අවස්ථාවේදීය.



මෙම හමුවේදී මැලේසියානු මහකොමසාරිස් හා ඉන්දුනීසියානු තානාපතිවරයා දැනට මෙරටට පාම් තෙල් ආනයනය කිරීම සඳහා පනවා ඇති තහනම සම්බන්ධයෙන් සාකච්ඡා කළහ.

එහිදි අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද පාවසීය. කර්මාන්ත සඳහා යෙදවුමක් ලෙස අවශ්‍යතාව පවතින ගුණාත්මක බවින් ඉහළ හා ලෝක ප්‍රමිතීන්ට අනුකූල වන පිරිපහදු කළ පාම් තෙල් ගෙන්වීම සඳහා රජය ක්‍රියාමාර්ග ගන්නවා. ඒ අනුව ආනයන අපනයන පාලක හරහා මෙරට කර්මාන්ත සඳහා යෙදවුමක් වශයෙන් ගෙන්වීමට අවශ්‍යතාව පවතින පිරිපහදු කළ පාම් තෙල් ආනයනය කිරීමට දේශීය ව්‍යවසායකයන්ට බලපත්‍රයක් දීමට නියමිතයි.

මේ පිළිබඳ වැඩිදුර කරුණු සාකච්ඡා කිරීමට, මුදල් අමාත්‍ය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා හා වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා හමුවීම සඳහා අවස්ථාවක් ලබා දෙන මෙන් මැලේසියානු මහකොමසාරිස් හා ඉන්දුනීසියානු තානාපති වෙළෙඳ අමාත්‍යවරයාගෙන් කළ ඉල්ලීමට අනුව ඉදිරියේදී ඒ සඳහා අවස්ථාව සැලසීමට කටයුතු කරන බව අමාත්‍යවරයා මෙහිදී ප්‍රකාශ කළේය.




ලෝක පශු වෛද්‍ය දිනය වෙනුවෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමය සංවිධානය කළ සැමරුම් උත්සවයක් කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී පසුගිය දා පැවැති අතර, එහිදී වෙට් මොබයිල් ඇප් එකක් ද හඳුන්වා දුන්නේය. ඒ අවස්ථාවට පැමිණි ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයේ සාමාජික සාමාජිකාවන් සමූහ ඡායාරූපයක පෙනී සිටි අවස්ථාව.

# සමාජ-සංස්කෘතික-ආර්ථික අභිලාෂ ඉටු කරන්න මාධ්‍ය නිදහස යොදාගන්න

## ● අගමැති සියලු මාධ්‍යවේදීන්ට කියයි



ජනතාවට නිවැරදි තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය සුරක්ෂිත කරමින් රටේ සමස්ත සමාජ, සංස්කෘතික හා ආර්ථික අභිලාෂ සාක්ෂාත් කර ගැනීම සඳහා මාධ්‍ය නිදහස යෙදාගන්නැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා සියලු ජනමාධ්‍යවේදීන්ගෙන් ඉල්ලීමක් කරයි.

ලෝක මාධ්‍ය නිදහස් දිනය වෙනුවෙන් සුබපැතුම් පණිවිඩයක් නිකුත් කරන අගමැතිවරයා වැඩි දුරටත් මෙසේ සඳහන් කරයි.

ලෝක මාධ්‍ය නිදහස් දිනය යෙදෙන අද දිනයේ ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම උදෙසා දිවා රෑ වෙහෙසෙන සියලුම මාධ්‍ය ආයතන සහ ජනමාධ්‍යවේදීන්ට සුබ පැතුම් එක් කරන්නේ ඉමහත් සතුටිනි. මේ වන විට තොරතුරු සන්නිවේදනය ලොව වේගයෙන්ම දියුණු වන විෂය පථයක් බවට පත්ව තිබේ. පසුගිය දශක කිහිපයක කාලය තුළ විවිධ සන්නිවේදන මාධ්‍ය ඔස්සේ ජනතාවට තොරතුරු ගලායෑම වේගවත් විය.

එහෙත් කාලීන අවශ්‍යතාව වී ඇත්තේ ස්වාධීන හා වගකීම් සහගත මාධ්‍ය භාවිතාවයි. ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය සුරක්ෂිත වන්නේ නිවැරදි මාධ්‍ය භාවිතාව තුළිනි. ඒ වෙනුවෙන් කටයුතු කිරීම සියලු දෙනාගේම වගකීමක් මෙන්ම යුතුකමද වන බව මාගේ විශ්වාසයයි.

මෙරට මාධ්‍ය නිදහස බරපතළ ලෙස කප්පාදුවට ලක්ව තිබූ යුගයන් පිළිබඳ අප අමුතුවෙන් සිහිපත් කළ යුතු නැත. අප බලයට පත්ව සිටින සෑම අවස්ථාවකම තොරතුරු දැනගැනීමේ අයිතියත් මාධ්‍ය නිදහසත් සුරක්ෂිත කිරීමට කටයුතු කර ඇති බව සිහිපත් කරමි.

ලොවම වසංගත තත්ත්වයකින් පීඩා විඳින මෙවන් වකවානුවක තොරතුරු මහජන යහපත උදෙසාය තේමාවෙන් මෙවර ලෝක මාධ්‍ය නිදහස් දිනය සැමරීම ඉතා කාලෝචිතය.

රටක් වශයෙන් කොවිඩ් වසංගත අභියෝගයට මුහුණ දෙමින්, එය මැඩලීමේ කාර්යයේ දී ජනතාව දැනුවත් කරමින් ජීවිත අවදානම නොතකා මාධ්‍යවේදීන් ඉටු කරන සුවිශේෂ කාර්යය භාරය සහ කැප කිරීම රජය සැමවිටම අගය කරමි.

දැනුමෙන් සන්නද්ධ විය යුතු ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය දියුණුව උදෙසා අධ්‍යාපන ශිෂ්‍යත්ව මෙන්ම මාධ්‍ය උපකරණ පිරිනැමීමට අප තැබූ පියවර ඉදිරියටත් ක්‍රියාත්මක වනු ඇත. ජනතාවට නිවැරදි තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය සුරක්ෂිත කරමින් රටේ සමස්ත සමාජ, සංස්කෘතික හා ආර්ථික අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා මාධ්‍ය නිදහස යෙදා ගන්නැයි මා සියලු ජනමාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිමි.

# අන් කවරදාටත් වඩා අද මාධ්‍යවේදීන්ගේ මැදිහත් වීම වැදගත්

## ● ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල



ලොව සිව් වැනි බලවේගය ලෙස හැඳින්වෙන ජනමාධ්‍යවේදීන්ගේ ක්‍රියාකාරීත්වය අන් කවරදාටත් වඩා වත්මන් ලෝක ව්‍යසනය හමුවේ අතිශය වැදගත් වනු ඇති බව ජනමාධ්‍ය අමාත්‍ය කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි.

එවැනි අතිශය සමාජ වගකීමක නිරත වන ජනමාධ්‍යවේදීන්ගේ නිදහස උපරිමයෙන් අගය කරන බවද අන්තර්ජාතික මාධ්‍ය නිදහස් දිනය වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කරමින් ඇමැතිවරයා පවසයි.

වත්මන් කොවිඩ් -19 ව්‍යසනය හමුවේ අවදානම් තත්ත්වය පවා නොතකා මෙරට ජනමාධ්‍යවේදීන් සුවිශාල කාර්යභාරයක නිරත වන බවත් ඔවුන් සියලුදෙනාට ජාතියේ ප්‍රණාමය හිමි වන බවත් ඇමැතිවරයා පෙන්වා දෙයි.

විශේෂයෙන් මෙම ව්‍යසන තත්ත්වය හමුවේ නිවැරදි තොරතුරු සපයමින් ජනතාව දැනුම්වත් කිරීමට වෙහෙසන මාධ්‍යවේදීන් ඉටුකරනුයේ ජාතික කාර්යභාරයක් යැයිද එහි උපරිම ගෞරවය ඔවුන්ට හිමි වන්නේ යැයිද රඹුක්වැල්ල මහතා පවසයි.

නවීන තාක්ෂණය මුසු වීමත් සමග ජනමාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ කාර්යභාරය මේ වන විට වඩාත් පුළුල් වී ඇති බවත් ඒ ඔස්සේ ජනමාධ්‍ය යන්නට ඉහළම අවධානය හිමිව ඇති බවත් හෙතෙම පෙන්වා දෙයි.

'සෞභාග්‍යයේ දැක්ම' ඔස්සේ ජනමාධ්‍යවේදීන්ගේ කාර්යභාරයට ඉහළම වටිනාකමක් ඇතැයිද එහෙත් ගෙවුණු වකවානුව පුරා පැවැති වසංගත තත්ත්වය හේතුවෙන් ඒ සඳහා වන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වූයේ යැයිද ඇමැතිවරයා පවසයි.

රටත් ජනතාවත් සමාජයත් උදෙසා ජනමාධ්‍යවේදීන්ගේ කාර්යභාරයද නිදහසද නිසි ලෙස යොදා ගන්නා ලෙස ඇමැතිවරයා ඉල්ලා සිටී.

# පිරිසුදු පාම් ඔයිල් ගෙන්වීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්න

## ● බේකරි හිමියන්ගේ සංගමය රජයට කියයි

**ශිරාන් රණසිංහ**

බිස්කට්, චොකලට්, සබන්, අයිස්ක්‍රීම් ඇතුළු නිෂ්පාදන රැසකට අත්‍යවශ්‍ය වන පාම් ඔයිල් හිඟය මේ වන විට උග්‍ර අතට හැරී තිබෙන නිසා පිරිසුදු පාම් තෙල් මෙරටට ගෙන්වා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයක් සකසන ලෙස බේකරි හිමියන්ගේ සංගමයේ සභාපති එන්. කේ. ජයවර්ධන මහතා රජයෙන් ඉල්ලා සිටී.

පාම් ඔයිල් හා මාගරින් මිල ගණන් ඇතුළු අමුද්‍රව්‍ය මිල ඉහළ යෑම හා හිඟය නිසා බේකරි කර්මාන්තය කරගෙන යෑම අසීරු වී ඇතැයි ද ඒ මහතා දිනමිණට ඊයේ (03) පැවැසීය.

පාම් ඔයිල් ගෙන්වීම හා ඒවා පිරිපහදු කිරීමට සාමාන්‍ය ව්‍යාපාරිකයන් සතුව පහසුකම් නොමැති බැවින් එම පහසුකම් ඇති සමාගම්වලටම ඒවා ගෙන්වීමට ඉඩ ලබාදීමට සිදුව ඇතැයි ද ඒ මහතා කීය.

නමුත් මෙරටට ගෙන්වන පාම් ඔයිල්වල ප්‍රමිතිය අධීක්ෂණය කිරීම රජය සතු වගකීම යැයි ද ඒ මහතා පැවැසීය.

මේ වන විට පාම් ඔයිල් හා මාගරින් මිල ගණන් විශාල ලෙස ඉහළ ගොස් ඇතැයි ද එනිසා ඒවායේ හිඟයක් ද මතු වී ඇතැයි ඒ මහතා කීය.

පාම් ඔයිල් මෙරටට ගෙන්වන පුද්ගලික සමාගම් අතර තෙල් පිරිපහදු පහසුකම් ඇත්තේ ප්‍රධාන සමාගම් නවයකට පමණකැයි ද ඒ මහතා පැවසීය.

# මත්ද්‍රව්‍ය ජාවාරම්වල නිරත වූ නාකොටික් නිලධාරීහු 14 තෙක් රිමාන්ඩ්

**සිරන්ජනි කුමාරි**

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධාරීන් මත්ද්‍රව්‍ය ජාවාරම් කළැයි කියන සිද්ධියේ සැකකරුවන් ලබන (14) වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා ඊයේ (3) නියෝග කළේය.

ඊයේ දින සැකකරුවන් බන්ධනාගාරය මඟින් අධිකරණය හමුවේ ඉදිරිපත් කර නොතිබිණි.

සැකකරුවන් සම්බන්ධයෙන් ත්‍රස්තවාදි පනත යටතේ විමර්ශන කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙදින කරුණු දැක්වීය.

ඊයේ මෙම නඩුව කැඳවූ අවස්ථාවේදී පැමිණිල්ල වෙනුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන ඒකකයේ සහකාර පොලිස් අධිකාරී මෙරිල් රන්ජන් ළමාහේවා මහතා ඇතුළු නිලධාරී මඩුල්ලක් අධිකරණය හමුවේ පෙනී සිටියහ.

# ගොවි ජනතාවගේ උකස් කළ ඉඩම්වල ණය ගෙවන්න සමුපකාරයෙන් වැඩපිළිවෙළක්

## ● රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ කියයි

**නුවන් කොඩිකාර සහ පොළොන්නරුව දිසා සමූහ එම්. පී. සරත්**

පෞද්ගලික ගැනුම්කරුවන්ට සිය ගොවිබිම් උකස් කර නැවත එම කුඹුරු ඉඩම් බේරා ගැනීමට නොහැකිව සිටින ගොවීන් වෙනුවෙන් සමුපකාරය මඟින් එම උගස් ණය ගෙවීමේ ක්‍රමවේදයක් ඇති කිරීමට රජය සැලසුම් සකස් කර ඇතැයි පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා පැවසීය.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ගොවි ජනතාව ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව මෙම වැඩසටහන ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට නියමිත බව හෙතෙම කීවේය.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගෙන දැනට ගෙවා ගැනීමට නොහැකිව සිටින ගොවීන්ගේ ගැටලු විසඳීම මූලික කරගනිමින් සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා සමග පැවැති සාකච්ඡාවේදී මෙම තීරණයට එළැඹි බව රාජ්‍ය ඇමැතිවරයා කියා සිටියේය.



උගස් කර ඇති, නමුත් බේරා ගැනීමට නොහැකි කුඹුරු ඉඩම් වෙනුවෙන් සමූපකාරය මැදිහත් වී උගස බේරා ඉඩම නිදහස් කර ගැනීමෙන් අනතුරුව ඉඩම් හිමියාට එම ඉඩම්වල වගා කිරීමට හැකියාව ලබා දෙන අතර, එම අස්වැන්න සමූපකාරය මඟින් මිලදී ගැනීමට සැලසුම් කර ඇති බව රණසිංහ මහතා ප්‍රකාශ කළේය.

ඉඩම් හිමියාට ඉතා අඩු ප්‍රතිශතයකට අනුව වාරික වශයෙන් අදාළ ඉඩමේ ණය ගෙවීමට හැකියාව දෙන බවත්, ගොවිබිමේ භුක්තියට ද කිසිඳු බාධාවක් සිදු නොවන බවත් රාජ්‍ය ඇමැතිවරයා පැවසීය.

මෙම තත්ත්වය මඟ හරවා ගනිමින් ඔවුන්ට බාධාවකින් තොරව ගොවිතැන් කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට මෙහිදී තීරණය කළ බව පැවැසූ ඒ මහතා මෙහි නියමු ව්‍යාපෘතිය පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් ආරම්භ කිරීමට යෝජිත බව කීවේය.

රෝෂාන් රණසිංහ මහතා වැඩි දුරටත් මෙසේද කියා සිටියේය.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පමණක් 89,000කට අධික පිරිසක් ගොවිතැන් මඟින් ජීවිකාව ගෙන යනවා. එයින් 50%කට වඩා පිරිසක් ඔවුන්ගේ කුඹුරු ඉඩම් උකස් තබා තිබෙනවා. එහිදී අධික පොලියක් ගෙවීමට සිදු වී තිබෙනවා. ඉඩමේ භුක්තිය සම්බන්ධ ගැටලු රැසකට මුහුණ දීමට සිදුවන නිසා විවිධ හේතූන් මත අස්වැන්නේ ප්‍රමාණය වෙනස් වීම මත ණය ගෙවා ගැනීමට නොහැකිව අසරණ වෙනවා. අවසානයේදී ඉඩමත්, ආදායමත් දෙකම අහිමි වී යනවා.

ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ නියමු වැඩසටහන සඳහා තෝරාගන්නා ගොවීන් ප්‍රමාණය හා ඔවුන්ගේ විස්තර ගැනීම වගේම, ක්‍රියාත්මක කිරීමත් කමිටුවක් හරහා සිදු කිරීමට අප යෝජනා කරනවා. ඒ අනුව එම කමිටුවේ වාර්තාව මැයි මස 15 වැනි දින ලබා දීමට සැලසුම් කර තිබෙනවා.

# මධ්‍යම අධිවේගයේ මීරිගම - පොතුහැර ඉදිකිරීම් 90%ක් අවසන්

## යහපාලන ඇමැතිගේ සමාගමේ වැඩ පමණක් තාමත් ඉබි ගමනේ

● ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

**ක්‍රිසන්ති විතාරණ**

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ දෙවනි අදියරේ මීරිගම සිට පොතුහැර දක්වා ඉදිකිරීම් 90%ක් අවසන් නමුත් යහපාලන ආණ්ඩුවේ කැබිනට් අමාත්‍යවරයකුට අයත් ඉදිකිරීම් සමාගමට අයත් කොටසේ ඉදිකිරීම් තවමත් ඉබිගමනේ බව මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසීය.

එම කොන්ත්‍රාත් සමාගමේ ඉදිකිරීම්වල මන්දගාමීත්වය නිසා එහි පලවිපාක අද ජනතාවට අත්විඳින්න සිදු වී ඇති බවද අමාත්‍යවරයා සඳහන් කළේය.

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ මීරිගම සිට පොතුහැර දක්වා වූ කොටසේ ඉදිකිරීම්වල ප්‍රගතිය සොයා බැලීමේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූ මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මේ බව අනාවරණය කළේය.



මෙහිදී ඉදිකිරීම්වල වත්මන් තත්ත්වය පිළිබඳ ව්‍යාපෘති භාර නිලධාරීන්ගෙන් කරුණු විමසූ අමාත්‍යවරයා ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස ඔවුන්ට උපදෙස් දුන්නේය.

ඉන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් අමාත්‍යවරයා මෙසේද කීවේය.

මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට පොතුහැර දක්වා කොටසේ වැඩ කටයුතු අප ඉක්මනින් ඉවර කරන්න බලාපොරොත්තු වනවා. දැන් මේ අදියරේ ඉදිකිරීම්වල විශාල ප්‍රගතියක් තියෙනවා. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ මීරිගම සිට පොතුහැර දක්වා වූ කොටසේ ඉදිකිරීම් බලාපොරොත්තු වූ දිනට අවසන් කිරීමට නොහැකි වුයේ පසුගිය යහපාලන ආණ්ඩු සමයේ රජයේ කැබිනට් අමාත්‍යවරයකුට අයත් ඉදිකිරීම් සමාගමකට ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ලබා දුන් නිසයි. එම කොන්ත්‍රාත් සමාගමේ ඉදිකිරීම්වල මන්දගාමීත්වය නිසා එහි පලවිපාක අද ජනතාවට අත්විඳින්න සිදු වෙලා. පසුගිය අවුරුදු පහ ඇතුළත ඔවුන් වැඩ කටයුතු කළේ ඒ ආකාරයටමයි. සෑම සංවර්ධන ව්‍යාපෘතියක්ම භාර දුන්නේ ඔවුන්ගේ හිතවතුන්ටයි. ඒ නිසා තමයි ජනතාව ඔවුන්ව පරාජයට පත් කළේ. මුඩුබිමක් බවට පත් කළ රටක් සංවර්ධනය කරා අරගෙන යනවා කියා අප කිවුවා. මුඩු බිමක්ව තිබූ රට වැඩබිමක් බවට පත් කළා. අද මුළු ලංකාවම සංවර්ධනය වෙමින් තියෙනවා.

පාරවල් වගේම වැව් පන්දහක් අප හදනවා. ඒ වගේම විවිධ ව්‍යාපෘති ගණනාවක් අද මේ කොවිඩ් අර්බුදය පවතිද්දීත්, ඒවගේම ලෝකයේ ආර්ථිකය හෙලවී තිබියදීත් අප කරගෙන යනවා. පසුගිය අවුරුදු පහ ඇතුළත ප්‍රශ්න නැතුව තිබියදීත් ඔවුන්ට මේ රට සංවර්ධනය කරා මෙහෙයවන්න බැරි වුණා. කෝවිඩ් අර්බුදය තිබියදීත් අප මනා ලෙස එය කළමනාකරණය කර ගනිමින් රට දැවැන්ත සංවර්ධනයක් කරා අරගෙන යනවා. ජනාධිපතිතුමා ඇතුළු රජය, රාජ්‍ය නිලධාරීන් සමඟ එකතු වී අපේ රට සංවර්ධනය කරා මෙහෙයවනවා.

කොතරම් බාධා ආවත්, ප්‍රශ්න ආවත්, නොයෙක් මඩ ප්‍රචාර අරගෙන ගියත් ඒ කිසි දේකට සැලෙන්නේ නැතුව අප මේ රට මෙහෙයවනවා. සංවර්ධනය කරා රැගෙන යනවා.

මෙම අවස්ථාවට මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවැනි අදියරේ ව්‍යාපෘති අධ්‍යක්ෂ කෙහෙල්ඇල්ල මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# රජය කොවිඩ් පාලනයට කඩිනම් තීන්දු තීරණ ගන්නවා

● පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක

**වී. කේ. මහින්ද**
**වැලිගම සමූහ**



කොවිඩ් පාලනය කළ හැක්කේ රට වසා දැමීමෙන් නොව, පවතින අවස්ථා හඳුනා ගනිමින් විදිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් බව මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක මහතා පැවසීය. රජය කොවිඩ් පාලනයට කඩිනම් තීන්දු තීරණ ගන්නා බවද හෙතෙම කීවේය.

දීර්ඝ කාලයක් වසා දමා තිබූ වැලිගම, කොහුණුගමුව ප්‍රදේශයේ අත්කම් සහ පේෂකර්ම මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කර ජනතා අයිතියට පත් කිරීම වෙනුවෙන් පැවති ජනහමුවට එක් වෙමින් මන්ත්‍රීවරයා මෙසේ පැවසීය.

වැඩි දුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා- එක් එක් පුද්ගලයාට විවිධ මත තිබෙන්න පුළුවන්. නමුත් පසුගිය කාලය තුළ රට වසා දැමීමෙන් නැවත යථා තත්ත්වයට පත් කරන්න ගත් අපහසුතාව අප දැක්කා. පසුගිය අප්‍රේල් මාසයට කලින් යම් පාලනයක් සිදු වුණා. සංචරණ සීමා ඉවත් වීමත් සමඟ නැවත පැතිරෙන්න පටන් ගත්තා. රට සම්පූර්ණයෙන් වැසීමෙන් කොවිඩ් ව්‍යවසනයට ස්ථිර විසඳුමක් දිය නොහැකියි. හඳුනා ගත් ප්‍රදේශ පමණක් වැසිය යුතුයි. අපේ ගමන් බිමන් සීමා කළ යුතුයි. පාලනය කිරීමට අවශ්‍ය සහාය ජනතාව ලබා දිය යුතුයි.

දෙවන වටයේ එන්නත් කිරීම දැන් ආරම්භ කරලා. කොවිඩ් ව්‍යවසනයේ ඉදිරිපෙළ සිටින සෞඛ්‍ය අංශයේ නිලධාරීන්ට මේ වන විට දී තිබෙනවා. රටක් ලෙස ආර්ථිකය ගොඩනැඟීමට අවශ්‍ය වැඩපිළිවෙළ ආරම්භ කර තිබෙනවා. කොරෝනා සමඟ දේශීය ආර්ථිකය පිළිබඳ විශ්වාසයක් ගොඩනැගී තිබෙනවා.

රසායනික පොහොර සම්පූර්ණයෙන් නතර කර, කාබනික පොහොර මගින් වගා කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කර තිබෙනවා.

රජයක් ලෙස කොරෝනා තත්ත්වයට මුහුණ දෙන්න අප සූදානම්. අවශ්‍ය අවස්ථාවන්හිදී තීන්දු ගත්තා. අපට ලොකු අර්බුදයක් නැහැ. ලෝකයේ මේ ව්‍යවසනය කොතරම් කාලයක් පවතීද යන්න කාටවත් කිව නොහැකියි. එන්නත්කරණය මීට ඇති හොඳම විසඳුමයි. එය සියලු පුරවැසියන්ට ලබාදීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා.

# රජය බලයට ඇවිත් මාස 15යි අක්කර 62,000ක වනය විනාශ කරලා

● පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක් අබේසිංහ

**ඉබ්බාගමුව සමූහ**
**කුමාරි දිසානායක**



මේ රජය බලයට පත් වී මාස 15ක් යද්දි ස්ථාන 270ක අක්කර 62,000ක වනය විනාශ කළා. දැන් වන විනාශය ගැන කවුරුත් කතා කරන්නේ නැතැයි කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක් අබේසිංහ මහතා පැවසීය.

අබේසිංහ මහතා මේ අදහස් පළ කළේ පෙරේදා (2) කුරුණෑගල පැවැති මාධ්‍ය හමුවකදීය. මෙහිදී තව දුරටත් අදහස් දැක්වූ අශෝක් අබේසිංහ මහතා මෙසේ මෙසේද කීය .

රජය බලයට පත් වී මාස 15කදී ස්ථාන 270ක අක්කර 62,000ක වනය විනාශ කළා. දැන් වැලි කපන එක ගැන කතා කරන්නේ නෑ. පස් කපන එක ගැන කතා නෑ. වන විනාශය ගැනත් කතා නෑ. ඒ වගේම සීනි මගඩිය, විෂකාරක පොල්තෙල් ගැන කතා නෑ. ඒ ඔක්කොම අමතක වෙලා. දැන් කොවිඩ් ප්‍රශ්නය එළියට ඇවිත්. ඊට මුවා වී රටේ භෞමික අඛණ්ඩතාවට නීතියට පටහැණි වරාය නගරය පනත සම්මත කරගන්න යනවා.

පාර්ලිමේන්තුවේදී 5 වැනිදා උදේ ඉඳන් රෑ 8 වන තුරු විවාදය තියන්න හදනවා. ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් 21ක් ගියා. මේ රටේ නීතිඥ සංගමයත් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ඒකට හේතුව මෙම පනත මේ රටේ මූලික නීතියට පටහැණි නිසායි. එක දවසකින් මේක කරන්න පුළුවන්ද? දැන් සිතියම වෙනස්. අක්කර 1115ක් වැඩියෙන් ඇවිල්ලා. ඒක ගොඩ කරන්න චීනයෙන් ඩොලර් බිලියන 1.4ක් දී තිබෙනවා. ඉතින් චීනය නිකම් ඉදීද? ලංකාවේ බලපවත්වන මුදල් නීති 14ක් මේ තුළ ක්‍රියාත්මක කරන්න බෑ. නාගරික සංවර්ධන පනත් 7ක් මේ නගරය තුළ ක්‍රියාත්මක කරන්න බෑ. මේ භූමියෙන් 43%ක් චීනෙට අයිතියි. අපේ රජයට අයිති වෙන්නේ 23%යි. අනෙක් කොටස පොදු ස්ථාන. ශ්‍රී ලාංකිකයෙක් මේ නගරය ඇතුළට ගිහින් එළියට එද්දි බදු අය කරනවා.

# කඳුකර - උතුරු- නැඟෙනහිර ජනතාවගේ ගැටලු ගැන බලන්න

● පාර්ලිමේන්තු මන්ත්‍රී රාධක්‍රිෂ්ණන් තමිල්නාඩු නව මහ ඇමතිට කියයි

**මස්කෙළිය සමූහ**
**ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක**

කඳුකර හා උතුරු නැඟෙණහිර ජනතාවගේ ගැටලු කෙරෙහි අවධානය යොමු කරන ලෙස කඳුරට ජනතා පෙරමුණේ නායක හා නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වේළුසාමි රාධක්‍රිෂ්ණන් මහතා තමිල්නාඩු ප්‍රාන්තයේ මෙවර මැතිවරණයෙන් තේරී පත් වූ ප්‍රධාන අමාත්‍ය එම්.කේ. ස්ටාලින් මහතාට සුබ පතමින් ඉල්ලා සිටී.

වේළුසාමි රාධාක්‍රිෂ්ණන් මහතා තමිල්නාඩු අභිනව ප්‍රධාන අමාත්‍යවරයා වෙත යැවූ සුබ පැතුම් පණිවිඩයේ වැඩි දුරටත් මෙසේ සඳහන් වේ.

ශ්‍රී ලංකා ඉන්දීය ධීවරයන්ගේ ගැටලුව පිළිබඳ ඔබතුමා දීර්ඝ කාලයක් හොඳින් දන්නා බැවින්, අපගේ ශ්‍රී ලාංකික ධීවරයන්ට හානියක් නොවන විසඳුමක් සෙවීමේ අවශ්‍යතාව පවතී. වසර 10ක අඛණ්ඩ අරගලයකින් පසු තමිල්නාඩුවේ බලය ලබා ගැනීමට ඩී.එම්.කේ. පක්ෂයට මෙවර හැකි වුණා. ශ්‍රී ලංකාවේ කඳුකරයේ හා සමස්ත ශ්‍රීලාංකික ජනතාව වෙනුවෙන් මාගේ සුබ පැතුම් මේ සමඟ පිරිනමනවා. ඔබගේ පියා තමිල්නාඩුවේ ජනතාවට පමණක් නොව ලෝකයේ සියලුම ද්‍රවිඩයන්ට නායකත්වය ලබා දුන්නා. ඔබත් පියතුමා ගිය ගමන් මගේම තම දේශපාලන කටයුතුවල නිරත වෙයි කියා අපේ විශ්වාසය පවතිනවා.

අද ද්‍රවිඩ සරණාගතයන් විවිධ නීතිමය ගැටලුවලට මුහුණ දී සිටී. අප ඔවුන්ගේ නීතිමය කටයුතු වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු අතර, ඉන්දීය මධ්‍යම රජය සමඟ සාකච්ඡා කර විසඳුමක් සෙවීමට ඉදිරිපත් විය යුතුයි. බොහෝ අභියෝග මැද ඔබ පෙරමුණ ගත යුතුයි.



## අසරණ ගොවියා කබලෙන් ළිපට නොදමා

# අස්වනු මිල දී ගැනීමට ශක්තිමත් වැඩපිළිවෙළක් සැකසිය යුතුයි

● පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර

**අමිල ප්‍රභාත් වනසිංහ**
**අනුරාධපුර අතිරේක**



අන්ත අසරණ වී සිටින ගොවි ජනතාව කබලෙන් ළිපට නොදමා ඔවුන්ගේ අස්වනු මිල දී ගැනීමට ශක්තිමත් වැඩපිළිවෙළක් සැකසිය යුතු බව සජබ අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර මහතා පැවසීය.

ගොවියා මුහුණ පා සිටින අස්වනු අලෙවි කර ගැනීමේ හා පොහොර ලබා ගනේමේ ගැටලු පිළිබඳ මාධ්‍ය වෙත අදහස් දක්වමින් මේ බව කියා සිටි මන්ත්‍රීවරයා වැඩි දුරටත් මෙසේද පැවසීය.

ආණ්ඩුව හැමවෙලේම අනාගන්නවා. නිසි ක්‍රමවේදයක් නෑ. විශේෂයෙන් සිස්ටම් චේන්ජ් කරන්න කියායි ආවේ. ඒත් එහෙම කිසිදු දෙයක් දකින්න නෑ. අතීසාරයට අමුඩ ගහනවා වගේ මොකක් හරි ප්‍රශ්නයක් ඇතිවන විට ඒ මොහොතට උත්තරයක් දෙනවා. අද වනවිට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය දින දාහතරකට වහලා. ඒ දින ගණනින් නතර වෙයිද කියා අපට සැකයයි.

අද ගොවියයා පලදාව නෙළන්නේ නෑ. ඒවා ගස්වලම ඉදෙන්න හැර තිබෙනවා. ඒ නිසා ගොවිජනතාව දැඩි ලෙස අසරණ වී තිබෙනවා.


එදා ජනාධිපතිවරණයේදී අනුරාධපුර පැවති ජන හමුවේදී ගොවි ජනතාවට නොමිලේ පොහොර ලබා දෙනවා කීවා. එදා පොහොර නොමිලේ ලබා දෙනවා කියා බොරු කතන්දරයක් මවා ජනතාවගේ ඡන්දය අරගෙන, අවසානයේදි ජනතාවට සල්ලිවලටවත් පොහොර දෙන්න බැරි වෙලා. දැන් එකවරම කාබනික පොහොර මතක් වෙලා. කොහොමද කාබනික පොහොරි නිෂ්පාදනය වැඩි කරන්නේ.

පොහොර ගෙන්නනවාට වඩා වගා කලාම එහි අස්වැන්න අඩුවුණොත් වන්දි මුදලක් දෙන එක ලාභයි කියා ආණ්ඩුව කියනවා. ඇයි එහෙනම් ගොවියා මහන්සි කරවන්නේ. එහෙනම් දැන්ම වන්දි මුදල් දී ගොවියාට වගා නොකර ඉන්න කියන්න. වගා නොකර හිටියොත් පුළුවන්ද දේශීය නිෂ්පාදන වැඩි කරන්න.

මූලික පොහොර නෑ. ගොවියා අසරණ වෙලා. ගොවියා රවට්ටන්න එපා. රසායනික පොහොරවලින් ඉවත් විය යුත්තේ ක්‍රමානු කූලවයි. ඊට පෙර රටට අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදනය කරන්න ක්‍රමවේදයක් සැකසිය යුතුයි.

# රාජ්‍ය සේවය පිරිහීමට හේතුව දේශපාලන මැදිහත් වීමයි

● දෙමළ ජනතා සන්ධානයේ නායක සී.වී. විග්නේස්වරන්



**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**

රාජ්‍ය සේවය පිරිහීමට බල පෑ ප්‍රධානතම හේතුව ඊට දේශපාලනය එකතු වීම හා දේශපාලන බලපෑම් බව දෙමළ ජනතා සන්ධානයේ නායක සී.වී. විග්නේස්වරන් මහතා පැවසීය.

යාපනයේදී ඊයේ (3) පැවති උත්සවයකදී ඔහු මෙසේ පැවසීය.

වැඩි දුරටත් අදහස් දැක්වූ විග්නේස්වරන් මහතා- අතීතයේදී රාජ්‍ය සේවකයා, රාජ්‍ය නිලධාරියා තුළ තිබූ අභිමානය කඩාකප්පල් කර ඔහුව නිවටයකු බවට පත් කළේ දේශපාලකයායි.

රාජ්‍ය සේවයට දේශපාලන බලපෑම් ඇති නොකළ යුතු බව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම සඳහන් වෙනවා. ඒත් පාලන තන්ත්‍රයට පැමිණෙන සෑම දේශපාලනඥයකුම රාජ්‍ය සේවකයාට බලපෑම් ඇති කරනවා. අද රාජ්‍ය සේවය පරිහානියට පත්ව ඇත්තේ මේ කාරණය නිසයි.

උගතුන්, විද්වතුන් මේ රට අතහැර වෙනත් රටවල සේවයට යෑමට ප්‍රධාන හේතුව වී තිබෙන්නෙත් මේ දේශපාලන බලපෑම හා දේශපාලනඥයන්ගේ පළි ගැනීමයි. වහාම මේ රටේ මේ අවාසනාවන්ත තත්ත්වය නතර විය යුතුයි. රාජ්‍ය සේවකයාට අභිමානයක් හා කොන්දක් තබාගෙන සේවය කිරීමට දේශපාලනඥයා අවශ්‍ය පරිසරය සකසා දිය යුතුයි.

මේ රටේ වර්තමාන තත්ත්වය ප්‍රජාතන්ත්‍රවාදයට මරණීය දණ්ඩනයක් වූවද, අධිකරණය, රාජ්‍ය සේවය, අධිකරණය සහ අධිකරණයේ ස්වාධීනත්වය, කොමිෂන් සභාව පත් කිරීම සහ එහි ක්‍රියාකාරකම් සහ රජය එහි වාර්තාව පිළිගැනීම යන කාරණා දෙස බලන විට රජය හා ඊට සම්බන්ධ දේශපාලනඥයන් රටේ සෑම ක්ෂේත්‍රයකටම බලපෑම් ඇති කරන බව ඉතා පැහැදිලිවම පෙනෙන්න තිබෙනවා.

# කොවිඩ් සැබෑ තොරතුරු ජනතාවට දෙන්නේ නෑ

● වසන්ත සමරසිංහ

**නදී මාණික්කගේ**

ආණ්ඩුව දැනට පවතින වසංගත තත්ත්වයේ සැබෑ තොරතුරු මහජනතාවට නොදෙන බව ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරකසභික, අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ මහතා පසුගියදා ජවිපෙ ප්‍රධාන පක්ෂ කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදී පැවසීය.

හෙතෙම වැඩි දුරටත් මෙසේද කියා සිටියේය.

හෙට දවසේ වඩා යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා වැඩ කරන ජනතාව සංවිධාන කිරීමේ වඩාත් අභියෝගකාරී කාර්යභාරය මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය ලෙස අප භාරගෙන තිබෙනවා. මේ රටේ ආණ්ඩුව වැඩ කරන පන්තිය ප්‍රමුඛව ජනතාවම අනතුරේ හෙළන ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. සෞඛ්‍ය අංශවල උපදෙස්වලට වඩා වෙනත් අයගේ උපදෙස් මුලට රැගෙන තිබෙනවා. ඒ නිසා වැඩ කරන ජනතාවට අයිතිවාසිකම් හා වරප්‍රසාද වගේම තමන්ගේ ජීවිත ආරක්ෂාකර ගැනීමේ අරගලයකටත් මුහුණදීමට සිදු වී තිබෙනවා.

හෙට දවසේ අප අපේ සටන ඉදිරියට ගෙනියන්නේ කොහොමද කියන අභියෝගයට ඔබ අප සැමදෙනා මුහුණ පා සිටිනවා. වසංගත තත්ත්වයේ සැබෑම තොරතුරු ජනතාවට හෙළි කරන්නේ නැහැ. මේ තත්ත්වය හමුවේ රැකියා අහිමිවීම වැඩි වෙමින් තිබෙනවා. අනික් පැත්තෙන් කම්කරු දිනයේදීත් හාම්පුතුන් තමන්ගේ කර්මාන්ත ශාලාවල සේවකයන් ගෙන් වැඩ ගත්තා. තමන්ගේ ලාබය වෙනුවෙන් මැයි දිනය දවසේත් පෞද්ගලික අංශයේ සේවකයෝ සේවයේ යොදවා තිබෙනවා. වසර 132කට පෙර එදා හේමාකට් කම්කරුවෝ පාරට බැස්සේ අනාගත පරම්පරාවන් වෙනුවෙන්. එදා ලබාගත් පැය අටේ වැඩ දිනය වෙනුවට ධනපති පන්තිය පැය 10ක වැඩ දිනයක් වෙනුවෙන් නීති සංශෝධනය කරන්න කටයුතු කරමින් ඉන්නවා. කාන්තාවන් රාත්‍රියේ සේවයේ යොදවන්න නීති සංශෝධනය කරමින් ඉන්නවා. සමාජය වෙනස්කම්වලට ලක් වෙලා, ප්‍රවාහන පහසුකම් වැඩි වෙලා, හැබැයි කාන්තාවකට, දරුවකුට ආරක්ෂා සහිතව පාරේ යන්න පුළුවන්ද කියන අනතුර තිබෙනවා.



### අභයාරාමය ආණ්ඩුවට විරුද්ධයි කියා සමහරු හීන දකිනවා

# අප පිහිටුවා ගත් ආණ්ඩුව විනාශ වන්න ඉඩ තබන්නේ නෑ

● නාරාහේන්පිට අභයාරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි

**මහින්ද අලුත්ගෙදර**

අභයාරාමය දැන් ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන බවට සමහරු හීන දැක්කත්, කැපවීමෙන් අප පිහිටවූ ආණ්ඩුව විනාශ වීමට ඉඩ නොතබන බව නාරාහේන්පිට අභයාරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමියෝ පැවැසූහ.

රට ඉදිරියට ගෙන යාමට ආණ්ඩුවට හරි වැරදි පෙන්වා දෙන්න ඇතැම් විට තදින් කතා කරන්න සිදු වන බවද උන්වහන්සේ කීහ.

ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා 1987 වර්ෂයේ දී මැයි දිනය තහනම් කිරීමට එරෙහිව අභයාරාමයේ පැවැති මැයි දින රැලියට සහභාගී වූ තරුණයන් දෙදෙනකු ඝාතනය වීම සිහිපත් කරමින් ඔවුනට පින් අනුමෝදන් කිරීම සඳහා මෙවර මැයි දිනයදා අභයාරාම විහාරයේ දී පැවැති විශේෂ බෝධි පූජාවකට සම්බන්ධ වෙමින් උන්වහන්සේ මේ බව සඳහන් කළහ.

ලෝක කම්කරු දිනය සමරන බොහෝ දේශපාලනඥයන්ට හා දේශපාලන පක්ෂවලට අධිරාජ්‍යවාදී ධනවාදයට යට නොවී මෙරට වැඩ කරන ජනතාව වෙනුවෙන් ජීවිත පූජා කළ සහෝදරයන් අමතක වීම කනගාටුවට කරුණක් බව උන්වහන්සේ කීහ.

අද අපට මැයි දිනය සමරන්න බැරිව තිබෙන්නේ වසංගත තත්ත්වයක් නිසායි. නමුත් එදා ඒකාධිපති බලය පාවිච්චි කරමින් ජේ.ආර්ලා වැඩ කරන ජනතාවගේ අයිතිය උදුර ගන්න හැදුවා. එදත් ඊට එරෙහිව බොරැළුගොඩ සිංහ පරපුරේ දිනේෂ් ගුණවර්ධනලා ජනතාව සමඟ පාරට බැස්සා. රට ජාතිය ගැන කැක්කුමක් ඇතිව අවංකව කටයුතු කළ, දේශපාලනයෙන් හම්බ කර නොගත් යමෙක් ඉන්නවා නම් ඒ බොරළුගොඩ පරපුර විතරයි කියා නිර්භයව කියන්න පුළුවන්. එදා 1987 දී වැඩ කරන ජනතාව වෙනුවෙන් දිවිපිදූ කිත්සිරිමෙවන් රණවක හා ආනන්ද කිරිබත්ගොඩ සහෝදරයෝ සිහිපත් කර හැම අවුරුද්දකම මහජන එක්සත් පෙරමුණ අභයාරාමයේ දී පින්කමක් කරනවා. මෙය අනෙක් දේශපාලන පක්ෂවලටත් ආදර්ශයක්.



## එජාප පාලන කාලවලදී වැඩ කරන ජනතාවගේ අයිතීන් කප්පාදු කළා

● ඇමැති දිනේෂ් ගුණවර්ධන

මේ මොහොත වෙනකොට අපේ රටත් ජනතාවත් අන්ත අසරණ තත්ත්වකට පත්ව තිබෙනවා. මේ තත්ත්වය ගැන වත්මන් රජය දක්වන ප්‍රතිචාර පිළිබඳ සතුටු වන්න බැහැ.

අපේ බොහෝ දේශපාලනඥයන්ට මුල අමතක වෙලා. වැඩ කරන ජනතාවට අයිතිවාසිකම් දෙන්න කතා කළාට එදා ඒ අයිතින් දිනා ගැනීමට ජීවිත පූජා කළ අය අපේ නායකයන්ට මතක නෑ. එහෙම වේලාවක මහජන එක්සත් පෙරමුණට නායකත්වය දෙන වත්මන් විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන ඇතුළු පිරිස එක්ව කම්කරු පන්තිය වෙනුවෙන් දිවිපිදූවන් සිහිකර ආගමික වතාවත් ඉටුකිරීම ගැන සතුටු වනවා.

**මහජන එක්සත් පෙරමුණේ නායක විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා** - මේ රටේ හැමදාම එජාප පාලන කාලවලදී වැඩ කරන ජනතාවගේ අයිතීන් කප්පාදු කිරීමට පියවර ගෙන තිබෙනවා. 1987 දී ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා මෙරට මැයි දින සැමරුම තහනම් කළා. ලෝකයේ කම්කරුවන්ට තම අයිතින් දිනාගන්න, ඒ පිළිබඳ පාරට බැස කතා කරන්න තියෙන දවසට බාධා කරන එක ප්‍රජාතන්ත්‍රවාදී නෑ. ඒ නිසා එදා අප අපේ අභයාරාමයේ නායක හාමුදුරුවෝ එක්ක එකතු වී ඒකාධිපති ආණ්ඩුවේ මර්දනයට එරෙහිව මැයි දින සැමරුම අභයාරාම මේ පන්සලේදී සිදු කළා. ඒකට පොලිසිය යොදා අපට හිරිහැර කළා. ඒ හිරිහැරයට ගොදුරුව පොලිස් වෙඩි පහරින් අපේ සහෝදරයන් දෙන්නෙක් මියගියා. ඔවුන් ජීවිත පූජා කළේ අප වෙනුවෙන්. වැඩ කරන ජනතාව වෙනුවෙන්. ඒ නිසා අප ඔවුන් අමතක කරන්න හොඳ නැ.

මෙවර කොවිඩ් වසංගය නිසා මැයි දිනය අප සැලසුම් කළ ආකාරයට සමරන්න නොහැකි වුණත් අප වෙනුවෙන් දිවි පිදූ ඒ ආදරණීයයන්ට පින් අනුමෝදන් කර ඔවුන් සිහිපත් කරන එක අපේ යුතුකමක් හා වගකීමක්.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මෙන්ම, අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු අපේ රජය මෙරට වැඩ කරන ජනතාව වෙනුවෙන් සුබසාධන වැඩ රැසක් ක්‍රියාත්මක කරන්න සූදානම් කර තිබෙනවා.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණී ගුණවර්ධන හා අගමැති දේශපාලන කටයුතු සම්බන්ධීකරණ ලේකම් කුමාරසිරි හෙට්ටිගේ මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

## ද්විපාර්ශ්වීය සබඳතා තරකර ගන්න උස්බෙකිස්තානය සමඟ සාකච්ඡා



**මහින්ද අලුත්ගෙදර**

දෙරටේ ද්විපාර්ශ්වීය සබඳතා ගොඩනගන්න ශ්‍රී ලංකාව සහ උස්බෙකිස්තානය අතර ඉහළ පෙළේ සාකච්ඡා ආරම්භ කර තිබේ.

උස්බෙකිස්තානය හා ශ්‍රී ලංකාව අතර සංචාරක කර්මාන්තය පුළුල් කිරීමට මෙන්ම සංස්කෘතික හා ආගමික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින හැකියාව පිළිබඳ රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති මහාචාර්ය එම්.ඩී. ලමාවංශ මහතා හා තානාපති කාර්යාලයීය නිලධාරීන් උස්බෙකිස්තාන් රජය සමඟ ඉහළ පෙළේ සාකච්ඡා වට කීපයක් පවත්වා තිබෙන බව විදේශ කටයුතු අමාත්‍යාංශය පැවසීය.

මේ අනුව තානාපති මහාචාර්ය ලමාවංශ මහතා උස්බෙකිස්තාන් ජනරජයේ නියෝජ්‍ය විදේශ ඇමැති සිඩිකොව් ෆුර්කාට් මහතා සමඟ ඵලදායී සාකච්ඡාවක් පවත්වා තිබෙන අතර, මෙම සංවාදයේ දී ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳ මාතෘකා - උස්බෙකිස්තානය සමඟ පවතින මිත්‍රත්වය පිළිබඳ ද්විපාර්ශ්වික හා අන්තර්ජාතික තලයේ සබඳතා සහ දෙරට අතර අන්තර් ක්‍රියාකාරිත්වය ශක්තිමත් කළහැකි ක්ෂේත්‍ර පිළිබඳ සලකා බලා ඇත.

මෙම රැස්වීමට උස්බෙකිස්ථාන් පාර්ශවයෙන්, විදේශ අමාත්‍යාංශයේ දකුණු ආසියාව, මැදපෙරදිග හා අප්‍රිකාව යන රටවල් අධීක්ෂණය කරන ප්‍රධානී එෂොනොව්, දකුණු ආසියා අංශයේ ප්‍රධානී බී. ෂරිපොව් සහ තානාපති කාර්යාල පාර්ශවයෙන් පළමු ලේකම් නිරෝෂා හේරත් සහ තානාපතිවරයාගේ පෞද්ගලික සහායක ඔලෙස්යා රොමානෝවා මහත්ම මහත්මීහු එක් වූහ.

## මුහුද අපවිත්‍ර කරන යාත්‍රාවලට මින් පසු බලපත් නෑ

● රාජ්‍ය ඇමැති කංචන විජේසේකර



**ජයසිරි පේදුරුආරච්චි ගන්දර සමූහ**

සෞඛ්‍ය නිර්දේශ ක්‍රියාත්මක නොකරන, මුහුද අපවිත්‍ර කරන යාත්‍රාවල පිරිස්වලට නීතිය තදින් ක්‍රියාත්මක කරන බවත්, මුහුදු පරිසර පද්ධතියට හානි කරන යාත්‍රාවලට ගමන් බලපත්‍ර නිකුත් නොකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බවත් ධීවර රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහතා පැවසීය.

නව ඉදිකිරීම් සිදුවන ගන්දර ධීවර වරායේ හා මිරිස්ස ධීවර වරායේ කටයුතු නිරීක්ෂණය කිරීමට පසුගියදා (2) එක්වෙමින් අමාත්‍යවරයා මේ බව පැවසීය.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍යවරයා මෙසේ ද පැවසීය.

ධීවර වරායන් තුළින් රටේ ආර්ථික සංවර්ධනයටත් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමටත් ඉහළ දායකත්වයක් ලැබෙනවා. ඒ ධීවරයන් නෙළා ගන්නා මත්ස්‍ය සම්පත හරහායි. කෙතරම් සේවාවක් වුණත් මේ මොහොතේ අප සියලු දෙනාම කොරෝනා සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍යයි. ඒ වාගේම ධීවරයාගේ මත්ස්‍ය සම්පත අලෙවිකර ගැනීමේ හැකියාව තිබෙනවාද යන්නත් අප සොයා බැලිය යුතුව තිබෙනවා.

නාවික හමුදාවෙන් අපේ ධීවර වරායන් සඳහා ලැබෙන සහාය ඉතා ඉහළයි. නාවික හමුදාවේ සහය ඉදිරි කාලයේදී ආරක්ෂාවට පමණක් නොව සෞඛ්‍ය නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් ලබා ගන්නවා.

මත්ස්‍ය තොග විකිණීමේදී මුළු ජැටියම පාවිච්චි කිරීමටත්, පැමිණෙන පිරිස සීමා කරන්නත්, මත්ස්‍ය තොග ගෙනියන ලොරි රථ හැර අනෙකුත් පෞද්ගලික වාහන සියල්ල වරාය භූමියෙන් එළියේ ඇති රථ ගාලේ නැවැත්වීමටත් අවශ්‍ය පියවර ගන්නවා. මුහුදු ගොස් එන යාත්‍රාවල පැමිණෙන පිරිස ගැන සොයා බැලීමට හා ඒ පිරිස් සෞඛ්‍ය උපදෙස් අනුව ක්‍රියා කරන ආකාරය පිළිබඳත් අවධානය යොමු කළා.

## සියලු ගංගාවලට සංරක්ෂිත කලාපයක් නම් කරන්න

● ඇමැති අමරවීරගෙන් පරිසර අධිකාරියට උපදෙස්

පරිසර අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන 'සුරකිමු ගංගා' වැඩපිළිවෙළ යටතේ සියලු ගංගාවලට සංරක්ෂිත කලාප නම් කරන ලෙස පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා මධ්‍යම පරිසර අධිකාරියට උපදෙස් දී තිබේ.

මෙරට ගංගා පද්ධතිය තුළ ඇති ගංගා 103න් බහුතරයක් මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වන අතර, ඉතිරි ඒවා විවිධ ප්‍රදේශවලින් ආරම්භ වෙයි. එහෙත් මෙම ගංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා මෙතෙක් ගංගා සංරක්ෂිත කලාප නම් කිරීමක් සිදු වී නැත.

පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතාගේ උපදෙස් පරිදි මධ්‍යම පරිසර අධිකාරිය සියලුම ගංගා ආශ්‍රිතව තොරතුරු එක් රැස් කළ අතර, ඒ අනුව පෙනී යන්නේ විවිධ පුද්ගලයන් ගංගා ද්‍රෝණි විනාශ කිරීමේ නීති විරෝධී කටයුතුවල යෙදෙන බවයි. මේ සම්බන්ධව ක්‍රියාත්මක වන ස්ථාන වීඩියෝ ගත කර ඇති අතර, ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන පමණක් 10,700කට වඩා ඇති බව මධ්‍යම පරිසර අධිකාරිය නිරීක්ෂණය කර තිබේ.

එමෙන්ම මෙතෙක් කිසිදු ගංගාවකට ගංගා සංරක්ෂිත කලාප නම් කර නොමැතිවීම නිසා විවිධ පුද්ගලයන් නිවාස, ව්‍යාපාරික ස්ථාන, හා වගාව සඳහා ගංගා සමීපයේ වූ ඉඩම් අත්පත් කර ගෙන සිටින බවද තහවුරු වී තිබේ. මේ නිසා ගංගා ඉවුරු දැඩි හානියට පත්ව ඇති අතර, විශාල ජල ප්‍රමාණයක් ගලා එන අවස්ථාවල ඉවුරු කැඩී බිඳී ගොස් මහජන ජීවිත මෙන්ම දේපළවලට ද හානි පැමිණෙන අවස්ථා වැඩිවෙමින් පවතින බව අනාවරණය විය.

මෙම තත්ත්වය සම්බන්ධයෙන් දැඩිව අවධානය යොමු කරන ලෙස පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා මධ්‍යම පරිසර අධිකාරියට උපදෙස් දී තිබේ.

දැනට ගංඉවුරු ආශ්‍රිතව ඇති ඉඩම් අල්ලාගෙන සිටින පිරිස් ඉන් ඉවත් කිරීමටත්, ගංගාවක සිට අඩු තරමින් මීටර් 150ක් වත් යන තෙක් කිසිදු ඉදි කිරීමක් හෝ වගාවන් සඳහා යොදා ගැනීමට ඉඩ නොදෙන ලෙසත්, එවැනි ඉඩම් ගංගා සංරක්ෂිත කලාපය ලෙස නම් කර ගංගාවල සුරක්ෂිතභාවය සඳහා පවරා ගැනීමට පියවර ගන්නා බවත් අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවසීය. එමෙන්ම ගංගාධාරවල පදිංචිව සිටින පුද්ගලයන් විකල්ප ස්ථානවල පදිංචි කරවීමට පියවර ගන්නා බව ඇමැතිවරයා කීවේය.

අප රටේ ගංගා ද්‍රෝණිවල විශාලත්වය වර්ග කි. මී. 10 සිට 10,000 දක්වා වේ. මෙම ගංගා පද්ධතියට අමතරව විශාල දිය උල්පත් පද්ධතියක් ද අප රට සතුව පවතී. නුවරඑළියේ ජල උල්පත් 1544ක් ද, මහනුවර 204ක්ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 19ක්ද, මොනරාගල 210ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ 2ක්ද හඳුනාගෙන තිබේ. මෙම ජල උල්පත් ආරක්ෂා කර ගැනීම සඳහා ද සංරක්ෂිත කලාප නම් කිරීම අවශ්‍ය බව අමාත්‍යවරයා පැවසීය.

## පෞද්ගලික සුව සේවකයන්ගේ අධ්‍යාපනය - පුහුණුව ඉහළ නැංවිය යුතුයි

● පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය



**මහින්ද අලුත්ගෙදර**

සෞඛ්‍ය සම්පන්න සමාජයක් ගොඩනැඟීම සඳහා පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවක කාර්ය මණ්ඩලයට දෙන අධ්‍යාපනය හා පුහුණුවීම් ඉහළ නැංවීම අවශ්‍ය බව පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය ප්‍රකාශ කරයි.

සාධාරණ, යුක්තිගරුක හා සෞඛ්‍ය සම්පන්න ලෝකයක් උදෙසා පුහුණු කිරීම් හා කුසලතා සංවර්ධනය ඉහළ නැංවීම තුළින් සෞඛ්‍ය සේවකයා සවිබල ගැන්වීමේ සිය කැපවීම මෙහිදී පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය යළි යළිත් අවධාරණය කළේය.

මේ පිළිබඳ අදහස් දැක් වූ පුද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමයේ සභාපති ආචාර්ය ලකිත් පීරිස් මහතා සමාජයේ හා රටේ සිටින සෞඛ්‍ය සේවකයන් ඉටුකරන කාර්යභාරය ඇගයීමටත්, හඳුනා ගැනීමටත් කොවිඩ්-19 වසංගතය අප සියලු දෙනාටම බලකර තිබෙනවා යැයි කීවේය. දැන් අප ඉදිරියේ ඇති අභියෝගය වන්නේ කොවිඩ් වසංගතය හේතුවෙන් මේ වනවිට දැඩි පීඩනයට මුහුණ දෙමින් සිටින පෞද්ගලික අංශයේ සේවය කරන සේවක සේවිකාවන් සවිබල ගැන්වීම හා මෙම ඇගයීම අඛණ්ඩව පවත්වා ගෙන යෑම යැයිද හෙතෙම කීවේය.

## ගොවියා සාම්ප්‍රදායක ගොවිතැනට සමීප කරන වැඩපිළිවෙළක් හඳුන්වා දුන්නා

● ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනී කේෂලා ජයවර්ධන

**ජයසිරි මුණසිංහ**



දිනෙන් දින මෙරටින් ඈත්ව යන දේශීය සාම්ප්‍රදායක ගොවිතැන සඳහා නැවත වතාවක් ගොවිජනතාව සමීප කරවීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව නව වැඩපිළිවෙළක් හඳුන්වා දුන් බව සභාපතිනි කේෂලා ජයවර්ධන මහත්මිය ප්‍රකාශ කළාය.

ඒ අනුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අනුබද්ධ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව හරහා දේශීය සාම්ප්‍රදායක ගොවිතැනෙහි නිරතව සිටින පිරිසට වගා ණය ලබාදීමට පියවර ගෙන ඇත. ඊට අමතරව ඔවුන්ගේ කුරහන්, බඩඉරිඟු, තල, මුං, කවුපි වැනි බෝග වර්ග වැඩි මිලට මිලදී ගැනීමට ව්‍යාපාරික ප්‍රජාව යොමුකර තිබේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ජාතික වැඩපිළිවෙළ තුළ ආර්ථික අතින් සහ ජීවනෝපාය වශයෙන් සවිමත් වූ ගොවි පිරිසක් බිහිකිරීම ඉලක්ක කර තිබේ. එම ඉලක්කය සපුරා ගැනීමට සාම්ප්‍රදායක දේශීය ගොවිතැනෙහි නියැළි ගොවි ජනතාව පෙළ ගැස්සවීම අරමුණින් නව වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ බව කේෂලා ජයවර්ධන මහත්මිය කීවාය.

ගොවිතැනෙහි දියුණුවට ණය මුදල් අඩු පොලී අනුපාතය යටතේ ලබා දීමට අමතරව ඉස්සන් වගාව, මිරිදිය ධීවර කර්මාන්තය සහ ධීවර කර්මාන්තය නංවාලීමට ණය වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම ස්වයං රැකියා ලාභීන්ගේ ආදායම් වැඩිදියුණු කිරීම සඳහා පහසු ණය ක්‍රම, රූපලාවන්‍ය හා පෙර පාසල් ගුරුභවතුන්ගේ කාර්යයන් පහසු කිරීමට සහ ඔවුන් සිදු කරන අත්කම් භාණ්ඩ නිෂ්පාදන වැනි දේ වැඩිදියුණු කිරීම සඳහා මූලික ප්‍රාග්ධනය ලබාදීමක් ලෙස ණය වැඩසටහන් ද හඳුන්වා දී ඇතැයි සභාපතිනිය සඳහන් කළාය.

## ජාතික පාසල් විදුහල්පතිවරුන්ට දින හතරක වැඩමුළුවක්

**මහින්ද අලුත්ගෙදර**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ගොඩනැගෙන ජාතික පාසල් සඳහා පත් කරන විදුහල්පතිවරුන් අනාගත ජාතික පාසල් පද්ධතියේ නියමුවන් ලෙස බලගැන්වීමට රජය තීරණය කරයි.

ඒ අනුව රට හදන සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සිදු කිරීමට බලාපොරොත්තු වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ගොඩනැගෙන ජාතික පාසල් 1170 අතරින් පාසල් 62ක විදුහල්පතිවරුන් සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුම්වත් කිරීමේ සහ අනාගත ජාතික පාසල් පද්ධතියේ නියමුවන් ලෙස ඔවුන්ව බලගැන්වීමේ දින හතරක වැඩමුළුවක් ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ අධ්‍යාපන නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විණි.


මෙම වැඩමුළුවට සහභාගී කරවාගනු ලැබුයේ දැනට එකම ජාතික පාසලක් හෝ නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 123 අතරින් ඉදිරියේ දී ජාතික පාසල් බවට පත්වන පාසල්වල විදුහල්පතිවරු 62කි.

මෙම ආරම්භක වැඩමුළුව විවෘත කිරීමේ උත්සවය සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන පිළිබඳ රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේමජයන්ත, කාන්තා කටයුතු, ළමා සංවර්ධන, පෙරපාසල් අධ්‍යාපනය, ප්‍රාථමික අධ්‍යාපනය සහ පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා සංවර්ධනය පිළිබඳ රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහත්වරු, අදාළ රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන් වන ආචාර්ය උපාලි ඇම්. සේදර, කේ. එම්. එස්. ඩී. ජයසේකර මහත්ම මහත්මීන් ඇතුළු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිහු සහභාගී වූහ.


# බද්දර මල්ල


සතියේ 'තුන පහ' මඩිස්සලේ


# කල් ඉකුත් නොවන නබොකෝව්ගේ, 'සමානරූපීයා'








## උඩුපෙළ සහ යටිපෙළ

සාහිත්‍ය ලෝකය තුළ, ව්ලදිමීර් නබොකෝව් (Vladimir Nabakov) නම කියූ සැණින්, කාගේත් මතකයට නැංවෙනු ඇත්තේ 'ලොලිටා' (Lolita) නමැති සුප්‍රකට නවකතාවය. නබොකෝව් කෙටිකතාකරුවකු, පරිවර්තකයකු පමණක් නොව කීට විද්‍යාඥයෙක් ද විය. එහෙත් හෙතෙම ජගත් කීර්තියට පත් වූයේ 'ලොලිටා' සමඟිනි.

රුසියාවේ උපත ලද්දකු වුව ද, ව්ලදිමීර් නබොකෝව් පසු කාලයක හැඳින්වුණේ රුසියානු-අමෙරිකානු ගත්කරුවකු වශයෙනි. ධනවත් පවුලක සාමාජිකයකු වූ නබොකෝව්, රුසියානු විප්ලවයෙන් පසු, එරටින් පිට වී ප්‍රංසය, ජර්මනිය වැනි රටවල වෙසෙමින්, පසුව අමෙරිකාවේ පදිංචි වීම එයට හේතු විය. 1977දී ඔහු මිය යන විට වාසය කළේ ස්විට්සර්ලන්තයෙහිය.

'ලොලිටා' නවකතාවට ඉමහත් ප්‍රසිද්ධියක් ලැබීමට හේතු වූයේ, එහි ආන්දෝලනාත්මක තේමාවය. මැදිවියේ පසු වන, සාහිත්‍යය පිළිබඳ මහාචාර්යවරයකු හා දොළොස් හැවිරිදි ගැහැනු ළමයකු අතර ඇති වන අසම්මත ප්‍රේම සබඳතාවක් වටා ලියවුණු 'ලොලිටා' ප්‍රථම වරට ප්‍රකාශයට පත් වූයේ 1955දී පැරිසියේදීය. රුසියානු බසින් මෙන්ම ඉංග්‍රීසියෙන් ද ලිවීමෙහි දක්ෂතාවක් දැක්වූ නබොකෝව් 'ලොලිටා' ලියන්නේ ද ඉංග්‍රීසි බසිනි. පසුව ඔහු විසින්ම එය රුසියානු බසට ද පරිවර්තනය කරන ලදි (නබොකෝව් අමෙරිකාවේ වෙලස්ලි විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයකු වශයෙන් ද, කෝර්නල් සරසවියෙහි රුසියානු භාෂා මහාචාර්යවරයකු වශයෙන් ද සේවය කර ඇත. 1972දී සාහිත්‍ය සඳහා පිරිනැමෙන අමෙරිකානු ජාතික සම්මානය ද නබකෝව්ට හිමි විය.

'ලොලිටා' ගැන බොහෝ දේ ලියවී ඇත. එය මනෝ විශ්ලේෂණාත්මක නවකතාවක් ලෙස ද සැලකේ. බොහෝ දෙනකු එය අගය කළේ අසභ්‍ය විය හැකිව තිබූ, එහෙත් අසභ්‍ය නොවන කතාවක් ලෙසිනි.

'ලොලිටා' නිසා නබොකොව්ට අසාධාරණයක් ද සිදු විය. එනම්: එය ලද කීර්තිය හමුවේ ඔහුගේ අනෙක් නිර්මාණ 'පහළ රාක්කය'ට ඇදවැටීමය. මෑතකදී මට කියවීමට ලැබුණු නබොකෝව්ගේ 'ඩිස්පෙයාර්' (Despair - නිරපේක්ෂාව) ද නවකතාකරුවකු වශයෙන් ඔහුගේ ආකර්ෂණීය ආඛ්‍යාන ශෛලිය සහ පරිකල්පනය විදහා දක්වන ප්‍රබන්ධයකි. පිටු 205කින් යුත් කුඩා නවකතාවක් වන එය, නබොකෝව්ගේ සත්වන කෘතියයි. 1934දී රුසියන් බසින් පළ වන සාහිත්‍ය සඟරාවක කොටස් වශයෙන් මුල් වරට පළ වූ මේ නවකතාව 1936දී ග්‍රන්ථයක් ලෙස ප්‍රකාශ කෙරිණි. 1937දී නබොකෝව් විසින්ම ඉංග්‍රීසියට පරිවර්තනය කෙරුණු 'ඩිස්පෙයාර්' එංගලන්තයේදී ප්‍රකාශයට පත් වුණ ද, ඊට හොඳ ප්‍රතිචාරයක් (අලෙවියක්) නොලැබිණි. ප්‍රකාශකයා වෙත තිබූ පොත්ගොඩ දෙවැනි ලෝක යුද සමයේදී ජර්මන් බෝම්බ ප්‍රහාරයකින් විනාශයට පත් විය. එය නැවත මුද්‍රණය කෙරෙන්නේ 1965දීය.

බ්‍රිතාන්‍ය විචාරකයකු වන මාර්ටින් ඇමිස් 'ඩිස්පෙයාර්' නවකතාව නබොකෝව්ගේ ප්‍රබන්ධ අතුරින් දෙවැනි තැනෙහි තැබුවේය.

මෙහි කතානායකයා (කථකයා ද ඔහුමය) වන හර්මන් කාලෝවිච්, ජර්මන් පෙළපතක් ඇති රුසියානුවෙකි. ඔහු චොක්ලට් නිෂ්පාදකයෙකි. ඔහුගේ බිරිය ලිඩියා, එතරම් සිහිකල්පනාවක් නැති, බොළඳ ගතිපැවතුම් ඇති කාන්තාවකි. ඇයගේ මස්සිනා මෙන්ම කලකට ඉහත පෙම්වතාව ද සිටි ආර්ඩලියොන් ද ඔවුන් සමඟ වෙසෙයි.

හර්මන් ප්‍රාග් නගරයට යන්නේ එහි තිබෙන සමාගමක් සමග එකතුව තම චොක්ලට් බෙදාහැරීමට කටයුතු යොදනු පිණිසය. එහි සිටින කාලයේදී හර්මන්ට, මගවැටී සිටින පුද්ගලයකු අහඹු ලෙස මුණගැසෙයි. ඔහුට දුම්වැටියක් ද පිරිනමන හර්මන් කතාවට වැටෙයි.

ෆීලික්ස් නමැති ඔහු අයාලේ යමින් සිටින රැකියා විරහිත පුද්ගලයෙකි. හර්මන් පුදුමයට පත් කරවන කාරණය වන්නේ, ඔහු ද පෙනුමින් තමාට බෙහෙවින් සමාන වීමය. ෆීලික්ස්, තමාට රැකියාවක් සොයා දෙන මෙන් හර්මන්ගෙන් ඉල්ලීමක් කරයි.

"මට දැනට නම් උදවුවක් කරන්න බෑ... ඒත් මට තමුසෙගෙ එඩ්‍රස් එක දීල තියනවකො" හර්මන් කියයි.

ෆීලික්ස් සරදම් සිනාවක් පෑවේය.

"මට මන්දිරයක් නෑ... මං ඔය කොහේ හරි පිදුරු ගොඩක, බැංකුවක තමයි නිදාගන්නෙ."

"එතකොට මං කොහොමද තමුසෙව හොයාගන්නෙ?"

"මම ලබන ගිම්හාන සෘතුව ගත කරන්නෙ, ගිය අවුරුද්දෙ පොඩි රස්සාවක් කරපු ගමේමයි. මං ඒකෙ තැපැල් කන්තෝරුවේ එඩ්‍රස් එක ලියල දෙන්නං."

ලිපිනය ගත් පසු, ෆීලිකිස්ගෙ තොප්පිය තුළට ක්‍රවුන් දහයේ කාසියක් දමන හර්මන් ඔහුගෙන් සමු ගනී.

ප්‍රාග්හි නවාතැන් ගෙන සිටි හෝටල් කාමරයට ගිය ද, හර්මන් ඉදිරියෙහි මැවෙන්නේ ෆීලික්ස්මය; තමාගේම රූපය ඇති 'ද්විත්ව මිනිසා'ය. එහෙත් මෙවර ඔහු පෙනී සිටින්නේ හොඳින් රැවුළ බෑ අනර්ඝ ඇඳුම් කට්ටලයකින් සැරසී චොක්ලට් සමාගමේ ලාංඡනය සහිත ටයිපටියක් ද පැලඳ ගත් වැදගත් මහත්මයකු ලෙසිනි. ඇත්තෙන්ම ඒ අන් කවරකුවත් නොව, හර්මන්මය. කෙසේ වෙතත් මේ සිද්ධිය රහසක් ලෙස තබා ගැනීමට හර්මන් ඉටා ගනී.

අහඹු ලෙස හමු වූ ද්විත්ව රූපය හර්මන්ගේ ජීවිතයේ ඉතිරි අර්ධය පුරා බලපායි. ව්‍යාපාරික වශයෙන් ද අසාර්ථක වන හර්මන්, ඉන් ගැලවීමට පිළියම් සොයයි. අවසානයේ ඔහු සැලසුම් කරන්නේ තම 'සමානයා' මරා දමා, ඒ තමායැයි ඔප්පු කර, විශාල රක්ෂණ වන්දියක් ගැනීමටය. ඔහු ඒ සඳහා බිරියගේ සහ මස්සිනාගේ ද උපකාරය පතයි.

හර්මන් විසින්ම තම 'සමානයා' තම 'අනෙකා' වෙඩි තබා ඝාතනය කෙරෙයි. එහෙත් ඔහුගේ සැලසුම සාර්ථක නොවෙයි. පොලිසිය හර්මන් පසුපස ලුහුබඳින්නට වෙයි.

මේ නවකතාව අවසන් වන්නේ පාඨකයා බලාපොරොත්තු නොවන ආකාරයේ, කිසියම් විකාරරූපි නො එසේ නම් හාස්‍යජනක ආකාරයකිනි.

හර්මන්, පැරිසියේ හෝටල් කාමරයක සැඟවී සිටී. හෝටලය ඉරිපස සෙනඟ රොක්වී සිටිනු ඔහු කවුළුවෙන් දකී. ඈතින් පොලිස් රථයක් ද පැමිණෙයි.

රැස්ව සිටින පිරිස අමතා කතාවක් පැවැත්වුව හොත් හොඳ යැයි ඔහු කල්පනා කරයි.

"ප්‍රංස වැසියනි, මේක පුහුණු වීමක් පමණයි. තව ටිකකින් ප්‍රසිද්ධ චිත්‍රපට නළුවෙක් මේ හෝටලයෙන් පිටතට එනවා. ඔහු භයානක අපරාධකාරයෙක්. ඔහුට පලා යෑමට අවශ්‍යයි. ඒ සඳහා ඔබ ඉඩ දිය යුතුයි. බාධාවකින් තොරව පොලිස් භටයන්ට පහර දී ඔවුන්ගෙන් ඔහු බේරා ගත යුතුයි. මේක චිත්‍රපටයේ කතාවස්තුවේ කොටසක්. අපි හැමෝටම ගෙවනවා. පොලිස් භටයන්ටත් ගෙවනවා... මේක ජර්මන් සමාගමක නිෂ්පාදනයක්. කරුණා කරලා මගේ දුර්වල ප්‍රංස උච්චාරණයට සමා වෙන්න. මගේ කාර්මික ශිල්පීන් සහ සන්නද්ධ උපදේශකයන් දැනටමත් ඔබ අතර සිටිනවා. කරුණා කරලා මාර්ගය ඉඩ දෙන්න. දැන් මා පිටතට එනවා. ඔබ සැමට ස්තුතියි!"

1978දී සුප්‍රකට ජර්මන් සිනමාවේදි 'රෙයිනර් ෆැස්බින්ඩර්' විසින් මේ නවකතාව චිත්‍රපටයකට නඟන ලදි. එහි තිර නාටකය රචනා කරන ලද්දේ බ්‍රිතාන්‍ය නාට්‍යකරු 'ටොම් ස්ටොපාර්ඩ්' විසිනි.

විචාරකයන්ට අනුව නබොකෝව්ගේ නවකතාව අයත් වන්නේ, දොස්තයෙව්ස්කියානු නවකතා ශෛලියටය. එහි එන හර්මන් ද දොස්තයෙව්ස්කිගේ 'අපරාධය සහ දඬුවම' නවකතාවේ එන රස්කොල්නිකොෆ්ට සමානය. දෙදෙනාම තම ආර්ථික ප්‍රශ්නවලින් ගැලවීමට මිනීමැරුමක් සැලසුම් කරයි.

ඒ හැරුණු විට නබොකෝව්ගේ කෘතිය පුරා ඇලෙක්සැන්ඩර් පුෂ්කින්, නිකොලායි ගොගොල්, ඔස්කාර් වයිල්ඩ්, ඉවාන් තුර්ගිනේව්, ආතර් කොනන් ඩොයිල් ආදීන්ගේ අන්තර්-ග්‍රාන්ථික සබඳතාවක් (Intertextual Connection) දැක ගත හැකිය.

නබකොව්, 'ඩිස්පෙයාර්' ලියන්නේ 'ලොලිටාට' 20 වසරකට පෙරය. එහෙත් ඔහුම කියන ආකාරයට ලොලිටාවේ 'හම්බර්ට්' සහ ඩිස්පෙයාර්හි 'හර්මන්' යනු එකම සිත්තරකු විසින් යුග දෙකකදී අඳින ලද මකරු දෙදෙනෙකි.

30 දශකයේදී පොතේ ප්‍රථම මුද්‍රණය අසාර්ථක වීම ගැන පසුව දුක් වූ නබොකොව් මෙසේ කීය: "එදා මගේ නවකතාව හරියට පැණි කුරුල්ලන් මැද්දට ගිය රයිනෝසිරසයෙක් වගේ..."

ඇත්තෙන්ම නබොකෝව්ගේ 'ඩිස්පෙයාර්' කල් ඉකුත් නොවන නවකතාවකි. එහි කතානායක හර්මන් ලෝකය පුරා ගමන් කරමින් සිටී.

**කපිල කුමාර කාලිංග**

# අපේ ගෙදර







ඔබ වැඩිහිටියකු වුවාට කම් නැත. මොහොතකට ඔබ ද
දරුවකු සේ ඔවුන් අතර රැඳෙන්න.
ඉතා සුළු දේවල් සම්බන්ධයෙන් පවා
ඔවුන්ගේ දෑස්වල පිරී ඇති විස්මය දකින්න;
මනස උතුරා යන කුතූහලය දකින්න.
ඇයි ඒ?
හැම තිස්සේම හැම දෙයක් ගැනම
ඔවුන් සිටින්නේ සතුටින් නිසාය.

**ජීන් පියාජේ (1896-1980)**

කීර්තිමත් මනෝවිද්‍යාඥයකු වූ ස්විස් ජාතික ජීන් පියාජේගේ ඒ කියමන ඇස ගැසීමත් සමග මට දිනේෂ් සිහිපත් විය.

කලකට පෙර දිනේෂ් ගැන මට පැවසුවේ මගේ ගුරු යෙහෙළියකි. එකල ඔහු ඇයගේ සිසු දරුවෙක් වූයේය. ඔහුගේ පියා සිංහලය; මව දෙමළ කාන්තාවක් වූවාය.

දිනේෂ්ගේ පාසල දුප්පත්ය; පාසල තිබූ ගම ද දුප්පත්ය; පාසලට ආ හැම ළමයාම දුප්පත්ය .

පාසලේ පන්ති තිබුණේ පස් වන ශ්‍රේණිය දක්වා පමණකි. මුළු පාසලේම සිටියේ සියයකටත් අඩු ළමයි සංඛ්‍යාවකි.

පිරිමි ළමයි සුදු කමිසය ද නිල් කලිසම ද ඇන්දෝය. ගැහැනු ළමයි සුදු ගවුම් ඇඳගෙන ආවෝය. එහෙත් ඒ සුදු කමිස සහ සුදු ගවුම් බොහෝ විට කහ පැහැයට හුරු විය.

ගවුම්වල, කමිසවල පමණක් නොව සමහරෙක් කලිසම්වල ද හැට්ට කටු නොහොත් ආයා කටු ගසාගෙන සිටියහ (පාසලේ සිටි අනෙක් ගුරුවරිය හා එක්ව මගේ යෙහෙළිය දරුවන්ගේ නිල ඇඳුම්වල කැඩුණු, ගිලිහුණු බොත්තම් වෙනුවට අලුත් බොත්තම් අල්ලන්න දිනයක් යොදාගත් බවක් ද මතක ඇත).

"පරිස්සමින් පද්මා මිස්. මේ ළමයි මහ කට්ට-කයිරාටිකයො. ඕනෑවට වඩා ආදරේ පෙන්නුවම කරේ නගින්න එනව."

එකී පාසලට පත්වීම ලබා ගිය මගේ යෙහෙළියට මුල්ම දවසේ විදුහල්පතිතුමා එසේ පවසා තිබිණි.

"කට්ට-කයිරාටිකයො ද මන්දා සර්... මට නම් පේන්නෙ මේ ඔක්කෝම අන්ත-අහිංසකයො ටිකක් හැටියට." මගේ යෙහෙළිය ඔහුට පිළිතුරු දී තිබුණේ එසේය.

දිනේෂ් උගත්තේ ඉහත කී පාසලේ පස් වන ශ්‍රේණියේය. දිනක් විවේක කාලයෙන් පසු කාල පරිච්ඡේදය ඔවුන්ට වෙන්ව තිබුණේ චිත්‍ර පාඩමටය.

ඒ දිනවල චිත්‍ර පාඩමට ප්‍රායෝගිකව චිත්‍ර ඇන්දා මිසක න්‍යායාත්මක පාඩම් තිබුණේ නැත.

"අද අපි අඳින්න යන්නේ අපි හැම දෙනාම වැඩියෙන්ම කැමැති තැන. කොහේද අපි වඩාත්ම කැමැති තැන?"

ගුරුතුමිය ඇසුවාය.

"ඉස්කෝලෙ."

"පන්සල."

දෙ-තුන් දෙනෙක් කීහ.

"අපේ ගෙදර."

වැඩි දෙනකු කීවේ එලෙසය.

"වැඩිදෙනෙක් කැමැති තැන ගෙදර නෙ. මාත් එහෙමයි. මමත් වඩාත්ම කැමැති මගේ ගෙදරට. එහෙනම් අද චිත්‍රයේ මාතෘකාව 'අපේ ගෙදර.'

'Home, Sweet Home.'

දරුවන් චිත්‍රය ඇන්දේ ඉතා කැමැත්තෙනි. බොහෝ දරුවන් සතුව පාට පෙට්ටියක් නැති බව ඇය අත්දැකීමෙන්ම දැන සිටියාය.

"පාට තියෙන අය නැති අයට දෙන්න ඕනෑ හොඳ ද? ළමයි පුරුදු වෙන්න ඕනෑ හැම දෙයක්ම බෙදා-හදාගෙන ජීවත් වෙන්න. එහෙම නේද?"

එක් දැරියක සිය සිතුවම වර්ණ ගන්වා තිබුණේ තනිකරම දුඹුරු පැහැයෙනි.

"චාන්දනීලගෙ ගෙදර හැම දෙයක්ම දුඹුරු පාටයි. ගහ-කොළත් දුඹුරු පාටයි. මොක ද ඒ?"

"නෑ මිස්. ගස් කොළ පාට තමයි. ඒත් මට පාට පෙට්ටියක් නෑ. රම්‍යලතා මට දුන්නෙ දුඹුරු පාට විතරයි."

කුඩා දරුවන්ගේ සිත් විවෘතය. ඔවුහු බොරු නොකරති.

සියල්ලෝ තම තමාගේ නිවෙස් ඇඳ තිබුණේ ඇත්ත ඇති සැටියෙන්ම පෙන්වා ලමිනි. නවක ගුරුවරියක වූ මගේ යෙහෙළියට තම සිසු දරුවන්ගේ පවුල්වල වග-තුග දැනගන්න වුවමනාවක් ද තිබිණි.

ඇය ඔවුන්ට 'අපේ ගෙදර' අඳින්නැයි කීවේ ඒ අදහසද යටිසිතෙහි රන්දාගෙනය.

පන්තියේ තරමක් දඟකාර දරුවකු වූ දිනේෂ් තම චිත්‍රය අලුත් ගුරුතුමියට පෙන්නුවේ මහත් ආඩම්බරයකිනි.

"ෂා! දිනේෂ්, ඔයාලගෙ ගෙදර සත්තු වත්තක් වගේනෙ."

දිනේෂ් ඇඳ තිබුණේ පොල් අතු සෙවිලි කළ මැටියෙන් කළ නිවෙසකි. එහි ඉස්තෝප්පුවෙහි ලණු ඇඳකි. එහි නිදා සිටියේ ඔහුගේ තාත්තාය. ඒ හැරුණු විට බල්ලකු, පූසකු, එළු දෙනක සහ පැටියකු මෙන්ම එළදෙනක ද එහි දැකිය හැකි විය.

"මොකද දිනේෂ් මේ, හරක්, එළුවො ගේ ඇතුළෙ ඉන්නෙ?"

"එහෙම තමයි මිස්. වැස්ස වෙලාවට අපේ සුද්දිත් එනව ඉස්තෝප්පුවට; එළු අම්මයි, පැටියයි දෙන්නත් එනව. නැත් නම් එයාල තෙමෙනවනෙ. කිකිළි නම් හැමදාම රෑට ඉන්නෙ ඉස්තෝප්පුවෙ. නැත් නම් හෝතඹුවො ඇරන් යනව"

"මාත් එන්න ඕනැ දිනේෂ්ලගෙ ගෙදර. ආසයි බලන්න."

ඔහුට ලොකු හරියක් දුන් ගුරුතුමිය කීවේ සිත පුරා කඳුළක් ගලා යද්දීය.

පාසල ඇරෙන්න සීනුව නාද වූ විට පාසලේ සිටින ගුරුවරියන් දෙදෙනා වහා දිව යන්නේ සැතපුම් එක හමාරක් පයින් ඇවිද ගොස් බසයක් ගත යුතු වූ බැවිනි.

එදින පාසල නිම වූ වහා ඔවුන් දෙදෙනා වෙනදා මෙන්ම කඩිමුඩියේ පාසලෙන් පිට වෙද්දී දිනේෂ් ගේට්ටුව අසලය.

"මොකද දිනේෂ්, අද ගෙදර යන්නෙ නැද්ද? කෝ යාළුවො ටික?"

"යාළුවො ටික ගියා. මං හිටියෙ මිස්ව එක්කන් යන්න. ඇයි මිස් කිවුවෙ අපේ ගේ බලන්න ආසයි කියල..."

ගෝරු පත

"වැස්සක් ළඟ එනවා වගේ. අපි වෙන දවසක යමු ද දිනේෂ්?"

ගුරුවරියෝ දෙදෙන මුහුණෙන් මුහුණ බැලූහ.

"මිස්ලා යන පාරෙම චුට්ටක් ඇතුළට ගියාම අපේ ගේ තියෙන්නෙ. අදම යමු මිස්."

හදිසිය පසෙක තබා ගුරුවරියෝ දෙදෙන ඔහු සමග යන්න තීරණය කළෝය. ඒ, දරුවකු අපේක්ෂා භංගත්වයට පත් කිරීම ගුරුවරයකුට තරම් නොවන නිසාය.

අතරමගදී වට වැස්ස දිනේෂ්ට නම් සතුටක් විය.

"දැන් මිස්ට අපේ සත්තු ඔක්කොම බලන්න පුළුවන්. වැස්සට ඒ ගොල්ලො ඉස්තෝප්පුවට එනව නෙ."

දිනේෂ් ගේ නිවෙසට ඔවුන් යන විට වැස්ස තරමක් තද වෙමින් තිබිණි.

දිනේෂ් ඔහුගේ චිත්‍රයට කොතරම් අවංක වී තිබුණාදැයි ගුරුතුමියට සිතුණේ ඔහුගේ ගෙමිදුලට ගොඩ වූ විටය.

ඔහුගේ පියා ඉස්තෝප්පුවෙහි වැල් ඇඳ මත වැතිර සිටියේය. මෑතකදී කිතුල් ගසකින් වැටුණු ඔහුගේ පාදයේ ආබාධය සුව වන්න තවත් මාස ගණනක් ගත වනු ඇත.

ඇඳ පසෙක විශාල බටපොතු කූඩයකින් වැසූ කිකිළියක් සහ පැටවු රොත්තකි. සිරුරේ තැන තැන ලොම් හැලී ගිය මහලු බල්ලකු නොබුරාම වල්ගය වනමින් ඔවුන් ඉදිරියට ආයේ මේ දිනේෂ්ට ශිල්ප සතර සදන ගුරුවරුන් නොවේ දැයි දැනගෙන වාගේය. එළිච්චිය තම පැටියා සුරතල් කරමින් සිටියේ තණ පිටියක නිදැල්ලේ සිටින්නා සේ සැහැල්ලුවකිනි.

පශ්චාද් භාගය තෙමී යමින් තිබුණ ද ඉඩ-කඩ ඇති සැටියට එළදෙන ද ඉස්තෝප්පුවට හිස පොවාගෙන සිටියාය.

දිනේෂ්ගේ පූසා නම් පෙනෙන්න සිටියේ නැත.

"අනේ මිස්, දිනේෂ් මිස්ලා ගැන නිතර කියනවා. ඇතුළටම එන්න මිස්."

දිනේෂ්ගේ මව ආරාධනා කළ ද ගෙතුළට යන්න ඉඩක් නොතිබූ තරමය.

"බොහොම ස්තුතියි. අපි වෙන දවසක එන්නම්. දිනේෂ්ගෙ මේ සුරතල් සත්තු ටික බලන්න නෙ අපි අද ආවෙ."

"සමා වෙන්න මිස්ලා. ගෙට එන්නවත් ඉඩක් නෑ මේ සත්තු ඔක්කොම ගේ ඇතුළෙ වැස්ස වෙලාවට. මේ දවස්වල අපිට කන්ඩ බොන්ඩ දෙන්නෙත් මේ එළිච්චියි, එළදෙනයි, කිකිළියි තමයි මිස්. ඉතින් වැස්සට ගෙට ගොඩ වෙනවා. පන්නලා දමන්නත් දුකයි..."

දිනේෂ්ගේ මව පැවසුවේ ඔවුන් මිදුලේම තබන්න සිදු වීම ගැන මහත් සේ විස්සෝප වෙමිනි.

**සුනිලා විජේසිංහ**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ







# සඳූපමා

## කැදැල්ලක නෙත

ඇළ ඉවුරේ සදාහරිත තුඟු තුරු විටින් විට පැරණි පත් බිම හෙළමින් ද නව ළපල්ලෙන් හැඩ-වැඩ වෙමින් ද මවා පාන අසිරිය හරියාකාරව පසක් කර ගන්න නම් ඇළට බැසිය යුතුමය.

ඇළ දියේ ගිලි-ගිලී මාරා අතු-ඉති අතුරින් දිස් වන නිලඹරෙහි පාව යන සුදෝසුදු වලාකුළ ද ඒ නීල හා ධවල පසුබිමෙහි සරන උකුසු යුවළ ද ඕනෑම මිනිස් නෙතක් සනහා ලන තරමට සොඳුරුය.

ඇළෙන් ඔබ්බෙහි කුඹුරු යාය ද විශාල තොටිල්ලක් බඳුය. මව් දෑතින් පැද්දෙන තොටිල්ල තුළ සුව නින්දේ පසු වන බිළිඳුන් සේම පූදින ගොයම සැනසිල්ලේ නැළවිල්ලේ සැලෙයි. ඒ රිද්මය වූකලි සොබාදහමේ සදාතනික සුන්දරත්වයේ හා සෞභාග්‍යයේ සංකේතයක් නොවන්නේ ද? සැබැවින්ම සොබාදහමේ රිද්මයට අනුගත වන්නේ නම් මිනිසා ඇතුළු අපා දෙපා සීපා සියලු සත්ත්වයන් නිදුක් නීරෝගි සුවපත් වනවා නො අනුමානය. එහෙත් සොබාදහමේ රිද්මය බිඳ හෙළන්න තරම් අකාරුණික හා අඥාන වන මිනිසා හේතු කොට ගෙන සත්වග මෙන්ම ලෝකය ද ඇදවැටෙන්නේ අතිභයංකර අගාධයකටය.

ඇළ දියේ පාව යමින් මා ඇළෙන්, බඩවැටියෙන්, කෙත් යායෙන් ඔබ්බට ඉගිළ යන බව දන්නෝ කවුරු ද? එහෙත් සක්වළ සැරි සරන්නට ඉසිඹුවක් නැත්තේය. අලුයම අවදිව උදය දිවා ආහාර වේල් දෙකම උයා-පිහා තබා රෙදි බෑසමක් ද ඔසවාගෙන ඇළට දිව එන්නී උදෑසන නවයේ කණිසමට සිව්මංසලට ළඟා වන ගල්නෑව බසයට ගොඩ විය යුතුය. බසයේ ගමනාන්තය ගල්නෑව වුවද මගේ ගමනාන්තය බුල්නෑවයි. ආදරය, සතුට හා සහනය සපිරි ඇයගේ කැදැල්ලයි.

අජිත් මංගල එදිරිසිංහ සහ අශෝකා දිසානායක යුවළගේ සන්සුන් හා සාමකාමි කැදැල්ල කලඹාලන කුණාටුව අන් කිසිවකු නොව මේ මමම නොවන්නී ද? ඔවුන්ගේ ආදරණීය දියණිය සඳූපමා සෙව්මිණි එදිරිසිංහගේ වටිනා කාලය ද ශ්‍රමය ද සොරා ගනු පිණිස මම දිනපතාම පාහේ එහි යන්නෙමි.

මගේ කුරුම්ණි කකුල් සරි අකුරු ඇයගේ පරිගණක තිරය මතට කැන්දාගෙන එන්න ඇය දරන වෙහෙසට මම ණයගැති වෙමි.

එහෙත් ඇය විඩාවක පීඩාවක් පිළිබඳ පැමිණිලි නොකරයි. ඇයගේ දිගු හා මනහර අතැඟිලි නොනවත්වා වැඩෙහි නිරත වන අතරතුර ද ඇගේ දෙතොලතර මඳ මුදු සිනා බිඳ නොවියැකේ. මෙවන් දක්ෂ හා බුද්ධිමත් දියණියක ලද මව්පියන් සැබැවින්ම භාග්‍යවත් නොවේ දැයි මට සිතෙයි. ඔවුන් ඇය වෙනුවෙන් දරන ලද අසීමිත වෙහෙස ඇය සරසවි වරම් ලැබීමෙන් මල්ඵල ගත් බව සැබෑය.

එහෙත් කොරෝනා වසංගතය මෙන්ම අපේ රටේ අවිධිමත් අධ්‍යාපන ප්‍රතිපත්තිය හේතු කොට ගෙන ඇය මෙන්ම ඇය වන් තවත් සිසු සිසුවියෝ දහස් ගණනක් ද ඔහේ කල් මරමින් සිටිති. කොතරම් අභාග්‍යයක් ද?

මේ නිකරුණේ ගතව යන්නේ ජවයෙන්, උද්‍යෝගයෙන් සහ බුද්ධියෙන් උතුරා යන යෞවනයයි. නිදහස් අධ්‍යාපනය උදෙසා සිය මව්බිමට පෙරළා කෘතගුණ දක්වන්න ඔවුන් නොඉවසිල්ලෙන් පසු වෙතත් දිනෙන් දින ගත වී යනවා පමණි. වසර ගණනාවකින් අපේ අධ්‍යාපන ප්‍රතිපත්තියෙහි සාධනීය සංශෝධනයක් සහ ප්‍රතිසංස්කරණයක් සිදු කර නැතැයි කියවේ. අධ්‍යාපනය යනු දොරගුළු ලා සුරැකිය යුතු පූජා වස්තුවක් නොවේ. වහා වෙනස් වන ලෝකයත් සමඟ තාක්ෂණයත් බද්ධ කර ගනිමින් යාවත්කාලීන විය යුත්තකි. රටක ඉදිරි ගමනෙහි ලා වැදගත්ම සාධකය එරට අධ්‍යාපනය නොවේ ද? එහෙත් ආර්ථිකයෙහි මෙන්ම අධ්‍යාපනයෙහි ද විෂමතා අපේ දරුවන් පමණක් නොව මව්පියන් ද පීඩාවට පත් කරන්නට තරම් ප්‍රබලය.

"ඔන්න ලොකු අම්මේ ඒ පරිච්ඡේදය නම් ටයිප් කරලා ඉවරයි..."

ඇය පාන සුන්දර හා සිරිමල් හිනාව තුළින් මම අවිනිශ්චිත අනාගතයක අඳුරු සෙවණැලි දකිමි.

අප රටේ කෘෂිකර්මයට මෙන්ම අධ්‍යාපනයට ද ජාතික ප්‍රතිපත්තියක් නැත. විටින් විට බලයට පත් වන ආණ්ඩුවල අභිමතය හා මනදොළ පරිද්දෙන් යම් යම් ප්‍රතිසංස්කරණ සිදු කෙරෙතත් බොහෝ විට එයින් සිදු වන්නේ නව අර්බුද හටගැනීම පමණි.

පන්ති කාමරයට කොටු නොවී පරිසරය හා වෙනත් ජාතීන් හා ආගමිකයන් සමඟ සහජීවනයෙන් අනාගත ලෝකය ජය ගත හැකි අනිවාර්ය මෙවලම් වන ඉංග්‍රීසි භාෂාව හා තාක්ෂණය විධිමත්ව හදාරමින් මව්බිමට පමණක් නොව මුළුමහත් ලෝකයටම වැඩදායි සැබෑ මිනිසකු නිර්මාණය කිරීම වූකලි යල් පැන ගිය හා ගතානුගතික අධ්‍යාපන ක්‍රමයකින් කිසි සේත් කළ නොහැකිය.

වේගයෙන් ඉක්ම යන කාලය අපේ ප්‍රමාදයට සරදම් කරයි. කොරෝනා වසංගතය හේතුවක් කොට ගනිමින් අපේ දරුවන්ගේ අපේක්ෂා සහ උසස් අධ්‍යාපන අයිතීන් මඟ බිඳ නොදමන්නට බලධාරීන් ක්‍රියා කළ යුතුව තිබේ.

ඉතා දක්ෂ, බුද්ධිමත් හා කාරුණික සිසුවියක වන සඳූපමා දියණිය ඇතුළු අපේ සියලු දූ-පුතුන් මහත් වැර වෑයමෙන් අත් පත් කර ගත් සරසවි වරම මේ අතිශය දුෂ්කර හා බැරෑරුම් වකවානුවේ වුව සාක්ෂාත් කර ගන්න ඉඩ හසර සලසා දිය යුතුමය.

**ශාන්ති දිසානායක**



# මගේ සිනා ඔබ අරගෙන ඔබේ කඳුළු මට දෙන්න

## විදවස සොඳුරුමය

ජීවිතය යනු අභියෝග පිරුණු, අභියෝග ජයගන්නා, ඇතැම් අවස්ථාවක අභියෝග හමුවේ පරාජය පිළිගන්නට සිදුවන අත්දැකීම්වලින් බහුල වූවකි. අභියෝග හමුවේ ඒවා ජයගැනීම කෙසේ වෙතත් ඒවාට නොබියව මුහුණ දෙන්නට හැකිවීම වුව ජයග්‍රහණයක් නොවන්නේ ද කියා සිතුණු වාර බොහෝය. ළමා කාලයේ සිට තරුණ විය තෙක්, ඉන් පසුව කුටුම්බ ජීවිතය තුළ ද ජීවිතයේ අවසාන කාලය තෙක් අභියෝග සමඟ ජීවත් නොවන්නකු සොයාගැනීම දුර්ලභ අත්දැකීමක් වනු නොඅනුමානය. අධ්‍යාපනය, රැකියාව, ආදරය, විවාහය, කුටුම්භය, ලෙඩ රෝග, ගුරු දෙගුරු, නෑ හිතමිතුරු සබඳතා, ජීවිත කාලය පුරා ඉටු කළ යුතු වගකීම් හා යුතුකම් ආදි මෙකී නොකී සියලු අවස්ථාවකදීම අපි අභියෝගවලට මුහුණ දෙන්නෙමු. දශක හතක මැද ජීවත් වන මා මුහුණ දී ඇති අභියෝග ලද ජයග්‍රහණ හා පරාජයන් පිළිබඳ විශාල මතක සම්භාරයක් මා සතුව තිබුණ ද ඒ මතක ගොන්න අකුරු කරන්නට කල්ප කාලයක් ගත වේ යැයි සිතේ. එහෙත් වරින් වර මතකයට නැඟෙන අභියෝගවලට මුහුණ දීමේ ව්‍යායාමය තුළ ඉතා මෑතකදී මට මුහුණ දෙන්නට සිදු වූ හා ජය ගත් අභියෝගයක තතු සොඳුරු මතකයක් ලෙස මෙලෙස ලියා තබන්නෙමි.

මා ඔබ සමඟ බෙදා හදා ගන්නට සැරසෙන අත්දැකීමට සමාන අත්දැකීම් කවදා හෝ කොතැනකදී හෝ ඔබත් අත්විඳ ඇති බව මට හොඳින්ම විශ්වාසය. එවන් අවස්ථාවක මුහුණ දුන් අභියෝග ජය ගත් හෝ පරාජය වූ මතක අප සැමගේම ජීවිත තුළ සොඳුරු මතක ලෙස රැඳී ඇත්තේ වරින් වර දුක මෙන්ම සතුට ද හදවතට ළං කරමිනි. මා කැමතිම ගීත, ගායක ගායිකාවන්, නළු නිළියන් , මා කැමතිම නවකතා, කවි පොත්, මා කැමතිම චිත්‍රපට, වේදිකා නාට්‍ය, පුද්ගල චරිත, ක්‍රීඩකයන්, දේශපාලනඥයන්, ආගමික නායකයන් ආදි වශයෙන් තෝරා ගැනීමට ඉඩ හසර සලසමින් ඒ පිළිබඳ කතාබහ කරන්නට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයෙන් ඇරයුමක් ලැබෙන සෑම අවස්ථාවක්ම දුෂ්කර අභියෝගයක් වන බව කිව යුතු නොවේ. ඉතාම මෑත දිනෙක එවන් අභියෝගයක් හමුවේ මා අසරණ වූයේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වෙළෙඳ සේවයේ නිවේදිකා, නිෂ්පාදිකා ඉනූෂා වීබැද්ද සොයුරියගෙන් ඇරයුමක් ලද මොහොතේදීය. දිගු කාලයක් තිස්සේ ඈ විසින් සැලසුම් කොට නිෂ්පාදනය කරමින් ඉදිරිපත් කරනු ලබන විකසිත රෑ හත හෝරාවකුත් අඩක කාලයක් පුරා ප්‍රචාරය වන සජීවී වැඩසටහනට ගී හතක් තෝරමින් කතාබහට එක්වීමට ඉනූෂා මට ඇරයුම් කරන්නීය. මා සතුව ගුවන් විදුලි යන්ත්‍රයක් නොමැති බැවින් විකසිත රෑ හත කිසි දිනක අසා නැති බවත්, එහි සංයුතිය කවරාකාරදැයි නොදන්නා බවත් මම ඇයට කීවෙමි. සෑම බදාදාවකම රාත්‍රී 7.30-9.00 දක්වා සජීවීව ප්‍රචාරය වන සංවාදාත්මක වැඩ සටහන සඳහා මා කැමති ගීත හතක් තෝරා දීමෙන් අනතුරුව ඉනූෂා හා ආරාධිතයා අතර කෙරෙන සංවාදය සඳහා හෝරාවකුත් අඩක කාලයක් වෙන් වේ. පැය එකහමාරක කාලයක් තුළ ගී හතක් සමඟ කුමන කතාබහක්දැයි කල්පනා වූ මුත් ඇගේ දෙවන ඉල්ලීමෙන් මම තිගැස්සුණෙමි. විකසිත රෑ හතට ඇරයුම් ලබන ගේය කාව්‍ය රචකයා විසින් තෝරා දිය යුත්තේ ඔහු විසින්ම ලියූ ගී හතක් වීමය ඒ ඉල්ලීම. මවිසින් රචනා කරන ලද ගීත ගැන මා කුමක් කියන්න ද? මගේ විකල්ප යෝජනාවට ඉනූෂා ඉතා කාරුණිකව සවන් දී ඒ දුෂ්කර අභියෝගයෙන් මා මුදා ගත්තාය. මා ලියූ ගී වෙනුවට මා වඩාත් ආසා කරන රස විඳි ගී හතක් පිළිබඳ කතාබහට ඈ එකඟ වූවාය. කෙසේ නමුත් ඉන් එක් ගීයක් පමණක් මගෙ රචනයක් ලෙස තෝරා දෙන්නට එකඟ වූයේ ඒ සඳහා වූ විශේෂ හේතුවක් නිසාය. එහෙත් දරුණුම අභියෝගය වූයේ ඉතිරි ගී හය තෝරා ගන්නේ කෙසේද යන්නය. අභියෝග හමුවේ පලා යන පුරුද්දක් මා සතු නොවූ බැවින් ඊට මුහුණ දුන්නෙමි. පෙබරවාරි 3 දා රාත්‍රි 7.30-9.00 දක්වා කාලය තුළ තෝරා ගත් ගී හත ප්‍රචාරය කරන්නට අවශ්‍ය තරම් කාලය නොවූවත් විකසිත රෑ හත අභියෝගය ජය ගත්තෙමි.

ඉනූෂාගේ ආරාධිතයා පිළිබඳ ඈ සොයාගෙන තිබූ ඇතැම් තොරතුරු අතරට ආරාධිතයාගේ ළමා කලයේ මතක පවා ඇතුළත් වූයේ කෙසේදැයි ආරාධිතයාට ද අදහාගන්නට නොහැකි විය. වැඩසටහන වෙනුවෙන් ඉනූෂාගේ පෙර සූදානම ඉතා ඉහළ මට්ටමක වූ බවයි මගේ පළමු නිරීක්ෂණය වූයේ. නන්දා මාලිනීගේ තෝරා ගත් ගීතයට අදාළ පරිකථා කියන්නට පෙර ඇයට පෙර අපගේ නිළි රැජන හා ගීත කෝකිලාව ලෙස විරුදාවලී ලත් රුක්මණී දේවිය පිළිබඳ සිහිපත් කළෙමි. නන්දා මාලිනී යනු අද දවසේ අපගේ ගීත කෝකිලාවිය හා ජාතියේ යශෝරාවය බව කීමට වඩා මගේ පළමු තේරීම පිළිබඳ විස්තර කීමට කාලය වෙන් කර ගත්තෙමි. ගායනයෙහි මතු නොව ගී තනු නිර්මාණයෙහි ඇගේ කුසලතාව සනාථ කෙරෙන එක් ගීයක් ලෙස මම මෙය හැඳින්වූවෙමි. නන්දා ශ්‍රී ලංකාවේ ප්‍රථම සංගීත අධ්‍යක්ෂවරිය යැයි චන්දන ගුණවර්ධන විසින් 1997 දී ඉරිදා ලංකාදීපයට ලියූ ලිපියක සඳහන් කොට තිබිණ. ඇගේ ගී තනු නිර්මාණ කුසලතාවට සාක්ෂි සපයන මේ ගීත සිහි කරන්න. බුද්ධානුභාවේන, රන් ගිරි ගිරි ගිගිරි, මල් මල් හීනය, චන්ද්‍ර මඬුළු යට, මිරිවැඩි සඟලක් ඉල්ලා හැඬුවෙමි හා තවත් නිර්මාණ රැසක් ඇගේ තනුවලින් වර්ණවත් වී ඇති බව දනිමු. විකසිත ගී හත ආරම්භක ගීතය නන්දා මාලිනීගේ ගායනා අතර මගේ සිත පැහැර ගත් ගීතයක් වුව එය ජනප්‍රිය ගීතයක්දැයි නොදනිමි. ආරියසිංහ පෙරේරා නම් ගේය කාව්‍ය රචකයකු පිළිබඳ අපට නිතර අසන්නට නොලැබුණ ද මේ රචනය ඔහු සතු අපූරු කවිත්වයක දීප්තිමත් සලකුණු සටහන් කරන්නකි. කවියෙහිදී භාවිත කෙරෙන රූපකාර්ථවත් භාෂාව පිළිබඳ මනා නිදසුනක් සපයන්නකි මේ ගේය කාව්‍ය රචනය.

මගේ සිනා ඔබ අරගෙන
ඔබේ කඳුළු මට දීලා
පාළු නුවර මා තනිකොට
මතක සිහින පොදි බැඳගෙන
ඔබ කොතැනද සැඟවී ඉන්නේ
කියාගන්න බැරි දුක මම කාට
කියන්නේ

පෙම්වතියකගේ වැලැපීමක් නොවන එහෙත් බිඳුණු ආදරයක් පිළිබඳ කියැවෙන සංවේදී දුක් ගැනවිල්ලකි මේ.

අහස දැවී වියරු වැටී
ළසෝ දුකින් තරු වැලපී
නිදිබර ඇස් මඟ රැඳිලා
ඔබ එනතුරු සිටියා
ප්‍රාර්ථනා තරු අතරේ
සොඳුරු මගේ ලොව ඇවිලේ
මගේ සිනා මට දීලා
ගෙන යන්න කඳුළු නොතියා

දැවී වියරු වැටුණු අහස, ළසෝ දුකින් වැලැපෙන තරු, මඟ බලා සිටින නිදිබර ඇස්, ප්‍රාර්ථනා තරු, කවියාගේ සංකල්ප රූප පිරුණු කාව්‍යෝක්ති සහිත බස පිළිබඳ අපූරු චිත්‍රයක් මවන මොහොතකි. ගේය කාව්‍ය රචනයෙන් ඉල්ලා සිටිනු ලබන ශෝකී ස්වරය නන්දා මාලිනීගේ හඬින් ප්‍රතිනිර්මාණය වන්නේ ශ්‍රාවක හද සියුම් රිදුමක් ද ඇති කරවමිනි. අත්දැකීමට උචිත ළයාන්විත ස්වරය ඈ සතුය. ඇගේ ගී තනුව ගේය කාව්‍ය රචකයා අපේක්ෂා කළ බිඳුණු ආදරයේ වේදනාව ශ්‍රාවක සිත්හි වඩවාලයි. ගී හතක අභියෝගය තුළ එච්.ආර්.ජෝතිපාලගේ ගීයක් ඇතුළත් නොකිරීමට කිසිදු හේතුවක් මට සොයා ගැනීමට නොහැකි විය. මෙරට ජනප්‍රියම ගායකයා ලෙස ජෝතිපාලගේ නම සමඟ බැඳුණු ගීතාවලියේ හමු වන සුන්දර චිත්‍රපට පෙම් ගීතයක් වූ ආදර මල් පවනේ ඈ යන මේ ගමනේ මගේ දෙවන ගීතය විය. ගේය කාව්‍ය රචක ධර්මසිරි ගමගේ නම් වූ සුන්දර මිනිසා පිළිබඳ අතීත ස්මරණ අතරට ඉනූෂා මා කැඳවාගෙන ගියාය. වනස්පතියක් බඳු ඔහු සෙවණෙහි අපගේ නිර්මාණ කුසලතා ඔප් නැංවුණු අයුරු සිහිපත් විය. දුලීකා චිත්‍රපටයේ විජය කුමාරතුංග, බියුලා ඩයස්ගේ රංගන සමඟ ප්‍රේමසිරි කේමදාසගේ සංගීතයට ජෝතිගේ මධුර ස්වරය මුසුවීමෙන් එළි දුටු අපූරු ගීතයක් වූ බැවින් විකසිත ගී හතට එය ඇතුළත් විණ.

ජෝතිගේ මධුර ස්වරය අමතක කළ නොහැකි නම් වික්ටර්ගේ රන් ස්වරය කෙසේ අමතක කළ හැකිවේ ද? සරත් දසනායකගේ මධුර තනුව හා සංගීතයෙන් පෝෂණය වූ යෞවනයේ ප්‍රේමාන්විත ස්වරය සතු වූ වික්ටර් රත්නායකගේ පසුබිම් ගායනයෙන් විචිත්‍ර වූ ටෝනි රණසිංහ නම් වූ සුකුමාර පෙම්වතාගේ රංගනය ඇතුළත් දිනුම් කණුව චිත්‍රපට රූප රාමුව මතකයෙන් ඈත් නොවන්නකි. ගේය කාව්‍ය රචනය පුරා භාවිත උත්ප්‍රාසාත්මක වදන් අපට පවසන්නේ ප්‍රේමකීර්ති ද අල්විස් නම් විශිෂ්ටයාගේ නිර්මාණශීලීත්වයයි.

ඔබේ ආදරය වෙනුවෙන් මට නොකළ හැක්කේ කුමක් ද?

පිනි බිඳකින් මුතු අමුණම්
දිනිසුරුගෙන් සීතල දෙම්
කටු අකුලෙහි මල් පුබුදම්
ඔබ හිනැහේ නම්
මියුරු කල්පනා නෙතක දැල්වුණා
අමයුරු රස හසකැන් මැද
සිතක් හිනැහුණා
වරෙක හිනැහුණා වරෙක
ළතැවුණා
නුපුරුදු ගිනි දහසක් මැද
සිතක් මැලවුණා

විකසිත රෑ හත අභියෝගයට මුහුණ දෙමින් මගේ නොවන මගේම ගීතයක් මවිසින් තෝරා ගන්නා ලද්දෙ අප අතරින් මෑත කාලයේ වියෝ වූ ළබැඳි යෙහෙළිය අනුලා බුලත්සිංහල වෙනුවෙනි. මවිසින් ඇයට රචනා කළ සුදු ඔසරිය ඇඳලා ගීතය අනුලාගේ සරල ගී ගායනයෙහි සොඳුරු නිර්මාණයක් ලෙස ශ්‍රාවකයෝ දැක තිබිණ. මල්සර දුනු හී නොවැදි යෞවනියකගේ විවාහාපෙක්ෂාව අනුලා තම මධුර හඬින් අර්ථ ගන්වන්නී එවැන්නියකගේ සිතෙහි නිරතුරුව ඇඳෙන සිහිනයක විලාසයෙනි.

සුදු ඔසරිය ඇඳලා
සුදු මුතුපොට බැඳලා
සුදු මල් පියවිල්ලේ
කවදද මා යන්නේ
රන්මිණි අබරණ කෝ පට සළු
නැත මට දායාදේ
කඳුළක රස දැනෙනා හදක්
ඇත
වෙන් වූ නමින් ඔබේ
රෑ හීනෙන් දකිනා ඔබේ රුව
හදවත ඇඳ ගනිමී
උදෑසනින් බිඳිලා සිහින ලොව
තනිවම ඉකි බිඳිමී

අනුලා මෙන්ම ගීතයට අපූරු තනුවක් හා සංගීත නිර්මාණයෙන් දායක වූ අප අතර නොමැති ගුණදාස කපුගේ සහෘදයා ද විකසිත රෑ හත මතකයට එක්වුණේ අනුලාගේ ගීතය සමඟිනි. අනුලාගේ මතකයෙන් පසු ගී හතට පිවිසෙන්නී දීපිකා ප්‍රියදර්ශනී පීරිස් මිතුරියගේ මධුර කටහඬයි. කෙළිලොල් දඟකාර පෙම්වතියකගේ ගති සොබා සිහියට නංවන ස්වරයකින් ඈ ගැයූ මේ ගීතය මගේ සිත සොරාගෙන ඇත්තේ එම රචනයෙහි ගැඹුරට වඩා ගායනාවෙහි බුහුටි බව නිසාම යයි සිතේ. බැලූ බැල්මට කුමාර කවිරාජ ගේය කාව්‍ය රචකයාගේ නිර්මාණය බොළඳ රචනයක් සේ පෙනුණ ද දීපිකා විසින් ඊට නව අරුතක් එක් කරමින් ගීතයේ කතා නායිකාවගේ මුවට නංවන ඇතැම් ප්‍රකාශයක් ශ්‍රාවක සිතට සමීප කරවන්නේ ළඳ බොළඳ කෙල්ලකගේ දඟකාර කතාබහයි.

විකසිත හසරැලි
මුකුලිත වෙන කොට
බලා ඉන්න ආසයි
යාන්තමට වගෙ හිත රිදවන්නට
විහිළු කරන්නම් මං
හා .. හා.. තරහවෙන්න තහනම්...
ආල වදන් පිරි පෙම්පත් ලැබුණම
සෙනෙහස උතුරන හිත රිදවෙන්නට
පිළිතුරු නොලියා දින තුන හතරක්
පමා කරන්නම් මං
හා... හා... තරහවෙන්න තහනම්...
හා හා තරහ වෙන්න තහනම්.. යැයි

දීපිකා ගායනා නොකරන්නීය.

ඈ පෙම්වතාට මෙසේ පවසන්නීය. හා හා ඕන්න තරහ වෙන්න එහෙම බෑ වැනි අර්ථයක් නොවෙද දීපිකාගේ ස්වරයෙන් අපට ඇසෙන්නේ? විකසිත රෑ හත සරසන්නට මට ඉතිරි වී තිබුණේ තවත් ගීත දෙකක් සඳහා කාලයක් පමණි. අබේවර්ධන බාලසූරිය ගායනා කළ සුනිල් ආරියරත්නගේ ගේය කාව්‍ය සංකල්පනාව, ඔබෙන් තොර ලෝකයක් කොයින් දෝ හා මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු ලියූ ප්‍රේමසිරි කේමදාසගේ සංගීතය හා තනුවට සනත් නන්දසිරි ගායනා කළ ඉරා අඳුරු පට චිත්‍රපට ගී සංකල්පනාව අවසාන තේරීම වූවත් ඉරා අඳුරු පට වාදනය වන්නට පෙර හෝරාවකුත් අඩක් නොදැනීම ගෙවුණු බැවින් රාත්‍රී ප්‍රවෘත්ති විකාශයෙන් පසුව සනත් නන්දසිරිගේ ඉල්ලීමට සවන් දෙන්නට ඉඩ හසර සැලසිණ.

ඇගෙන් තොර ලෝකයක්, මාවතක් , හීනයක්, ගීතයක් නොමැති පෙම්වතාට සියලු තන්හි පෙනෙන්නේ ඇගේ රුවමය. ඇසෙන්නේ ඇගේ කටහඬ පමණි.

ඔබෙන් තොර ලෝකයක්
කොයින්දෝ
ඔබෙන් තොර හීනයක්
ඔබෙන් තොර මාවතක්
ඔබෙන් තොර ගීතයක් කොයින්දෝ

අබේවර්ධන බාලසූරිය සුමිතුරු පිළිබඳ අතීතාවර්ජනයකට සුනිල්ගේ ගීතය මට ලබා දුන් විරල අවස්ථාව පිළිබඳ ඉනූෂා හට ස්තුතිවන්ත වීමි. ඔහුගේ අකල් වියොව දැඩිව දනෙන්නේ ඔහු විසින් ගායනා කරන ලද මෙවන් ගීතයක් රස විඳින මොහොතකය. විකසිත රෑ හත හත්වන ගීතය රාත්‍රී නවයට පෙර ප්‍රචාරය නොවූවත්, ශ්‍රාවක අපේක්ෂා බිඳ නොදමමින් එය ප්‍රවෘත්තිවලින් පසුව අසන්නට සලස්වා තිබිණ. සනත් නන්දසිරි, ප්‍රේමසිරි කේමදාස, චන්ද්‍රසිරි පල්ලියගුරු සුසංයෝගයේ මිහිරි මතකයක් ලෙස තරුණයන්ගේ සිනමාව සංකේතවත් කළ ධර්මසේන පතිරාජගේ අහස් ගව්ව වෙතට ළං වෙද්දී සනත්ගේ ඇරයුම අපට ඇසුණි. එන්න මගේ පිය මිතුරන් යැයි ඉල්ලා සිටි බොහෝ දෙනා අප හැර ගොසිනි. පතී, කේමදාස මාස්ටර්, විජේ, කොස්තා, බෝගොඩ, අහංගම, බන්දුල සුන්දර මතක පමණි.

ඉරා අඳුරු පට පෙරදිග අහසේ
පොකුරු පොකුරු තරු නිවී යන්ට
පෙර
අරුණළු උදයේ දිලිසෙන පිනි මත
පියමං කරමින්
අහස්ගව්වටයි ළංවන්නේ

විකසිත රෑ හත අවසන් විනාඩි කීපයේදී මතකයට නැඟුණු සහෘද සමාගමය මෙරට බොහෝ කලා ක්ෂේත්‍ර කිහිපයකම දැවන්තයන්ගෙන් සැදුණකි. කේමදාස මාස්ටර්, පතී, විජය ඒ අතර සදානුස්මරණීය සුන්දර නිර්මාණකරුවන්ය. විකසිත රෑ හත වර්ණවත් කරන මොහොතේ ඔවුන් පිළිබඳ මතක ලොවට යන්නට ඉඩ ලබා දුන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ඉනූෂා වීබැද්ද සොයුරියට ස්තුතියි කියා සමු ගනිමි.

**බුද්ධදාස ගලප්පත්ති**

**දිනමිණ දසත** - දස අත ම එක තැන

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

# වට්ටක්කා ටික රැකගන්න පැලට ගිය ගොවියෙක් මරුට

තම වට්ටක්කා වගාව වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පැල් රකිමින් සිටි ගොවියකු එම පැල කඩා වැටීමෙන් බරපතළ තුවාල ලබා අනුරාධපුර ශික්ෂණ රොහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇතැයි නොච්චියාගම පොලිසිය ප්‍රකාශ කළේය.

නොච්චියාගම ලෝහෙට්ටියාව මාර්ගයේ පිහිටි හේන් යායකට පසුගියදා (28) කඩාවැදුණු වන අලින් වට්ටක්කා හේන් කීපයක් විනාශ කර තිබේ. මේ හේතුවෙන් ඉතිරි වට්ටක්කා ටික හෝ බේරා ගැනීමේ අරමුණින් මේ පුද්ගලයා තම ඥාති පුත්‍රයකු සමඟ පසුදින රාත්‍රී හේනට ගොස් තිබේ. අඩි විසිදෙකක් පමණ උස ගසක සකස් කර තිබූ පැල මත රාත්‍රියේ රැඳී සිටියදී පැල කඩා වැටීමෙන් දෙදෙනාම බිමට ඇදවැටී ඇත.

පසුව ඥාති පුතා විසින් අසල වෙනත් පැල්වල සිටි අයට කෑ ගසා දෙදෙනාම ත්‍රිරෝද රථයකින් අසල ගම්මානයට ගෙනැවිත් එතැන් සිට 1990 ගිලන් රථයකින් නොච්චියාගම රෝහලට රැගෙනවිත් අනතුරුව අනුරාධපුර ශික්ෂණ රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළත් කර තිබේ. දෙදෙනාම රොහල්ගත කර ඇති අතර එහිදී බරපතළ තුවාල ලබා සිටි 53 හැවිරිදි එස්. සුනිල් නමැති තිදරු පියකු මෙසේ මියගොස් තිබේ.

අනුරාධපුර හදිසි මරණ පරීක්ෂණ ජේ. එම්. ජයතිලක මහතා පරීක්ෂණය පවත්වා ඇති අතර අධිකරණ වෛද්‍ය නිලධාරී විශේෂඥ වෛද්‍ය එස්. එම්. එච්. එම්. කේ. සේනානායක මහතා විසින් එහි පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කර ඇති අතර වැටීමෙන් සිදු වූ බහුවිධ තුවාල හෙතුවෙන් මරණය සිදු වී ඇති බවට නිගමනය කරන ලදි.

ධර්මදාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක සහ අනුරාධ ප්‍රියදර්ශන - කරන්දෙණිය සමූහ

# අම්බලන්ගොඩ නගරාධිපතිට කොරෝනා

## ප්‍රා.සභා සභාපතිටත් හැදිලා

අම්බලන්ගොඩ හා ඒ අවට මේ වන විට කොරෝනා රෝගීන් විශාල ලෙස හමුවීමත් සමගම ප්‍රදේශ පාළුවට ගොස් ඇති අතර ජනතාව මහත් සේ බියටත් තැතිගැන්මටත් පත්ව සිටිති.

පසුගිය 25 හා 27 යන දිනවලදී කරනා ලද පීසීආර් පරීක්ෂණ වාර්තාවල ප්‍රතිඵල මත හා පෞද්ගලික පීසීආර් පරීක්ෂණ අනුව මේ වන විට ආසාදිතයන් 50කට වඩා හමුව ඇති බවත් ඒ අනුව මේ තත්ත්වය ඇති වී තිබෙනා බවත් පසුගියදා (28) දින කරන ලද පරීක්ෂණවල ප්‍රතිඵල ලැබුනු විට මෙය තවත් වැඩි විය හැකි බවත් අම්බලන්ගොඩ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක ඒ. ආර්. පාලිත මහතා පැවසීය.

එමෙන්ම අම්බලන්ගොඩ නගරාධිපතිවරයාට අමතරව ප්‍රාදේශීය සභාවේ සභාපති පුෂ්පලාල් කුමාරසිංහ මහතාට ද කොරෝනා ආසාදනය වී රෝහල්ගත කර ඇති අතර බටපොළ පිහිටි අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලය වසා දමා විෂබීජහරණය කරන ලද බවත් බටපොළ මහජන බැංකුවේ ආසාදිතයන් 08 දෙනකු පමණ වාර්තා වන බවත් අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ප්‍රකාශ කළේය. එමෙන්ම එම ආයතන දෙකේ කාර්ය මණ්ඩලවල පීසීආර් පරීක්ෂණ සිදු කිරීමට ද නියමිතය. එමෙන්ම තල්ගස්ගොඩ ප්‍රදේශයේ ආබාධ සහිත අයකුට වයිරසය ආසාදනය වී මියගොස් ඇත.

නිරෝධායන පිරිසට වියළි ආහාර බෙදා දීමට කටයුතු කර ඇති බවත් වෙළෙඳසල් විවෘතව ඇති බවත් ජනතාව දැනුම්වත් කරමින් සිටිනා බවත් ග්‍රාම නිලධාරී හර්බට් කරුණාවර්ධන මහතා පවසා සිටියේය.

එමෙන්ම ප්‍රදේශයේ කාන්තාවන් ඇතුළු විවිධ අය විසින් බුරු පිටි පවත්වාගෙන යන බවත් ඒ තුළින් මේ තත්ත්වය වර්ධනය විය හැකි බවටත් ප්‍රදේශවාසීහු චෝදනා නගති.

මේ සම්බන්ධයෙන් විමසූ විට අම්බලන්ගොඩ ප්‍රධාන පොලිස් පරීක්ෂක එන්. කේ. පී. විතානගේ මහතා කියා සිටියේ ඒ සම්බන්ධයෙන් වහාම සොයා බලනා බවයි.

සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ සහ මහානාම විතානගේ - මල්වාන සමූහ

# හුණුපිටිය ශ්‍රී ධර්මාරාම විහාරස්ථානයේ ආශිර්වාද පින්කම්



කොවිඩ් - 19 වසංගතයෙන් පීඩාවට පත් රටවාසී ලෝකවාසී ජනතාවට ආශිර්වාද ප්‍රාර්ථනය කිරීමේ පින්කම් මාලාවක් වත්තල හුණුපිටිය ශ්‍රී ධර්මාරාම විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් පසුගියදා (02) ආරම්භ විය.

වත්තල හුණුපිටිය ශ්‍රී ධර්මාරාම විහාරාධිපති පුරිප්පල අනෝමදස්සී මාහිමියන්ගේ අනුශාසකත්වයෙන් ලක්බොදු සවිය ජාතික සංවිධානය මගින් සෞඛ්‍ය මාර්ග උපදේශ සහිතව මේ පින්කම සංවිධාන කර ඇත. ධර්මාරාම විහාරස්ථානයේ සිට මේ මස 07 වැනිදා පෙරවරුවේ විශේෂයෙන් සකස් කළ රථයකින් අනුරාධපුර රුවන්වැලි සෑය දක්වා රතන සූත්‍රය සජ්ඣායනය කරමින් පිරිත් පැන් ඉසිමින් ගමන් ආරම්භ කිරීමට ලක් බොදු සවිය ජාතික සංවිධානය කටයුතු සංවිධාන කර ඇත.

සිසිල ගුණතිලක - ගම්පහ දිස්ත්‍රික් විශේෂ

# දොම්පේ පරකඩමුල්ල වාරි ඇළේ ප්‍රතිසංස්කරණය අරඹයි




වාරි සෞභාග්‍යා රජයේ වැඩසටහන යටතේ ග්‍රාමීය වැව් හා අමුණු සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමගාමීව දොම්පේ මැතිවරණ කොට්ඨාසයේ පළමු වැඩසටහන ලෙස පරකඩමුල්ල වාරි ඇළ ප්‍රතිසංස්කරණය කර ඒ හරහා අමුණක් ඉදි කිරීමේ වැඩසටහන ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ආරම්භ කෙරිණි.

එම අවස්ථාවට දොම්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති පියසේන කාරියප්පෙරුම, ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුදර්මි, දොම්පේ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා, සැලසුම් අධ්‍යක්ෂවරයා ඇතුළු ප්‍රදේශයේ ගොවි මහත්ම මහත්මීහු විශාල පිරිසක් සහභාගි වූහ.

එස්.ජී. උබේපාල - කැබිතිගොල්ලෑව සමූහ

# ගලෙන්බිඳුණුවැව මානන්කට්ටිය ගම්වාසීන්ට තවමත් ඉඩම් ඔප්පු නෑ







වසර තිස්පහකට ආසන්න කාලයක් විවිධ රජයන් යටතේ මානන්කට්ටිය ගම්මානයේ ජීවත් වන ජනයාට තමන් ජීවත්වන නිවාස සහිත ඉඩම් සඳහා ඔප්පු ලබා දී නැති බවත් අවස්ථා ගණනාවකදී ඉඩම් කච්චේරි පැවතුණද එයින් සාධාරණයක් ඉටු නොවුණු බවත් ගලෙන්බිඳුණුවැව, මානන්කට්ටිය ගම්වාසීහු පවසති.

දීර්ඝ කාලයක සිට මානන්කට්ටිය වැව හා අහස් දියෙන් කුඹුරු, ගොඩ ගොවිතැන් සිදු කර ජීවිත ගමන ගෙන යෑමට ඉහළ මානන්කට්ටිය ගම්මානයේ ජනයා හුරු පුරුදු වී සිටිති. මේ ගම්මානයේ පවුල් 250කට ආසන්න පිරිසක් මේ වන විට පදිංචිව සිටිති. එයින් පවුල් 100කට ආසන්න පිරිසකට එම භූමිවල නිසි බලය සහිත රජයේ ලියවිල්ලක් ලැබී නැත.

මේ හේතුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් දෙන කිසිදු වරප්‍රසාදයක් ගම්වාසීන්ට නොලැබෙමින් පවතිනා බවට ගම්වාසීහු චෝදනා කරති.

එස්. සිරියලතා මහත්මිය - "අපිට අපේ ඉඩකඩම්වලට ඔප්පු ලබා දෙන්නනම් ජීවත් වන ඉඩම්වල ස්ථිර භෝග වගා කර ඉඩම් සංවර්ධනය කරලා තියෙන්න ඕනලු. ස්ථිර භෝග වගා කර තිබෙනවා නම් පමණක් ඔප්පු ලබා දෙනවා කියනවා නිලධාරීන්. ස්ථිර භෝග වගා කර තිබීම අනිවාර්ය සුදුසුකමක් නම් ගම්මානයේ බොහෝ දෙනකුට මින් ඉදිරියට රජයේ නීත්‍යනුකූල ලියවිල්ලක් ලබා ගැනීමට හැකි වෙන්නේ නෑ මේ ඉඩම්වලට. ඔප්පුව හා බැඳුණු කිසිදු වරප්‍රසාදයක් අපේ ගම්මානයට ලැබෙන්නේ නෑ. එයට හේතුව හැමදාම ගම්වදින වන අලි වසර ගණනාවක ඉඳලා අපේ නිවාසවලට ඇවිත් අපි වගා කර ඇති ස්ථිර භෝග සහ ගොඩ භෝග විනාශ කරලා යනවා. කොහොමද අපි එතකොට ස්ථිර භෝග හිටවන්නේ. අපේ ජීවිත වගේම දේපළ පවා අහිමි වනවා මේ නිසා. ඒ නිසා මෙරට පුරවැසියකුට අයිති ඉඩම් අයිතියවත් අපට ලැබෙන්නේ නෑ. එය ලබා දෙන්න කියලයි අපි බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ."

එච්. රම්බණ්ඩා මහතා - "නිරන්තරයෙන් වන අලි ග්‍රහණයට ලක්වන අපි ඉල්ලා සිටින්නේ ගෙවතුවල ස්ථිර භෝග වගා කර ගැනීමට තිබෙන ප්‍රධාන ගැටලුව වන අලි ප්‍රදේශයෙන් පන්නා ගම්මානය වටා විදුලි වැටක් කඩිනමින් ඉදි කර දෙන්න කියලයි. නැත්නම් ඔප්පුවක් දෙන්න බලන සුදුසුකම වන ස්ථිර භෝග තිබිය යුතුයි යන නිගමනය වෙනස් කරලා දෙන්න. අපි මේ ගම්බිම්වල වසර තිස්පහකට ආසන්න කාලයක් ස්ථිරව පදිංචි වී සිටින අය."

බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# ටීචර්ට පී.එච්.අයි. අමුතු පීසීආර් එකක් කරලා

**දෙසියයෝ සාක්කි**

තරුණ ගුරුවරියකට ලිංගික අතවරයක් සිදුවන ආකාරයේ අමුතු පීසීආර් පරීක්ෂණයක් සිදු කිරීමට ගිය බවට චෝදනා ලැබූ අනුරාධපුර මහ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් ලක්ෂය බැගින් වූ ශරීර ඇපයක් මත මුදාහරිනා ලෙස අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු නාලක ජයසූරිය මහතා නියෝග කළේය.

මෙසේ ඇප මත මුදාහැර ඇත්තේ අනුරාධපුර නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව සේවය කරනා දඹුල්ලේ පදිංචි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුය.

සිද්ධිය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිල්ලකට අනුව පරීක්ෂණ ඇරඹූ බවත් 31 හැවිරිදි ගුරුවරිය නිවෙසේ නිරෝධායනය වෙමින් සිටියදී සැකකාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා පීසීආර් පරීක්ෂණයක් සිදු කිරීමට එහි ගොස් ඇති බවත් පොලිසිය අධිකරණයට දැන්වීය.

ඇය නිවෙසේ සිටියදී පීසීආර් පරීක්ෂණය සිදු කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා කටයුතු කර තිබෙනා බවත් ඇය පුටුවේ වාඩි වී සිටියදී ඇයට ලිංගික අතවරයක් සිදුවන ආකාරයෙන් පරීක්ෂණය සිදු කර නව ක්‍රමයකට අනුව හදගැස්ම පරීක්ෂා කළ යුතු බව කියමින් ඇය හැඳ සිටි බ්ලවුසයේ බොත්තම් දෙකක් ගලවා පපු පෙදෙස ස්පර්ශ කළ බවට ගුරුවරිය පොලිසියට පැමිණිලි කර තිබෙනා බව ළමා හා කාන්තා කාර්යාංශය අධිකරණයට දැන්වුවේය.

නිලධාරියා සිදු කළ ක්‍රියාවෙන් තමන් බියට පත් වී කෑගැසූ බවත් නිවෙසේ කාමරයක නිදා සිටි සැමියා ඒ අවස්ථාවේ පිටතට පැමිණි බවත් ඔහු සැකකරු සිදු කළ ක්‍රියාව දුටු බවත් ගුරුවරිය පොලිසියට සිදු කළ පැමිණිල්ලේ සඳහන්ව ඇති බව පොලිසිය අධිකරණයට දැන්වුවේය. එම අවස්ථාවේ නිවෙසේ මව හා පියාත් සිටි බව ඇය පොලිසියට සිදු කළ පැමිණිල්ලේ සඳහන්ව ඇති බව පොලිසිය අධිකරණයට දන්වා සිටියේය.

අයුතු ලෙස නිවෙසට ඇතුළු වී ලිංගික අතවරයක් සිදු කිරීමේ චෝදනාව සම්බන්ධයෙන් සැකකරු අත්අඩංගුවටගෙන අධිකරණයට ඉදිරිපත් කරනා බවත් ඔහු රාජකාරියට පැමිණි අවස්ථාවේ නිවැසියන් පොල්ලකින් පහරදුන් බව කියමින් රෝහල්ගත වී ඇති බවත් පොලිසිය අධිකරණයට පැවසීය.

සැකකරු වෙනුවෙන් අධිකරණයට කරුණු දැක්වූ නීතිඥවරුන් කියා සිටියේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා කිසිදු අවස්ථාවක අයුතු ලෙස නිවෙසට ඇතුළු වී නැති බවත් රාජකාරියට ගිය සිය සේවාදායකයාට නිවෙසේ සිටි පිරිස පොල්ලකින් පහරදී රාජකාරියට බාධා සිදු කර තිබෙනා බවත්ය.

අධිකරණයට ඉදිරිපත් වූ කරුණු සැලකිල්ලට ගත් විනිසුරුවරයා සැකකාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා ඇප මත මුදාහැර ඇති අතර ඔහුට ජුනි මස 7 වැනිදා නැවත අධිකරණය හමුවේ පෙනී සිටිනා ලෙස නියෝග කර තිබේ. එමෙන්ම පැමිණිල්ලට කිසිදු බලපෑමක් සිදු නොකරනා ලෙස විනිසුරුවරයා සැකකරුට නියෝග කළේය.

අනුරාධපුර මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඊ.එම්. සංජීව මහනාම මහතාගේ උපදෙස් මත ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක යමුනා කාන්ති මහත්මියගේ මෙහෙයවීමෙන් පොලිස් සැරයන් ඒ. සී. දයානන්ද (28163) මහතා පැමිණිල්ල වෙනුවෙන් අධිකරණයට කරුණු දැක්වා සිටියේය.

සමීර අබේසිංහ - නුගේගොඩ සමූහ

# බස්නාහිර විහාරස්ථාන රැසක රත්හඳුන් පැළ සිටුවයි



බස්නාහිර පළාතේ පැළ ලක්ෂයක් රෝපණය කිරීමේ ජාතික වැඩසටහනට සමගාමීව පොලිස් පරිසර ආරක්ෂණ කොට්ඨාසය මගින් බස්නාහිර පළාතේ වෙහෙර විහාරස්ථානයන්හි රත්හඳුන් පැළ දහසක් සිටුවීමේ සමාරම්භක උත්සවය බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් බොරලැස්ගමුව, පිල්ලෑව බෝධි රාජ විහාරස්ථානයේදී මැයි මස පළමුවන දින උදෑසන පැවැත්විණි.

මේ අවස්ථාවේදී මහා සංඝරත්නය විසින් පැවැත්වූ පිරිත් සජ්ඣායනා හා බෝධි පූජා පින්කමකින් අනතුරුව රුක් රෝපණ වැඩසටහන ආරම්භ විය. විහාර භූමියේ ස්ථාන කීපයක රත්හඳුන් පැළ දහයක් පමණ රෝපණය කිරීමද මේ අවස්ථාවේදී සිදු කෙරිණි.

බොරලැස්ගමුව, පිල්ලෑව විහාරස්ථානයේ පැවැති රත්හඳුන් පැළ සිටුවීමේ රුක් රෝපණ වැඩසටහනෙන් අනතුරුව පැපිලියාන සුනෙත්‍රාදේවි මහා පිරිවෙන් විහාරස්ථානයේ සහ කෝට්ටේ ඓතිහාසික රාජමහා විහාරයේ මෙන්ම කෝට්ටේ නාග විහාරය, පන්නිපිටිය ශ්‍රී දෙව්රම් වෙහෙර ඇතුළු විහාරස්ථාන තුළ ද සඳුන් පැළ රෝපණය කෙරිණි.

කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය උපදෙස් මත ජන සහභාගීත්වයකින් තොරව මේ වැඩසටහන පැවැත්වූ අතර මේ අවස්ථාවට බොරලැස්ගමුව, පිල්ලෑව බෝධි රාජ විහාරයේ විහාරාධිපති පොලොන්නරුවේ ශීලානන්ද නාහිමි සහ විහාරාධිකාරි ගෝනපීනුවල චන්ද්‍රරතන ස්වාමීන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නය හා බොරලැස්ගමුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ. ජී. විජේරත්න, බොරලැස්ගමුව පොලිස් ස්ථානයේ පාරිසරික අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ආසිරි ජයසූරිය යන මහත්වරුන් ඇතුළු පොලිස් නිලධාරීහු පිරිසක් සහභාගි වී සිටියහ.

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

# රුවල්වෙල මීයන්නා ඔයට පාලමක්



බිබිල මැතිවරණ බල ප්‍රදේශයේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුල්ල රුවල්වෙල මාර්ගයේ මීයන්නා ඔය හරහා පාලමක් ඉදි කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය පියවරගෙන ඇත.

මේ පාලම ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 25ක් පමණ වැය කෙරේ. පාලමේ ඉදි කිරීම් කටයුතු දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතා විසින් ඉකුත්දා (30) ආරම්භ කරන ලදි. මේ අවස්ථාවට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති චමින්ද පුෂ්පකුමාර මහතාද සහභාගි විය.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

# කොරෝනා හැදුණු සිසුවියන් දෙදෙනා රෝහලේ ඉඩ නැතිව ගෙදර එවලා

මේ වසරේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිටිනා අහංගම ප්‍රදේශයේ මහ විදුහල් දෙකක සිසුවියන් දෙදෙනකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇතැයි හබරාදූව සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය ප්‍රකාශ කළේය.

ඒ අනුව අහංගම කුරුඳුවත්තේ පදිංචි 17 හැවිරිදි සිසුවියකට සහ කොග්ගල පදිංචි 18 හැවිරිදි සිසුවියකට මෙසේ කොරෝනා වයිරසය ආසාදනය වී ඇත.

අහංගම කුරුඳුවත්තේ පදිංචි සිසුවිය රෝහල්ගත කිරීමෙන් අනතුරුව රෝහල්වල ඉඩකඩ නැති වීමෙන් ඇය ආපසු නිවෙසට එවා ඇත.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

# පෝද්දලදී ඇල්ලූ සැකකරුවන් දෙදෙනෙක් ළඟ හෙරොයින්

පෝද්දල ප්‍රදේශයේදී හෙරොයින් ග්‍රෑම් 14 මිලිග්‍රෑම් 660ක් සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගත් බව ගාල්ල පොලිසිය ප්‍රකාශ කළේය.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ වක්වැල්ල හපුගල මවුන්ට් ප්ලෙසන්ට් වත්ත පදිංචි 38 හැවිරිදි සැකකරුවෙක් සහ හපුගල මොල්ලිගෙඩ වත්ත පදිංචි 28 හැවිරිදි සැකකරුවෙකි. මවුන්ට් ප්ලෙසන්ට් වත්ත පදිංචිකරු සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 9 මිලිග්‍රෑම් 330ක්ද මොල්ලිගොඩ වත්ත පදිංචි සැකකරු සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 5 මිලිග්‍රෑම් 330ක්ද සොයාගෙන ඇත.

සැකකරුවන් හෙරොයින් ජාවාරම් කිරීමට යන බවට ලැබුණු තොරතුරක් අනුව ගාල්ල පොලිසියේ දූෂණ මර්දන අංශයට අනුයුක්ත පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා, සැරයන්වරුන් වන ලක්මාල් (1765), වික්‍රමරත්න (15044), කොස්තාපල්වරුන් වන ගුරුසිංහ (67482), අචිල(83532), ඉසුරු (84466) යන නිලධාරීහු වැටලීමට එක් වූහ. සැකකරුවන් දෙදෙනා ගාල්ල මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

# Samson Compounds රිදී ජුබිලිය සමරයි



දිවයිනේ ප්‍රමුඛතම 'රබර් කම්පවුන්ඩ්' නිෂ්පාදකයකු වන Samson Compounds පෞද්ගලික සමාගම, තම රිදී ජුබිලිය සහ රුපියල් බිලියන 3ක වාර්ෂික පිරිවැටුම සමරමින්, පසුගියදා විවිධ වැඩසටහන් රැසක් සංවිධාන කිරීමට කටයුතු සූදානම් කර තිබිණි. ඒ අනුව වසර 25ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන්ට උපහාර පිදීමේ උත්සවයක් ද, කොට්ටව රක්ෂිත වනාන්තරයේ පැළ රෝපණයක් සහ ආගමික වැඩසටහන් රැසක්ද පැවැත්විණි.

රබර් කම්පවුන්ඩ් නිෂ්පාදනයට අමතරව, තිරසර බව, නව තාක්ෂණය, ගතික වෙළෙඳපොළවලට පිවිසීම සහ උසස් තත්ත්වයේ විවිධ වූ රබර් නිෂ්පාදන හඳුන්වා දීම ආදිය කෙරෙහි සමාගමේ ප්‍රමුඛ අවධානයක් යොමුව තිබේ. සංයුක්ත රබර්, රබර් ෂීට් සහ මැට්ස්, රබර් අච්චුගත නිෂ්පාදන, EVA නිෂ්පාදන, ප්ලාස්ටික් හා PVC නිෂ්පාදන හා වහල මත අතුරන ෂීට් ආදිය සමාගමේ නිෂ්පාදන පෙළට අයත් වේ. මේ නිෂ්පාදන සඳහා ISO9001;2015, FSC-STD-40-007, FSC-STD-40-004, FSC-STD-50-001 ආදි තත්ත්ව සහතික මෙන්ම, REACH, RoHS, PAH free, Phthalate free යන අනුකූලතා සහතික රැසක් ද හිමිව තිබේ. තවද ICQCC 2020, NCQP 2020/2019/2018/2017, ශ්‍රී ලංකා ආයතනික සෞඛ්‍ය හා ඵලදායිතා සම්මාන 2020 සහ 2018 වැනි සම්මාන උලෙළ රැසකදී සමාගම සම්මානවලින් පිදුම් ලබා ඇත. 1996 වසරේදී ආරම්භ වූ Samson Compounds පෞද්ගලික සමාගමේ මෙහෙයුම් කටයුතු වර්ෂ 1962 සිට DSI සන්නාමය යටතේ ක්‍රියාත්මක අතර, ඕස්ට්‍රේලියාව, ෆීජි දූපත්, එක්සත් රාජධානිය, කැනඩාව, ඉතාලිය, ජර්මනිය, පාකිස්තානය සහ සිංගප්පූරුව යන රටවලට තම නිෂ්පාදන අපනයනය කරයි.

# CIPM ශ්‍රී ලංකා සංවිධාන කළ Kandy Chapter සාර්ථකව අවසන්



මානව සම්පත් කළමනාකරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වන CIPM ශ්‍රී ලංකා ආයතනය විසින් පසුගියදා Kandy Chapter නම් දැනුවත් කිරීමේ වැඩසටහන උත්කර්ෂවත් අන්දමින් මහනුවර මහවැලි රීච් හෝටලයේදී පවත්වන ලදි. එම සුවිශේෂ වැඩසටහනට මහනුවර ප්‍රදේශයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් 200කට වැඩි පිරිසක් සහභාගි වූහ. මානව සම්පත් කළමනාකරණයෙන් සපිරුණු වෘත්තිකයන් දේශයට දායාද කිරීමට මානව සම්පත් කළමනාකරණයට අදාළ සහතිකපත්, ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා රැසක් CIPM ශ්‍රී ලංකා ආයතනය සාර්ථකව පවත්වයි. CIPM ශ්‍රී ලංකා ආයතනය දේශයට විශිෂ්ට වෘත්තිකයන් රැසක් දායාද කර ඇත. Kandy Chapter වැඩසටහනේ මූලික අරමුණ වූයේ CIPM ශ්‍රී ලංකා පාඨමාලාවල විශේෂත්වය සහ එහි දැක්ම පිළිබඳ මහනුවර ප්‍රදේශයේ ව්‍යාපාර හිමිකරුවන්, වතු හිමියන්, ප්‍රධාන විධායක නිලධාරින්, කළමනාකරුවන් සහ වෘත්තිකයන් දැනුම්වත් කිරීමයි.

Kandy Chapter වැඩසටහනට CIPM ශ්‍රී ලංකා ආයතනයේ විධායක සභාවේ සභාපති ජයන්ත අමරසිංහ, ලේකම් කෙන් විජයකුමාර්, භාණ්ඩාගාරික ප්‍රියන්කර සෙනෙවිරත්න මහත්වරු සහ අනෙකුත් කමිටු සාමාජිකයෝ, CIPM ශ්‍රී ලංකා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි සහ සාමාජිකයෝ සහභාගි වූහ. "මානව සම්පත් කළමනාකරණ හැකියාවෙන් සහ දක්ෂතාවෙන් පිරිපුන් වෘත්තිකයන් ආයතනික මට්ටමෙන් බිහි කරන්න අවශ්‍ය පසුබිම සහ දැනුවත්භාවය දීම මේ වැඩසටහනේ ප්‍රමුඛතම අරමුණයි. මේ වැඩසටහන විශිෂ්ට ලෙස සංවිධාන කරන්න දායකත්වය දැක්වූ සැමට කෘතවේදීත්වය පිරිනමනවා." සභාපති ජයන්ත අමරසිංහ මහතා පැවසීය. CIPM ශ්‍රී ලංකා මහනුවර ශාඛාව සංවිධාන කළ Kandy Chapter වැඩසටහනේදී එදින සහභාගි වූ සාමාජිකයන් විසින් Kandy Chapter වැඩසටහනේ සභාපතිවරයා වශයෙන් ධම්මික කොබ්බෑකඩුව මහතා පත් කර ගන්නා ලදි. 1959දී IPM නාමයෙන් ස්ථාපනය කරන ලද CIPM ශ්‍රී ලංකා ආයතනය 2018දී පාර්ලිමේන්තු පනතකින් වරලත් ආයතනයක් බවට පත් කරන ලදි. වසර 60කට ආසන්න කාලයක් තුළ විශිෂ්ට වෘත්තිකයන් රැසක් දේශයට දායක කිරීමට CIPM ශ්‍රී ලංකා ආයතනය මහඟු මෙහෙවරක් කර ඇත.

# විශිෂ්ටතම ව්‍යවසායකයා සම්මානය සදර්න් ඇග්‍රෝ සර්ව් දිනයි



කෘෂි උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර අලෙවි ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාගමක් වන සදර්න් ඇග්‍රෝ සර්ව් පෞද්ගලික සමාගම ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය සංවිධාන කළ වසරේ ව්‍යවසායකයා සම්මාන උලෙළේදී ජාතික මට්ටමේ, මධ්‍ය පරිමාණ කාණ්ඩයේ, ලෝකඩ සම්මානයෙන් සහ දකුණු පළාතේ, මධ්‍ය පරිමාණ කාණ්ඩයේ, රිදී සම්මානයෙන් පිදුම් ලැබීය. සම්මාන උලෙළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ


ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් ලෙස BMICHහිදී පැවැත්විණි. සදර්න් ඇග්‍රෝ සර්ව් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ එස්. පී. රවීන්ද්‍ර මහතා එහිදී සම්මානය ගත්තේය. මීට පෙරද සදර්න් ඇග්‍රෝ ආයතනය වසරේ ව්‍යවසායකයා සම්මානය ඇතුළු සම්මාන රැසකින් පිදුම් ලබා ඇත.

"ශ්‍රී ලංකාවේ අනාගත පැවැත්ම තහවුරු කරන්න දායකත්වය දෙන කෘෂි කර්මාන්තයට ප්‍රමුඛ දායකත්වයක් දෙන්න අපට අවස්ථාව ලැබීම සතුටට කරුණක්. කෘෂිකාර්මික කටයුතු කාර්යක්ෂම සහ ඵලදායි කරන කෘෂි උපකරණ දීම අපගේ ප්‍රධාන අරමුණයි. එසේම අනාගතයේදී තවත් නිෂ්පාදන රැසක් හඳුන්වා දෙන්න අප සූදානම්. මේ සම්මානය දිනා ගැනීමට දායකත්වය සැපයූ කාර්ය මණ්ඩලයට මෙන්ම ආදරණීය පාරිභෝගිකයන්ට මගේ කෘතවේදීත්වය පිරිනමනවා." එස්. පී. රවීන්ද්‍ර මහතා පැවසීය.

පහසුවෙන් මෙන්ම ආරක්ෂාකාරීව භාවිත කළ හැකි උදලු, අලවංගු, සවල්, කප්පාදු කියත්, කතුරු ඇතුළු ඕනෑම වර්ගයක කෘෂි උපකරණ රැසක් සදර්න් ඇග්‍රෝ සමාගම නිෂ්පාදනය මෙන්ම ගෙන්වා බෙදා හරින අතර, එම සියලු නිෂ්පාදන දිවයින පුරා පිහිටි අලෙවි නියෝජිතයන් 600කට ආසන්න පිරිසකගෙන් ගත හැකිය. අලෙවියෙන් පසු විශිෂ්ට සේවයක් මෙන්ම වගකීමක් සහිතව නිෂ්පාදන අලෙවි කරන බැවින් කෘෂි කාර්මික ක්ෂේත්‍රය තුළ විශ්වාසය දිනූ නාමයක් බවට පසුගිය කාලය තුළ සදර්න් ඇග්‍රෝ සර්ව් සමාගම පත් විය. 2004 වසරේදී ආරම්භ කළ සදර්න් ඇග්‍රෝ ආයතනය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් නිරන්තරයෙන් කටයුතු කරයි.




| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| පහත රට එළවළු | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 70 | | 60 | 50 | 80 | | ගෝවා | 100 |
| අළු කෙසෙල් | | | 90 | 60 | 70-80 | | කැරට් | 125 |
| පිපිඤ්ඤා | 80 | | 60 | 60 | 30 | | ලීක්ස් | 50 |
| වැටකොළු | 100 | | 120 | 120 | 60-80 | | රාබු | 50 |
| බණ්ඩක්කා | 100 | | 90 | 70 | 70 | | බීට්රූට් | 60 |
| කරවිල | 130 | | 110 | 90 | | | අර්තාපල් | 125 |
| පතෝල | 100 | | 100 | 100 | 60-80 | | අර්තාපල් රතු | 110 |
| මාළු මිරිස් | 200 | | 210 | 110 | 20-25 | | නෝකෝල් | 60 |
| බටානා | | | 90 | 70 | 70 | | බෙල්පෙපර් රතු | 350 |
| මුරුංගා | 300 | | | | | | කහ | 350 |
| එළබටු | 80 | | 100 | 90 | 60-70 | | කොළ | 550 |
| කැකිරි | 80 | | 40 | 30 | 20-25 | | බැසිල් | 220 |
| නෝකෝල් | 100 | | 120 | 90 | 50 | | චයිනීස් කැබේජ් | 330 |
| මඤ්ඤොක්කා | 60 | | 50 | | 85-100 | | රෙඩ් කැබේජ් | 670 |
| බතල | | | 80 | | 85-90 | | සැල්දිරි | 450 |
| දඹල | 130 | | 110 | 100 | 80-100 | | කොත්තමල්ලි කොළ | 200 |
| මැකරල් | 90 | | 90 | 70 | 70-100 | | අයිස්බර්ග් | 220 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 60 |
| බෝංචි | 180 | | 160 | 170 | 170 | | රතුසලාද | 700 |
| ගෝවා ගෙඩි | 160 | | 90 | 100 | 90 | | මිංචි | 600 |
| කැරට් | 180 | | 160 | 160 | 150-180 | | පාස්ලි | 400 |
| ලීක්ස් | 100 | | 80 | 75 | 70-80 | | රුබා | 60 |
| රාබු | 80 | | 100 | 70 | 70 | | රෝස්මරි | 700 |
| තක්කාලි | 100 | | 100 | 70 | 90 | | බ්‍රොකෝලි | 600 |
| බීට්රූට් | 80 | | 50 | 40 | 110 | | මල්ගෝවා | 400 |
| සලාද | | | 250 | | 120 | | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 60 | | 110 | 30 | | | පැචර්ලි | 220 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 170 |
| අන්නාසි | 140 | | | 110 | 80-110 | | කහ සුකිනි | 100 |
| ඇඹුල් කෙසෙල් | 120 | | | 70 | 20-50 | | දිගරාබු | 100 |
| කෝලිකුට්ටු | 220 | | | 160 | 100-130 | | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 130 | | | 80 | 30-40 | | මාළුමිරිස් | 200 |
| ඇඹුල් | 200 | | 130 | 80 | 100-140 | | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | | | 100 | | 35-50 | | | |
| ගස් ලබු | 140 | | 100 | | 30-50 | | | |
| ඇපල් (ආනයනික) | 60-80 | | 60 | | 35-75 | | | |
| මිදි (දේශිය) | | | | | | | | |
| මිදි (ආනයනික රතු) | 1100 | | 950 | | | | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | | 950 | | 900 | | | |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස් - අලුත් (සම රහිත) | 600 | | - | | 550 | | | |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 550 | | - | | | | | |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 200 | | 180 | 160 | 130-140 | | | |
| දෙහි | 150 | | 180 | 130 | | 55-60 | | |
| අමු ඉඟුරු | - | | 240 | | 180-200 | 150-155 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96-100 | | 110 | 105 | 104-115 | | | |
| සුදු නාඩු | 96-120 | | 115 | 110-113 | | | | |
| රතු කැකුළු | 89-100 | | 95 | 93 | | | | |
| සුදු කැකුළු | 93-115 | | 110 | 100 | | | | |
| සුදු කැකුළු සම්බා | 108 | | 120 | 117-125 | 135-140 | | | |
| තම්බපු කැකුළු සම්බා | 110 | | 155 | 117-125 | 135-140 | | | |
| කිරි සම්බා | 125-205 | | 190 | | 198 | | | |



දැනගෙන ගන්න රන් මිල

කැරට් 21 - 94.500
කැරට් 22- 94.000
කැරට් 24- 1.08000

### සෞඛ්‍ය අමාත්‍යාංශය

# ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ රෝහල් හා සෞඛ්‍ය ආයතන සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීම - 2021/2022

# ලංසු දැන්වීමයි

2021/2022 වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පහත සඳහන් රෝහල් හා ආයතනවල පිරිසිදු කිරීමේ සේවය සැපයීම පිණිස ලියාපදිංචි ආයතනවලින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන C2 කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

1. මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ලිය යුතුය.
   - i. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත යටතේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස පුවත්පත් දැන්වීම පළ වූ දිනට අවම වශයෙන් වර්ෂයකට පෙර ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.
   - ii. පිරිසිදු කිරීමේ සේවය සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය / අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ බව අදාළ ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ලිපිය සමඟ සේවාව සැපයූ ආයතනයෙන් ලබා ගත් ලිපි මඟින් තහවුරු කළ යුතුය.
   - iii. පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය (ඒ ඒ රෝහල් /ආයතනය සඳහා වෙන වෙනම ලියාපදිංචි සහතික ඉදිරිපත් කළ යුතුය)
   - iv. රෝහල් සහ සෞඛ්‍ය ආයතන සඳහා පහත සඳහන් වටිනාකම්වලට මාස 06ක් ඇතුළත ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් පොදු 170 ආකෘතියේ වටිනාකම් සහතිකය (මුල් පිටපත) (කොන්ත්‍රාත්කරු විසින් රෝහල් / ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කරනු ලබන්නේ නම් එම රෝහල්/ ආයතනවල වටිනාකම්වල එකතුවට සමාන හෝ වැඩි වටිනාකමට ලබාගත් සහතිකයක් විය යුතුය.) තවද, ඔබ විසින් ඉල්ලුම් කරන රෝහල/ආයතනය අනුව වාර්ෂික වටිනාකම පහත පරිදි විය යුතුය.)

| | | වාර්ෂික වටිනාකම |
|---|---|---|
| 1. | සෞඛ්‍ය අමාත්‍යාංශය/ ශික්ෂණ රෝහල් හා මහ රෝහල් | රු. 1,000,000.00 |
| 2. | මූලික රෝහල් හා දිසා රෝහල් හා ප්‍රාදේශීය රෝහල් | රු. 500,000.00 |
| 3. | සෞඛ්‍ය ආයතන | රු. 300,000.00 |

   - v. පහත සඳහන් එක් එක් රෝහල/ආයතන සඳහා වගුවෙහි සඳහන් වටිනාකම් වලට බැංකු අයිරා පහසුකම් ලබාදෙන බවට කොන්ත්‍රාත්කරු ගනුදෙනු කරන බැංකුවෙන් නිකුත් කළ ලිපිය (මුල් පිටපත) (කොන්ත්‍රාත්කරු විසින් රෝහල් /ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කරනු ලබන්නේ නම් එම රෝහල්/ආයතනවල වටිනාකම්වල එකතුවට සමාන හෝ වැඩි වටිනාකමට ලබාගත් සහතිකයක් විය යුතුය.)
   - vi. පූර්වාසන්න වර්ෂය සඳහා තම ව්‍යාපාර ලියාපදිංචි නාමය යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම වෙනුවෙන් සේවයේ යොදවනු ලැබූ සියලුම සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුවෙන්/ සේවක භාරකාර අරමුදලෙන් ලබාගත් රිසිට්පත් සහ සේවකයින්ගේ නමින් ඒ ඒ ගිණුම් වලට බැර වූ බවට ලබාගත් සී වාර්තා හෝ විද්‍යුත් මාර්ගික ගෙවීම් 2020.12.31දින දක්වා ඇතුළත් ගෙවීම් ලේඛන ඉදිරිපත් කළ යුතුය. (2020/2021 වර්ෂයට අදළ ආසන්න පසුගිය මාස 12ක )
   - vii. පූර්වාසන්න තක්සේරු වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ ආයතනය නමින් වැට් බදු/ආදයම් බදු ගෙවා ඇති බව ලිඛිත සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය. (සී/ස සමාගමක් නම් සමාගම නමින් ද, තනි පුද්ගල/හවුල් ව්‍යාපාර ආයතන සියලු හවුල්කරුවන්ගේ නමින් ද, පූර්වාසන්න වර්ෂය සඳහා අදයම් බදු, වැට් බදු ගෙවා ඇති බවට ලිඛිත ලියවිලි ඉදිරිපත් කළ යුතුය. (2019/2020 වර්ෂය සඳහා පමණි)
   - viii. රු. ............................................................. ක් වටිනා ලංසු ඇපකරයක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති මූල්‍ය ආයතනයකින් / රක්ෂණ ආයතනයකින් කොළඹ10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සුවසිරිපාය, 385, ලිපිනයෙහි වූ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් නමට ලියන ලද ලංසු භාර ගැනීම අවසන් වූ දින සිට දින 119 ක කාලයකට වලංගු වන සේ ලබාගත් ලංසු බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතුය. (ඇමුණුම 01 ආකෘතිය පරිදි) (2021.05.25 දින සිට 2021.09.20) දක්වා වලංගු විය යුතුය.

2. ලංසු අයදුම්පත් **2021.05.04 දින සිට 2021 05.24 දින දක්වා** සතියේ වැඩ කරන දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා** නො.26, 2 වන මහල, ශ්‍රී සංඝරාජ මාවත. කොළඹ 10, ලිපිනයෙහි වූ සෞඛ්‍ය අමාත්‍යාංශයේ (නව ගොඩනැගිල්ල) ප්‍රසම්පාදන ශාඛාවෙන් ලබා ගත හැකිය. ලංසු අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන ඒ ඒ රෝහල/ආයතනය සඳහා පහත පරිදි ගාස්තුවක් ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 7040244 වෙත මුදලින් ගෙවා ලබාගත් ලදුපත හා ලංසු ලියවිලි ඉල්ලුම් කිරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.

### ආයතනය/ රෝහල

| අනු අංකය | රෝහලේ නම | ටෙන්ඩර් අංකය | වටිනාකම් සහතිකය (රු.) | ණය පහසුකම් ලබාගත යුතු වටිනාකම (රු.) (හෝ නොඅඩු) | ලංසු ඇපකරය (රු) | ලංසු ලියවිලි ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|---|
| 1 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - ස්නායු ක්ෂිත ඒකකය හා හදිසි අනතුරු අංශය ඇතුළත් වන ප්‍රදේශය | MH/PB/CL/01/2021 | 1,000,000.00 | 1,504,517.00 | 602,000.00 | 12,500.00 |
| 2 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - උගුර, කන්, නාසය සායනය 18, 45 සායනය, X-ray අංශය හා X-ray කසළ, 15, 16, 62, 63, 64, 66 වයිට් හවුස් අවට, වත්ත, චර්ම රෝග, බෞද්ධ මධ්‍යස්ථානය අවට වත්ත, PHI කාර්යාලය, පෞද්ගලික කාර්යාලය, AB ඕවර්සියර් කාර්යාල, ABC නවලෝක ශල්‍යාගාර, ලේ බැංකු අවට, භෞතික විකිරණ අවට සියලුම බිම් කොටස, 65 වාට්ටුව, ඇතුළත් වන ප්‍රදේශය | MH/PB/CL/02/2021 | 1,000,000.00 | 711,503.50 | 285,000.00 | 3,500.00 |
| 3 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - 17, 18, 19, 20, 21, 22, 23, 24, 25, 26, 27, 28 හා 65AB වාට්ටු, ශල්‍යාගාර, OPD / ECG කාමර, වැස්කියුලර් ලැබ්, බෝධිය අවට ඇතුළු වත්තට අයත් කලාපය ඇතුළත් වන ප්‍රදේශය | MH/PB/CL/03/2021 | 1,000,000.00 | 758,972.25 | 304,000.00 | 3,500.00 |
| 4 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - මුළුතැන් ගෙවල් 02, බෙහෙත් ශාලාව, ඖෂධවේදී පාසල, ලිපි ද්‍රව්‍ය ගබඩාව, ලේඛනාගාරය, අසාදන පාලන, විගණන, පොත් බැඳීම්, වායු සමීකරණ නඩත්තු, පෝෂණවේදී, හෙද පාලිකා, වෛද්‍ය විවේක, සුළුසේවා පාලක ප්‍රධාන ඕවර්සියර් කාර්යාලය ඇතුළු කලාපයට ඇතුළත් වන ප්‍රදේශය. | MH/PB/CL/04/2021 | 1,000,000.00 | 267,844.93 | 108,000.00 | 3,500.00 |
| 5 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - 29, 30, 31, 32,33, 34 35,36, 37, 38, 39, 40 රසායනාගාරය, මෘත ශාරීරාගාරය, ඕවර්සියර් කාර්යාලය E, ඉකියිලේටර් ප්‍රදේශය ඇතුළත් වන ප්‍රදේශය | MH/PB/CL/05/2021 | 1,000,000.00 | 646,936.70 | 259,000.00 | 3,500.00 |
| 6 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - 52, 53, 54 BU, BMOT, V SOT අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලය, ඕවර්සියර්, අධි හදිසි අනතුරු විකලාංග සායන (ASOC) විකලාංග සායන (GSSD) DPM, බෙහෙත් ශාලාව, කාර්මික වැඩපළ ඇතුලු කලාපය ඇතුළත් වන ප්‍රදේශය | MH/PB/CL/06/2021 | 1,000,000.00 | 533,059.10 | 214,000.00 | 3,500.00 |
| 7 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - 60,61, 69, 70, CCU, ICU, NICU, NDU, OTJ, OPD, CIU I, CIU II, ECG, දේශන ශාලාව CIU III, NTS, 93 NQ, 200NQ, PBS, භෞතික චිකිත්සක පාසල, DQ නිල නිවාස වත්ත ඇතුළත් කලාපය ඇතුළත් වන ප්‍රදේශය | MH/PB/CL/07/2021 | 1,000,000.00 | 1,061,342.48 | 425,000.00 | 3,500.00 |
| 8 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - බාහිර රෝගී අංශය ඇතුළත් වන ප්‍රදේශය | MH/PB/CL/08/2021 | 1,000,000.00 | 327,952.00 | 132,000.00 | 3,500.00 |
| 9 | **ශ්‍රී ලංකා ජාතික රෝහල** - අපස්මාර ගොඩනැගිල්ල හා අවට ඇතුළත් වන ප්‍රදේශය | MH/PB/CL/09/2021 | 1,000,000.00 | 515,446.13 | 207,000.00 | 3,500.00 |
| 10 | ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර | MH/PB/CL/10/2021 | 300,000.00 | 215,378.30 | 86,200.00 | 1,000.00 |
| 11 | සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය | MH/PB/CL/11/2021 | 300,000.00 | 84,530.50 | 34,000.00 | 1,000.00 |
| 12 | මහ රෝහල, හලාවත | MH/PB/CL/12/2021 | 1,000,000.00 | 1,182,595.62 | 474,000.00 | 3,500.00 |
| 13 | අපේක්ෂා රෝහල, මහරගම | MH/PB/CL/13/2021 | 1,000,000.00 | 1,741,262.65 | 697,000.00 | 12,500.00 |
| 14 | පවුල් සෞඛ්‍ය කාර්යාංශය | MH/PB/CL/14/2021 | 300,000.00 | 87,950.00 | 36,000.00 | 1,000.00 |
| 15 | මහ රෝහල (ශික්ෂණ), කෑගල්ල | MH/PB/CL/15/2021 | 1,000,000.00 | 825,845.16 | 331,000.00 | 3,500.00 |
| 16 | මහ රෝහල, මාතර සහ අනුබද්ධ ආයතන | MH/PB/CL/16/2021 | 1,000,000.00 | 1,786,080.85 | 715,000.00 | 12,500.00 |
| 17 | මූලික රෝහල (ශික්ෂණ), ගම්පොල | MH/PB/CL/17/2021 | 500,000.00 | 730,950.50 | 293,000.00 | 3,500.00 |
| 18 | වෛද්‍ය පර්යේෂණ ආයතනය, බොරැල්ල | MH/PB/CL/18/2021 | 300,000.00 | 216,000.00 | 87,000.00 | 1,000.00 |
| 19 | කාසල් විදියේ කාන්තා රෝහල (ශික්ෂණ) | MH/PB/CL/19/2021 | 1,000,000.00 | 1,180,548.15 | 473,000.00 | 3,500.00 |
| 20 | මහ රෝහල, ත්‍රිකුණාමලය | MH/PB/CL/20/2021 | 1,000,000.00 | 1,117,221.50 | 447,000.00 | 3,500.00 |
| 21 | දිස්ත්‍රික් මහ රෝහල, මොණරාගල | MH/PB/CL/21/2021 | 1,000,000.00 | 1,275,817.19 | 511,000.00 | 12,500.00 |
| 22 | පළාත් මහ රෝහල, රත්නපුර | MH/PB/CL/22/2021 | 1,000,000.00 | 2,461,152.00 | 985,000.00 | 12,500.00 |
| 23 | ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, නාරාහේන්පිට | MH/PB/CL/23/2021 | 300,000.00 | 134,344.00 | 54,000.00 | 1,000.00 |
| 24 | පළාත් මහ රෝහල, බදුල්ල. | MH/PB/CL/24/2021 | 1,000,000.00 | 1,809,593.56 | 724,000.00 | 12,500.00 |
| 25 | ද සොයිසා කාන්තා රෝහල | MH/PB/CL/25/2021 | 1,000,000.00 | 653,397.00 | 262,000.00 | 3,500.00 |
| 26 | ශික්ෂණ රෝහල, මඩකලපුව | MH/PB/CL/26/2021 | 1,000,000.00 | 1,679,178.44 | 672,000.00 | 12,500.00 |
| 27 | නැගෙනහිර කොළඹ මූලික රෝහල, මුල්ලේරියාව | MH/PB/CL/27/2021 | 500,000.00 | 788,604.44 | 316,000.00 | 3,500.00 |
| 28 | මුල්ලේරියාව අංශ II හා හෙද විදුහල | MH/PB/CL/28/2021 | 1,000,000.00 | 1,026,602.70 | 411,000.00 | 3,500.00 |
| 29 | සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල, පේරාදෙණිය | MH/PB/CL/29/2021 | 1,000,000.00 | 803,376.31 | 322,000.00 | 3,500.00 |
| 30 | ශික්ෂණ රෝහල, පේරාදෙණිය - රෝහලට අනුයුක්ත ගලහා ජාතික භික්ෂු මධ්‍යස්ථානය | MH/PB/CL/30/2021 | 1,000,000.00 | 95,095.44 | 39,000.00 | 1,000.00 |
| 31 | ශික්ෂණ රෝහල - කුලියාපිටිය | MH/PB/CL/31/2021 | 1,000,000.00 | 877,475.22 | 351,000.00 | 3,500.00 |
| 32 | දකුණු කොළඹ ශික්ෂණ රෝහල - කළුබෝවිල | MH/PB/CL/32/2021 | 1,000,000.00 | 2,027,500.00 | 811,000.00 | 12,500.00 |
| 33 | දිස්ත්‍රික් මහ රෝහල, මීගමුව | MH/PB/CL/33/2021 | 1,000,000.00 | 947,480.03 | 379,000.00 | 3,500.00 |
| 34 | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදූව | MH/PB/CL/34/2021 | 1,000,000.00 | 256,031.48 | 103,000.00 | 3,500.00 |
| 35 | ශික්ෂණ රෝහල, කරාපිටිය | MH/PB/CL/35/2021 | 1,000,000.00 | 2,694,642.01 | 1,078,000.00 | 20,000.00 |
| 36 | ජාතික අක්ෂි රෝහල, කොළඹ 10. | MH/PB/CL/36/2021 | 1,000,000.00 | 599,603.34 | 240,000.00 | 3,500.00 |

3. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි 2021.05.25 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "$C_2$", සෞඛ්‍ය අමාත්‍යාංශය (නව ගොඩනැගිල්ල), 2 වන මහල, අංක 26, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ සෞඛ්‍ය අමාත්‍යාංශ, නව ගොඩනැගිල්ලෙහි 2 වන මහලේ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ භාරදීමට කටයුතු කළ යුතුය. ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2021/2022 වර්ෂයේ ............................................... රෝහල/ ආයතනය සඳහා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා රෝහල් සහ ආයතනවල පිරිසිදු කිරීමේ සේවය සැපයීම සඳහා ඉදිරිපත් කරන ලංසු එක් එක් ආයතන වෙනුවෙන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලා ඇති ලියකියවිලිවල මුල් පිටපත එක් ලංසුවක් සමඟ ද සහතික කළ පිටපත් එක් එක් ලංසුව සමඟ වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

5. ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

6. 2021.05.25 දින පෙ.ව. 10.00 දක්වා අංක 26, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10, සෞඛ්‍ය අමාත්‍යාංශ නව ගොඩනැගිල්ලෙහි දෙවන මහලෙහි අතිරේක ලේකම් ( ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ලංසු භාරගැනීම සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. වැඩි විස්තර සඳහා අතිරේක ලේකම් ( ප්‍රසම්පාදන) අමතන්න. (දුරකථන අංක 011-2112713, 011 -2112717)

7. අදළ ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

**සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "C2",**
**ප්‍රසම්පාදන අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශ (නව ගොඩනැගිල්ල),**
**දෙවන මහල, අංක 26, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.**

අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග
දිනමිණ මඟුල්
මංගල යෝජනා තීරයයි...
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
classified@lakehouse.lk
රු. 560/-
පියුමි - 011 2 429 383 , රමනි - 011 2 429 347 , ගයනි - 011 2 429 343 / 342

# ප්‍රසම්පාදන දැන්වීම

## මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

## මධ්‍යම පළාත

මධ්‍යම පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මාර්ග සඳහා වලංගු ලියාපදිංචිය ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් කර්මාන්ත ඉදිකිරීම සහ ද්‍රව්‍ය සැපයීම සඳහා ද ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් සැපයීම සඳහා රජයේ වලංගු ලියාපදිංචිය ඇති ඇස්ෆෝල්ට් නිෂ්පාදනය කර බෙදාහරින්නන්ගෙන් ද පහත උපලේඛනයේ සඳහන් කර්මාන්ත සඳහා ලංසු කැඳවනු ලැබේ. ලංසු මුදල රුපියල් මිලියන 5 හෝ 5 ට වැඩි කර්මාන්ත සමාගම් මැදුරේ 1987 අංක 03 පොදු කොන්ත්‍රාත් පනත අනුව ලියාපදිංචි විය යුතුය.

2021.05.04 දින සිට 2021.05.25 දින දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා කාර්යාල වේලාවන් තුළදී මහනුවර, බෝගම්බර, ඇහැලේපොල කුමාරිහාමි මාවතේ පිහිටි පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙත, කොන්ත්‍රාත්කරුවන් විසින් කර්මාන්ත ඉදිකිරීම සහ ද්‍රව්‍ය සැපයීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මාර්ග සඳහා වලංගු ලියාපදිංචි සහිත පොත ද ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් සැපයීම සඳහා ඇස්ෆෝල්ට් නිෂ්පාදනය කර බෙදාහැරීමට අදාළ ව්‍යාපාර ලියාපදිංචිය සමග පහත ඒ ඒ විෂයය ඉදිරියේ දක්වා ඇති පරිදි ආපසු නොගෙවන ලංසු තැන්පතු මහජන බැංකුවේ අංක 158100110000022 ගිණුම් අංකයට බැර කර ලබාගත් කුවිතාන්සියේ මුල් පිටපත ඉදිරිපත් කර ලංසු පත්‍රිකා ලබාගත හැකිය.

සැලකිය යුතුයි: ඉහත සඳහන් ගිණුම් අංකයට ඔබ විසින් මුදල් බැර කිරීමේදී එක් කර්මාන්තයක් සඳහා එක් කුවිතාන්සිය බැගින්

➢ කොන්ත්‍රාත් ආයතනයේ නම සහ ලිපිනය

➢ ඔබ විසින් මුදල් ගෙවන කර්මාන්තයට අදාළ කොන්ත්‍රාත් අංකය

➢ අදාළ ලංසුව සඳහා වන ආපසු නොගෙවන මුදල පැහැදිලිව සඳහන් කර සම්පූර්ණ කර තිබිය යුතුය.

නිසි ලෙස සම්පූර්ණ කර මුද්‍ර තබන ලද ලංසු මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව කවරවල බහා එක් කවරයක ඇතුළත් කර සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, අංක 109, යටිනුවර වීදිය, මහනුවර යන ලිපිනයට 2021.05.31 දින පෙ.ව. 10.30 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ එම කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ලංසු පෙට්ටියෙහි තැන්පත් කිරීමට හැකිය. ලංසු බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පුවත්පත් දැන්වීමේ සඳහන් අදාළ කර්මාන්තයට අයත් කොන්ත්‍රාත් අංකය සහ කර්මාන්තයේ නම පැහැදිලිව ලිවිය යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරු හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

2021.05.18 දින පෙ.ව. 9.30 ට පූර්ව ලංසු රැස්වීමක් අංක 09, ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර හි පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

ඔබට අවශ්‍ය අමතර විස්තර සඳහා සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී මෙම දුරකථන අංකවලින් විමසීම් කළ හැකිය. දු.ක. 081-3159904, 081-3159905, 081-3159925, 081-2204378

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ කොන්ත්‍රාත් ආයතන විසින් 2020 වසරේ ඉටු කරන ලද කර්මාන්තවල ප්‍රගතිය කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ.තවද මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා අදාළ වන චක්‍රලේඛ වලට අදාළ විධිවිධාන ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාළ කරගනු ලැබේ. එසේම එක් කොන්ත්‍රාත් ආයතනයකට එක් කර්මාන්තයකට වඩා පිරිනමන්නේ ද යන තීරණය ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ගනු ලැබේ. ලංසු ලේඛන සමග ඔබ විසින් ලබා දෙන ලිපි ලේඛන නිවැරදිව සහ ලංසු පත්‍රිකාවේ දී ඇති උපදෙස්වලට අනුකූලවම ඉදිරිපත් කිරීම ඔබගේ වගකීමක් වන අතර, අදාළ තොරතුරු නිවැරදිව ඉදිරිපත් නොකිරීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. තවද ඕනෑම ලංසුවක් හෝ සියලුම ලංසු ඒ සඳහා හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ සහ ප්‍රදානය කිරීම තීරණය කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, අවම මිල ගණන් සඳහන් ලංසුව භාර ගැනීමට ද බැඳීමක් නොමැත.

**මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ**
**නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය,**
**අංක 109, යටිනුවර වීදිය,**
**මහනුවර.**

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව.**

## පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

### දෙවන අදියර ප්‍රසම්පාදන කැඳවීම (විවෘත) - 2021

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | විස්තරය | CIDA ලියාපදිංචිය | ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන) | ආපසු නොගෙවන (ලංසු පත්‍ර මුදල) රු. | ලංසු ඇපකරය දින 120 ක් සඳහා වලංගු වියයුතුය. | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ලංසු ඇපකරය මුදලින් (රු.) | ලංසු ඇපකරය බැංකු අණකර (රු.) |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩසටහන | | | | | | | |
| මහනුවර දිස්ත්‍රික්කය | | | | | | | |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - මහනුවර | | | | | | | |
| 1 | CPC/PRDA/PSDG/K/KAN/2021/02 | කන්ද කැපුතැන්න තීලවල මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම හා නිර්මිත ඉදිකිරීම : (2+863-4+750 km) | C5 - C4 | 33.07 | 9,000.00 | 165,500.00 | 331,000.00 |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - හාරිස්පත්තුව | | | | | | | |
| 2 | CPC/PRDA/PSDG/K/HAR/2021/03 | යටිවාවල පොල්වත්ත මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම හා නිර්මිත ඉදිකිරීම : (0+450 -0+990 km) | C7 - C6 | 6.23 | 3,500.00 | 31,500.00 | 63,000.00 |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - කුණ්ඩසාලේ | | | | | | | |
| 3 | CPC/PRDA/PSDG/K/KUN/2021/03 | පිලවල හීනැටිකුඹුර මාර්ගයේ ඇස්ෆෝල්ට් ඇතිරීම හා නිර්මිත ඉදිකිරීම : (0+000-0+540km) | C6 - C5 | 13.01 | 5,000.00 | 65,500.00 | 131,000.00 |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - ගම්පොළ | | | | | | | |
| 4 | CPC/PRDA/PSDG/K/GAM/2021/03 | පිළිගල දවුලගල මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සහ නිර්මිත ඉදිකිරීම : (2+000-3+550 km) | C6 - C5 | 13.76 | 5,000.00 | 69,000.00 | 138,000.00 |
| 5 | CPC/PRDA/MAIN/K/GAM/2021/04 | ස්ටෙලන්බර්ග් ගැප් මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සහ නිර්මිත ඉදිකිරීම : (0+000-1+600 km) | C6 - C5 | 14.28 | 5,000.00 | 71,500.00 | 143,000.00 |
| මාතලේ දිස්ත්‍රික්කය | | | | | | | |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - මාතලේ | | | | | | | |
| 6 | CPC/PRDA/PSDG/M/MAT/2021/03 | වේරගම බණ්ඩාරපොල ගොඩපොල මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සහ නිර්මිත ඉදිකිරීම : (From 4+190 - 5+190km) | C6 - C5 | 19.73 | 6,000.00 | 99,000.00 | 198,000.00 |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - නාඋල | | | | | | | |
| 7 | CPC/PRDA/PSDG/M/NAU/2021/03 | මැණික්දෙන වැලමිටියාව මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සහ "U" හැඩති කාණු ඉදිකිරීම : (From 3+146 - 3+831km) | C7 - C6 | 7.99 | 3,500.00 | 40,000.00 | 80,000.00 |
| මාර්ග නඩත්තු වැඩසටහන | | | | | | | |
| මහනුවර දිස්ත්‍රික්කය | | | | | | | |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - මහනුවර | | | | | | | |
| 8 | CPC/PRDA/MAIN/K/KAN/2021/03 | රජපිහිල්ල මාර්ගය පුළුල් කොට කාපට් යොදා සංවර්ධනය කිරීම සහ නිර්මිත ඉදිකිරීම : (1+475-1+850 km) සහ වාරියපොල ශ්‍රී සමංගල මාවතේ නිර්මිත ඉදිකිරීම : (0+150 - 0+550 km) | C6 - C5 | 12.26 | 5,000.00 | 61,500.00 | 123,000.00 |
| 9 | CPC/PRDA/MAIN/K/KAN/2021/11 | අංකෙලිපිටිය උඩුවෙල මාර්ගයේ පැති බැම්ම සහ "U" හැඩති කාණු ඉදිකිරීම : (4+950 - 5+250 km) | C8 - C7 | 2.33 | 2,500.00 | 12,000.00 | 24,000.00 |
| 10 | CPC/PRDA/MAIN/K/KAN/2021/12 | හාරගම අංගණය නවීකරණය කිරීම | C8 - C7 | 3.14 | 2,500.00 | 16,000.00 | 32,000.00 |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - හාරිස්පත්තුව | | | | | | | |
| 11 | CPC/PRDA/MAIN/K/HAR/2021/10 | ගල්හින්න විලාන මාර්ගයේ පැති බැම්ම සහ මාර්ගය හරස් කාණු සකස් කිරීම : (0+000-1+000 km) | C8 - C7 | 4.65 | 2,500.00 | 23,500.00 | 47,000.00 |
| 12 | CPC/PRDA/MAIN/K/HAR/2021/11 | අකුරණ බුළුගෝහොතැන්න මාර්ගයේ කොන්ක්‍රීට් නිර්මිත ඉදිකිරීම : (0+400 km RHS) | C7 - C6 | 7.72 | 3,500.00 | 39,000.00 | 78,000.00 |
| 13 | CPC/PRDA/MAIN/K/HAR/2021/12 | මඩදෙණිය මාරතුගොඩ මාර්ගයේ කොන්ක්‍රීට් නිර්මිත ඉදිකිරීම සහ සුදු ඉරි ලකුණු කිරීම : (0+000 - 1+560 km) | C7 - C6 | 5.11 | 3,500.00 | 26,000.00 | 52,000.00 |
| 14 | CPC/PRDA/MAIN/K/HAR/2021/13 | හැදෙණිය බෝලගල මාර්ගයේ නිර්මිත ඉදිකිරීම සහ මාර්ග සලකුණු ලකුණු කිරීම : (0+000-3+000 km) | C7 - C6 | 5.11 | 3,500.00 | 26,000.00 | 52,000.00 |
| 15 | CPC/PRDA/MAIN/K/HAR/2021/14 | වැලිගොඩපළ පොත්තපිටිය මාර්ගයේ නිර්මිත ඉදිකිරීම සහ මාර්ග සලකුණු ලකුණු කිරීම : (0+000-6+000 km) | C7 - C6 | 5.53 | 3,500.00 | 28,000.00 | 56,000.00 |
| 16 | CPC/PRDA/MAIN/K/HAR/2021/15 | අරඹේපොල පතබරාගොල්ල මාර්ගයේ "U" හැඩති කාණු සහ පැති බැම්ම ඉදිකිරීම : (0+000 - 1+500 km) | C8 - C7 | 4.14 | 2,500.00 | 21,000.00 | 42,000.00 |
| 17 | CPC/PRDA/MAIN/K/HAR/2021/16 | අකුරණ දුණුවිල පත්ගොල්ලාමඩ මාර්ගයේ "U" හැඩති කාණු සහ පැති බැම්ම ඉදිකිරීම : (0+025 LHS & 1+200 RHS) | C8 - C7 | 2.90 | 2,500.00 | 15,000.00 | 30,000.00 |
| 18 | CPC/PRDA/MAIN/K/HAR/2021/17 | බෝතොට අත්තරගම මාර්ගයේ නිර්මිත ඉදිකිරීම : (0+000-1+850 km) | C8 - C7 | 3.39 | 2,500.00 | 17,000.00 | 34,000.00 |
| 19 | CPC/PRDA/MAIN/K/HAR/2021/18 | මාරතුගොඩ පිරිවෙන හරහා ගල්ලෑල්ල මාර්ගයේ නිර්මිත ඉදිකිරීම සහ සුදු ඉරි ඇඳීම : (0+000-1+000 km) | C8 - C7 | 2.73 | 2,500.00 | 14,000.00 | 28,000.00 |
| 20 | CPC/PRDA/MAIN/K/HAR/2021/19 | කිතුල්ගොල්ල වැල්ගාල මාර්ගයේ නිර්මිත ඉදිකිරීම : (0+000 - 2+000 km) | C8 - C7 | 2.44 | 2,500.00 | 12,500.00 | 25,000.00 |
| 21 | CPC/PRDA/MAIN/K/HAR/2021/20 | මැදවල රුප්පේවත්ත මාර්ගයේ නිර්මිත ඉදිකිරීම : (0+000 - 6+000 km) | C7 - C6 | 8.39 | 3,500.00 | 42,000.00 | 84,000.00 |
| 22 | CPC/PRDA/MAIN/K/HAR/2021/21 | අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලීය ආරක්ෂිත බැම්ම ඉදිකිරීම | C7 - C6 | 5.68 | 3,500.00 | 28,500.00 | 57,000.00 |
| 23 | CPC/PRDA/MAIN/K/HAR/2021/25 | රුප්පේවත්ත මැඩිල්ල මාර්ගයේ "U" හැඩති කාණු සහ පැති බැම්ම ඉදිකිරීම : (0+000 - 2+200 km) | C8 - C7 | 4.94 | 2,500.00 | 25,000.00 | 50,000.00 |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - කුණ්ඩසාලේ | | | | | | | |
| 24 | CPC/PRDA/MAIN/K/KUN/2021/04 | කරදගොල්ල ගල්අළුව මාර්ගය කොන්ක්‍රීට් කිරීම : (1+785-1+876 km) හා සිරිමල්වත්ත මැණික්හින්න මාර්ගයේ රැඳවුම් බැම්ම ඉදිකිරීම : (2+010-2+025 km) | C8 - C7 | 2.82 | 2,500.00 | 14,500.00 | 29,000.00 |
| 25 | CPC/PRDA/MAIN/K/KUN/2021/05 | කිරිමැටිය කුණ්ඩසාල මාර්ගයේ කොන්ක්‍රීට් කාණු , දෘඩ උරහිස් හා යකඩ දැල් ඉදිකිරීම : (1/5-1/6) | C8 - C7 | 2.85 | 2,500.00 | 14,500.00 | 29,000.00 |
| 26 | CPC/PRDA/MAIN/K/KUN/2021/06 | තෙල්දෙණිය ඔරුතොට පන්විල මාර්ගයේ කොන්ක්‍රීට් කාණු සහ දෘඩ උරහිස් සකස් කිරීම : (3+709-4+000 km) | C8 - C7 | 3.07 | 2,500.00 | 15,500.00 | 31,000.00 |
| 27 | CPC/PRDA/MAIN/K/KUN/2021/07 | ගටතේතැන්න මැදගම්මැද්ද මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සහ නිර්මිත ඉදිකිරීම : (0+000-1+600 km) | C6 - C5 | 17.50 | 6,000.00 | 88,000.00 | 176,000.00 |
| 28 | CPC/PRDA/MAIN/K/KUN/2021/08 | උඩුදුම්බර කළුතැන්න තැම්මිටියාන මාර්ගය කාපට් යොදා කිරීම, කොන්ක්‍රීට් කාණු සකස්කිරීම සහ දැන්වීම් පුවරු සවිකිරීම : (0+000-8+800 km) | C5 - C4 | 34.77 | 9,000.00 | 174,000.00 | 348,000.00 |
| විධායක ඉංජිනේරු කොට්ඨාසය - ගම්පොළ | | | | | | | |
| 29 | CPC/PRDA/MAIN/K/GAM/2021/06 | උඩහේන්තැන්න ඇපලවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම : (Ch- 0+000 RHS 0+540 LHS) | C7 - C6 | 5.83 | 3,500.00 | 29,500.00 | 59,000.00 |
| 30 | CPC/PRDA/MAIN/K/GAM/2021/07 | එරින්මුල්ගම යැරෝවත්ත මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සහ "U" හැඩති කාණු හා පැති බැම්ම ඉදිකිරීම : (2+060-3+558 km) | C6 - C5 | 15.71 | 6,000.00 | 79,000.00 | 158,000.00 |
| 31 | CPC/PRDA/MAIN/K/GAM/2021/08 | වතුපොල බඹරාදෙණිය මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම : (1+380-LHS & 1+400-LHS) km | C8 - C7 | 2.01 | 2,500.00 | 10,500.00 | 21,000.00 |
| 32 | CPC/PRDA/MAIN/K/GAM/2021/09 | ගෙලිඔය කඹුරුදෙණිය මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සහ "U" හැඩති කාණු හා බෝක්කුව ඉදිකිරීම : (0+700-2+702 km) | C8 - C7 | 2.31 | 2,500.00 | 12,000.00 | 24,000.00 |
| 33 | CPC/PRDA/MAIN/K/GAM/2021/10 | වට්ටප්පොල ගංහත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම : (Ch 2+400 LHS & 2+430 LHS) | C8 - C7 | 2.41 | 2,500.00 | 12,500.00 | 25,000.00 |
| 34 | CPC/PRDA/MAIN/K/GAM/2021/11 | කළුවහල්කඩ ගංහත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම : (Ch 0+980LHS, 2+128 LHS) | C8 - C7 | 4.58 | 2,500.00 | 23,000.00 | 46,000.00 |
| 35 | CPC/PRDA/MAIN/K/GAM/2021/12 | වැලිගල්ල තලවතුර මාර්ගයේ පැති බැම්ම සහ "U" හැඩති කාණු ඉදිකිරීම : (Ch 2+800 km) | C8 - C7 | 2.18 | 2,500.00 | 11,000.00 | 22,000.00 |
| 36 | CPC/PRDA/MAIN/K/GAM/2021/13 | නියදිවල කොලොනි මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සහ "U" හැඩති කාණු ඉදිකිරීම : (0+000-1+430 km) | C6 - C5 | 19.53 | 6,000.00 | 98,000.00 | 196,000.00 |

ධීවර අමාත්‍යාංශය

**විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

# අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI)

## ජලජීවී වගාව සඳහා උනන්දුවක් දක්වන්නන්ට කෙරෙන ඇරයුමයි

### කොන්ත්‍රාත් අංක : NQ/DPC/2021/PPP/04

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව සංවර්ධනය සහ කළමනාකරණය සඳහා ධීවර අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ප්‍රධාන රාජ්‍ය ආයතනය වේ .

ප්‍රධාන වශයෙන් විදේශ විනිමය ඉපයීමට ඉලක්ක කර ඇති වෙරළබඩ ජලජීවී වගාව මගින් 2020 වර්ෂයේදී මෙ.ටොන් 8,700 ක් පමණ නිෂ්පාදනයක් ලබාගෙන ඇත. තවද, එම ප්‍රමාණය 2025 වර්ෂය වන විට මෙ.ටොන් 60,000 දක්වා වැඩි කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත. එම ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් පහත ඉඩම් රජයේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ වසර තිහක (30) ක කාලයකට දීර්ඝ කාලීන බදු මත ලබාදීමට බලාපොරොත්තු වේ. එබැවින් පහත ඉඩම්වල වාණිජ වශයෙන් සංවෘත වගා ක්‍රමය යටතේ වෙරළබඩ ජලජීවී වගා නිෂ්පාදනය සිදු කිරීම සඳහා උනන්දුවක් දක්වන පෞද්ගලික ව්‍යවසායකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොක්කඩිචෝලෙයිහි පිහිටා ඇති ජලජීවී වගාව සඳහා සුදුසු බවට හඳුනාගෙන වෙන් කර ඇති හෙක්ටයාර 153.76 (අක්කර 380ක) ප්‍රමාණයකින් යුත් රජයේ ඉඩම.
2. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගල්මුල්ල ප්‍රදේශයේ ජලජීවී ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති හෙක්ටයාර 89 (අක්කර 200ක) ඉඩම.

පූර්වෝක්ත අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI) (a) ව්‍යවසායකයා පිළිබඳ සාමාන්‍ය විස්තර (b) ව්‍යවසායේ නීත්‍යානුකූල භාවය (c) ව්‍යවසායකයාගේ මූල්‍යමය හැකියාව සනාථ කරන ලියවිලි (d) ජලජීවී වගාව පිළිබඳ පළපුරුද්ද (e) ව්‍යපෘතිය සඳහා මත්ස්‍ය බීජ ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ විස්තර (f) තාක්ෂණික පිරිස් බලය පිළිබඳ විස්තර (g) ජලජීවී වගා කර්මාන්තයට අදාළව කිසියම් අධිකරණයකින් හෝ බලයලත් ආයතනයකින් වරදකරුවකු වී නොතිබීම පිළිබඳව දිවුරුම් ප්‍රකාශය, යන කරුණු පිළිබඳව කෙටියෙන් සම්පූර්ණ විස්තර වලින් සමන්විත විය යුතුය. මෙම කාර්යය සඳහා උනන්දුවක් දක්වන්නන්ගේ ඉහත සඳහන් තොරතුරු සහිත සම්පූර්ණ කරන ලද ස්වකීය අභිලාෂය **සභාපති, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල** ලිපිනයට **2021 ජුනි 04 වන දින ප.ව. 2.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ අයදුම් කළ යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"අභිලාෂය ප්‍රකාශ කිරීම - ජලජීවී වගාව සඳහා ඉඩම් ලබා ගැනීම "** ලෙස සඳහන් කළ යුතුවේ.

මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් වන අභිලාෂයන් විධිමත් ඇගයීමකින් පසු වඩාත් සුදුසු ව්‍යවසායකයින්ගෙන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාර්ය පැවරුම් සංග්‍රහය (TOR) අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික හා මූල්‍ය යෝජනා කැඳවනු ඇත (RFP). තාක්ෂණික හා මූල්‍ය යෝජනා වෙන් වෙන් වශයෙන් ඇගයීමෙන් පසු සුදුසු ව්‍යවසායකයන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**
**2021.05.04**

**වැඩි විස්තර සඳහා අමතන්න**
**සහකාර අධ්‍යක්ෂ (වෙරළබඩ)**
**දු. අංකය : +9411278 6578/ +9411 278 6577/ +9471 805 5360**
**ෆැක්ස් : +94 11 278 6578 / +9411 278 6493**
**විද්‍යුත් තැපෑල : adcad@naqda.gov.lk**
**වෙබ් අඩවිය : www.naqda.gov.lk**

ප්‍රසම්පාදන දැන්වීම - තාවකාලිකව නතර කිරීම

**මධ්‍යම පළාත් සභාව - ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය**

## ජාතික තරගකාරී මිල ගණන් කැඳවීම (NCB)

### ප්‍රතිපාදන මූලාශ්‍රය - පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

රටෙහි පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන්, මධ්‍යම පළාතේ පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් වන කර්මාන්ත 33 ක් සඳහා ලංසු කැඳවමින්, 2021.04.09 වන දින දිනමිණ පුවත්පතෙහි පළ කරන ලද ප්‍රසම්පාන දැන්වීමේ සඳහන් 4 ඡේදයේ ලංසු නිකුත් කිරීමේ කාලසීමාව හා 6 ඡේදයේ සඳහන් ලංසු භාර ගැනීමේ කාලසීමාවන් තාවකාලිකව නතර කරන බවත් සංශෝධිත කාලසීමාවන් පුවත්පත් දැන්වීමක් මගින්ම පසුවට දැනුම් දෙනු ලැබේ.

**අමාත්‍යාංශ ලේකම් සහ ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය.**
**දුරකථන / ෆැක්ස් අංක 081-4481322/ 081-2424938**
**2021.05.04 දින**

**පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,**
**පල්ලේකැලේ,**
**කුණ්ඩසාලේ.**

# යෝජනා සඳහා ආරාධනයයි

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම

1. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මධ්‍ය සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ උපදේශකයින් වෙතින් මුද්‍ර, තැබූ යෝජනා කැඳවනු ලැබේ.
2. ආපසු නොගෙවන **රුපියල් 500/= ක** ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව යෝජනා ලිපිලේඛන ගිණුම් අංශයෙන් ලබාගත හැකිය. යෝජනා ලිපිලේඛන **2021.05.04 දින** සිට **2021.05.24 දින** දක්වා කාර්යාල දිනයන්හි **පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත්** අතර නිකුත් කරනු ලැබේ.
3. කොළඹ කිරුළපන ඇවනියුහි නො. 163, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේදී හෝ www.news.lk වෙබ් අඩවියට පිවිසීමෙන් යෝජනා ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.
4. යෝග්‍යතාපූර්ණ උපදේශකයින් පහත දැක්වෙන සුදුසුකම් නිර්ණායක හා සමග අනුකූල විය යුතුය.
   - සමාන ස්වභාවයේ කාර්යයන් පිළිබඳ පළපුරුද්ද.
   - කර්තව්‍යයන් කරගෙන යාමට සුදුසුකම්ලත් උපදේශකයින් වීම.
5. පූර්ව - යෝජනා රැස්වීම **2021 මැයි 13 දින පෙ.ව. 10.00** ට කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කුඩා ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.
6. යෝජනා **2021.07.31** දින දක්වා වලංගුවිය යුතුය.
7. මුද්‍ර, තැබූ යෝජනා කොළඹ 05, කිරුළපන ඇවනියුහි, නො 163, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ හැකිය.
8. ලංසු භාරගැනීම **2021.05.25 දින 11.00** පැයට අවසන් වන අතර, එම වේලාව ඉකුත් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ.
9. උපදේශකයින් හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.


**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
**163, කිරුළපන ඇවනියු, කොළඹ 05.**
**දුරකථනය : 011-2514759, 071-8859889**

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 727, මහවත්ත ග්‍රාම නිලධාරී වසමේ අංක 42/15B, වික්‍රමසිංහ පෙදෙස, කළුතර දකුණ ලිපිනයේ පදිංචි වාසනා මධුවන්ති විට්ටාච්චි වන මාගේ දියණිය වන **ෆාතිමා සෆා** යන අය මෙතැන් පටන් **සනුලි දියානා මෙත්සදී විට්ටාච්චි** යන නම භාවිත කරන බවට ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**වාසගම ඇතුළත් කිරීම**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 114 පණ්ඩුකාභයපුර තුලානේ අංක 525 යාය 05 පණ්ඩුකාභයපුර අනුරාධපුර ලිපිනයේ පදිංචි **අවුසදහාමිගේ චන්ද්‍රසේකර** වන මම මින් ඉදිරියට **කළුගමුව මුදියන්සේලාගේ අවුසදහාමිගේ චන්ද්‍රසේකර** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහ ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**කළුගමුව මුදියන්සේලාගේ**
**අවුසදහාමිගේ චන්ද්‍රසේකර**

21 වැනි
සියවසට
එළඹෙන
යෞවනයට
නිරවුල් ගමන් මග
බුදුසරණ


ධීවර අමාත්‍යාංශය

**විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

# අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI)

## කිලිනොච්චිය සහ යාපනය දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක මුහුදු කූඩැල්ලන් අපනයන ගම්මානය තුළ මුහුදු කූඩැල්ලන් පොකුරු ගොවිපල ස්ථාපිත කිරීම සඳහා උනන්දුවක් දක්වන්නන්ට කෙරෙන ඇරයුමයි

### කොන්ත්‍රාත් අංක : NQ/DPC/2021/PPP/03

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව සංවර්ධනය සහ කළමනාකරණය සඳහා ධීවර අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ප්‍රධාන රාජ්‍ය ආයතනය වේ .

මෙම අධිකාරිය අපනයනය පදනම් කරගත් මුහුදු ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සහ ප්‍රදේශයේ ජීවනෝපාය කටයුතු සංවර්ධනය කිරීම සඳහා කිලිනොච්චිය සහ යාපනය දිස්ත්‍රික්කවල පොකුරු වගා පද්ධති ලෙස මුහුදු කූඩැල්ලන් වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කර ඇත. එම දිස්ත්‍රික්ක වලට අයත් මුහුදු ප්‍රදේශයන්හි මුහුදු කූඩැල්ලන් කොටු තුළ වගා කිරීම අපේක්ෂිතය. මේ සඳහා ආයෝජකයා සමග පොකුරු වගා ගොවීන් හවුල් ව්‍යවසායක් ලෙස මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

මේ සඳහා කැමැත්තක් දක්වන ධීවර සංවිධාන, ධීවර ප්‍රජාවන්, සමාගම් සහ වෙනත් උනන්දුවක් දක්වන පුද්ගලික ආයෝජකයින්ගෙන් තමා සතු අභිජනනාගාරවල නිෂ්පාදනය කරන ලද මුහුදු කූඩැල්ලන් පැටවුන් යොදා ගනිමින් පොකුරු ක්‍රමයට මුහුදු කූඩැල්ලන් වගාව සිදු කිරීම සඳහා අභිලාෂ කැඳවනු ලැබේ.

පූර්වෝක්ත අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI) (a) ව්‍යවසායකයා පිළිබඳ සාමාන්‍ය විස්තර (b) ව්‍යවසායේ නීතිමය තත්ත්වය (c) ව්‍යවසායකයාගේ මූල්‍යමය හැකියාව සනාථ කරන ලියවිලි (d) මුහුදු කූඩැල්ලන් වගා කිරීම, අභිජනනය හා අලෙවිය පිළිබඳ පළපුරුද්ද (e) මෙම ව්‍යාපෘතිය සඳහා මුහුදු කූඩැල්ලන් පැටවුන් සපයා ගැනීමට ඇති හැකියාව (f) තාක්ෂණික පිරිස් බලය පිළිබද විස්තර (g) ජලජීවී වගා කර්මාන්තයට අදාළව කිසියම් අධිකරණයකින් හෝ බලයලත් ආයතනයකින් වරදකරුවකු වී නොතිබීම පිළිබඳව දිවුරුම් ප්‍රකාශය, යන කරුණු පිළිබඳව කෙටියෙන් සම්පූර්ණ විස්තර වලින් සමන්විත විය යුතුය.

මෙම කාර්යය සඳහා උනන්දුවක් දක්වන්නන්ගේ ඉහත සඳහන් තොරතුරු සහිත සම්පූර්ණ කරන ලද ස්වකීය අභිලාෂය සභාපති, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයට 2021 ජුනි 04 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ අයදුම් කළ යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"අභිලාෂය ප්‍රකාශ කිරීම - මුහුදු කූඩැල්ලන් වගා කිරීම"** ලෙස සඳහන් කළ යුතුය.

මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් වන අභිලාෂයන් විධිමත් ඇගයීමකින් පසු වඩාත් සුදුසු ව්‍යවසායකයින්ගෙන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාර්ය පැවරුම් සංග්‍රහය (TOR) අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික හා මූල්‍ය යෝජනා කැඳවනු ඇත (RFP). තාක්ෂණික හා මූල්‍ය යෝජනා වෙන් වෙන් වශයෙන් ඇගයීමෙන් පසු සුදුසු ව්‍යවසායකයකු තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**
**2021.05.04**

**වැඩි විස්තර සඳහා අමතන්න**
**සහකාර අධ්‍යක්ෂ (උතුරු පළාත)**
**දු. අංකය : +94212283890 / +94778415543**
**විද්‍යුත් තැපෑල : adcad.np@naqda.gov.lk**
**වෙබ් අඩවිය : www.naqda.gov.lk**

# ලංසු කැඳවීමයි

## දකුණු කොළඹ ශික්ෂණ රෝහල - කළුබෝවිල, දෙහිවල

## රෙදි වර්ග හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මිලදී ගැනීම

දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් රෝහල සඳහා අවශ්‍ය රෙදි වර්ග හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

01. මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයවලුන් ලංසු ලියකියවිලි ගාස්තු වශයෙන් රු. 2,000.00 ක ආපසු නොගෙවනු ලබන අයදුම්පත් ගාස්තුවක් දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෙත ගෙවා ලබාගත් ලදුපත සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් 2021.05.04 දින සිට 2021.05.17 දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා මෙම රෝහලේ මුදල් අංශයෙන් ලංසු ලියකියවිලි ලබාගත හැක.
02. ලංසු අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර - දකුණු කොළඹ ශික්ෂණ රෝහල, කළුබෝවිල, දෙහිවල - රෙදි වර්ග හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා මිල ගණන් - 2021.05.18 යනුවෙන් සඳහන් කර 2021.05.18 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, දකුණු කොළඹ ශික්ෂණ රෝහල, කළුබෝවිල, දෙහිවල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැක. මිල ගණන් භාර ගන්නා අවසාන දිනය 2021.05.18 දින පෙ.ව. 10.00 ට වන අතර, එදින පෙ.ව. 10.00 ට ගණකාධිකාරී කාර්යාලයේදී මිල ගණන් විවෘත කරනු ලැබේ. මිල ගණන් විවෘත කිරීමට පෙර සාම්පල පොදු ගබඩාවට භාර දී පොදු ගබඩා භාරකරු විසින් භාර ගත් බවට සහතික කළ ලිපියේ පිටපතක් මිල ගණන් සමග ඉදිරිපත් කළ යුතුය.
03. ලංසු ලියකියවිලි පිටපත් 02 න් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර 02 තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.
04. ලංසු භාර ගැනීම අවසන් වූ විගස එම ස්ථානයේදීම ලංසු අයදුම්පත් විවෘත කරන අතර, ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.
05. ලංසු ලියකියවිලි ගෙවීමකින් තොරව දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ගණකාධිකාරී කාර්යාලයේදී පරීක්ෂා කිරීමට පිළිවන.
06 රජයේ කොන්ත්‍රාත්, කොන්දේසි කඩකර අසාධු ලේඛන ගත කොට ඇති පුද්ගලයින් වෙත ලංසුපත් නිකුත් කරනු නොලැබේ.
07. අදාළ ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.
08. වැඩි විස්තර සඳහා දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ගණකාධිකාරී අමතන්න. (දුරකථන අංකය - 0112763038)

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**දකුණු කොළඹ ශික්ෂණ රෝහල,**
**කළුබෝවිල, දෙහිවල.**


**1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.**

**පුස්තකාලයාධිපති**
**දුරකථන**
**(011) 2 242 9491**

LAKE HOUSE



# මහල් නිවාස ගැන වගවීම අපගේ වගකීමයි

**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති, නීතිඥ සරණ කරුණාරත්න**

සංවර්ධනයේ නිම්වළලු පුළුල් වීමේදී ඉඩම් හා දේපළ කළමනාකරණය නව දැක්මකින් කළ යුතු වෙයි. නගර අලංකරණය, භූමිය කළමනාකරණය මෙන්ම පාරිසරික සමතුලිත බව ජන දිවියෙහි සහජීවනය සුරැකෙන ආකාරයෙන් ඉටු කිරීම ප්‍රමුඛ වෙයි. මේ පරමාර්ථ ඉටු කිරීමේ අරමුණින් ස්ථාපිත කර ඇති සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සංවර්ධනයේ ප්‍රමුඛ වෙයි. එහි සභාපති, නීතිඥ සරණ කරුණාරත්න හා සාමාන්‍යාධිකාරී, ආචාර්ය ඉඳුනිල් ලියනගේ සමඟ කළ සාකච්ඡාවකි මේ.

**● සහාධිපත්‍ය දේපළ යනුවෙන් හඳුන්වන්නේ මොනවා ද?**

සිරස් අතට මහල් දෙකක් හෝ ඊට වැඩි මහල් ප්‍රමාණයකින් යුතු පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් පොදුවේ භුක්ති විඳිනු ලබන ගොඩනැගිල්ලක් සහාධිපත්‍ය දේපළක් වෙනවා. සාමාන්‍යයෙන් පිඹුරක මායිම් හතරක් ඇති අතර, සිරස් අතට ගොඩනැගුණු සහාධිපත්‍ය දේපළක මායිම් හයක් දක්නට ලැබෙනවා තිරස් අතට පොදු බිත්තිවලින් වෙන්වූ පොදු පහසුකම් සහ පොදු අංගෝපාංගවලින් යුතු ඒවා පොදුවේ භුක්ති විඳිනු ලබන ඒකකයන්ද සහාධිපත්‍ය දේපළක් ලෙස හැඳින්විය හැකියි.

සහාධිපත්‍ය දේපළ දැනට ඉදි වෙමින් පවතින සහ දැනට පරිහරණය කරමින් පවතින වශයෙන් කොටස් දෙකකින් යුතු වෙයි. මහල් නිවාස සංකීර්ණ, ව්‍යාපාරික ස්ථාන මෙන්ම ආයතන කිහිපයක් එකම ගොඩනැගිලි සංකීර්ණයක් තුළ පවත්වාගෙන යන අවස්ථා සහාධිපත්‍ය දේපළක් ලෙස හඳුනාගත හැකියි. එහි නේවාසික හා මිශ්‍ර සහාධිපත්‍ය දේපළ ලෙස වර්ගීකරණය කර තිබෙනවා. ජනගහනය වර්ධනය මෙන්ම නාගරීකරණය ව්‍යාප්ත වීම හේතුවෙන් සහාධිපත්‍ය ගොඩනැගිලි සංකීර්ණ නාගරික නිවෙස් කළමනාකරණයේ මූලික විසඳුමක් බවට හඳුනා ගෙන තිබීම සංවර්ධිත රටවල මූලික ලක්ෂණයකි. විධිමත් මට්ටමින් සහාධිපත්‍ය දේපළ කළමනාකරණය කිරීම. මෙන්ම එවැනි දේපළ ඉදි කිරීම සඳහා ආයෝජනයද ලොව ප්‍රමුඛතම ආයෝජන ක්‍රමෝපායක් බවට පත්වී ඇත.

**● මහල් නිවෙස් මෙන්ම මහල් නිවෙස් සංකීර්ණ විවිධ සමාජ මට්ටම් අනුව වෙන්ව තිබෙනවා. සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් පවතින නීති රීති හා හිමිකම් එලෙස වෙනස් වෙනවා ද?**

සමාජ තරාතිරම්වලට වඩා දැනටමත් සහාධිපත්‍ය දේපළ ලෙස භාවිත කරන දේපළ මෙන්ම අනාගතයේදී භාවිත කිරීම සඳහා මිලදී ගැනීමට අපේක්ෂිත දේපළ පිළිබඳ මෙහිදී අවධානය යොමු කළ යුතුයි. සහාධිපත්‍ය දේපළ භාවිත කිරීමේදී නොදැනුවත්කම හේතුවෙන් බොහෝ ගැටලු උද්ගත වී තිබෙනවා. ඒවා හඳුනා ගැනීම සහාධිපත්‍ය දේපළ පරිහරණය කරන අයට මෙන්ම ඉදිරියේදී පරිහරණය කිරීමට අපේක්ෂිත අයටත් රැකුලක් වේවි.

නිවෙස් සංකීර්ණයක් හෝ පොදුවේ භාවිත කරන ගොඩනැගිල්ලක පදිංචි වීමට පෙර 50-600ක පමණ පිරිසක් සමඟ නිරතුරුව ගැටෙමින් ජීවත් වීමට කැමැත්තක් තිබිය යුතුය. එසේම එවැනි ස්ථානවල ඇති විදුලි සෝපාන, පියගැට පෙළ, පොදු ශාලා, පොදු ආලින්ද ආදිය භාවිත කිරීමේදී පොදු පිළිවෙතකට අනුව භාවිත කළ යුතු වෙයි. කිසිවිටකත් තම පෞද්ගලික දේපළක් ලෙස සලකා කටයුතු නොකළ යුතු වෙනවා.

සහාධිපත්‍ය දේපළක් මිලදී ගැනීමට අපේක්ෂා කරන්නකු පළමුව තමාට හිමි දේපළ පිළිබඳ අවබෝධයකින් සිටිය යුතුයි. එවැනි දේපළ අලෙවි කිරීම සඳහා ප්‍රචාරක ආයතන විවිධ උපක්‍රම භාවිත කරන අතර, එවැනි ප්‍රචාරණයන්ගෙන් පමණක් නොසෑහී අදාළ දේපළ පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කර ගත යුතුයි.

උදාහරණයක් විදිහට අදාළ ගොඩනැගිල්ලට ළඟා විය හැකි මාර්ග පහසුකම් පිළිබඳ දිශාවන් කිහිපයකින් පෙන්වා තිබුණද ඒවා නිවැරදි නොවන අවස්ථා පැවතිය හැකියි. එපමණක් නොවේ තමන් මිලදී ගන්නා මහල් නිවෙසට පිවිසිය හැකි විදුලි සෝපාන දෙකක් පිළිබඳ තොරතුරු දිය හැකියි. නමුත් සැබෑ ලෙසම පවතින්නේ එක් විදුලි සෝපානයක් පමණක් විය හැකියි. මෙවන් ගැටලු ඇති නොවීමට නම් සහාධිපත්‍ය පිඹුර පරීක්ෂා කළ යුතුයි. මෙවැනි ගනුදෙනුවකදී සහාධිපත්‍ය අධිකාරියෙන් අනුමැතිය දෙන ලද සහාධිපත්‍ය පිඹුර ඉල්ලා සිටීමේ අයිතිය ගැනුම්කරුවන් සතුයි. එසේම සහාධිපත්‍ය පිඹුර දීම සඳහා දේපළ අලෙවිකරුවන් බැඳී සිටිනවා.

**● සහාධිපත්‍ය දේපළක් නෛතික වීමට නම් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙහි අනුමැතිය පැවතිය යුතුම ද?**

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙහි අනුමැතියෙන් තොරව එවන් දේපළක් ඉදි කිරීමට ප්‍රාදේශීය සභා පළාත් සභා නගර සභා ආදි කිසිදු ආයතනයකින් අනුමැතිය හිමි වන්නේ නෑ. එපමණක් නොවේ මෙවන් ආයෝජන සඳහා බැංකු ණය ආදිය දීමටත් පාරිසරික වාර්තාව මෙන්ම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙහි අනුමැතිය හිමිවී ඇති බවට වන වාර්තාවද වැදගත් වෙයි. එසේම සහාධිපත්‍ය දේපළක් මිලදී ගැනීමට එකඟවී විකිණීමේ ගිවිසුමකට පාරිභෝගිකයා සංවර්ධනකරු සමඟ එළඹීමේදී සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිසි අවසරය ලබා ඇත්දැයි සෙවීම වැදගත්.

**● සහාධිපත්‍ය පිඹුරකට අනුමැතිය දීමේදී සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙහි අවධානය යොමු වන ඉසව් මොනවා ද?**

ජනාවාසයක් සඳහා සුදුසු පරිසරයක් පවතීද යන්න මෙන්ම, ස්වාභාවික අනතුරු උවදුරු සඳහා අදාළ පරිසරයෙහි පවතින ආරක්ෂිත බව මෙන්ම මලාපවහන පද්ධති, ජලසැපයුම, වාතාශ්‍රය ලැබීම, ගොඩනැගිල්ලෙහි ශක්තිමත් බව, යොදා ගන්නා අමුද්‍රව්‍යයන්ගේ ප්‍රමිතිය, පොදු පහසුකම්වල ප්‍රමාණාත්මක බව ආදි කරුණු රාශියක් පිළිබඳ අවධානය යොමු කිරීමෙන් අනතුරුවයි අනුමැතිය දෙන්නේ.

**● නිවෙස් සංකීර්ණ කඩාවැටුණු අවස්ථා මෙන්ම ඇතැම් ව්‍යාපෘති වංචාසහගත බවට චෝදනා ඉදිරිපත් වී තිබෙනවා. සහාධිපත්‍ය පිඹුර නිසි ලෙස අනුමත කර ගත්තේ නම් එබඳු ගැටලු ඇති විය හැකි ද?**

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ලෙස අප අපගේ වගකීම මැනවින් ඉටු කළ ද වංචාසහගත පිරිස් වැරදි කරන අවස්ථා හසු වී තිබෙනවා. ඇතැම් අය අනුමැතිය ගත් ඉදි කිරීමට වඩා වෙනස් ඉදි කිරීම් කළ අවස්ථා තිබෙනවා. අප දැනුම්වත් වන විට ඒ දෙපළෙහි අලෙවි කිරීම් කර අවසන් වූ අවස්ථා තිබෙනවා. සහාධිපත්‍ය පිඹුර අනුමත කිරීම අදියර කිහිපයකින් කළද, පසුවිපරම් කළද වංචා කිරීම් ඇතැම් අවස්ථාවල වෙනවා. මෙවැනි ලිපියකින් අප අපේක්ෂා කරන්නේත් පාරිභෝගිකයා දැනුම්වත් කිරීම මෙන්ම නිවැරදිව මෙවැනි ආයෝජන කිරීමට ආයෝජකයන් දිරිමත් කිරීමයි.

**● සහාධිපත්‍ය දේපළක් මිල දී ගැනීමට පෙර සැලකිලිමත් විය යුත්තේ කුමන කාරණා පිළිබඳ ද?**

නාගරික සංවර්ධන අධිකාරියෙහි හෝ අදාළ පළාත් පාලන ආයතනයන්හි සහතික ගෙන තිබේ දැයි විමසීම. එම ආයතන වෙතින් අනුමත කරන ලද අදාළ සහාධිපත්‍ය දේපළෙහි පිඹුර පරීක්ෂා කළ හැකිය. එසේම අදාළ පොදු පහසුකම් නිසි පරිදි ස්ථාපිතව ඇති දැයි විමසිය යුතුය. තම නිවෙසට අයත් යැයි සඳහන් නියමිත වර්ග අඩි ප්‍රමාණය පවතී දැයි විමසා බැලීමද වැදගත් කරුණකි.

සහාධිපත්‍යය කළමනාකරණ අධිකාරිය විසින් අනුමත කරන ලද පිඹුර නිසි ලෙස පරීක්ෂා කිරීමෙන් අදාළ දේපළ පිළිබඳ මනා අවබෝධයක් ගත හැකියි. පිඹුරෙහි සඳහන් නොවන පොදු පහසුකම්, කිසිවක් හිමි වීමට අවකාශ නොමැති අතර, ඒවා ගැනීම සඳහා නෛතික බැඳීමක් ද නැත. එසේම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අවසන් සහතිකය මත සහාධිපත්‍ය පිඹුර නිසි පරිදි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත් ද යන්න පරීක්ෂා කිරීමද අතිශය වැදගත්.

**● මෙවන් දේපළක් සම්බන්ධයෙන් පාරිභෝගිකයාට මුහුණ දීමට වන නරකම අත්දැකීම් මොනවා ද?**

අදාළ දේපළ පිළිබඳ පිඹුර සහාධිපත්‍ය අධිකාරියෙහි ලියාපදිංචි නොවීම නිසා ඔප්පු ගත නොහැකි වීම. අදාළ භූමියෙහි මෙන්ම ඉදි කිරීම්වල අක්‍රමිකතා හේතුවෙන් ගෙවා ඇති මිලෙහි වටිනාකම අහිමි වීම මෙන්ම ජීවත් වීමට නුසුදුසු ස්ථානයක් බවට පත්වීම. මෙවන් තත්ත්වයන් ඇති වීම වළක්වා ගත හැක්කේ දැනුම්වත් බව වැඩි කර ගැනීම හා නෛතික රාමුව පිළිබඳ මනා අවබෝධයකින් යුතු වීමෙන් පමණයි.

**● සහාධිපත්‍ය දේපළක් තුළ ස්ථාපිත කරනු ලබන කළමනාකරණ සංස්ථාව පිළිබඳ විස්තර කළොත්?**

උදාහරණයක් විදිහට ඇන්ඩසන් නිවෙස් සංකීර්ණය පිළිබඳ සිතමු. එහි එක් එක් ගොඩනැගිල්ල සඳහා වෙන් වෙන් වශයෙන් නිවැසියන් නියෝජනය කරමින් සකසන ලද කළමනාකරණ සංස්ථාව නම් ආයතනයක් පවතිනවා. අදාළ සහාධිපත්‍ය දේපළට නිත්‍යානුකූල සාධන පත්‍රයක් මඟින් හිමිකම් කියන නියෝජිතයන් අතරිනුයි මේ කළමනාකරණ සංස්ථාව සඳහා නියෝජිතයන් පත් කිරීම කරන්නේ. එම කළමනාකරණ හිමිකම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙහි ලියාපදිංචි විය යුතුයි. අදාළ නිවෙස් සංකීර්ණයෙහි පොදු පහසුකම් නඩත්තුව කෙරෙනුයේ මේ ආයතනය හරහායි. මේ ආයතන පිහිටුවීම හා නියාමනය හා අවැසි සහාය දීම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙහි ප්‍රමුඛ වගකීමක්.

**● මහල් නිවෙස් සංකීර්ණ ඉදි කරන ව්‍යවසායකයන්ට සලසන සහන මොනවා ද?**

රටක් විදිහට නාගරිකකරණය මෙන්ම අර්ධ නාගරිකකරණයට කඩිනමින් ප්‍රවේශ වන වටපිටාවකයි අප ඉන්නේ. කඩිනමින් ඉදි වන අධිවේගී මාර්ග පද්ධතිය, ජනප්‍රිය පාසල් සඳහා වන තරගය. කර්මාන්තශාලා වැනි කරුණු නිසා අඩු ආදායම්ලාභි, දිළිඳු අයට අමතරව මධ්‍යම පන්තියේ නිවෙස් ගැටලුව ඉහළ මට්ටමකයි පවතින්නේ. මේ අතරින් මධ්‍යම පාන්තිකයන්ට තම ආදායමට සරිලන අන්දමින් සහනදායි ගෙවීමේ පදනමකට ගැළපෙන අයුරින් මහල් නිවෙස් ඉදි කිරීමේ කාර්ය පෞද්ගලික අංශයේ දේපළ සංවර්ධනකරුවන් වෙත පැවරීමටයි සැලසුම වී ඇත්තේ. මෙහිදී සුදුසු ඉඩම් රජය විසින් දීමෙන් වඩාත් සහනදායී මිලකට නිවෙස් දීමට හැකි වේවි. මේ මඟින් දේශීය ව්‍යවසායකයන් සඳහා ආයෝජන අවස්ථා පුළුල් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, රැකියා අවස්ථා බහුල වීමටද මඟ සැලසෙයි.

මේ ක්ෂේත්‍රය සඳහා විදෙස් ආයෝජනද ආකර්ෂණය කර ගැනීමේ වැඩසටහනක් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය වෙතින් දෙන සහන හා පහසුකම් එවැනි ආයෝජන සඳහා හිමි වනු ඇති. මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ආර්ථිකයට විසල් දායකත්වයක් දිය හැකි බවයි අපේ විශ්වාසය.

**● සහාධිපත්‍ය අධිකාරියෙහි අනාගත සංවර්ධන ඉලක්ක මොනවා ද ?**

ඉතාම වැදගත් ප්‍රශ්නයක් . මීට දශක 5කට පමණ පෙර එනම් 1970දී එවකට ආණ්ඩු බලය හිමිව තිබූ සමගි පෙරමුණ විසින් ජනතාවගේ නිවෙස් ප්‍රශ්නය විසඳීමට මහල් නිවෙස් යෝජනා ක්‍රමයන් ආරම්භ කළා. ඒ මහල් නිවෙස්වල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග නියාමනය කිරීම සඳහා 'පොදු පහසුකම් මණ්ඩලය ' 1973 අංක 10 දරන පනත මඟින් ස්ථාපනය වුණා. මෙය 2003දී 'සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය' වශයෙන් වඩාත් පුළුල් සේවාවක් සැපයීම සඳහා පරිවර්තනය වුණා.

නිදහසින් පසු ගෙවී ගිය දශක හතක කාලය තුළ ජනතාවගේ නිවෙස් ප්‍රශ්න විසඳීමට නොයෙක් ආණ්ඩු ව්‍යාපෘති ගෙනාවා. එහෙත් වර්තමාන ජනාධිපතිවරයාගේ 'සෞභාග්‍යයේ දැක්ම' තරම් නිවෙස් ප්‍රශ්න විසඳීමට ගෙන ආ වෙනත් ප්‍රායෝගික වැඩපිළිවෙළක් නැහැ. විශේෂයෙන්ම 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්තිය තුළ නිවෙස් ප්‍රශ්නය විසඳීමේ ප්‍රායෝගික හා සාර්ථක වැඩපිළිවෙළක් සහාධිපත්‍ය දේපළ ඉදිකිරීම තුළින් ලබා ගත හැකි බවට දක්වා තිබෙනවා. 'සෑම පවුලකටම සුවපහසු නිවෙසක්' සංකල්පය යටතේ නාගරික, අර්ධ නාගරික පමණක් නොව වතු ආශ්‍රිතව ද සහාධිපත්‍ය දේපළ ඉදි කිරීම තුළ භූමිය ඵලදායි ලෙස කළමනාකරණය කර ගැනීමට තීරණය කර තිබෙනවා. ඒ අනුව නාගරික මධ්‍ය පාන්තික හා ඉහළ මධ්‍ය පාන්තික තට්ටු නිවෙස් සංකීර්ණ පමණක් නොව සෑම මැතිවරණ කොට්ඨාසයකම නිවෙස් 100 බැගින් සහාධිපත්‍ය දේපළ ඉදි කිරීමටත්, වතු ලැයින් වෙනුවට ඔවුන්ටද සහාධිපත්‍ය නිවෙස් ඒකක දීම දැනටමත් අරඹා තිබෙනවා.



සාමාන්‍යාධිකාරී, ආචාර්ය ඉඳුනිල් ලියනගේ

මේ සියලු නිවෙස් ව්‍යාපෘති තුළ පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පමණක් නොව අනාගතයේදී එකී දේපළ නිසි පරිදි කළමනාකරණය කර ගෙන පවත්වා ගෙන යෑම පිළිබඳ පූර්ණ නියාමනය අප අධිකාරිය සතු වෙනවා. ජනාධිපතිවරයාගේ රාජ්‍ය ප්‍රතිපත්තිය වේගවත් කිරීම සඳහා නිවෙස් ඉදි කිරීමට නියමිත රාජ්‍ය ආයතන නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට දැනටමත් පියවර රාශියක් අප අධිකාරිය අරගෙන තිබෙනවා.

සංවර්ධනයෙහි මූලික අරමුණක් සැමට නිවෙසක් හිමිව තිබීම. නිදහස් සාමකාමී නිවෙසක ජීවත් වීම මානවීය අවශ්‍යතාවක්. තවත් පැත්තකින් නාගරිකව සුවපහසු දිවියක් අපේක්ෂා කරන අය වෙනුවෙන් වාසස්ථාන ඉදි කිරීම ලොව ප්‍රමුඛතම ආයෝජන ක්ෂේත්‍රයක්. ඒ සඳහා දෙස් විදෙස් ආයෝජකයන්ට හොඳ අවස්ථාවක් ලැබෙනවා. ප්‍රමිතියට අනුව ඉදි කිරීම් කරමින් නෛතික රාමුවට අනුව කටයුතු කරයි නම් හොඳ ලාභයක් ලැබිය හැකි ක්ෂේත්‍රයක් වගේම නාගරිකව දිවි ගෙවමින් පහසුකම් අත්විඳීමට කැමති අයට සේවාවක් ද වෙනවා. එසේ වෙන්නේ මේ ක්ෂේත්‍රය සංවර්ධනය වීමෙන් පමණයි. අප අධිකාරියෙහි අරමුණ සහාධිපත්‍ය සංවර්ධන ක්ෂේත්‍රය පාරිභෝගිකයාටත් ආයෝජකයාටත් දෙදෙනාටම ජයග්‍රාහි බව අත් වන ක්ෂේත්‍රයක් ලෙසට දියුණු කිරීමයි.

**බුද්ධිකා බ්‍රහ්මණගේ**


# උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය

## ගන්නෝරුව

## ලංසු කැඳවීමයි

**ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 14 ක තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 15 ක කුඹුරු ඉඩම්වලින් ලබාගත් පස් සාම්පල පනස්දහසක (50,000) පස් පරීක්ෂාකර පොහොර නිර්දේශ ලබාදීමට අදාළ විශ්ලේෂණ කටයුතු සඳහා රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම**

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වී වගාවේ පස් පරීක්ෂාකර පොහොර නිර්දේශ ලබාදීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 14 ක තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 15 ක කුඹුරු ඉඩම්වලින් ලබාගත් පස් සාම්පල පනස්දහසක (50,000) පස් පරීක්ෂාකර පොහොර නිර්දේශ ලබාදීම සඳහා විශ්ලේෂණ කටයුතු සිදුකිරීමට රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා දේශීය ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යටතේ 13 වන ව්‍යාතිරේකයේ 8:1 න් පෙන්වා දී ඇති පරිදි අදාළ අයදුම්කරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ වන රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි වී සිටිය යුතුය.

උක්ත කාරණය සඳහා එක් ලංසු පෝරමයක් පමණක් භාවිතා කළ යුතුය. රුපියල් 3000/- ක ආපසු නොගෙවන ගාස්තුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදලින් ගෙවා ලබාගත් රිසිට්පතක් තැ.පෙ. 11, ගන්නෝරුව, පේරාදෙණිය යන ලිපිනයේ පිහිටි උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද ලංසු ලියවිලි 2021 මැයි 04 දින සිට මැයි 24 වන දින දක්වා සතියේ වැඩ කරන දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැකි වේ.

තවද මීට අදාළ අතිරේක විස්තර ලංසු ලේඛනවල සඳහන් වන අතර, මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉහත ස්ථානයේදීම එම ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.

සියලුම ලංසු මුද්‍රා තැබූ කවරවල බහා එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ "Purchasing of Chemicals Needed for 50000 Soil Samples Analysis for the Soil & Plant Nutrition Division, Horticultural Crops Research & Development Institute, Gannoruwa, Peradeniya" යනුවෙන් සඳහන් කොට **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව, පේරාදෙණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ඉහත ලිපිනයේ කාර්යාලයේ තබා ඇති ලේඛනයේ සටහන් කර ලංසු පෙට්ටියට බහාලිය හැකිය.

ලංසු භාර ගැනීම 2021 මැයි 25 වන දින පෙරවරු 10.30 ට අවසන් කරන අතර, ඒ විගසම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසු ඉදිරිපත් කළ අයට හෝ ඔවුන්ගේ ලිඛිත බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියලුම ලංසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් රු. 86,400.00 (අසූහයදහස් හාරසියක) ක බැංකු ඇපකරයක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නමට ඉදිරිපත් කළ යුතුය. මුදලින් ගෙවන්නේ නම් ඇපය රු. 43,200.00 (හතළිස් තුන්දහස් දෙසීය) කි. බැංකු ඇපකරයේ වලංගු කාලය 2021-09-06 දක්වා විය යුතුය.

ඕනෑම මිලදී ගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,**
**ගන්නෝරුව, පේරාදෙණිය.**
**2021-05-04**
**දු.ක. 081-2388011/12**

### දවසේ රාහු කාලය

සවස 03.13 සිට 04.46 දක්වා අලුයම 03.01 සිට 04.29 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

### දින තත්ත්වය

මේෂ රවි 21 භාග අව අටවක තිථිය ලත් කුජ දින ඉර උදාව 05.56ට ඉර බැසීම 06.19ට සුවණ නැකත උදේ 08.29 න් ගෙවී දෙනට නැකත ලබයි. අව අටවක තිථිය දහවල් 01.16න් ගෙවී අව නවවක තිථිය උදා වේ. ශූග්‍ර යෝගය රාත්‍රී 08.26න් ගෙවී බ්‍රහ්ම යෝගය ලබා පවතී. බාලවකරණය අලුයම 01.24න් ගෙවී කෞලවකරණය උදා වේ. එය දහවල් 01.16න් ගෙවී තෛතිලකරණය ලබයි.

විෂ කලාව - පතුල අමෘත කලාව - තනය

මරු සිටින දිසාව - බටහිර යෝගිනී - ඊසාන සුබ දිසාව - දකුණ

### 2021.05.04 කුජ දින හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**
05.56 සිට 06.56 දක්වා - කුජ හෝරාව
06.56 සිට 07.56 දක්වා - රවි හෝරාව
07. 56 සිට 08.56 දක්වා - සිකුරු හෝරාව
08. 56 සිට 09. 56 දක්වා - බුධ හෝරාව
09. 56 සිට 10. 56 දක්වා - සඳු හෝරාව
10. 56 සිට 11. 56 දක්වා - සෙනසුරු හෝරාව

**සවස**
11. 56 සිට 12. 56 දක්වා - ගුරු හෝරාව
12. 56 සිට 01. 56 දක්වා - කුජ හෝරාව
01. 56 සිට 02. 56 දක්වා - රවි හෝරාව
02. 56 සිට 03. 56 දක්වා - සිකුරු හෝරාව
03. 56 සිට 04. 56 දක්වා - බුධ හෝරාව
04. 56 සිට 05. 56 දක්වා - සඳු හෝරාව

**රාත්‍රී**
05.56 සිට 06.56 දක්වා - සෙනසුරු හෝරාව
06.56 සිට 07.56 දක්වා - ගුරු හෝරාව
07. 56 සිට 08.56 දක්වා -කුජ හෝරාව
08. 56 සිට 09. 56 දක්වා - රවි හෝරාව
09. 56 සිට 10. 56 දක්වා - සිකුරු හෝරාව
10. 56 සිට 11. 56 දක්වා - බුධ හෝරාව

**අලුයම**
11. 56 සිට 12. 56 දක්වා - සඳු හෝරාව
12. 56 සිට 01. 56 දක්වා - සෙනසුරු හෝරාව
01. 56 සිට 02. 56 දක්වා - ගුරු හෝරාව
02. 56 සිට 03. 56 දක්වා - කුජ හෝරාව
03. 56 සිට 04. 56 දක්වා - රවි හෝරාව
04. 56 සිට 05. 56 දක්වා - සිකුරු හෝරාව

**බබාට නමක්**

උදේ 08.29 දක්වා සුවන නැකත උදාව පවතින නිසා එතෙක් උපදින දරුවන්ට ජු ජේ. ඩො. ෂ අකුරු ද ඉන් පසු දෙනට නැකත උදා වන නිසා එතැන් සිට උපදින දරුවනට ග, ගි. ගු ගෙ, අකුරු ද දිනට අදාළව ක, බ, ග, ඩ අකුරු ද මුල් කොට දරුවාට නමක් තැබීම සුබයි.



අද සුබසෙත

## දවසේ ලග්න පලාපල

**මේෂ ලග්නය - වාසනාවන්ත ලැබීම්**

මේෂ ලග්නයට අනුව අද ඔබට තම අභියෝග ජයගත හැකි දිනකි. අන් අය තම කටයුතුවලට උදව් උපකාර දක්වනු ඇත. ආර්ථිකයේ වාසනාවන්ත ලැබීම් ඇත. රැකියාගත බාධා පැමිණෙන නිසා තව කෙනෙකු සමග තුන්වැන්නකුට කරන චෝදනාවලින් බැහැර වන්න. කේලාම් හා එදිරිවාදිකම් නිසා ගැටලු ඇතිවනු ඇත. තුනටියට අගුණයි. සැලකිලිමත් වන්න. උගුරේ ආසාදිත තත්ත්වයක් ඇතිවේ.

**වෘෂභ ලග්නය - ගෘහ ජීවිතයේ ගැටලු**

වෘෂභ ලග්නයට අනුව අද ඔබට සිතේ දෙගිඩියාව නිසා කටයුතු අඩාළ වේ. එහෙත් රැකියාගත යහපත්කම් මතු කෙරේ. තම ගෘහ ජීවිතයේ මතභේද මතු වීමට ඉඩ ඇත. තමා තම පෞද්ගලික ජීවිතයේ කිසියම් රහසක් රැක ගැනීමට යෑමේදී ගැටලු එළඹෙනු ඇත. වියදම් පැත්ත ඉහළ ගිය ද ලැබීම් ද ඒ හා සමානව උසස් වන නිසා බිය විය යුතු නැත.

**මිථුන ලග්නය - ආගමික කටයුතු කෙරේ නැඹුරුවක්**

මිථුන ලග්නයට අනුව අද ඔබට ආර්ථික අතින් උසස් ලැබීමකට හේතු වේ. සිතේ තදබල කේන්තිය නිසා කටයුතු අඩාළ වීමට පුළුවන. තම එදිනෙදා ජීවිතයේ කටයුතු තමාට පෞද්ගලිකව ඉටු කර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවේ. ආගමික කටයුතු කෙරේ වැඩි නැඹුරුවක් දක්නට ලැබේ. මව් පාර්ශ්වයේ අයකුට මාරක එළඹෙන දිනකි.

**කටක ලග්නය - එදිනෙදා කටයුතු සාර්ථක වේ**

කටක ලග්නයට අනුව අද ඔබට විවාහගත සුබවාදී ලකුණු පෙනේ. රැකියා ස්ථානගත අභිවෘද්ධිය ද ඇත. තම ආධ්‍යාත්මික ශක්තිය උදෙසා කටයුතු කෙරෙනු ඇත. ඒ වෙනුවෙන් වාසස්ථානයෙන් බැහැරව දුර බැහැර යෑමකට හේතු වෙයි. උදරයේ උෂ්ණ ගති මතු කෙරේ. තම එදිනෙදා කටයුතු අපහසුවෙන් වුවද සාර්ථක කර ගැනීමට හැකි වේ.

**සිංහ ලග්නය - දේපළ හිමිකම්**

සිංහ ලග්නයට අනුව අද ඔබට තම උරුමකම් හිමිකම් උදාවන දිනකි. විවාහ ස්ථානගත අභිවෘද්ධිය හා තම විවාහ සහකරු හෝ සහකාරියගේ පැත්තෙන් දේපළ හිමිකමක් ද පවතී. ඒ සඳහා තිබූ නීති ගැටලු ලිහිල් වේ. ලැබීම් අතින් සුබයි. ගෘහ ජීවිතය සැපවත්ය. ශරීර සෞඛ්‍ය අතින් පරිස්සම් විය යුත්තේ තමා එදිනෙදා ගන්නා ඖෂධ වේලක් මඟ හැරී යෑමෙන් ගැටලු මතු විය හැකි නිසාය.

**කන්‍යා ලග්නය - ප්‍රධානීන් සමඟ මතභේද**

කන්‍යා ලග්නයට අනුව ඔබට අද දින රැකියාගත ගැටලු මතු විය හැකිය. ඉවසීම නොමැතිකම නිසා ප්‍රධානීන් සමග මතභේද හට ගනී. ඒ නිසා අවශ්‍ය වන්නේ තමා වෙතින් මොන අඩුපාඩුවක්වත් සිදු නොවීමට වගබලා ගැනීමයි. දණහිසට අගුණයි. මුත්‍රා අඩස්සිය හා මුත්‍රා මාර්ගයේ අවහිරතා නිසා ගැටලු මතු විය හැක. උපරිම වතුර පානය සුදුසු වෙයි.

**තුලා ලග්නය - යුග දිවි සතුට**

තුලා ලග්නයට අනුව ඔබට වාසනාවන්ත දරු සම්පත් උරුම වෙයි. පාසල් යන වයසේ සිටින දරුවකු මීට පෙර සහභාගි වූ විභාගයකින් උසස් ප්‍රතිඵල ලැබී ඇති බව දැනගන්නට ලැබීමෙන් සිතේ සතුට මතු වේ. විවාහ ස්ථානගත සහයෝගිතාව එකමුතුකම, අඹුසැමියන් අතර සතුට සමාදානය ඇති වේ. ආර්ථික වශයෙන් උසස් ලැබීම් ඇත. විකුණා ගැනීමට නොහැකිව තිබූ ඉඩමක් විකුණා ගැනීමට හැකි වේ.

**වෘශ්චික ලග්නය - විවිධ වගකීම් පැවරේ**

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට විවිධ වගකීම් පැවරෙන නමුත් ඒවා එකින් එකට පිළිවෙළට කරගෙන යෑමට නොහැකි වෙයි. කේතු ග්‍රහයා ඔබ කේන්ද්‍රයේ ලග්නගත වීම සිතේ නොසන්සුන් ගති අපිළිවෙළ සහගත ගති නිසා එම කටයුතුවල ද අපිළිවෙළක් ඇති වන නිසාය. නමුත් ඔබ තම ආගමික කටයුතු කෙරේ යොමු වෙමින් සිත සන්සුන් කර ගැනීමට උනන්දු විය යුතු දිනකි.

**ධනු ලග්නය -කලකිරීම් සිතට දැනේ**

ධනු ලග්නයට අනුව අද ඔබට බොහෝ වගකීම්වලින් නිදහස්ව විවේකයෙන් ගත කිරීමට හැකි වේ සමාජ විෂමතා නිසා කලකිරෙන ස්වභාවයක් ද ගෙන දේ. ආර්ථිකයේ එතරම් ශක්තියක් නොවන අතර වියදම් අංශයෙන් ද අඩුවක් නොවේ. තම මවු පාර්ශ්වයේ කෙනෙකුට සිදුවන හදිසි අනතුරක් නිසා ඒ වෙනුවෙන් කාලය ශ්‍රමය ධනය වැය කිරීමට සිදු වනු ඇත.

**මකර ලග්නය - ප්‍රබල ආයෝජනයක්**

මකර ලග්නයට අනුව අද ඔබට ධනයෝග සහිතයි. පිටරටකට යෑමට සිටි ගමන කල් යන ස්වභාවයකි. ඒ නිසාම ඔබ මෙරට ප්‍රබල ආයෝජන කටයුත්තකට අත පෙවීම නිසා සුබවාදී වෙයි. දුර බැහැර ගමන් යෙදෙන දිනයක් වන අතර තම ගෘහ ජීවිතයේ කටයුතු අඩාළ වනු ඇත. විවිධ පුද්ගලයින් වෙතින් කෙරෙන අභූත චෝදනා නිසා සිත කලකිරුණු ස්වභාවයක් ද ගනී.

**කුම්භ ලග්නය - ආර්ථික වාසියක්**

කුම්භ ලග්නයට අනුව අද ඔබට සිතේ සතුට රජයන දිනකි. ඒ අනුව ආර්ථික වාසියක් උදා වන ලකුණු පෙනේ. එහෙත් ඒ ලැබීම ක්ෂණියෙන් ඔබ වෙතින් ක්ෂය වීමට ඉඩ ඇති නිසා කල්පනාකාරී වන්න. අරපරිස්සම ඉතා වැදගත් වන අතර සෝදිසිය හොඳ සිහිකල්පනාව වැදගත් වෙයි. තම සහායට සිටින අය නිසා පාඩු සිදු විය හැකිය. ලේ ඥාති සබඳතා ඇති අයගෙන් වඩාත් පරිස්සම් වන්න.

**මීන ලග්නය - සුබ අසුබ සම වේ**

මීන ලග්නයට අනුව අද ඔබට සුබ අසුබ සමසේ බුක්ති විඳීමට හැකි වේ. ශ්‍රමයට අනුව ප්‍රතිපල නැතත් එදිනෙදා කටයුතු දුෂ්කරතා මධ්‍යයේ සාර්ථක කර ගැනීමට හැකි වේ. ශරීර සෞඛ්‍ය අතින් සැලකිලිමත් විය යුත්තේ පපුවේ අපහසුතා විය හැකි නිසාය. හෘදයාබාධ ඇති අය ප්‍රවේශම් විය යුතුය. නහරගත ආපදා මතු වනු ඇත. සැර උෂ්ණ ආහාර අවම කරන්න. අධික වෙහෙස මහන්සියට පත් නොවන්න.

# කළුතර දිසාවේ ගැමි සංස්කෘතිය

ස්වභාවික සෞන්දර්ය අතින් පමණක් නොව, ඓතිහාසික, සමාජීය සහ ආර්ථික වශයෙන් ද අනන්‍යතාවක් සතුව පවතින කළුතර දිස්ත්‍රික්කයේ විසි වැනි සියවසේ "ගැමි සංස්කෘතිය" අලළා රචිත මෙම කෘතිය, ගැමි සංස්කෘතියක පොදුවේ දැකිය හැකි බොහෝ කරුණුවලින් පරිපූර්ණය.

2018 වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන උලෙළේ හොඳම ශාස්ත්‍රීය කෘතියට හිමි සම්මානය මෙම කතුවරයාගේ "කළුතර දිසාව" නමැති කෘතියට හිමි විය. මෙම කෘතිය "කළුතර දිසාව" කෘතියේ දිගුවක් ලෙස සැලකිය හැකි අතර කෘති දෙකම එකට ගත් කල මෙම කෘති කළුතර දිසාව පිළිබඳ ලියවුණු පරිපූර්ණ විශ්ව කෝෂයක් ලෙස හැඳින්විය හැකිය.

විසිවැනි සියවසේ අග භාගයේ දී මෙරට රජය හඳුන්වා දුන් විවෘත ආර්ථිකයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉතා ශීඝ්‍ර සෝදාපාලුවකට ලක් ව ඇති ගැමි සංස්කෘතිය පිළිබඳ කරුණු ගවේෂණය කිරීම සඳහා මෙම කාල පරිච්ඡේදය තුළ ගැමි ජනයාගේ ජීවන වෘත්තීන්, ඔවුන් භාවිත කළ උපකරණ සහ ශිල්පීය දැනුම පිළිබඳ දැනට දිස්ත්‍රික්කයේ ජීවත්වන පරම්පරාගත ගැමි ජනයා සතු දැනුම සොයා කතුවරයාට දිස්ත්‍රික්කය පුරා සංචාරයට කිරීමට සිදු ව ඇති ආකාරය මෙම කෘතිය පරිශීලනය කරන්නෙකුට පැහැදිලිව දැක ගත හැකිය.

ගැමි සංස්කෘතියට අයත් බොහෝ සංස්කෘතිකාංග පිළිබඳ කරුණු රැස් කිරීමේ දී කළ සම්මුඛ සාකච්ඡාවලට අතිරේකව මෙම විෂය යටතේ ලියවුණු ඉතා වටිනා බොහෝ මූලාශ්‍රය, කතුවරයා ඉවහල් කර ගැනීම නිසා මෙහි ඇති ශාස්ත්‍රීය වටිනාකම ඉතා ඉහළ මට්ටමක පවතී.

විසිවැනි සියවසේ මැද භාගය දක්වා කළුතර දිසාවේ ගැමි ජනතාවගේ ජීවන වෘත්තීන්හි දී භාවිත කළ උපකරණ සහ ඒ සඳහා භාවිත කළ තාක්ෂණය පිළිබඳව සොයා බැලීමට කතුවරයා මහත් වෙහෙසක් ගෙන ඇත. දිස්ත්‍රික්කයෙන් සොයා ගත් එම උපකරණ දැක්වෙන ඡායාරූප මෙම කෘතියට ඇතුළත් කර තිබීම අනාගතයේ ඒ පිළිබඳ ගවේෂණයක යෙදෙන්නකුට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. නිදසුනක් ලෙස වී ගොවිතැනේ යෙදුණු ගොවියා භාවිත කළ නගුල, පෝරු උදැල්ල, දෑ කැත්ත, යොතු කඳ, යනාදි උපකරණවල පිංතූර පමණක් නොව ගොයම ආරක්ෂා කර ගැනීම සඳහා ගොවියා භාවිත කළ දිය හොල්මන, ඇතුළු විවිධ උපක්‍රම පිළිබඳ ව ද පින්තූර සහිත ව කරුණු විස්තර කර ඇත. එමෙන් ම වී ගොවිතැන පිළිබඳ එකල පැවති මිනුම් ක්‍රම මේ වන විට සමාජයෙන් අතුරුදන්ව ඇති බැවිනි




මෙම කෘතියේ සැලකිය යුතු ඉඩකඩක් විසි වැනි සියවසේ දී කළුතර දිස්ත්‍රික්කයේ ගැමි ජනතාව අතර පැවති චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව විස්තර කිරීමට වෙන් කර ඇත. ජීවිතයේ ඉතා වැදගත් දරු උපත, මල්වර වීම, විවාහය, මරණය යනාදි අවස්ථාවල දී ගැමියා අනුගමනය කළ බොහෝ චාරිත්‍ර වාරිත්‍ර මෙහි දැක්වේ.

මෙහි දී කතුවරයා සිංහල බෞද්ධ ගැමි ජනතාවගේ පමණක් නොව කළුතර දිස්ත්‍රික්කයේ වෙසෙන හින්දු, ඉස්ලාම්, සහ කතෝලික (ක්‍රිස්තියානි) යන අන්‍ය ආගමිකයන්ගේ ද ඉහත සඳහන් වැදගත් අවස්ථාවල දී අනුගමනය කළ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ විමසා බැලීම බෙහෙවින් වැදගත්ය.

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ගැමි ජනතාව අතර විසි වැනි සියවසේ අග භාගය දක්වා ජනප්‍රියව පැවති පොර පොල් ගැසීම, අං කෙළිය, කතුරු ඔංචිල්ලා පැදීම ආදී ශාන්තිකර්ම ක්‍රීඩා කිහිපයක් පිළිබඳ සවිස්තරව කරුණු දක්වා ඇත්තේ එම ක්‍රීඩාවල උපත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමිනි. විශේෂයෙන් ම රයිගම් කෝරළයේ ප්‍රකට ව පැවති "කතුරු ඔංචිල්ලාව" පිළිබඳ ඉතා වටිනා තොරතුරු රාශියක් මෙම කෘතියේ ඇතුළත් කර ඇත.

එ මෙන්ම මෙහි ළමා ක්‍රීඩා සඳහා වෙන ම පරිච්ඡේදයක් වෙන් කර ඇත්තේ වර්තමාන ළමා පරපුරට දැක ගත නොහැකි වූ එකල පැවති ළමා ක්‍රීඩා රාශියක් කෘතියට ඇතුළත් කිරීමෙනි. ඒ අතර මේවර ක්‍රීඩාව, කොප්පර කොප්පර පිපිඤ්ඤා, අඹ ඇට ක්‍රීඩාව, කල්ලි ගැසීම, කජු කිරීම, ආදී ක්‍රීඩා ගැන මෙන් ම දරුවන් විනෝද වූ බට තුවක්කුව, රබර් ඇට බඹරය, කොළපත් කරතත්ත, පොල්පිති ගොනා, ගොක්කොළ නලාව, කඩදාසි ඔරු යැවීම යනාදී වර්තමානයේ දැකිය නොහැකි ළමා ක්‍රීඩා රාශියක් පිළිබඳ පිංතූර සහිතව කරුණු ඉදිරිපත් කර ඇත.

විසි වැනි සියවස තුළ කළුතර දිස්ත්‍රික්කයේ සිංහල ගම්මානය සහ එහි පැවති පොදු අංගෝපාංග, ගැමි ජනතාවගේ ජන ජීවිතයට බෙහෙවින් සම්බන්ධ වූ ප්‍රවාහන සේවය ඇතුලු බොහෝ සේවාවන් පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබේ.

කෘතියේ තිස්හත්වන පරිච්ඡේදයේ සිට පරිච්ඡේද තුනක්ම වෙන් කර ඇත්තේ විසි වැනි සියවසේ කළුතර දිස්ත්‍රික්කයේ පැවති "ජනශ්‍රැති" පිළිබඳ විමසා බැලීමට ය. එහි දී ජනශ්‍රැතිය ගැන ලියවුණු ඉතා වටිනා මූලාශ්‍රය කිහිපයක් භාවිත කර තිබේ.

විශේෂයෙන්ම රයිගම් කෝරළයේ ප්‍රකටව පැවති ගම්මඩු, දෙවොල් මඩු, යනාදී මඩු ශාන්තිකර්ම සම්බන්ධව කතුවරයා දැනට දිස්ත්‍රික්කයේ ජීවත්ව සිටින පාරම්පරික නර්තනවේදීන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා ලබා ගත් ඉතා දුර්ලභ කරුණු රාශියක් මෙහි ඇතුළත් කර ඇති බැවින් මෙම අභිචාර විධි පිළිබඳව පර්යේෂණයක යෙදෙන්නෙකුට මෙම කෘතිය පරිශීලනය කිරීමෙන් ඉතා වටිනා කරුණු සොයා ගත හැකිය.

සමස්තයක් වශයෙන් ගත් විට වික්ටර් පෙරේරා ශූරීන් කළුතර ගැමි සංස්කෘතිය පිළිබඳ ඇතුළත් විය යුතු සියලු කරුණු ක්‍රමානුකූලව පෙළ ගස්වා ඇති බැවින් මෙය ගැමි සංස්කෘතිය පිළිබඳ උනන්දුවක් දක්වන එමෙන් ම පර්යේෂණයක යෙදෙන විද්‍යාර්ථීන්ට බෙහෙවින් වැදගත් වන කෘතියක් ලෙස පෙන්වා දිය හැකි ය. කතුවරයා විසින් රචිත "කළුතර දිසාව" සහ "කළුතර දිසාවේ ගැමි සංස්කෘතිය" නමින් එළි දක්වන මෙම කෘති දෙක එක්ව ගත් කල එම විෂය පිළිබඳ "විශ්ව කෝෂයක්" සේ සැලකිය හැකි බව සතුටින් සඳහන් කරමි.

**බී.ඒ. ටෙනිසන් පෙරේරා**
**සම්මානිත මහාචාර්ය (සමාජ විද්‍යාව)**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

# කම්කරු නායක ඒ.ඊ. ගුණසිංහ පිළිරුවට පුෂ්පෝපහාර

**මැදකොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

කම්කරු නායක ඒ. ඊ. ගුණසිංහ මහතාගේ 130 වැනි ගුණසමරුව ඉකුත්දා (1) සජබ ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක, කොළඹ හිටපු නාගරික මන්ත්‍රී විජිත කදිරගොන්න මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් ගුණසිංහ පිළිරුව අබියසදී පැවැත්විණි.

පිටකොටුව සෝන්ඩර්ස් පෙදෙසේ ගුණසිංහ පිළිරුව වෙත දිවංගත ගුණසිංහ මහතාගේ මිනිපිරියන් වන යස්මින් කෝච් සහ ලෝහිණි අබේරත්න මහත්මීහු මල් කලඹ තබා ගෞරව දැක්වූහ.

ඊට අමතරව කොළඹ නියෝජ්‍ය පුරපති එම්. ටී. එම්. ඉක්බාල් මහතා ගුණසිංහ පිළිරුවට මල්දමක් පැලඳූ අතර, එම අවස්ථාවට සහභාගි වී සිටි විජිත කදිරගොන්න මහතා ගුණසිංහ පිළිරුවට රතු මල්මාලාවක් පැලඳවීය.

මෙහිදී ජනතාව ඇමතූ විජිත කදිරගොන්න මහතා දිවංගත රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ දේශපාලන ගුරුවරයා වූ ඒ. ඊ. ගුණසිංහ මහතාට කෘතගුණ සැලකීමක් ලෙස කොළඹ පිටකොටුව ප්‍රයිස් ක්‍රීඩාපිටිය ඒ. ඊ. ගුණසිංහ ක්‍රීඩාපිටිය නමින් ද ඒ අසල පිහිටා තිබෙන විදුහල ගුණසිංහ විද්‍යාලය නමින් ද, කෙහෙල්වත්ත නිවාස යෝජනා ක්‍රමය ගුණසිංහපුර නිවාස යෝජයා ක්‍රමය ලෙස නම් තැබූ බවත් හිටපු ජනාධිපතිවරයා නිවාස ඉදිකිරීම් හා අග්‍රාමාත්‍යවරයාව සිටි සමයේදී මෙම නම් කිරීම සිදුකළ බව ලංකා කම්කරු සමිතියේ සභාපති හිටපු නාගරික මන්ත්‍රී විජිත කදිරගොන්න මහතා පැවසීය.



කොළඹ මහ නගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රීවරයකු වන සුනිල් කුමාර සහ ස්ටැන්ලි ක්‍රිස්ටෝපර්, කොටහේන සමුපකාර රෝහලේ හිටපු උප සභාපති සරත් කුමාර යන මහත්වරුන් ඇතුළු ලංකා කම්කරු සමිතියේ සාමාජික සාමාජිකාවෝ පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

# කළුබෝවිල ශික්ෂණ රෝහලේ මිලේනියම් වාට්ටු සංකීර්ණයේ වැඩ කඩිනමින් නිම කරනවා

## රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

**උපාලි කරුණාරත්න**

කළුබෝවිල ශික්ෂණ රෝහලේ ඉදි වන මිලේනියම් වාට්ටු සංකීර්ණය සහ බාහිර රෝගී අංශ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු දින කිපයක් ඇතුළත කඩිනමින් අවසන් කර කොවිඩ් - 19 වසංගතය හමුවේ රෝගී ජනතාවට ඉඩ පහසුකම් සැලසීමට කටයුතු කරන බව ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පැවසීය.



රාජ්‍ය ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේ, කළුබෝවිල ශික්ෂණ රෝහලේ (දකුණු කොළඹ) ඉදිවන මිලේනියම් වාට්ටු සංකීර්ණය සහ බාහිර රෝගී අංශ ගොඩනැගිල්ල නිරීක්ෂණය කිරීමේ අවස්ථාවට ඊයේ (3) සහභාගි වෙමිනි.

රට පුරා පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රෝහල් පද්ධතිය වැඩිදියුණු කිරීම විශාල අවශ්‍යතාවක් බව මෙහිදී පෙන්වා දුන් ඉන්දික අනුරුද්ධ මහතා, වසංගත අවදානම් තත්ත්වය තුළ සෞඛ්‍ය උපදෙස් නිවැරදිව අනුගමනය කරමින් නිසි වැඩ පිළිවෙළක් යටතේ මෙහි ඉදිකිරීම් කටයුතු අවසන්කර සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාරදෙන බවද ප්‍රකාශ කළේය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ රුපියල් මිලියන 743ක ප්‍රතිපාදන මත ඉදිවෙන මෙම ගොඩනැගිල්ල ශල්‍යාගාර 7කින්, පර්යේෂණාගාර 5කින්, බාහිර රෝගී අංශ 2කින් හා වාට්ටු සංකීරණවලින් සමන්විත තට්ටු 10ක ගොඩනැගිල්ලකි. මෙහි ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සිදු කරයි.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති රත්නසිරි කළුපහන, උප සභාපති භාග්‍ය ජයතිලක මහත්වරුන් ඇතුළු නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ





# වෛද්‍යසේකර මුල්ගුරුතුමාගේ ලොග් පොත

## සංහිඳ පාමුල

හරියටම දින වකවානු කියන්න හැකියාවක් නැතත් වෛද්‍යසේකර ලොකු මහත්තයා මට හමු වන්නේ මීට අවුරුදු තිස්පහකට නැත් නම් තිස්හයකට කලින් පොළොන්නරුවේදීය. ඒ මුහුණට මුහුණ හමු වීමක් නොවේ; අඩු තරමින් අද කාලයේ මෙන් දුර බණුවකින් හෝ අත් බණුවකින් අදහස් හුවමාරු කර ගනිමින්, ඔහුගේ කටහඬ අසමින් සිදු වූ හමුවක් ද නොවේ. ඔහු මට හමු වන්නේ නවසිය හැටේ දශකයේ මුල් භාගයේ ලොග් පොතක පළින් පළ කාකි පැහැයට හුරු පැල්ලම් සහිත සුදු පැහැ කොළ අතර තීන්ත පෑනකින් ලියවුණු අත් අකුරු අතුරිනි. හැබැයි එකක් කිව යුතුය. හමු වූ සැණින් ඔහු මා තුළ ඔහුගේ කටු අකුරු කියවීමේ ආශාව දැල්වීය; මට මතක හිටින චරිතයක් බවට පත් විය.

වෛද්‍යසේකර ලොකු මහත්තයා මුලසුන හෙබවූ වකවානුවේ ඒ පාසලේ සේවය කළ, මට හමු වන විට වියපත්ව සිටි ගුරුවරියක හා කතා කරන්න අවස්ථාව ලැබිණි. පාසලේ අතීත තොරතුරු විමසන විට වෛද්‍යසේකර මහත්තයා ගැන විමසන්නට ද අමතක නොකළෙමි.

"අප්පා...! මහ ගුප්ත මිනිහෙක්. කොයි වෙලේ කාට අංචියක් අදියි ද කියන්න බෑ."

"හැඩරුව කොයි වගේ ද?"

"කළු හීන්දෑරි මනුස්සයෙක්." ඈ කීවා ය.

වෛද්‍යසේකර මහත්තයා හමු වීමේ අවස්ථාව ද අහම්බෙන් ලැබුණු එකකි. හයවන ශ්‍රේණියේ අලුත් විෂය නිර්දේශයට අනුව සමාජ අධ්‍යයනයට පාසලේ ඉතිහාසය ඉගැන්විය යුතු විය. පාසල ආරම්භ කොට අවුරුදු විසිහයකට වඩා ගත වී නැත. ඉතිහාසය කොතැනක වත් සටහන් වී ද නැත. මම ගැටලු සහගත තත්ත්වය විදුහල්පතිවරයා සමඟ සාකච්ඡා කළෙමි.

"ඊළඟ අවුරුද්දෙත් පාසල් ඉතිහාසය ඕනෑ වෙනවනෙ. ඔයා අපේ ඉස්කෝලෙ ඉතිහාසය හොයන්න. හොයල ලියල තියන්න. මුල් කාලෙ ඉගෙන ගත් අයට කතා කරන්න. මම ලොග් පොත් ටික දෙන්නම්. ඒවායෙන් තොරතුරු ගන්න."

ලොග් පොත වනාහි පාසලේ නිල ලේඛනයයි. පැරණි විදුහල්පතිවරුන් එය වෙනම තැනක ලා සුරැකිව තබා ගෙන ඇත්තේ සිය විරුද්ධවාදීන් විසින් ඇතැම් පිටු ඉරා ගෙනු යනු ලබතියි යන බියෙනි. විදුහල්පතිවරයා දුන් ලොග් පොත් මා තව දෙ-තුන් දෙනකු සමඟ නවාතැන් ගෙන සිටින ගුරු නිවාසයේ සිට කියවන්න ගත්තේ රසවත් තොරතුරු නැති නිල ලේඛනයක් කියවා දින-වකවානු, තොරතුරු සටහන් කරගන්නා අටියෙනි. එහෙත් මුල් ලොග් පොතම මගේ සිතිවිලි වෙනස් කළේය. ඒ පාසලේ දෙවන මුල් ගුරුවරයා වන වෛද්‍යසේකර මහතාගේ සටහන් දුටු විටය.

වෛද්‍යසේකර ලොකු මහත්තයා 1963 අවුරුද්දේ දිනෙක මෙවන් ලොග් සටහනක් තබයි:

"ගම් පෙදෙසින් බැහැරව, අඹු-දරුවන් ද සමඟ පර හිත සුව පිණිස දුෂ්කර සේවයට පැමිණ දැන් කලකි. ගම් ප්‍රදේශයේ ඇති මගේ ඉඩම් කීපයක් මැරවර බලයට යටත්ව මගේ අයිතිවාසිකම් පවා නැති වන තත්ත්වයට පත්ව ඇති බැවින් ඒවා බේරා ගැනීමට මේ අවස්ථාවේ ඉදිරිපත් නොවීම බැරි නිසා ගමට යෑමට සිදු වී ඇත. අද වස දෙකට පිටත්ව යමි. උපගුරු ජිනදාස මහතාට පාසලේ වැඩ බලා ගැනීම පවරන්න යෙදුණා ඇත."

ඉන් පසු දක්නට ලැබෙන්නේ උපගුරු ජිනදාස මහතා යොදන ලොග් සටහන්ය. දින කීපයකින් පසු ජිනදාස මහතා තබන්නේ මෙවන් ලොග් සටහනකි: "මෙදින විදුහල්පතිතුමා කොළඹ මහ රෝහලේ 46 වන වාට්ටුවේ ප්‍රතිකාර ලබන බවත්, තත්ත්වය ඉතා බරපතළ බවත් දන්වන විදුලි පණිවිඩයක් ලැබිණි."

සිය අයිතිවාසිකම් බේරා ගැනීමට ගිය වෛද්‍යසේකර මුල් ගුරුතුමා මුහුණ දුන් කනගාටුදායක තත්ත්වය අප දැනගන්නේ උප ගුරුවරයාගේ ලොග් සටහනෙනි. වෛද්‍යසේකර මහතාගේ ලොග් සටහනක් අපට නැවත දැකගන්න ලැබෙන්නේ මසකට පමණ පසුය. ඒ මෙසේය:

"හතුරු අනතුරකට ගොදුරුව මාසයක් ඔත්පළව සිටීමෙන් පසු අද දින සේවයට පැමිණියෙමි."

වෛද්‍යසේකර මුල් ගුරුතුමා සේවය කළ, ඉන් අවුරුදු විසි ගණනකට පසු මා ද සේවය කළ පාසලේ ගුරු නිවාස තුනක් තිබිණි. පාසල් ඉඩම ඉදිරිපසින් වැටෙන ගුරු පාරට මුහුණ ලා ඉඩමේ වම් කෙළවරට වන්නට මුල්ගුරු නිවාසය පිහිටා තිබිණි. ඊට පිටුපසින් සමාන්තර දුර සහිතව ප්‍රමාණයෙන් ඊට වඩා කුඩා උපගුරු නිවාස දෙකක් තිබිණි. පාසල් ළිඳ පිහිටියේ ගුරු නිවාසවලට සමාන්තරව වත්තේ පිටුපස පිට්ටනියේ කෙළවරකය. මුහුණු දෙවීම්, වතුර ගෙන ඊම් ආදියට ගුරු නිවාසවල අය මේ ළිඳට පැමිණිය යුතුය. ලොග් පොතට අනුව ඩිංගිරි බණ්ඩා උප ගුරු මහතා පදිංචිව සිට ඇත්තේ මුල්ගුරු නිවාසයට එපිටින් වූ උපගුරු නිවාසයේය. දෙදෙනා අතර හිත් නොහොඳකම් තිබුණු බවට ලොග් පොත සාක්ෂි දරයි. ඇතැම් විටෙක අඬදබර සිදු වෙයි. ඒවා ද ලොග් පොතේ සටහන් වෙයි. මේ එවැන්නකි:

"මෙදින උදේ මා මුහුණ දෙවීමට ළිඳට යන විට මගේ නිවාසයට යාබද ගුරු නිවාසයේ සිටින කේ.ඒ. ඩිංගිරි බණ්ඩා මහතා ළිඳ ළඟ සිටියේය. මා එනු දුටු ඔහු ළිඳේ දම්වැල ළිඳට අතහැරියේය. මීට කලින් දවසක මගේ ළමයෙක් දිය ගෙන එනු පිණිස ළිඳට ගිය විට ද මොහු මෙසේම කර ඇත."

වෛද්‍යසේකර මුල්ගුරු සහ ඩිංගිරි බණ්ඩා ආරවුලට සම්බන්ධ තවත් ලොග් සටහනක් ලොග් පොතේ මෙසේ සටහන් වෙයි:

"අද දින විවේක කාලය ගත වනවාත් සමගම උපගුරු කේ.ඒ. ඩිංගිරි බණ්ඩා මහතා 'මම මේකට ආවේ වල්ගෙ කපාගන්න නෙවෙයි යකෝ...' කියමින් මහ හඬින් කෑගෑම නිසා ළමයින් හා ගුරු මණ්ඩලය අතර මහත් කලබලයක් ඇති විය."

වෛද්‍යසේකර මහත්මයා ලොග් පොතේ සටහන් කර ඇත්තේ පාසලේ පරිපාලනයට අවැසි දේ පමණක් නොවේ. ගුරුවරුන්ගේ වැරදි යයි සිතෙන සියලු දේ (ඉතා සුළු කාරණා පවා) සඳහා ඔහු ලොග් සටහන් යොදා ඇත. බොහෝ විට ඔහු හා පැටලෙන, ඔහුට කරදරයක්යැයි සිතෙන අයට ලොග් සටහන් නමැති හැන්දෙන් වැඩිපුර බෙදෙන්න ඇතැයි සිතීම අසාධාරණ නොවේ. පහත සඳහන් සටහන් ද කියවනු මැනවි:

"උපගුරු ජේ.ඇම්. සිරිරත්න මහතා මා පන්ති පරීක්ෂාවට යන විට, අටවන ප්‍රමාණයේ බුද්ධාගම කාල පරිච්ඡේදයේ ගුරු පුටුවට වී නිදාගෙන සිටියේය. මොහු හය, හත, පෙර-දෙටු පෙළ පන්තිවල ද මෙසේම බව ළමයි කියති."

"උපගුරු ජේ.ඇම්. සිරිරත්න මහතා තමන්ගේ පන්තියේ වැඩ නොකර, ආර්.එම්. අප්පුහාමි මහතාගේ පන්තිය අසලට ගොස් ඔහුටත් වැඩ කරන්න නොදී කතා කරමින් සිටියේය."

"එච්.පී. ලීලාවතී ගුරු මහත්මිය නිසි පරිදි පන්තියේ වැඩ නොකරයි; සටහන් නොලියයි; ළමයින්ගේ උත්තරපත්‍ර කලට වේලාවට පරීක්ෂා කර ලකුණු නොදෙයි. මේ පිළිබඳ අවවාද කරන්න ගිය විට ළමයින්ට සහ වෙනත් ගුරුවරුන්ට ද ඇසෙන සේ පරුෂ වචනයෙන් මට බැණ වදින්න යෙදුණා ඇත."


වෛද්‍යසේකර මුල් ගුරුතුමා ඔහුගේ ලොග් සටහන් මඟින් අවුරුදු විසි ගණනකට පසු ඒවා කියවූ මට හාස්‍ය රසය ජනිත කරන්න ඇත. එහෙත් ඔහුගේ පාලනය යටතේ පාසලේ අර්බුද රැසක් ඇති වන්න ඇතැයි ඒ සටහන් ඇසුරෙන් නිගමනය කිරීම අසීරු නැත.

**මහානාම දුනුමාල**

# ඡන්දයේ ආනන්දය

# මැන්ඩෙලා








COME AND SEE

හිමිදිරි පාන්දර පිල් කඩක නිදා සිටි මිනිසෙකු හෙමින් සැරේ නැඟිට එතැනම වූ දිය බඳුනකින් මුහුණ සෝදා තවත් වතුර සෙම්බුවක් ගෙන අසල තල් ගසින් පිරි කැලයකට වදී. ඒ ශරීරකෘත්‍යය සඳහාය. එහි තැනින් තැන ඔහු වැනිම තවත් අය අඳුරේ එම කටයුත්තට සැරසෙනුයේ හිරු පායා ගත් පසු එය කරන්නට තැනක් නැති හෙයිනි. එහෙත් එකවරම විදුලි පහන් එළියක් වදින්නේ රථයකිනි. එය කුමක් දැයි වටහා ගත නොහැකි වුවත් මේ පිරිස එම රථයට නංවාලන්නේ කරන්නට පැමිණි කාරණය පසෙකලමිනි. එයට ගැමියන්ගෙන් එළඹුණු විරෝධය කිසිවකුට හෝ වැදගත් නැත.

හිරු එළිය වැටීගෙන එද්දී ඔවුන් අස්වසනු ලද්දේ අලුත් පුවරුවක් ඉදිරිපිටය. පිරිසුදු ඉන්දියාවක් යන මැයෙන් අග්‍රාමාත්‍ය මෝදි විසින් අරඹන ලද ගම්මානවලට වැසිකිළි සැපයීමේ ව්‍යාපෘතියක් යටතේ ඉදිකරන ලද වැසිකිළියක් විවෘත කිරීමේ මහෝත්සවයකි. එයට සියල්ල සූදානම්ය.

මේ ගම්මානයේ උතුර සහ දකුණ ලෙස ජීවත් වන වනුයේ කොට්ඨාසග දෙකකි. කුලයන් දෙකකි. දකුණේ තරුණ නායකයා වැසිකිළිය සිය ගම්වාසීන් උදෙසා විවෘත කරන්නට සැලසුම් කරයි. උතුරේ තරුණ නායකයා එයට විරුද්ධව ඒ අයිතිය තම පිරිසට බව පවසයි. මේ අතර ගමේ උත්සවයට එළැඹෙන්නට සැරසෙන පැරණි වයෝවෘද්ධ නායකයා නැතහොත් වැඩිහිටියා කරුණාධරන් පෙරියර්ය. ඔහු අඳින්නට සැරසෙන වේට්ටියේ මොකක්ද ගෑවී ඇත. එය සෝදන්නට එන්නේ එක් භාර්යාවකි. ඇය එය සෝදා හැර යළි වේට්ටිය ඔහු අතට දෙන්නේ තම පුතුගේ දේශපාලන අනාගතය ගැන සිහිපත් කරමිණි. එසැණින්ම එය උදුරා ගන්නා තවත් ගැහැනියක් එය හොඳින් මැද ආපසු ලබා දෙන්නේ තම පුතුගේ අනාගතය ගැන ද සිහිපත් කරමින්ය. අනතුරුව මේ ගැහැනුන් දෙදෙනා එකම අසුනක වාඩි වී හරි බැරි ගැහෙනුයේ ටෙලි නාට්‍යයක් නරඹන්නටය.

මේ නායකයා මේ ගම් දෙකම සනසා ඇත්තේ ගම් දෙකෙන්ම විවාහ දෙකක් කරගෙනය. දැන් ඔවුන්ගේ දරුවෝ තරුණයන්ය. වැසිකිළිය විවෘත කරන්නට යන විට පුතුන් දෙදෙනා තම ප්‍රදේශ දෙකෙහි සගයන් සමඟ ආරවුලකි. ඔවුන් පෙරියර් ඉදිරියේ හිස නමති. පෙරියර් වැසිකිළිය විවෘත කරන්නට පෙරාතුව බැල්ලක එහි රිංගා ඇත. එබැවින් එය පිරිසුදු කළ යුතුව ඇත. නායකයන්ගේ ගෝලයන්ගෙන් එකිනෙකා අතට පත් වන එම වගකීම දකින විට නායකයා සැරසෙන්නේ තමා විසින්ම වැසිකිළි සෝදනු ලබන්නටය. කට්ටියට පත්තු වන්නේ එවිටය. ඔවුන් අතරින් එක් අයකු පෙරියර් ගේ මෝටර් රථයේම තවත් කෙනෙකු සොයා යයි. ඒ වැසිකිළිය සෝදන්නටය.

උතුරත් දකුණත් යා කරන හන්දියේ ඇති මහ ගසක් මුල දුප්පත් බාබර් කෙනෙක් ජීවත් වෙයි. ඔහුට නමක් නැත. උප්පැන්නයක් නැත. බාබර්කමට අමතරව ගමේ සියලු දේට අත් උදව් දිය යුත්තේ ඔහුය. ඔහු සියල්ලටම වඩා කුලහීන ය.

'ස්මයිල්' ඔහු සිතන අන්දමට ඔහුගේ නාමයයි. ඔහුගේ ගෝලයාත් එහෙමය. ඔහුගේ නම සයිඩ් බර්න්ස්ය. ස්මයිල් ජීවත්. වනුයේ මේ හන්දියේ ඇති මහ ගසක් යටය මෝටර් රථය පැමිණෙන්නේ එතැනටය. ගස මතට ගල් ගසා අවදි කර ගන්නා ස්මයිල්ට පවසන්නේ නායකයා වහාම එන්නැයි පැවසූ බව ය. ඔහු සිය බාබර් උපකරණ ද රැගෙන සගයා සමඟ රථයේ පසුපස අසුනට ගොඩ වනුයේ රජකු සේය. හොඳ කනේ පහරකින් පසුව ඔහුට පයින් වෙන්නට නියම වෙයි. රථය යවා ඇත්තේ ඔහුට පණිවිඩය කියන්න මිස ඔහු කැඳවා ගෙන එන්නට නොවේ. එබැවින් ඔහු රථය පසුපස දූවිලි වදිමින් දිවයයි.

ස්මයිල් කැඳවාගෙන එන්නේ කොණ්ඩයක් කැපීමට නොව වැසිකිළි සුද්ද කරගන්නටය. ඔහු කරබාගෙන කටයුත්ත කර දෙයි. ඔහුට දෙන්නට කියා දෙන මුදල එක් පුතකුගේ ගෝලයා විසින් යටිමඩි ගසා ගනී. පීත්ත පටිය කපා වැසිකිළිය විවෘත කරන්නට ගිය ද එයට ඇතුළු වෙන මුල්ම කටයුත්ත කරන්නට නායකයා නිසා උතුරේ සහ දකුණේ පිරිස් අරගලයකි. ඇත්තටම වැසිකිළි වඩාත් අවශ්‍ය ගැහැනුන්ටය. අවසානයේ එය විවෘත කරන්නට එතුළට රිංගන්නේ පෙරියර් ය. එහෙත් ඔහු ඒ තුළ රෝගී වේ. මේ සියල්ල උපේක්ෂාවෙන් බලා සිටිනවා විනා ඒ පිළිබඳව කිසිවක් කීමට හෝ ස්මයිල්ට අයිතියක් නැත. ඔහු එදින මෝටර් රථයට ගොඩනංවන්නට සැරසෙද්දී පහර දෙන බව සැබෑය. තව ටික දවසකින් ඔහු සොයා මෝටර් රථය යළි එනවිටද ඔහු ඉන්නේ පෙරසේම ගහ උඩ නිදි සුවයෙනි. මෝටර් රථය ගහ පාමුල නතර වේ. ඔහුට ගසින් බසින්නට ආරාධනාවකි.. ස්මයිල් හරියට දේවතාවෙකු සේ මෙවර අපට පෙනෙයි. පහළ සිටි පිරිසට පෙනෙන්නේ රජ්ජුරුවෝ උඩයි උඩයි කියන්නාක් සේය.

ඔහු ගසෙන් බසින්නට පය තැබිය යුත්තේ රථයේ වහලය මතටය. ඔහුගේ බරට වහලය මඳක් එබෙයි. මෙයට පෙර රථයට ගොඩවීම නිසා කන හරහා පාරක් කෑව ද දැන් ස්මයිල් ගේ පා දූවිලි ද ඔවුන්ට වැදගත් ය. ඔවුන් ස්මයිල් බිමට බස්සවා ගන්නේ ඔහුගේ යටි පතුලට අත තබා පරිස්සමිනි. චිත්‍රපටය අවසාන වන විට මේ මෝටර් රථය පමණක් නොව තවත් මෝටර් රථයක් ද ස්මයිල් අසල නතර කර ඇත්තේ ඒ ඕනෑම රථයකට ඔහු නංවා ගැනීමේ අභිලාෂයෙනි.

චිත්‍රපටයේ පැය දෙකක් ඇතුළත ස්මයිල් ට ලැබුණු වටිනාකම කුමක් ද? මේ අලුත්ම දෙමළ චිත්‍රපටයක් වූ මැන්ඩෙලා අපට ගෙනෙන පැනයයි.

මැන්ඩෙලා දේශපාලන උපහාසාත්මක චිත්‍රපටයකි. කොවිඩ් 19 හරහා මරණ ගණන වැඩිවුව ද ඉන්දියානු දේශපාලකයන්ට එය වැදගත් නැත. තමිල්නාඩුව සිය ප්‍රාන්ත ඡන්දය සඳහා සූදානම්ව සිටිති. ඡන්දදායකයන් සිය ඡන්දය පාවිච්චි කර ඇත. තමිල්නාඩු ඡන්ද යනු අරුම පුදුම ගණයේ ඒවා බැව් අමුතුවෙන් කිව යුතු නැත. ඒවා අපට වටහාගන්නට ද නොහැකිය. අලුත් සිනමාකරුවකු වන මැඩෝන් අශ්වින් ස්පර්ශ කරනුයේ තමිල්නාඩු ඡන්දයේ ඇති මේ නොපෙනෙන පැත්තයි. ඉන්දියාව යනු එක්තරා ආකාරයක සමස්ත ලෝකයේම පුංචි මොඩලයකි. මෙහි දුප්පත්කම ද එමටය. පෝසත්කම ද එහෙමය. අකුරු දන්නා එවුන් මෙන්ම නොදන්න එවුන් ද එහෙමය. නැති ජාතියකුත් නැත. නැති ආගම කුත් නැත. මේ හැම එකම මැද ඉන්දියාව යනු අපබ්‍රංශ වර්ගයේ රටක් බැව් අමුතුවෙන් කිව යුතු නැත. බොලිවුඩයේ කොලිවුඩයේ හෝ වෙනත් තැනක තැනෙන සර්ව පිත්තල බයිස්කෝප්වලින් දකින ඉන්දියාවේ හැව බයිස්කෝප් අතහැරිය විට ඉන්දියාව විකට නාට්‍යයක් බව ඇස් පනාපිට පෙනෙන්නට තිබේ.

මැන්ඩෙලා තුළින් අපට පෙන්වා දෙන්නේ මේ ඉන්දියාවේ නාට්‍යයයි. ඉන්දියානු සිනමාවේ ඇති මේ දේශපාලනය ඇතැම් සිනමාකරුවන් අතින් බරපතළ අන්දමෙන් විවේචනයට ලක් වන බව අමුතුවෙන් කිව යුතු නැත. එහෙත් ඒ සියල්ලට වඩා මේ සිනමාකරු ගෙන එන ප්‍රහසනය දරුණුය.

චිත්‍රපටයට දකුණු අප්‍රිකානු නායක නෙල්සන් මැන්ඩෙලාගේ නම් ලැබුණේ කුමට ද? එසේත් නැත්නම් ස්මයිල් ගේ තත්වය වර්ධනය වූයේ කෙසේ ද?

ස්මයිල්ට තැපැල් ස්ථානයේ ගිණුමක් අරින්නට උවමනාය. එහි සේවය කරන තෙන්මෝලි කාරුණික කාන්තාවකි. ඇය ඔහුගේ නම විමසයි. ඔහුට නමක් නැත. ඔහුට කුඩා කල නම දැමූ මහල්ලා කලකට ඉහත නමක් දැමුවා යැයි පැවසුව ද ඒ නම මතක නැත. නම මතක් කර ගැනීම සඳහා ඔහුට බීඩි පැකට් ගණනාවක් වියදම් කරන්නට සිදු වුව ද පලක් නැත. අවසානයේ විවිධ නම් රාශියක් ඔහු සඳහා යෝජනා කරයි. ඒ අතර දකුණු ඉන්දියාවේ ජනප්‍රිය නම් රාශියක් ද ඇතුළත්ය. අවසානයේ මුද්දරයක තිබුණු තමන් කිසිවිටකත් නොඇසූ, එහෙත් තමන්ට මෙන් ක්රේල් කොණ්ඩයක් හිමි වූවකුගේ නම ස්මයිල් විසින් ලබා ගනී. ඒ නෙල්සන් මැන්ඩෙලාගේ නමය . ස්මයිල් දකුණු අප්‍රිකාවේ අසහාය නායකයාගේ නම ගත් විත්තිය දකුණු ඉන්දියාවේ මේ ගම්වාසීන් දන්නේ නැත. මේ සමඟ මැන්ඩෙලා නමින් ඔහුට හැඳුනුම්පතක් ද ලැබෙයි. ඔහු හැඳුනුම්පත සඳහා ඡායාරූපයක් ද ලබාගනී.

මේ කිසිවක් ඔහුගේ ජීවිතය වෙනස් කරන්නේ නැති බව නම් ඇත්තය. එහෙත් වන්නේ කුමක් ද? අසනීප වන නායකයා වෙනුවට ඔහුගේ පුතුන් දෙදෙනා වන රත්නම් සහමාති තම ජන කොට්ඨාස වෙනුවෙන් බෙදී පියාගේ අසුන තරග කරති. ඔවුන් දෙදෙනාටම තම තම කුලය අනුව ලැබෙන්නේ එකම ඡන්ද සංඛ්‍යාවකි. ඡන්ද ලබා ගැනීම සඳහා විවිධ උපක්‍රම ඔවුහු යොදා ගනිති. එහෙත් එකතු කර ගණන් හදා බැලූ විට දෙනාටම ලැබිය හැක්කේ එක සමාන ඡන්දයකි. එබැවින් අලුත් ඡන්දයක් ඔවුනට කොයි පැත්තකින් හෝ අවශ්‍යය. මේ සඳහා ඔවුහු කැති පිහි අමෝරා ගනිති. මේ වෙලාවේ කොහේවත් යන සාම දේවදූතයකු මගින් අලුත් ඡන්ද පත්‍රිකාවක් ගමට ලැබේ. සියල්ල උඩු යටිකුරු ඉන් පසුවය. ඒ නෙල්සන් මැන්ඩෙලා ය. එහෙම නම තියෙන එකෙක් අහල ගම් හතකවත් නැත. ඡායාරූපයේ සිටින හිමිකරුවා ස්මයිල්ය. සත පහකට ගණන් නොගන්නා ස්මයිල් ය.

ඡන්දයට වටිනාකමක් ඇත. ඡන්දයකට කළ හැකි දේ බොහෝමය. සිනමාකරු තීරණාත්මක ලෙස චිත්‍රපටයේ තිර රචනය වෙනස් කරනුයේ එතැනින් ය. මිනිසකුගේ ඡන්දය කොතරම් වටිනවා ද එයින් කළ හැකි දේ මොනවා ද සිනමාකරු ප්‍රේක්ෂකයා හමුවට ඇඟට නොදැනී ගෙන යන ගැටලුව එයයි. මැන්ඩෙලා මේ ඡන්දය පාවිච්චි කරන්නේ කොයි ආකාරයෙන් ද ඔහුගේ සිත දිනා ගැනීම සඳහා කළ යුතු දේ බොහොමයකි. එහෙත් එක් පැත්තක් ගත හොත් ඔහුට ඊට හිලව් වශයෙන් වන්දි ගෙවිය යුත්තේ තම ජීවිතයෙනි. එය වටහා ගන්නා විට ඔහු බොහෝ දුර ගොසිනි. චිත්‍රපටය පුරාම චිත්‍රපටයේ ලොකු කුඩා සියලු නළුවෝ විශිෂ්ට රංගනයක යෙදෙති. ඔවුහු බොහෝ දෙනා අප දන්නා හඳුනන අය නොවේ. බොහෝ චිත්‍රපට සඳහා සම්පූර්ණ විකට නළුවකු වූ යෝගී බාබු විසින් මැන්ඩෙලා ලෙස කරනු ලබන අති විශිෂ්ට රංගනය සැමවිටම සිහිපත් කළ යුතුය. විකට රංගනය යනු දෙපිට කැපෙන වචන හෝ කට ඇද කිරීම නොවන වග මේ අපූරු රංගනය අපට පසක් කර දෙයි. ඡන්දය වෙනුවෙන් එකෙක් ස්ථිර බාබර් සාප්පුවක් තනන විට අනෙකා ඊට අවශ්‍ය සියලු උපකරණ ලබා දෙයි. දිවා රෑ ආහාර ඇඳුම් පැළඳුම් හිමි වෙයි. මෙතුවක් කිසිවකුට වටිනාකමක් නැති මැන්ඩෙලා එක මොහොතකින් වටිනා මිනිසකු බවට පත්වන්නේ ඡන්දයක් වෙනුවෙනි. එහෙත් මේ කෙළවර තමා ලබාගත යුත්තේ කුමක් ද? තමා දිනා ගත යුත්තේ කුමක් ද? තමාට කළ හැකි දේ කුමක් ද? යන්න මේ මෝඩ මිනිසාට එකවරම හැඟීමක් ඇතිවෙයි. සියල්ල උඩු යටිකුරු වන්නේ එහෙමය. ඡන්දය දෙන හැටි පවා හොර රහසේ කියා දෙන දේශපාලකයන්ට ඇස් ඇරෙන්නේ එතැනින් එහාටය. ඇත්තටම මැන්ඩෙලා නැරඹිය යුතු චිත්‍රපටයකි. මැන්ඩෙලා කවුදැයි අපටම වටහා ගත හැක්කේ එවිටය.

**අරුණ ගුණරත්න**

# ටොම්සන් මහත්තයා



## කොරෝනා වසන්තේ

කොහොමද වසන්තේ නැගලා ගිය හැටි ටොම්සන් මහත්තයා... අපේ රටේ ඉන්නේ අකුරු ලියන්න කියවන්න පුළුවන් ජනතාවක් කියලා නේද කියන්නේ? ඒක නම් හරියටම හරි... තමන්ට ඕනෑ දේ කියවා ගන්න අකුරු හොඳට දන්නවා... ඒ වුණාට හරි දේ කියවා ගන්න තමයි අකුරු දන්නේ නැත්තේ..." කියා ඇම්බන් මහත්තයා බොහොම සද්දෙට කීවේය.

"ඇයි මොකද ඇම්බන් මහත්තයා...? උදේම ටිකක් කලබල වෙලා වාගේ..." කියා ටොම්සන් මහත්තයා කීවේය.

"කලබල වෙන්නේ නැතිව පුළුවන් ද? අපරාදේ අර වසන්තෙට යන්න බැරි වෙච්චි එක..." කියා ඇම්බන් මහත්තයා කීවේය.

"අපරාදේ තමයි... අර මහරත්මලේ ලොක්කා දැන් ඇහැරිලා ඉන්නේ වසන්තේ පවත්වපු එක ගැන. දැන් තමයි වසන්තාධිපතිගෙන් ප්‍රශ්න කරන්නේ. කොරෝනා මාර්ගෝපදේශ නොසලකා කොහොමද වසන්තේ තිබ්බේ... කොහොමද සංග්‍රහ පැවැත්වුවේ... කොහොමද මේ තරම් ජනකායක් වසන්තේට ගෙනාවේ... කොහොමද වසන්ත උත්සව පැවැත්වුවේ කියලා... මේවා අහලා මට නම් මක්ඤ්ඤං..." කියා උන්නැහේ කීවේ කෝචොක් කරමිනි.

"මේ මක්ඤ්ඤං කතා ඔය පත්තරවලත් පළ වෙනවා නේ... අපිත් කියවනවා... අපටත් මාර ජොලි... මේවට තමයි කියන්නේ අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලේ වහනවා කියලා..." කියලා ඇම්බන් මහත්තයා ගෙදරින් එළියට බැස යන්නට ගියේය.

ටොම්සන් මහත්තයා, උන්නැහේත් ඒ පස්සෙන් දුව ගෙන ගියෝය.

"කොහෙද ඇම්බන් මහත්තයා මේ දුවන්නේ... ඔය මහරත්මල ලොක්කා වසන්තාධිපති එක්ක පොඩි අශ්ව රේස් එකක් දානවා කියලා තේරෙන්නේ නැද්ද? ඕකට ඔය තරම් කේන්ති ගන්න එපා... ගාල වහලා දැම්මත් අශ්ව රේස් ටික අපූරුවට තිබ්බා නේ... රට පුරාම විනෝදකාමියෝ කොරෝනා පාර්සලුත් අර ගෙන අපූරුවට ඔය අශ්වයෝ වටේ වට වෙලා හිටියේ... අනේ ඇම්බන් මහත්තයා... යමු ආපහු... ඕකට ඔය තරම් කේන්ති ගන්න එපා..." කියා උන්නැහේ ඇම්බන් මහත්තයාගේ අතින් ඇද්දේය.

ඇම්බන් මහත්තයා අත ගසා දමා වේගයෙන් යන්නට පටන් ගත්තේය.

"මට මොකද වසන්තෙට මොනවා වුණාද? මං මේ යන්නේ අධිවේගේ පැත්තට ගිහින් එන්න... ඒකේ අඩු ගානේ වේග සීමා දාන්න නාම පුවරුවත් තිබුණා නම් අර පේළියට වාහන හැප්පෙන්නේ නෑනේ... මං අල්ලා ගන්නම්කෝ ඔය අධිවේගාධිපති.... කෝටි ගණන් සල්ලි හම්බ වුණා නම් ඇති... මේ තරම් වාහන කන්දරාවක් බස්නාහිර පළාතෙන් පිටත් වෙලා රට වටේ යන තුරු මුන් මොනවා කළා ද? රට පුරාම අරන් ගියේ කොරෝනා වසන්තේනේ... දැන් ඉතින් හුල්ලනවා..." කියා ඇම්බන් මහත්තයා තනියම කියව කියවා යන්න ගියේය.

ටොම්සන් මහත්තයා පාර අයිනේ තිබූ බොක්කු කනුවක් උඩ හිඳ ගත්තේය. උන්නැහේ ද ඒ අයිනේ තිබූ තවත් බොක්කු කනුවක් උඩ හිඳ ගත්තේය.

"මේ රටේ ඉන්නෙත් මහ පුදුම ජාතියක්... දැන් ඔය අවුරුදු කන්න රට පුරාම ගාල කඩා ගෙන වාගේ ගියේ... මෝඩ උදවියද? නෑනේ... උගත්තු, පොහොසත්තු, ඉහළ තානාත්තරවල ඉන්න උදවිය. ඒ එකෙකුටවත් මොලේ කළඳක් තිබුණේ නෑනේ... රට පුරා වසන්තේ යනකොට අන්තිමට මේක කොරෝනා වසන්තයක් වෙයි කියලා හිතන්න..." උන්නැහේ බොහොම විස්සෝපයෙන් කීවේය.

"අන්තිමේදී රටම මළ ගෙයක් වෙලා තමයි නතර වෙන්නේ... ඒක එහෙම නොවුණොත් හොඳයි... දැන් ඔය ඉස්පිරිතාල පිරිලා... දවස ගානේ කොරෝනා රෑනක් හම්බ වෙනවා... කොහොම වසන්තයක් ද? ඒ අස්සේ ලොකුම වසන්තේ තමයි මේ දේශපාළුවෝ අර අතට මේ අතට ඇර ගන්න එක... රට ගිනි ගනිද්දී ඒකෙන් සුරුට්ටු පත්තු කර ගන්න හදනවා... අපිත් ඉතින් සුරුට්ටුවේ දුම් ටික දිහා බලා ගෙන ඉන්නවා... රටට හැමදාම සිද්ද වුණේ ඒක තමයි... රෑ වැටුණු වලේ දවලුත් වැටෙන 'උගත්තු' ඉන්න රටක් මේක... ලෝකේ ඉහළම සාක්ෂරතාව තියෙන ජනතාවක් ඉන්න රටක් නේද මේක... ඒ වුණාට අඩු ගානේ තමන් කරන්නේ මොකක්ද කියලාවත් හිතා ගන්න බැරි බම්බු සාක්ෂරතාවක් තමයි තියෙන්නේ... අකුරු ලියන්න කියවන්න පුළුවන් වුණාට මොකටද? ඒ අකුරුවලින් කියවෙන්නේ මොකක්ද කියලා තේරුම් ගන්න බැරි කොට... මෙහෙම රැලක් එක්කනේ අපි මේ රට සංවර්ධනය කරන්න හදන්නේ..."ටොම්සන් මහත්තයා හීල්ලුවේය.

ඒ අස්සේ ඇම්බන් මහත්තයා පාර දිගේ ආපහු දුව ගෙන ආවේය.

"ඇයි මොකද ඇම්බන් මහත්තයා... ? මොකක් හරි අලකංචියක් ද? මං හිතුවා වසන්තෙට ගියා කියලා..."

"වසන්තේ...?" කියා ඇම්බන් මහත්තයා ටොම්සන් මහත්තයාගේ ඇඟට පැන්නේය.

"ටොම්සන් මහත්තයා දැන ගන්ඩ... ඔය වගේ අස්සයා ගියාට පස්සේ ගාල වහලා දාන මහරත්මලාධිපතියොත්, අස්ස තරග පවත්වලා ජොලිය දාන වසන්තාධිපතියොත් ඉන්නකං මේ රට හදන්න බෑ... ඒ විතරක් නෙවෙයි... ඒ අතට මේ අතට ප්‍රකාශ නිකුත් කරන හැත්තම කරන්නෙත් රටම රවට්ටන එක... තම තමන්ට ලකුණු ගන්න එක විතරයි එකම අරමුණ... අන්තිමට අපි ඔක්කොටම කොරෝනා වසන්තේ... අපි ආපහු යමු ටොම්සන් මහත්තයා, මේ එළියේ ඉන්න හොඳ කාලයක් නෙවෙයි... මට ඇහුණත් එක්ක හුළඟ දිගේ කොරෝනා වසන්තේ එනවා වගේ... අනේ අපි යමු ටොම්සන් මහත්තයා.. උන්නැහේ... අපි යමු... තව මාසෙකට මම නම් ගෙදරින් එළියට බහින්නේ නෑ... අඩු ගානේ තම තමන් ආරක්ෂා වුණොත් රට ආරක්ෂා කර ගන්න පුළුවන් වෙයි..." කියා ඇම්බන් මහත්තයා ගෙදර දෙසට දුවන්නට පටන් ගත්තේය. ටොම්සන් මහත්තයා ද, උන්නැහේ ද ඒ පස්සේ දිව්වෝය.

**බන්දුල පී. දයාරත්න**

2021 මැයි 04 අඟහරුවාදා
දිනමිණ
බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ

# හිංසනය පිටුදකිමු








දඬුවම් කිරීම සහ හික්මවීම කාරණා දෙකකි. වධ දී දඬුවම් කිරීමෙන් කෙනෙක් තාවකාලික යටත්වීමකට පත්විය හැකිය. එහෙත් ඉන් හික්මවීමක් ඇති වන්නේ නැත. කුඩා දරුවන්ට විශේෂයෙන්ම ශාරීරික වධ-හිංසා කිරීමෙන් හරි වැරදි තේරුම් කිරීම සිදු වන්නේ නැත. සිදු වන්නේ දරුවන් පීඩාවට පත් වීම පමණි. දරුවන්ට එරෙහි හිංසනය පිටුදකිනු වෙනුවට වැඩිහිටියෝ දරුවන්ට ශාරීරික වධහිංසා පමුණුවා, එය දරුවන් යහපත්ව තැනීමට ගන්නා පියවරක් ලෙස යුක්ති සාධනය කිරීමට උත්සාහ කරති. නිදහස් ජීවීන් ලෙස උපත ලබන ළදරුවන් කෙමෙන් වැඩෙද්දී වැඩිහිටියන් වන අපට ඕනෑ ආකාරයේ පුද්ගලයන් බවට පත් කිරීමේ අරමුණ ඉෂ්ඨ කරගැනීමට දරුවන් හරි මඟට ගැනීම යන නම දී එම අරමුණ ඉෂ්ට කරගැනීමට පාවිච්චි කරන හිංසාකාරී කුරිරු පරිභවාත්මක විධික්‍රමයට දරුවන් හික්මවීම යැයි කීම දරුවන්ට එරෙහි හිංසනයකි.

ස්වාභාවික වැඩීමේ ක්‍රියාවලියට එරෙහිව වැඩිහිටියාට වුවමනා ආකාරයේ හැසිරීමක නිරත වීමට කුසලතාවක් සහිතව දරුවන් මෙලොව එළිය නොදකින නිසා දරුවන් නොදරුවන් ලෙස අපි සෙනෙහසින් හඳුන්වන්නෙමු. බාලවයස්කරුවන්ගේ ශුභසාධනය, ශක්තිමත් ස්වාධීන පුද්ගලයින් වන තුරු ඔවුනට නපුරක් නොවෙන ලෙස රැකබලා ගැනීම වැඩිහිටියන්ගේ වගකීම්, යුතුකම් වේ.

එසේ වුවත් සහකම්පනයකින් තොරව වැඩිහිටියන් විසින් දරුවන් හොඳින් හෝ නරකින් දමනය කිරීමට හෝ උත්සාහ කරන්නේ ඇයි? දරුවන් පාලනය කිරීමට වැඩිහිටියන් වන අපට පුදුමාකාර අවශ්‍යතාවක් ඇත්තේ ඇයි? දරුවන්ගේ, බාලවයස්කරුවන්ගේ ස්වභාවයට සෑහෙන හැසිරීමක යෙදීම වැඩිහිටියන්ට විසඳීමට ඇති ප්‍රශ්නයක් වන්නේ ඇයි?

ඇතැම් කෙනකුට බාලවයස්කරුවන්ගේ වැඩීමේ ක්‍රියාවලිය ස්වභාවික සංසිද්ධියක් බව වැටහෙද්දී තව කෙනකුට දරුවන් තේරුම් ගැනීමට නොහැකි වීමට නොයෙකුත් හේතු කාරණා ඇත. බිළිඳකු ලෙස ඉපිදි මිනිසකු ක්‍රමයෙන් වැඩිමහල්ලකු බවට පත්වෙන ගමනේදී පුද්ගලයාට අදාළව බොහෝ අදියර මතින් ශාරීරික සහ මානසික විකාසනයක් සිදු වෙනවා මිස විදුලි ස්විචය දමනවා - වහනවා වැනි ක්‍රමයකට සාමාන්‍ය මිනිසුන් නොවැඩෙන බව ඇතැම් අය තේරුම් ගනිද්දී ඇතැම් අයට එය තේරුම් ගැනීමට අවබෝධ ශක්තියක් නැති වීමට බොහෝ හේතු ඇත. එවැනි සංකීර්ණතාවයන් ආගමික, සංස්කෘතික, අධ්‍යපනික, ආර්ථික සහ තවත් නොයෙක් තත්වයන්වල බලපෑම මත ලොව පුරා ඕනෑම තැනක දකින්නට හැකි වනු ඇත.

වැඩිහිටියන් වන අපි අනවශ්‍ය මතිමතාන්තරවලින් අපගේ සමාජය ව්‍යාකූල කරගෙන ඇත්තෙමු. අප විසින් නඩත්තු කෙරෙන ක්‍රමය අවුල්සහගත බව පිළිගැනීමට නොහැකි තරමට සාම්ප්‍රදායික බර මඟින් මමංකාරයේ මුද්‍රාව තබා අපි මනුෂ්‍යත්වයට අගුළු දමා ඇත්තෙමු. ළමයින්ගේ පිවිතුරු බව ඉදිරියේ අපට දැනෙන අපේ අඩුපාඩු වසාගනු නොහැකිව අපි දරුවන් පහතත් තත්වයකට ඇද දමන්නට නිතර වෙහෙසෙන්නෙමු. දරුවන් නිවැරදි කිරීමට කියා අප උත්සහ කරන්නේ ඔවුන් අප මෙන්ම අවුල් සහගත දෛනික ජීවන චක්‍රයක කැරකැවීමට කැමැත්තෙන් එකතු වෙන පිරිසක් බවට හීලෑ කිරීමයි.

ධනය බලය අධ්‍යාපනය යනාදි නොයෙක් දේවලින් තමන්ගේ තරාතිරම මැනීමට ඉඩ දෙන අනෙකාගේ තරාතිරම මැනීමට එම මිණුම් දඬු සතුටින් භාවිතා කරන වැඩිහිටියන් දරුවන්ට උපන්දා සිට කියාදෙන්නේ එම තරඟයෙන් වැඩි ලකුණු ගනිමින් තරාතිරමින් ලොක්කකු වීමටය. නිදහසේ උපන් දරුවන්ට එය නුහුරු අස්වාභාවික ඉගැන්වීමකි. ඒ නිසා එසේ හීලෑ සතුන් බවට පත් වීමේ ක්‍රියාවලිය ඔවුන්ට පහසු නැත. වැඩිහිටියන්ටත් දරුවන් හීලෑ කිරීම පහසු නැත. එහෙත් අප විසින් පිළිගෙන ඇති ක්‍රමය තුළ, දරුවන් අපට ඕනෑ විදියට හීලෑ කරගැනීම අපගේ ජයග්‍රහනයක් ලෙස පෙන්වා දේ. වැඩිහිටියෝ ඔවුන්ගේ සාර්ථකත්වය, බලය පෙන්වීමට හොඳින් හෝ නරකින් දරුවන් මෙල්ල කිරීමට කටයුතු කරති. විටින් විට තමන්ගේ ස්වාභාවික අහිංසක ගති පෙන්වන දරුවන් නොහික්මුන කියන දේ නාසන හිතුවක්කාරයින් ලෙස සළකමින් ඔවුන්ට දඬුවම් දෙන්නට වැඩිහිටියන් ඉදිරිපත් වෙන්නේ එය දරුවන් විසින් තමන්ට කළ නිග්‍රහයක් ලෙස බාර ගැනීමෙනි. දරුවන්ගේ දරුවන්ට අදාල හැසිරීම වැඩිහිටියන් දකින්නේ තමන්ගේ වෑයම ව්‍යර්ථ වීමක් ලෙසයි. එවිට වැඩිහිටියා ඉච්ඡාභංගය නිසා කිපෙයි. තමන්ගේ කෝපය බල රහිත බාලවයස්කරුවා මත මුදාහරිමින් දරුවාට හිංසා පමුණුවයි. තමන් විසින් වෙන ඒ අපරාධයට දරුවන් නිසි මඟට ගැනීම, දරුවන් හොඳින් තැනීම වැනි බොරු ලේබල අලවයි.

තමන්ගේ ඇස් ඉදිරිපිට සිදු වන මේ සාමූහික අපරාධයෙන් දරුවන් ආරක්ෂා කටයුතු කරන්නේ ඉතා කුඩා වැඩිහිටියන් පිරිසක් පමණි. අනෙක් අය අපරාධකාරී ක්‍රමය අනුමත කරමින් එය පෝෂණය කරමින් නඩත්තු කරන්නේ දැනුවත්ව හෝ නොදැනුවත්ව විය හැකිය.

දරුවන්ට එරෙහි හිංසනය පිටුදැකීමට කටයුතු කරන මිනිසුන්ගේ මහන්සියේ ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ බොහෝ රටවල දරුවන් හික්මවීමට හිංසාකාරී දඬුවම් පැමිණවීම නීති විරෝධී අපරධකාරී ක්‍රියාවන් බවට හඳුන්වා ගැනෙන ප්‍රතිපදාවන් සම්මත කරගෙන ඇත. දඬුවම ලැබිය යුත්තේ අපරාධකරන්නාට මිස දරුවන් දරුවන් වීම නිසා නොවන නිසා දරුවන්ට වධ හිංසා පමුණුවන අයට නීතියෙන් දැඩි අවහිරතා ඇති කළ යුතුය. නමුත් එපමණක් නොසෑහේ.

ලෝකයේ විවිධාකාර සංස්කෘති, සම්ප්‍රදායන්, සාරධර්මවලින් හෙබි ප්‍රජාවන්ට ගැලපෙන ලෙස දරුවන්ට විනය පුහුණු කිරීමට හැකි අහිංසාවාදි ක්‍රම ඇති කරගැනීමට සියලු දෙනා එකතුව සියලු දෙනා එකතුව ක්‍රමයක් ගොඩ නඟා ගත යුතුය. එසේ කරගැනීමට අවැසි දැනුම, පුහුණුව ලබාගත හැකි පහසුකම් වගකිව යුතු බලධාරීන් විසින් ජනතාවට පවරා දිය යුතුය. පර්යේෂණ, විසඳුම් සොයා ගැනීම, දැනුම බෙදා හැරීම සිදු විය යුතුය. ගුරුවරුන්ට, මව්පියන්ට, දරුවන් සමඟ වැඩ කරන්නන්ට දරුවන් හඳුනා ගැනීමට, දරුවන්ගේ වැඩීමේ අදියර තේරුම් ගැනීමට අවශ්‍ය දැනුම ලැබිය යුතුය. උපන්දා සිට දරුවන්ට හිංසා පීඩාවකින් තොරව වැඩීමට අයිතියක් ඇති බව දන්නා සමාජයක් බිහිකිරීමට කටයුතු කිරීම හැම කෙනකුගේම වගකීම විය යුතුය. මේ සැමට ඉහළින් හෝඩි පොතටත් පෙර දරුවන්ට කියා දිය යුත්තේ හිංසා-පීඩාවෙන් තොරව වැඩීමට තමන්ට අයිතියක් ඇති බවය.

**හිමාලි එන්. ලියනගේ**

# අපේ නිවාස මහ ගෙදර



නිවාස මහ ගොඩක කතන්දරය ලියවෙන නිවාස මහ ගෙදර තිවුනණ, කොළඹමයි. බේරේ ගෙදර මහ පත්තර කන්තෝරුව ඉස්සහරින් තමයි නිවාස මහ ගෙදරත් තිවුණෙ. මුලින්ම තිවුණෙ නිවාස දෙපාර්තමේන්තුවක්. ඒ තට්ටු තුනක පුංචි බිල්ඩිමේ හෙවණෙ ඉඳං ඊට ඉස්සහරින් තමයි ඉදිවුණේ තට්ටු නවයක මහා ගොඩනැගිල්ල.

මුදුන් තට්ටුවට පේනවලු අහස උඩින් ගියෝතින්, දෑකැත්තයි මිටියයි. වැඩ කරන කම්කරුවන්ගේ මහා ජවයයි ඒකෙන් කියාපෑවෙ කියලා සෝවියට් රුසියාවට හිතැති උදවිය කියනවා. නිවාස අධිකාරියේ මහ ගොඩනැඟිල්ල හදද්දි අපි උන්නෙ නිවාස දෙපාර්තමේන්තුවෙ. නිවාසෙන් තෝරගත්තු, නැත්නම් දාම් ලෑල්ලක ඉත්තො වගෙ එහෙන් මෙහෙන් තේරිච්ච අයත් එක්ක තමයි මුලින්ම නිවාස අවශ්‍යතා වැඩ සටහන ක්‍රියාත්මක වුණේ. එතකොට ප්‍රේමදාස මහත්තය ඇතුළු අලුත් රජයක් පෙරට පැන්නෙ. ඒ එක්කම වගේ 79 දි ජනතාවට නිවාස ලබාදෙන අලුත් වැඩ පිළිවෙළ ඇතුළත් පනතකුත් හැදුණා. දිස්ත්‍රික්ක විසිහතරටම වගෙ නායක ඇත්තො පත් වුණා. ඒ ඒ වැයික්කයට ඒ ඒ මුලාදෑනින් වගෙ, කළමනාකාර මහත්තුරුත් පත් වුණා. පළාත් පාලන හා නිවාස ඇමතිතුමා වුණේ ප්‍රේමදාස මහත්තයා. මාසෙකට වතාවක් දෙකක් එනවමයි අපේ ආයතනයට. එතනදි තමයි මුළු දිවයිනේම; නියෝජිතයන් එන්නෙ නිවාස මහ ගෙදරට.

ඒ දවස තමයි දවස. මහ විසාල වාහනවලින් පිරෙනව මහගෙදර මුළු බිමම. ඒ විතරක් ද පාරෙත් ජීප් වාහන පෙළගැහිලා.

එදාට අපේ ආයතනයෙ හොඳටම වැඩ තියෙන්නෙ ආරච්චිලාට. ආරච්චිගෙ ඇඳුමත් සුදුයි උඩ ඉඳන් යටටම. ඒ ආරච්චිගෙ නිල ඇඳුම. උඩු කය වැහුණෙ ආරිය සිංහල ඇඳුමට නෑකම් කියන දිග කමිසයකින් ඇග මැද්දෑවෙන් බාපනේ. අගට වෙනකම්ම රත්තරං පාටට හුරු බොත්තම් පේළියක්. එදාට උන්නැහෙගෙ 'රැස්පොට්' එක තමයි බලන්නම වටින්නෙ. එක සීරුවටම කෑ ගහනව. වැඩත් කඩියා වගෙයි. අස් කරනව, පිහදාන්න අණ කරනව. කෑම, අතුරුපස, තේවතුර, වතුර වීදුරු එහා මෙහා වෙනව.

ඒ දවස්සල පස්වෙනි තට්ටුවට එන විදුලි සෝපාණෙ නතර වෙන්නෙ, පස් වෙනි තට්ටුවේම විතරයි. මුලින්ම ඇමතිතුමා වුණා. ඊළඟට අගමැතිතුමා වුණා. ඊටත් පස්සෙ තමයි ජනාධිපතිතුමා වුණේ. කොයි නිල තනාන්තර දැරුවත් නිවාස මහ ගෙදරට එන එක මාසික වැඩ සටහනේ එක අංගයක් එතුමාගෙ.

මේ කියන කාලවකවානුවෙදි, අපේ ආරච්චිල, කුලරත්න අයියා, මුලින්ම කරන්නෙ සෝපාණ දොරටුව ළඟම තියෙන වැසිකිළි කැසිකිළි සෝදවල පවිත්‍ර කරන එක. ඊට පස්සෙ එක සීරුවට ඒ පැත්තෙ දුගඳක් තියේනසම් නැති වෙලා යන්නම සුවඳ පැන් ඉසින එක. එදාට නිරන්තරයෙන්ම සෝපානය අවට පස්වැනි තට්ටු ප්‍රවේශය පුදුම විදියෙ සුවඳකින් පිරිලා. සුවඳත් එක්කම තමයි කාර්යාලයෙ කවු

රුත් වගෙ දන්නෙ අද අපේ මහ ගෙදරට අපේ මහ ඇත්තො වඩිනව කියල. ඒකයි එදාට ආරච්චිටත් වැඩ වැඩි. පස්සෙ කාලෙකදි එතන තියෙන වැසිකිළි පද්ධතිය වහල දැම්ම බිත්තියක් බැඳලා. එහෙම වෙද්දි, ආරච්චිටත් ඕනෑ වුණේ නෑ සුවඳ දියර ඉහින්න ඒ පැත්තට.

නිවාස මහ ගෙදර ලස්සන වෙන්නෙ 'ගම් උදාව' කාලෙට. දඹුල්ල, මහියංගණය, අනුරාධපුරය, තිස්සමහාරාමය වගෙ පැතිවල පවත්වපු 'ගම් උදා' උත්සව බලන්න අහල ගම් ගණනාවක ගම්මු පෙරහැර වගේ තමයි 'ගම් උදා' භූමියට ගොඩ වෙන්නෙ. ඒ දවස්සල තිබ්බිච එක විශේෂත්වයක් තමයි රටේ හැම ආයතනයක්ම, මණ්ඩලක්ම, බැංකු, පෞද්ගලික ආයතන හැම එකක්ම 'ගම් උදා' ව්‍යාපාරෙත් එක්කම බද්ධ වී තිබීම. ඒ කාලෙ ඒ තෝන් ලණුව තියාගෙන හිටියෙ ජනාධිපතිතුමා විසින්. ඒ හින්දම ප්‍රශනත් නෑ. ගැටලු ඇත්තෙත් නෑ. ඒ කාලෙ ජනාධිපතිතුමාගෙ නිල රියැදුරු තැන වුණේ 'චන්දරේ'. එතුමා, උත්සවයෙ නිල අවසන් අදියරට කලින් කාටවත්ම නොදැනෙන්නම චන්දරේ එක්කම යනව 'ගම් උදා' භූමියෙ පුංචි කොනකට. ඉන්නව නිවී සැනසිල්ලෙ හෝරාවක් විතර. මිනිසුන්ගේ, ජනතාවගේ සැබෑ ප්‍රතිචාරය කොයි වගේ ද කියල දැනගන්නයි ඇත්තටම එතුමාට ඕනෑ. චන්දරේ එක්ක රහසිගතව වගෙ වෙන මේ තොරතුරු ඒකරාසී කර ගැනීම, ඊළඟ ගම් උදා දොරටුවට සැබෑ ලෙසින් පිවිසීමට ලොකු අත්වැලක් වෙන වග එතුමා විශ්වාස කෙරුව වෙන්නැති.

සමහර තොරතුරු ඇත්තටම අපේ ජීවිතවලට වගේම, අපේ ආයතනවල හැඳුනුම්කම් වගා වීමටත් ලොකු පිටිවහලක් වුණා.

අපේ ආයතනයෙ නිල වශයෙන් පත් වුණු රටේ නායකතුමාගෙ තවත් පුරුද්දක් තමයි මහ පාන්දර තුනට විතර නැගිටලා, හතර දිගන්තයෙන් එන ජනතා සන්දේශ පෞද්ගලිකවම කියවා බැලීම. දිය යුතු සහන, කිව යුතු කරුණු, පුරෝගෙන සටහන් කර, අදාළ දෙපාර්තමේන්තු, සංස්ථා මණ්ඩල නියෝජිතවරු මහ පාන්දර යන්නෙ සුචරිතයට. එතෙන්ට තමයි හුග දෙනෙක් තම තමන්ගෙ දුක් කඳුළු, තැවුල් සන්තාප ගොඩ කරල ලියුං කරදහි එහෙම නැත්තම් සන්දේශ එවන්නෙ. අපේ ආයතනයෙන් මහ පාන්දරම ප්‍රේමදාස මහත්තයව මුණ ගැහෙන්න යන්නෙ පී. ගුණතිලක මහත්තය.

එදා දවසෙම කාර්යාලයට ඇවිත් මහජන සම්බන්ධතා නිලධාරියාවත් සමීප කරගෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරියට යොමු කර ඇති ප්‍රශ්න දුක් ගැනවිලිවලට විසඳුම් ලබාදීමට යුහුසුලු වෙන්නෙ කඩියො වගෙ. ඇත්තටම දින තුනක් තුළදි ලියුම එවපු තැනැත්තාට උත්තරයක් නම් ලැබෙනවාමයි.

ඒත් ඒ තත්ත්වය එතුමාගේ අභාවයෙන් පස්සෙ නැත්තටම නැති වුණා. පහුගිය කාලෙක එක්තරා අකටයුත්තක් ගැන සාධාරණත්වයක් බලාගෙන මාත් විශ්‍රාමිකයෙක් ලෙස එතුමාගේම පුතාට ලිපියක් යොමු කෙරුවා. කිසිම දවසක පිළිතුරක් තියා, ලිපියක් ලැබුණා කියලවත්
පිළිතුරක් ලැබුණෙ නෑ.

**ලක්ෂ්මී බෝම්බුවල**

'බද්දර මල්ල' ගැන ඔබේ අදහස් අපට කියන්න

බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ

සංස්කරණය - දිල්රූ ජයසේකර

'බද්දර මල්ල', දිනමිණ, අංක 35, ලේක් හවුස්,
ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
baddaramalla@lakehouse.lk

2021 මැයි 04 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.